# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,856 — 1969 මැයි 30 වැනි සිකුරාදා — 1969.5.30

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

## I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)



| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 845 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 862 | රට බිම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 867 | වෙන්දේසි ක්‍රම පිළිබඳ දැන්වීම් ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | 893 | පොදුපල් ගෙන්ද හා වෙනත් වෙන්ද විකිණීම ... ... | 898 |
| බඩු ආනිරාදිය විකිණීම ... ... ... | 893 | විවිධ දැන්වීම් ... ... | 904 |



## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

දීමනා.—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අත්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. සේවා කොන්දේසි.—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි, යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසි වලට හෝ යටත් වන්නේ ය.

3. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර), ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ අදකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට $7\frac{1}{2}$ කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබිම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප.) ආඥාපනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, අදාලවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශෙෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය.
කොළඹ.

ඇල්. ඩබ්ලිව්. පී. පීරිස්,
වැඩබලන ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

**3. බඳවා ගැනීමේ කොන්දේසි.—**

(i) මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත වේ. එසේ වුවද, තෝරාගනු ලබන අයදුම්කරු ප්‍රථම වශයෙන් අර්ථ සාධක අරමුදල් ක්‍රමයේ වරප්‍රසාද ලැබීමේ පදනම මත පත් කරනු ඇත. දස අවුරුද්දක සේවා කාලයක් සම්පූර්ණ කිරීමට ප්‍රථම ඕනෑම අවස්ථාවකදී විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට මාරු කරනු ලැබීමට ඇයට මනාපය පලකර සිටිය හැක. එසේ වරක් පලකරනු ලබන මනාපය අවලංගු කළ නොහැක.

(ii) මෙම පත්වීම ප්‍රථම කොට අවුරුදු 3 ක පරීක්ෂා කාලයකට යටත්වනු ඇත.

දැනටමත් රජයේ සේවයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරණ නිලධාරිනියක් තෝරාගනු ලැබුවහොත් ඇ එක් අවුරුදු වැඩ බැලීමකට යටත්ව පත් කරනු ලැබේ.

**4. අවශ්‍ය සුදුසුකම්.—** සෑම අයදුම්කරුවකු විසින්ම ඇ පිළිබඳ පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(අ) 1969.6.13 වැනි දිනට වයස අවුරුදු 28 ට නොඅඩු බවට හා අවුරුදු 40 ට නොවැඩි බවට (දැනටමත් රජයේ සේවයේ ස්ථිර තනතුරු දරන අයගේ අයදුම්පත් උපරිම වයස් සීමාව ගැන නොතකා සලකා බලනු ඇත.),

(ආ) විශිෂ්ඨ ශ්‍රේණියේ විදුහල්පතිවරයෙකු වීම,

හෝ

පහත දැක්වෙන සුදුසුකම් තිබෙන බවට—

(i) පිළිගත් විශ්ව විද්‍යාලයයක උපාධියක් (1 වැනි හෝ 2 වැනි පංතියේ නම් වඩා මැනවි) සහ පිළිගත් විශ්ව විද්‍යාලයක හෝ වෘත්තීය ආයතනයක පශ්චාත් උපාධි හෝ සමාන වෘත්තීය සුදුසුකම්,

සහ

(ii) විශ්ව විද්‍යාලයක අවුරුදු 5 කට හෝ කාර්මික විද්‍යාලයක සහ/හෝ ගුරු විද්‍යාලයක සහ/හෝ ද්විතීයික අධ්‍යාපන මට්ටමේ අවුරුදු 7 කට නොඅඩු කාලයක ඉගැන්වීමේ පළපුරුද්ද,

හෝ

උපාධිය ලැබීමෙන් පසු රාජ්‍ය සේවයේ මාණ්ඩලික පත්වීමක පරිපාලන තත්ත්වයේ හෝ විශ්ව විද්‍යාලයක I වැනි ශ්‍රේණියේ කථිකාචාර්යවරයෙකු වශයෙන් හෝ අවුරුදු 3 කට නොඅඩු සේවයක්,

(ඇ) අයදුම්කරුට සිංහලෙන් වැඩ කිරීමට මනා දැනුමක් තිබීම අවශ්‍ය වේ. අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් නියම කරනු ලබන කාල පරිච්ඡේදයක් තුළදී සිංහල පිළිබඳ නියමිත තත්ත්වයක වැඩිපුර ප්‍රවීණතාවයක් ලබා ගන්නා ලෙස පත්වීම සඳහා තෝරා ගන්නා ලද ඕනෑම තැනැත්තෙකුගෙන් අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්ට ඉල්ලා සිටිය හැකිය.

(ඈ) විශිෂ්ඨ චරිතයෙන් හා මනා ශරීර සනීපයෙන් යුක්තවීම.

5. පහත සඳහන් ලියවිලි එකක් හෝ සියල්ලම ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටි අවස්ථාවකදී අපේක්ෂකයන් විසින් ඒවා ඉදිරිපත් කිරීම අවශ්‍ය වනු ඇත.

(අ) උප්පැන්න සහිතිකය (සැ. යු.—බෞතීස්ම සහතික හෝ උපකෘත පාසල් සඳහා නියමිත අධ්‍යාපන ව්‍යවස්ථා පරිදි නිකුත් කරන ලද උප්පැන්න සහතික හෝ භාරගනු නොලැබේ.)

(ආ) උපාධිය සහ උසස් ම අධ්‍යාපන සහතික,

(ඇ) චරිත සහතික දෙකක්, මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂගෙන්, විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය,

(ඈ) ලබා ඇති වෘත්තීය හා/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික පත්‍ර,

(ඉ) සිංහලෙන් සමත් වූ උසස්ම විභාගයේ සහතික පත්‍රය.

සංලක්ෂ්‍යය :

(1) අයදුම් පත්‍රයට ලියවිලි හෝ ලියවිලි පිටපත් නොඇමිණිය යුතුයි.

(2) නියම කරනු ලැබූ අවස්ථාවක ලියවිලි ඉදිරිපත් කිරීමට නොහැකිවන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සළකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැන ගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙළින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝරමය සමග තමන්ට එවන ලද ("ආ" සලකුණ දරණ) මුද්‍රිත තැපැල්පත මේ සඳහා භාවිත කළ හැකිය.

7. අයදුම් පත්‍ර හා ඒ හා සම්බන්ධ අනෙකුත් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් හැරුණු හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකු නමට නොඑවිය යුතුයි.

8. මෙම ගැසට් පත්‍රයේ පළමුවැනි කොටසේ දෙවැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරනු ලබන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි බලනු මැනවි.

9. අයදුම්කරුවන් විසින් ඉල්ලුම් පත්‍ර පෝරමය සමග තම තමන්ට නිකුත් කරන ලද ("අ" සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝරමය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුනට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ලැබුණු බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නාවූද ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නො ලැබෙන්නා වූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරිය හොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 මැයි 21 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහා ලේකම් ගොඩනැගිල්ලේ
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දීය,
තැ. පෙ. 500.

5–1 66/1—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඒ බී. 101/එක්ස් 2090/68

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

### ජ්‍යෙෂ්ඨ සහකාර කොමසාරිස් (වගාරක්ෂණ) තනතුර

ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ සහකාර කොමසාරිස් (වගාරක්ෂණ) තනතුර සඳහා ඉල්ලුම් පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම් පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය :—

(ඒ) මෙරට ඉල්ලුම්පත්‍ර : 1969 ජූනි මස 13.

(බී) විදේශීය ඉල්ලුම් පත්‍ර : 1969 ජූනි මස 20.

සටහන් :

(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම තැපැලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද, නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9"×4" ප්‍රමාණයට කුඩා නොවූ ද තම ලිපිනය ලියන ලද්දාවූ ද මුද්දර නොගැසුවා වූද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝරම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබාගත හැකිය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාල සීමාව ඇතුළතදී බාර දීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍ය දැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත්, ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින් ම ගෙවිය යුතු වෙයි.

(iii) සිංහලෙන් ඉගැන්වීමට හැකියාවක් තිබීම හෝ සිංහලෙන් ඉගැන්වීමට හැකියාවක් පත්කළ දින සිට අවුරුදු 3ක් ඇතුලත දී ලබාගැනීම.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපෙක්ෂකයකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය. (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උප කෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතිස්ම සහතික භාරගනු නොලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂක තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු.—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපෙක්ෂකයින්ගේ අයදුම් පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින්ම තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර ෆෝර්මය සමග තමන්ට එවන ලද ("ආ" සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම් පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියකුගේ නාමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින්, ඉල්ලුම් පත්‍ර ෆෝර්මය සමග තම තමන්ට නිකුත් කරන ලද ("අ" සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන්කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර ෆෝර්මය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ලැබුණු බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නාවූද ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත, තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නොලැබෙන්නාවූද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

බී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 මැයි 21 වැනි දින,
කොළඹ 1, ගාලුමුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදී ය.
තැ. පෙ. 500.

5–1166/3—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඒබී. 36/එක්ස්. 2092/69.

## ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ බලවේග පේෂකම් යෝජනා ක්‍රමයේ සාමාන්‍යාධිකාරි තනතුරු

ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ බලවේග පේෂකම් යෝජනා ක්‍රමයේ සාමාන්‍යාධිකාරි තනතුරු සඳහා ඉල්ලුම් පත්‍ර එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම් පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර, කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය :—

(අ) මෙරට ඉල්ලුම් පත්‍ර—1969 ජූනි මස 13 වැනි දින.

(ආ) විදේශීය ඉල්ලුම් පත්‍ර—1969 ජූනි මස 20 වැනි දින.

**සටහන් :**

(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර ෆෝර්ම තැපැලෙන් එවන ලෙස ඉල්ලුම් කරණ විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක්ද නැද්ද යනු ඉතාමත්ම පැහැදිලිව සඳහන් කරමින් 9″ × 4″ ප්‍රමාණයට කුඩා නොවූද, තම ලිපිනය ලියන ලද්දාවූද මුද්දර නොගැසුවාවූ ද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපැලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර ෆෝර්ම විදේශයන්හි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාල වලින් ලබා ගත හැකිය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුළත දී බාර දීමට අයදුම්කරුවන්ට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණ සහ නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරා ගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍ය දැ යි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතු වෙයි.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය.

3. **වැටුප් සහ දීමනා.**—මෙම තනතුරට හිමි වැටුප් ක්‍රමය මෙසේය : රු. 4,080 වාර්ෂික වැටුපකින් පටන්ගෙන රුපියල් 360 වාර්ෂික වේතනාධික දොලහකින් රුපියල් 8,400 දක්වා වැඩිවන වාර්ෂික වැටුප් ක්‍රමයකි. රු. 6,600 ට පෙර කාර්යක්ෂමතා කඩඉමක් ඇත.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) විශිෂ්ඨ චරිතයෙන් සහ හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව ;

(ආ) 1969 ජූනි මස 13 වැනි දිනට වයස අවුරුදු 21 ට නොඅඩු හා, අවුරුදු 40 ට නොවැඩි බව,

(ඇ) විද්‍යාව, ආර්ථික විද්‍යාව හෝ වාණිජ විද්‍යාව පිළිබඳ පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධරයකු බව.

සටහන.—(i) වයස් සීමාවන් නොතකා පිළිගත් විශ්ව විද්‍යාලයක කිනම් හෝ උපාධියක් ලබා ඇති ග්‍රාම සංවර්ධන හා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට අයදුම්පත් ඉදිරිපත් කළ හැක.

(ii) පේෂ කර්මාන්තය පිළිබඳ පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතීස්ම සහතිකය හෝ භාරගනු නොලැබේ.)

(ආ) උපාධි හෝ උසස්ම අධ්‍යාපනය සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක්, මින් එකක් අධ්‍යයන අධ්‍යක්ෂක තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඈ) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(උ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාගය පිළිබඳ සහතික.

සැ. යු. :—(i) අයදුම් පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයන්ගේ අයදුම් පත් සලකා බලනු නොලැබේ.

6. රජයේ සේවයේ නියුක්ත නිලධාරීන් තම ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත් තම ඉල්ලුම් පත්‍ර එසේ එවූයේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන්

සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙනසේ ඔහු වෙත කෙළින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තමන්ට එවන ලද ("අ" සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම් පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලිපිකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් නැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින් ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තම තමන්ට නිකුත් කරණ ලද ("අ" සලකුණ දරණ) මුද්‍රිත තැපැල්පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝරමය මේ කාර්යාලයට ලැබුණ බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ලැබුනු බව ඔවුන්ට දන්වනු නොලැබේ මේ නියමය පිළිපදින්නාවූද ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුලත, තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නොලැබෙන්නාවූද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රා. සේ. කො. සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරිය හොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමිවේ.

බී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 මැයි 21 වැනි දින,
කොළඹ 1,
ගාලු මුවදොර මහලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදීය.
තැ. පෙ. 500.

5-1:6 /4—69.5.30 දින අංක 14,8:6 දරන ගැසට් පත්‍රය

---

අංක : ඒඒ. 49/එක්ස්. 2093/69.

## පළාත් පාලන අමාත්‍යාංශයේ ජලසම්පාදන ජලාපවහන සහ පළාත් පාලන වැඩ අංශය

### විදුලි ඉංජිනේරු තනතුර

පළාත් පාලන අමාත්‍යාංශයේ ජලසම්පාදන, ජලාපවහන හා පළාත් පාලන වැඩ අංශයේ විදුලි ඉංජිනේරු තනතුරක් සඳහා ඉල්ලුම්පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මඟින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම්පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුයි :—

(ඒ) මෙරට ඉල්ලුම්පත්—1969 ජූනි මස 13 වැනි දින.

(බී) විදේශීය ඉල්ලුම්පත්—1969 ජූනි මස 20 වැනි දින.

සටහන් :

(i) මුද්‍රිත ඉල්ලුම්පත පෝරම තැපැලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9" × 4" ප්‍රමාණයට කුඩා නොවූද තම ලිපිනය ලියන ලද්දාවූද මුද්දර නොගැසුවාවූ ද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම දරාගත යුතුය. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාදවූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම්පත්‍ර පෝරම විදේශයන්හි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබාගත හැක. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාල සීමාව ඇතුළතදී භාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරා ගනු ලබන නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතුය.

**2. සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි :**

(ඒ) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවනු ඇත.

(බී) පත්වීම් දෙනු ලබන්නේ අවුරුදු 3ක ආධුනික කාලයකට යටත්ව ය.

(සී) තෝරාගනු ලැබූ අයදුම්කරු රජයේ සේවකයෙක් නම් පළමුවෙන්ම පත්වීම දෙනු ලබන්නේ නියමිත කාලයක වැඩ බැලීමේ පදනම මතය.

(ඩී) පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් විසින් නියම කරනු ලබන ප්‍රමාණයක ඇපයක් තැබීමට තෝරාගනු ලබන අයදුම්කරුට සිදුවිය හැක.

3. **වැටුප් සහ දීමනා.**—මෙම තනතුරට හිමි වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේය :—

(ඒ) වසකට රු. 11,280දී දෙවර්ෂයකට නැවතීමක් හා වසකට රු. 6,960 හා රු. 11,280 වැටුපට පෙර කාර්යක්ෂමතා කඩඉම්ද සහිතව වර්ෂයකට රු. 5,160—360×3—6,240/ 6,960—360×4 සහ 480×10 වසකට රු. 13,200 දක්වා. නිලධාරියා ලන්ඩන්හි විදුලි ඉංජිනේරු ආයතනයේ සහචර සාමාජිකත්වය සඳහා තෝරාගනු ලැබූවිට ඔහුට ඉහත සඳහන් වැටුප් ක්‍රමයේ වසකට රු. 7,320 වැටුප යොදනු ඇත.

(බී) තෝරාගනු ලබන අයදුම්කරු, ලන්ඩන්හි විදුලි ඉංජිනේරු ආයතනයේ සහචර සාමාජිකයෙකු නම්, (ඒඑම්අයිඊඊ) ඔහුට ඉහතකී වැටුප් පරිමාණයේ වසකට රු. 7,320 වැටුපට නොඅඩු ආරම්භක වැටුපක් යොදනු ඇත.

(සී) (i) ඉංජිනේරුවරුන් (විදුලි) හට සම්පූර්ණ වෘත්තීය සුදුසුකම් (එනම් විදුලි ඉංජිනේරු ආයතනයේ සහචර සාමාජිකත්වය ඒඑම්අයිඊඊ) නොමැතිව ඉහත සඳහන් වැටුප් ක්‍රමයේ වසකට රු. 10,800 අභිබවා යාමට සුදුසුකම් නොමැත.

(ii) වසකට රු. 6,960 වැටුප් පියවරට පෙර ඇති කාර්යක්ෂමතා කඩඉම පසු කිරීමට දෙපාර්තමේන්තු කාර්ය සංවිධානය, ගිණුම් යනාදිය පිළිබඳ නියමිත පරීක්ෂණයකින් සමත්විය යුතුය. එසේ සමත්වීමට අපොහොසත්වීම වැටුප් වැඩිවීම් පමා කිරීමට හේතුවනු ඇත.

**සැ.යු.**—සම්පූර්ණ වෘත්තීය සුදුසුකම් සහිතව සේවයට ඇතුලත්වන ඉංජිනේරුවරුන් පත්වීමේ දිනයේ සිට අවුරුදු දෙකක් ඇතුළතදී මෙම පරීක්ෂණයෙන් සමත්විය යුතුවේ.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත වීම.

(බී) 1969 ජූනි මස 13 දින දී වයස අවුරුදු 21ට නොඅඩු එමෙන්ම අවුරුදු 40ට නොවැඩි බව (දැනටමත් රජයේ සේවයේ නියුක්ත වූවන් හට උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)

(සී) (i) ලන්ඩන්හි විදුලි ඉංජිනේරුවරුන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ; නැතහොත්

(ii) ලන්ඩන්හි විදුලි ඉංජිනේරු ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්ව විභාගයේ 1, 2 සහ 3 වැනි කොටස් වලින් සමත්ව සිටීම හෝ එයින් නිදහස් කෙරෙන විභාගයකින් සමත්ව සිටීම ; හෝ

නැතහොත්

(iii) පිළිගත් විශ්ව විද්‍යාලයක බී.ඇස්.සී. (ඉංජිනේරු විද්‍යාව පිළිබඳව) උපාධියක් ලබා සිටීම.

**සැලකිය යුතුයි.**—1961 අංක 70 දරණ අනිවාර්ය රාජ්‍ය සේවා පනත යටතේ ඉංජිනේරුවරුන්ද මේ තනතුරු සඳහා අයදුම් කිරීමට සුදුස්සෝ වෙත්.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය. (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බෞතීස්ම සහතික භාරගනු නොලැබේ).

(බී) උපාධිය හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂක තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු.—(i) අයදුම් පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්ලූ අවශ්‍යාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සළකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසෙකුදු වුවත්, තම ඉල්ලුම්පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දින දී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම්පත්‍ර පෝරමය සමග තමන්ට එවන ලද ("ආ" සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍යසේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින් ඉල්ලුම්පත්‍ර පෝරමය සමග තම තමන්ට නිකුත් කරන ලද "අ" සළකුණ දරණ මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම්පත්‍ර පෝරමය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් ලැබුණ බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නාවූද ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත, තම ඉල්ලුම් පත්‍රය ලැබුණ බවට දැන්වීමක් නොලැබෙන්නාවූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවෙකු ගැන සළකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 මැයි මස 21 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහලේකම් ගොඩනැගිල්ලේ
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදී ය.
තැ. පෙ. 500.

5-163/5—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඒඒ. 47/එක්ස්. 2094/69.

## අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය

### ඉලැක්ට්‍රොනික්ස් II වැනි ශ්‍රේණියේ කථිකාචාර්ය තනතුර

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ "හාඩි" ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයේ ඉලැක්ට්‍රොනික්ස් II වැනි ශ්‍රේණියේ කථිකාචාර්ය තනතුර සඳහා ඉල්ලුම් පත්‍ර එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කායඝ්ලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම් පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය.

(ඒ) මෙරට ඉල්ලුම් පත්‍ර—1969 ජූනි මස 13 වැනි ද.

(බී) විදේශීය ඉල්ලුම් පත්‍ර—1969 ජූනි මස 20 වැනි ද.

සටහන් :

(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම තැපැලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද, නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9"×4" ප්‍රමාණයට කුඩා නොවූ ද, තම ලිපිනය ලියන ලද්දා වූ ද, මුද්දර නො ගැසුවා වූ ද ලියුම් කවරයක් එවිය යුතුයි.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපැලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයන්ගේ කායඝ්ලවලින් ලබා ගත හැකිය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත් කොට සිටින ලංකා නියෝජිතයා ගේ කායඝ්ලයට නියමිත කාල සීමාව ඇතුලත දී භාර දීමට අයදුම්කරුවන්ට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරා ගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍ය දැයි දැන ගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතු වෙයි.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—මෙම තනතුරු ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. තෝරා ගනු ලබන අයදුම්කරු වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. ඔහුගේ පත්වීම තුන් අවුරුදු ආධුනික කාලයකට භාජනය කරනු ලැබේ.

3. **වැටුප් සහ දීමනා.**—මෙම තනතුරට හිමි වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේය :

වාර්ෂිකව රු. 4,080—360—රු. 8,400

සටහන :

(i) පිළිගත් විශ්ව විද්‍යාලයක ඉංජිනේරු උපාධිධරයින් හෝ ඉලැක්ට්‍රොනික්ස් විද්‍යාවෙන් එම්. එස්. සී. හෝ පී. එච්. ඩී. වැනි පිළිගත් පශ්චාත් උපාධි ලබා ඇත්තාවූ අය වාර්ෂිකව රු. 5,160 ක ආරම්භක වැටුපක් ලැබීමට හිමිකම් ලබති.

(ii) ගුරු අභ්‍යාස විද්‍යාලයක හෝ ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයක හෝ ලංකා කාර්මික විද්‍යාලයේ හෝ එවැනි උසස් තත්ත්වයකට සමාන හෝ උසස් පිළිගත් ආයතනයක අවුරුදු 3 ක ඉගැන්වීමේ පළපුරුද්ද ඇති උපාධිධරයින්වද වාර්ෂිකව රු. 5,160 ක ආරම්භක වැටුපක් නියම කරනු ලැබේ.

(iii) ඒ. එම්. අයි. ඊ. ඊ. වැනි සම්පූර්ණ වෘත්තීය සුදුසුකම් ලබා ඇත්නම්, ඔවුනටද වර්ෂයකට රු. 7,320 ක ආරම්භක වැටුපක් හිමිවේ. පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඉංජිනේරු උපාධි ලත්, II වැනි ශ්‍රේණියේ කථිකාචාර්යවරුන් ඔවුන්ගේ වැටුප් ක්‍රමයේ උපරිමය වන වර්ෂයකට රු. 8,400 වැටුප් පියවරට පැමිණ, එක් අවුරුද්දක් එම වැටුප් පියවරෙහි සේවය කරනු ලැබුවේ නම්, ඔවුහු රු. 480 බැගින් වාර්ෂික වැටුප් වර්ධකයන් සහිතව අවුරුද්දකට රු. 10,800 ක වැටුප් පියවර දක්වා වැටුප් ලැබීමට හිමිකම් ලබති.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව.

(බී) 1969.6.13 වැනිදා තමන්ගේ වයස අවුරුදු 21 ට නො අඩු හා අවුරුදු 45 ට නො වැඩි විය යුතුය. (දැනට රජයේ සේවයේ නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.)

(සී) (i) පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබන ලද ඉලැක්ට්‍රොනික්ස් හා විදුලි සංදේශ විෂයයන් ඇතුළත් විදුලි ඉංජිනේරු උපාධියක් ලබා තිබීම බී. ඈස්. සී (ඉංජිනේරු), හෝ

(ii) ඒ. ඈම්. අයි. ඊ. ඊ. I වැනි, II වැනි හා III වැනි කොටස් සමග අවුරුදු 3 ක ප්‍රායෝගික පළපුරුද්දක්, හෝ

(iii) ඉලැක්ට්‍රොනික්ස් හා විදුලි සංදේශ විෂයයන් ඇතුළත් පිළිගත් ඉංජිනේරු ඩිප්ලෝමා උපාධියක් ලබා තිබීම, සහ

(ඩී) සිංහලෙන් ඉගැන්වීමට හැකියාව තිබීම හෝ සිංහල ප්‍රවීණතාවය පත්වීමේ දින සිට අවුරුදු තුනක් ඇතුලත ලබා ගැනීම.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය. (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතීස්ම සහතික භාරගනු නො ලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතු ය. ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තමන්ට එවන ලද ("අ" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකි ය.

7. අයදුම් පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක් ළ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නාමට පුද්ගලිකව නො එවිය යුතු ය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරු වලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින්, ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තම තමන්ට නිකුත් කරන ලද ("අ" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතු ය. එවිට ඉල්ලුම් පත්‍ර පෝරමය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ලැබුණු බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නා වූ ද ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නොලැබෙන්නා වූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතු ය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

බී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 මැයි මස 21 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.
තැ. පෙ. 500.

5–1166/7—69.5.30 දින අ ක 14,856 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඒඒ 46/එක්ස් 2096/69.

## අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යා II ශ්‍රේණියේ කථිකාචාර්ය තනතුර

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ අම්පාරේ 'හාඩි' ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයේ යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යා II වැනි ශ්‍රේණියේ කථිකාචාර්ය තනතුර සඳහා ඉල්ලුම් පත්‍ර එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම් පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍යසේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය.

(ඒ) මෙරට ඉල්ලුම් පත්‍ර—1969 ජූනි මස 13 වැනිදා.

(බී) විදේශීය ඉල්ලුම් පත්‍ර—1969 ජූනි මස 20 වැනි දින.

**සටහන් :**

(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම තැපැලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද, නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9"×4" ප්‍රමාණයට කුඩා නොවූ ද, තම ලිපිනය ලියන ලද්දා වූ ද, මුද්දර නො ගැසුවා වූ ද ලියුම් කවරයක් එවිය යුතුයි.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපැලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබා ගත හැකිය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත් කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාල සීමාව ඇතුළත දී භාරදීමට අයදුම්කරුවන්ට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරා ගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍ය ද යි දැන ගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතු වෙයි.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**— මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත ය. තෝරා ගනු ලබන අයදුම්කරු වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. ඔහුගේ පත්වීම තුන් අවුරුදු ආධුනික කාලයකට භාජනය කරනු ලැබේ.

3. **වැටුප් සහ දීමනා.**—මෙම තනතුරට හිමි වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේ ය : වාර්ෂිකව රු. 4,080—360—රු. 8,400.

**සටහන :**

(i) පිළිගත් විශ්ව විද්‍යාලයක ඉංජිනේරු උපාධිධරයින් හෝ එම්.එස්.සී. හෝ පී.එච්.ඩී. වැනි පශ්චාත් උපාධි ලබා ඇත්තාවූ අය වාර්ෂිකව රු. 5,160 ක ආරම්භක වැටුපක් ලැබීමට හිමිකම් ලබති.

(ii) ගුරු අභ්‍යාස විද්‍යාලයක හෝ ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයක හෝ ලංකා කාර්මික විද්‍යාලයේ හෝ එවැනි උසස් තත්ත්වයකට සමාන හෝ උසස් පිළිගත් ආයතනයක අවුරුදු 3 ක ඉගැන්වීමේ පළපුරුද්ද ඇති උපාධිධරයින්ට ද වාර්ෂිකව රු. 5,160 ක ආරම්භක වැටුපක් නියම කරණු ලැබේ.

(iii) ඒ.එම්.අයි.සී.ඊ., ඒ.එම්.අයි.ඊ.ඊ. හෝ ඒ.එම්.අයි. යාන්ත්‍රික ඉංජිනේරු (ලන්ඩන්) වැනි සම්පූර්ණ වෘත්තිය සුදුසුකම් ලබා ඇත්නම්, ඔවුනටද වර්ෂයකට රුපියල් 7,320ක ආරම්භක වැටුපක් හිමි වේ.

පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඉංජිනේරු උපාධි ලත්, II වැනි ශ්‍රේණියේ කථිකාචාර්යවරුන් ඔවුන්ගේ වැටුප් ක්‍රමයේ උපරිමය වන වර්ෂයකට රු. 8,400 වැටුප් පියවරට පැමිණ එක් අවුරුද්දක් එම වැටුප් පියවරෙහි සේවය කරනු ලැබුවේ නම්, ඔව්හු රු. 480 බැගින් වාර්ෂික වැටුප් වර්ධකයන් සහිතව, අවුරුද්දකට රු. 10,800 ක වැටුප් පියවර දක්වා වැටුප් ලැබීමට හිමිකම් ලබති.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව,

(බී) 1969.6.13 වැනිදා තමන්ගේ වයස අවුරුදු 21 ට නො අඩු හා අවුරුදු 45 ට නො වැඩි විය යුතුය (දැනට රජයේ සේවයේ නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ),

(සී) (i) පිළිගත් විශ්ව විද්‍යාලයකින් යාන්ත්‍රික විද්‍යා විෂයයන් සහිතව බී.එස්.සී. ඉංජිනේරු උපාධිය ලබා තිබීම, හෝ

(ii) ඒ.එම්.අයි. යාන්ත්‍රික ඉංජිනේරු I වැනි හා II වැනි කොටස්වලින් සමත්වීම, හෝ

(iii) සමාන හෝ උසස් සුදුසුකම් ලබා තිබීම.

(ඩී) සිංහලෙන් ඉගැන්වීමට හැකියාව තිබීම හෝ සිංහල ප්‍රවීණතාවය පත්වීමේ දින සිට අවුරුදු තුනක් ඇතුළත ලබාගැනීම.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය. (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බෞතීස්ම සහතික භාරගනු නො ලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂතැනගෙන් හෝ විද්‍යාලීය ආචාර්යවරයාගෙන් හෝ මහා මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තිය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික,

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු.—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නො හැකි වන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් ම තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කල යුතුය. එසේකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින් ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තමන්ට එවන ලද ("බී" සලකුණ දරන) මුද්‍රිත තැපැල්පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින්, ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තම තමන්ට ඉදිරිපත් කරන ලද ("ඒ" සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් ලැබුණු බව ඔවුන්ට දන්වනු නො ලැබේ. මේ නියමය පිළිපදින්නාවූද ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුලත තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නො ලැබෙන්නා වූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතු ය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරිය හොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

බී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 මැයි මස 21 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදෙර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.
තැ. පෙ. 500.

5–1166/8—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඒ 126/එක්ස් 2097/69.

## අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ මහා විද්‍යාලයන්හි විශිෂ්ඨ ශ්‍රේණියේ විදුහල්පති තනතුරු

රජයේ සිංහල, දෙමළ හා මුස්ලිම් මහා විද්‍යාලයන්හි විශිෂ්ඨ ශ්‍රේණියේ විදුහල්පති තනතුරු සඳහා රජයේ මහා විද්‍යාලයන්හි I ශ්‍රේණියේ විදුහල්පතිවරුන්ගෙන් ඉල්ලුම් පත් භාර ගනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම් පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර තැ. පෙ. 5.00, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය.

(ඒ) මෙරට ඉල්ලුම් පත්‍ර—1969 ජූනි මස 13 වැනි දින.

(බී) විදේශීය ඉල්ලුම් පත්‍ර—1969 ජූනි මස 20 වැනි දින.

**සටහන් :**

(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම තැපෑලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද, නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9"×4" ප්‍රමාණයට කුඩා නො වූ ද, තම ලිපිනය ලියන ලද්දා වූද, මුද්දර නො ගැසුවා වූ ද, ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට හෝ කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරු විසින් ම විඳ දරා ගත යුතුය.

(iii) මුද්‍රිත අයදුම් පත්‍රයේ 15 වැනි කොටුවේ අසා ඇති තොරතුරුවලට අතිරේක වශයෙන් I ශ්‍රේණියේ විදුහල්පති වැටුප් ක්‍රමයේ උපරිම වැටුප් තලයට පැමිණි මාසය සහ වර්ෂයද අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයට උපරිම වැටුප් තලයේ කොපමණ කලක් සේවය කර ඇද්ද යන්න සඳහන් කළ යුතුයි.

(iv) පිටරටවල අයදුම්කරුවන් තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැන වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත් කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුලතදී භාර දීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(v) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරා ගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින් ම ගෙවිය යුතු වෙයි.

2. **වයස් සීමාව.**—ඉල්ලුම් පත් භාර ගන්නා අවසාන දිනට අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නො අඩු විය යුතුය.

3. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි :**

(i) ගුරු විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ මේ තනතුරු ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. පත් කරනු ලැබූවකු තෝරා ගැනීමට, පෙර, විශ්‍රාම වැටුප් වාර්තා යටතේ විශ්‍රාම වැටුප් හිමි ගුරුවරයෙකු/වරියක වශයෙන් තනතුරක් දැරුවේ නම්, ඔහු/ඇය විසින් මෙම තනතුර දරණ තෙක් විශ්‍රාම වැටුප් වාර්තා යටතේ මෙම තනතුර විශ්‍රාම වැටුප් සහිත යයි ප්‍රකාශ කරනු ලැබේ.

(ii) තෝරා ගනු ලබන අයදුම්කරුවන් අවුරුද්දක වැඩ බැලීමේ කාල පරිච්ඡේදයකට යටත්ව, අළුත් තනතුරට පත් කරනු ලැබේ. තනතුර ස්ථිර කිරීමෙන් පසු, මුදල් රෙගුලාසි අනුව, ශ්‍රේණියට උසස් කල දින සිට නියමිත වැටුප් ක්‍රමයේ ඔවුන් පිහිටවනු ලැබේ.

(iii) රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම පිණිසත්, විශේෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම පිණිසත් දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන්ම, මින්මතු පනවනු ලබන ව්‍යවස්ථා වලට ද, අනුකූලව තෝරා ගනු ලැබූ අයදුම්කරුවන් විසින් ක්‍රියා කළ යුතු වේ.

(iv) තෝරා ගනු ලබන අයදුම්කරුවන්ට දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සිදු වනු ඇත.

4. **වැටුප් හා දීමනා.**—මෙම තනතුරට හිමි වැටුප් ක්‍රමය මෙසේ ය: වර්ෂයකට රුපියල් 9,840—7×480—රු. 13,200.

5. **සුදුසුකම් :**

(i) 1969 ජූනි මස 13 වැනි දිනට සෑම අයදුම්කරුවෙකුම වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතුය.

(ii) අයදුම්කරුවන් වර්ෂයකට රුපියල් 5,520—8×360—2×480—රු. 9,360 වැටුප් ක්‍රමයේ උපරිම වැටුප් තලයේ වර්ෂයකට නො අඩු කාලයක් සේවය කර සිටිය යුතුය.

(iii) සෑම අයදුම්කරුවකුම විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත විය යුතුය.

1 **වැනි සටහන.**—අයදුම්කරුවන්ට, සිංහල/දෙමළ පිළිබඳ මනා දැනීමක් තිබිය යුතුය. (තෝරාගනු ලැබූ අයදුම්කරුවන්, අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයේ සිංහල/දෙමළ භාෂාව හා සාහිත්‍යයෙන් සාමාර්ථයක් හෝ ඊට සමාන වූ හෝ ඊට වඩා උසස් හෝ සමාර්ථයක් කලින් ලබා නැති නම්, පත්වීමේ දින සිට අවුරුදු 3ක කාල සීමාවක් ඇතුලත අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයේ සිංහල/දෙමළ භාෂාව හා සාහිත්‍යයෙන් ඔවුන් විසින් සාමාර්ථය ලබා ගත යුතුය. සිංහල/දෙමළ සාමාර්ථය ලබා ගැනීම සඳහා අවුරුදු 3 කට වැඩියෙන් ගතවන කාලය, වැටුප් වැඩිවීම පමා කළ කාල සීමාවක් සේ සලකනු ලැබේ.

6. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය (සැ.යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බෞතීස්ම සහතික භාරගනු නො ලැබේ.)

(බී) උපාධි හෝ උසස් අධ්‍යාපනික සහතික.

(සී) වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික.

(ඩී) සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

## ආදර්ශ ඉල්ලුම් පත්‍රය

(අඟල් $8\frac{1}{2} \times 13\frac{1}{2}$ ප්‍රමාණයේ පුල්ස්කැප් කඩදසිවල සකස් කළ යුතුයි).

**අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය—වඩුවැඩ හා පිරිද්දුම් වැඩ පිළිබඳ උපදේශක තනතුර සඳහා අයදුම් පත්‍රය**

සැදහුම : සාප/3/210

1. සම්පූර්ණ නම (පැහැදිලි ලෙස ලියන්න) :——————මහතා/මහත්මිය/මෙනවිය

2. තැපැල් ලිපිනය :————.
(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි)

3. ජාතිය :————.
(ලාංකික වන්නේ (අ) පරම්පරාවෙන්ද, (ආ) ලියාපදිංචි වීමෙන්ද, යන්න සඳහන් කරන්න. ලංකාවේ පුරවැසියකු වන්නේ, ලියා පදිංචි කිරීමෙන් නම්, පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත්, සැදහුම් අංකයත් සඳහන් කරන්න).

4. අයදුම් පත් භාරගන්නා අවසාන දිනයට නියම වයස :
අවුරුදු :————, මාස :————, දිනය :————.
(ආ) උපන් දිනය : අවුරුද්ද :————. මාසය :——. දිනය:——
(උප්පැන්න සහතිකයේ පිටපත් අමුණන්න.)

5. උපන්ස්ථානය : (අ) අයදුම්කරු :————.
(ආ) ඔහුගේ/ඇගේ පියා :————.
(ඇ) අයදුම් කරුගේ සීයා :————.
(ඈ) අයදුම්කරුගේ සීයාගේ පියා :————.

6. (අ) විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.
(ආ) විවාහක නම්, (i) විවාහ වූ දිනය :————.
(ii) ළමයි ගණන :————.

7. (අ) වයස අවුරුදු 15 සිට ඉගෙනගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :

| සාමාන්‍ය අධ්‍යාපනය | | | වෘත්තීය/කාර්මික අධ්‍යාපනය (ලබා ඇත්නම්) | | |
|---|---|---|---|---|---|
| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා | විද්‍යායතනය | සිට | දක්වා |
| 1. .................... | ........ | ........ | ............ | ........ | ........ |
| 2. .................... | ........ | ........ | ............ | ........ | ........ |
| 3. .................... | ........ | ........ | ............ | ........ | ........ |
| 4. .................... | ........ | ........ | ............ | ........ | ........ |

(ආ) අන්තිමට ඉගෙනගත් පාසලෙන් අස්වූ දිනය :————.

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය, දිනයත් සමග:—
(අ) සිංහල :————.
(ආ) ඉංග්‍රීසි :————.
(ඇ) දෙමළ :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ විස්තර (අ) ලැබූ දින හා (ආ) ආයතනවල නම්ද සඳහන් කරන්න :————.

10. කියවීම, ලිවීම, කථා කිරීම හා භාෂා පරිවර්තනය පිළිබඳ ප්‍රවීණතාවක් තිබේද ?
(අ) සිංහල :————.
(ආ) දෙමළ :————.
(ඇ) ඉංග්‍රීසි :————.

11. විශේෂ සුදුසුකම් :————.
(නිවේදනයෙහි සඳහන් කොට ඇති, විශේෂ සුදුසුකම් හා/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේ නම්, ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර දින වකවානු සහිතව සඳහන් කරන්න.)

12. කිසියම් අපරාධ වරදක් නිසා, අධිකරණය මගින් වරදකරු කරනු ලැබ තිබේද ? එසේ නම් (අ) දිනය (ආ) නඩු නොම්මරය හා (ඇ) වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

13. මුදල් කරදරවලින් නිදහස්ද ? එසේ නොවේ නම්, ඔබේ ණයතුරුස් වල ප්‍රමාණය කොපමණද ? :————.

14. වෙනත් විස්තර (වෙනත් විශේෂ හිමිකම් ආදිය) :————.

15. චරිත සහතික ලබාගත් අයගේ නම් හා පදවි නාම (මේ සහතිකවල පිටපත් මිස මුල් ලිපි ඉදිරිපත් නොකළ යුතුයි. දැනටමත් රාජ්‍ය සේවයේ යෙදී සිටී නම්, මේ අවශ්‍ය නැත) :————.

16. සේවා මුක්ත භටයෙක් නම් (අ) සේනාංකය (ආ) නිලය (ඇ) සේවයට බැඳුන හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

17. (අ) පාඨශාලාවෙන් අස්වූ දින සිට යෙදී සිටි රැකීරක්ෂා :
(i) දරන ලද තනතුර :————.
(ii) නියුක්තව සිටි දින වකවානුව :————.
(iii) අස්වීමට හේතුව :————.
(ආ) ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලන ආයතනයක් යටතේ හෝ කලින් ස්ථිර හෝ තාවකාලික වශයෙන් රක්ෂාවෙහි යෙදී සිට, එම සේවය යම් අවස්ථාවකදී නතර කරන ලද්දේ නම්, (අ) එම රක්ෂාව පිළිබඳ විස්තර, (ආ) සේවයේ යෙදී සිටි දින, (ඇ) සේවය නතර කිරීමට හේතුව සඳහන් කරන්න :————.

18. දැනට යෙදී සිටින රක්ෂාව :—
(i) (අ) තනතුර, ශ්‍රේණිය හා (ආ) ඊට පත්වූ දිනය :————.
(ii) විශ්‍රාම වැටුප් සහිතද ? තාවකාලික හෝ අනියම්ද ? :————.
(iii) දැනට ලබන වැටුප් හා වැටුප් ක්‍රමය (දීමනා රහිතව) :————.
(iv) මීළඟ වැටුප් වැඩිවීමේ දිනය :————.

මේ අයදුම් පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර, සත්‍ය බවත්, නිවැරදි බවත්, මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරාගනු ලැබීමට පළමු සොයාගනු ලැබුවහොත්, මා නුසුදුස්සකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

5–1154—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

---

## සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුව

**විමසීම් ලිපිකරු—ටැලිෆෝන් සේවක තනතුර—(තාවකාලික)**

සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුවේ විමසීම් ලිපිකරු—ටැලිපෝන් සේවක තනතුර (තාවකාලික) සඳහා අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ. මේ සඳහා වන අයදුම්පත් පහත දැක්වෙන ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කොට, 1969.6.13 වැනි දිනට හෝ ඊට පෙර සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ, තැ. පෙ. 535, ලෝටස් පාර, කොළඹ 1 යන ලිපිනයට ලැබෙන සේ එවිය යුතුය.

2. **වැටුප් පරිමාණය.**—වර්ෂයකට රු. 960 කින් පටන් ගෙන රු. 72 බැගින් වන වාර්ෂික වර්ධකයන් 11 කින් වර්ෂයකට රු. 1,752 දක්වා නගින් නකි.

3. **වයස් සීමා.**—1969.6.13 වන දිනට අවුරුදු 18 කට නො අඩු විය යුතු වන අතර, අවුරුදු 30 කට නො වැඩිවිය යුතුය. දැනටමත් රජයේ සේවයෙහි නියුතු වූවනට මෙම වයස් සීමාවන් බල පවත්වනු නො ලැබේ.

4. **අයදුම්කරුවනට තිබිය යුතු අධ්‍යාපනික හා සෙසු සුදුසුකම් :—**

(අ) ඉංග්‍රීසි භාෂාව විෂයයක් වශයෙන් ඇතිව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන්,

හෝ

දෙකකට නො වැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව අංක ගණිතය/ගණිතය හා ඉංග්‍රීසි භාෂාව ඇතුලුව විෂයයන් 6 කින් අධ්‍යයන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන්,

හෝ

මෙම විෂයයන් සහිතව ඊට සමාන හෝ උසස් විභාගය කින් සමත් වී සිටිය යුතුය.

(ආ) අතින් ක්‍රියාකරවන ටැලිපෝන් සුවිච් යතුරු පුවරු ක්‍රියා කර වීම පිළිබඳව අඩු වශයෙන් අවුරුදු 2 ක පල පුරුද්දක් තිබිය යුතුය.

5. **සේවයෙහි යෙදවීමේ වගන්ති.**—මෙම තනතුර තාවකාලික ය. රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

6. පහත සඳහන් ලියවිලිවල පිටපත් (මුල් පිටපත් නොවේ.) අයදුම්පතට ඇමිණිය යුතුය. මෙම පිටපත් අයදුම්කරුවන්ට ආපසු එවනු නොලැබේ. සියලුම සහතිකපත් හා ලියවිලිවල මුල් පිටපත් අයදුම්කරුවන් විසින් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය. මෙමම සහතිකපත්‍ර හෝ ලියවිලි කිසිවක් ඉදිරිපත් නොකිරීම අයදුම් කරු නුසුදුස්සෙකු බවට පත් කිරීමට හේතුවනු ඇත.

(අ) උප්පැන්න සහතිකය.—(සැ. යු.—බෞතීස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා සඳහා වන නියෝග සංග්‍රහයෙහි කාර්යයන් සඳහා නිකුත් කරන ලද උප්පැන්න සහතිකය හෝ බාරගනු නො ලැබේ.)

(ආ) උසස්ම අධ්‍යාපනික සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක්.

(ඈ) කලින් පලපුරුද්ද පිළිබඳ සහතිකය.

7. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදය ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවාවේ තනතුරුවලට කෙරෙන පත් කිරීම් පිළිබඳව පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

8. අයදුම්පත් හෝ මේ තනතුරුට අදාල වන අනෙකුත් ලියවිලි සියල්ලක් ම සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ වෙන යම් නිලධාරියෙකු ගේ නමට පෞද්ගලික ව නො එවිය යුතුය.

ඩබ්. එල්. පී. ද මැල්,
සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ.

තැ. පෙ. 535,
ලෝටස් පාර,
කොළඹ 1,

## අයදුම්පතෙහි ආකෘතිය

### සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුවේ ජ්මසිම් ලිපිකරු—ටැලිපෝන් සේවක තනතුර (තාවකාලික)

1. සම්පූර්ණ නම :————.

2. තැපැල් ලිපිනය :————.

3. උපන් දිනය හා වයස :————.

4. ඔබ ලංකාවේ පුරවැසියෙකු වන්නේ—

(i) පරම්පරාවෙන් ද :————.
නැතහොත්

(ii) ලියාපදිංචි වීමෙන් ද :————.

5. සමත් වූ උස්ම විභාගය :————.
(විෂයයන් සඳහන් කළ යුතුයි.)

6. අතින් ක්‍රියාකරවන ටැලිෆෝන් ස්විච් යතුරු පුවරු ක්‍රියාකරවීම පිළිබඳ පලපුරුද්ද :————.

7. විශේෂ සුදුසුකම් හා හිමිකම් :————.

8. දැනට කරන/කලින් කළ රක්ෂාවල් පිළිබඳ විස්තර :————.

මේ අයදුම්පතෙහි ම විසින් සපයනු ලැබ ඇති විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත්, මෙයින් සහතික කරමි. මෙහි ඇතුලත් විස්තර කිසිවක් අසත්‍ය බවට හෝ වැරදි බවට ඔප්පු වුවහොත්, මේ පදවියට මා පත්වීමට නුසුදුසු වන බව හ. පත්වීමෙන් පසු අසත්‍යතාවයක් ඔප්පු වුවහොත් කිසිම වන්දියකට මා අහිමි වී පදවියෙන් පහකර දමනු ලැබීමට ද හේතුවන බව හොඳාකාර දන්නා බව ද ප්‍රකාශ කරමි.

————.
අයදුම්කරුගේ අත් සන.

දිනය :————.

5–939—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

---

අංකය : එස්.එච්. 205/69.

## පොලිස් දෙපාර්තමේන්තුව

### කාන්තා පොලිස් කොස්තාපල් තනතුරු

ලංකා පොලිස් සේවයේ පොලිස් කාන්තා බලකායේ තනතුරු 5 ක් සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙහි පහත සඳහන් ආකෘතිපත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් කොළඹ කොටුවේ ඇව්ලන් චතුරශ්‍රයේ පිහිටා ඇති පොලිස් අභ්‍යාස විද්‍යාලයේ අධ්‍යක්ෂ වෙත ලිපිනය කර 1969.7.1 වැනි දින හෝ ඊට ප්‍රථම ලැබෙන ලෙස ලියා පදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් එවන කවරයේ මුදුනේ වම් කෙලවරෙහි "කාන්තා පොලිස් කොස්තාපල් අයදුම්පත්" යන්න සඳහන් කළ යුතුයි. අභ්‍යාස විද්‍යාලයෙන් ඉල්ලුම්පත් නිකුත් කරනු නොලැබේ.

2. (i) **වැටුප් ක්‍රමය.**—පළමුවැනි අවුරුද්ද තුළ ජීවන වියදම් දීමනා සහ විශේෂ ජීවන වියදම් දීමනාවද සමග රු. 750 ක වාර්ෂික වැටුපක් ගෙවනු ලැබේ.

(ii) එක් අවුරුද්දකින් පසුව ඔව්නු රු. 840—22×42—රු. 1,764 යන වැටුප් ක්‍රමයේ රු. 840 වාර්ෂික වැටුප මත තබනු ලබත්. ඉහත කී වැටුප් ක්‍රමයේ රු. 1,050, රු. 1,260, රු. 1,470 සහ රු. 1,638 යන වැටුප් තලයන් කරා ළඟාවීමට පෙර කාර්යක්ෂමතා කඩඉම් පසු කළ යුතුය.

3. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකු විසින්ම මතු දැක්වෙන සුදුසුකම් සම්බන්ධයෙන් පිළිගත හැකි සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(i) 1969.7.1 වැනි දිනට වයස අවුරුදු 19 ට නොඅඩු විය යුතු ~~අතර අවුරුදු 30 ට නොවැඩි විය යුතුය ;~~

(ii) අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් අනුමත කරන ලද පාසැලකින් නිකුත් කරන ලද කනිෂ්ඨ පාඨශාලා සහතිකපත්‍රය හෝ එවැනි පාසැලක 8 වැනි පන්තියෙන් සාමාර්ථයක් ලැබ එම සාමාර්ථය කනිෂ්ඨ පාඨශාලා සහතිකයට සමාන යයි එම පාසැල් ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය ;

(iii) ලාංකිකයෙකු විය යුතුය ;

(iv) අවිවාහක විය යුතුය ;

(v) උස අඩි 5 කට නොඅඩු විය යුතු අතර යහපත් ශරීර සෞඛ්‍යකින්ද මනා කාය ශක්තියකින් සහ හොඳ ඇස් පෙනුමකින්ද සිටිය යුතුය ;

(vi) යහපත් චරිතයක් ඇති විය යුතුය ;

(vii) සේවයට බඳවා ගැනීමට පෙර වෛද්‍ය පරීක්ෂණයකට භාජනය වීමට සුදානම්ව සිටිය යුතුය.

4. **පත්වීම් කොන්දේසි.**—තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. එහෙත් මුල් පත්වීම කරනු ලබන්නේ අර්ථ සාධක අරමුදල් පද නමක් මතය. පත්වීම් ලබන්නවුන්ට අංක 372 හා 1957.4.29 වැනි දින දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව විශ්‍රාම වැටුප් හිමි තත්ත්ව යට පිවිසීමට කැමැත්ත පල කිරීමේ අයිතිය හිමිවේ.

5. **සේවා කොන්දේසි :**

(i) පත්වීම් තුන් අවුරුදු ආධුනික කාලයකට යටත් වේ.

(ii) තෝරා ගනු ලබන අපේක්ෂකයින්, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහාද විශේෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පණතේ විධිවිධානයන් ක්‍රියාවට නැගීම පිණිස සම්පාදිතව පවත්නා හෝ මින් මතු සම්පාදනය කෙරෙන හෝ යම් යම් ව්‍යවස්ථාවනට අනුකූල වීම අවශ්‍ය වේ.

(iii) තෝරා ගනු ලබන අපේක්ෂකයින් රාජ්‍ය සේවා කොමිෂන් සභා රෙගුලාසි කාර්ය සංවිධානයෙන් වන රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග, පොලිස් විනය නීති සංග්‍රහය සහ පොලිස් පතිවරයා විසින් හෝ රජය විසින් විටින් විට නිකුත් කරන නියෝගයන්ට යටත් විය යුතු වේ.

(iv) ඔවුන්ගේ පත්වීම් ස්ථිර කරන තුරු විවාහ වීමට අවසර දෙනු නොලැබේ. කෙසේ වෙතත් මේ සඳහා අවුරුදු දෙකක සතුටුදායක සේවයක් ඇති කාන්තා පොලිස් කොස්තාපල් වරියන්ගෙන් ලැබෙන ඉල්ලුම්පත් සලකා බලා, පොලිස් පතිවරයා ගේ අභිමතය පරිදි අවසර දෙනු ලැබේ.

6. මෙම ගැසට් පත්‍රයෙහි පළමු කොටසේ දෙවෙනි ඡේදයේ ආරම්භයේ එන රාජ්‍ය සේවා තනතුරුවලට අදාල පොදු කොන්දේසි වලට අවධානය යොමු කළ යුතුයි.

7. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත්වලට පහත සඳහන් සහතිකවල පිටපත් අමුනා එවිය යුතුය :—

(i) උප්පැන්න සහතිකය.

(ii) මෑතකදී ගන්නා ලද චරිත සහතික දෙකක්.

(iii) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකය.

8. පොලිස් කාන්තාවන්හට නොමිලයේ නිවාස, නිල ඇඳුම්, ආයිත්තම් පෙට්ටි, ජලස් සහ බූට් සපත්තු හෝ සාමාන්‍ය සපත්තුද සපයනු ලැබේ.

9. අවසාන දිනට පසුව ලැබෙන සහ මෙම ගැසට් නිවේදනයට අනුකූල නොවන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තවද ඒවාට පිළිතුරු සපයනු නොලැබේ.

ඊ. එල්. අබේගුණවර්ධන,
පොලිස්පති.

1969 මැයි මස 19 වැනි දින,
කොළඹ 1, පොලිස් මූලස්ථානයේදී ය.

ජාතික පු[illegible]නය

## ආදර්ශ අයදුම්පත්‍රය

### කාන්තා පොලිස් කොස්තාපල් තනතුරු

(1) සම්පූර්ණ නම (අයදුම්කරුගේ උප්පැන්න සහතිකයේ සඳහන්ව ඇති පරිදිම විය යුතුයි) :————.

(2) (අ) දැනට ලිපිනය :————.

(ආ) එම ලිපිනයට ඉතා කිට්ටු පොලිස් ස්ථානය :————.

(3) උස : අඩි :——, අඟල් :——.

(4) 1969.7.1 වෙනි දිනට වයස :————. උපන් දිනය :————. (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි)

(5) අධ්‍යාපනික සුදුසුකම් (සමත් වී ඇති උසස්ම විභාගයේ සහතිකවල පිටපත් අමුණන්න) :————.

(6) විවාහක අවිවාහක බව :————.

(7) පියාගේ සම්පූර්ණ නම :————.

(8) පියාගේ රැකියාව :————.

(9) (අ) ජාතිය :————.

(ආ) ඔබ ලාංකිකයෙකු වූයේ පරම්පරාවෙන් ද ? නැතහොත් ලියාපදිංචි කිරීමෙන් ද ? ලියාපදිංචි වීමෙන් නම් එම සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි) :————.

(ඇ) ඔබ පරම්පරාවෙන් ලාංකිකයෙකු නම්, උපන් ස්ථානය :————.

(i) අයදුම්කරු :————.

(ii) ඔබගේ පියාගේ :————.

(iii) පිය පක්ෂයේ මුත්තාගේ :————.

(iv) පිය පක්ෂයේ මී මුත්තාගේ :————.

(10) ඔබ දැනට රැකියාවක යෙදී සිටින්නේ ද ? එසේ නම් විස්තර සපයන්න :————.

(11) ඔබේ යම්කිසි ඥාතියෙකු යම්කිසි අපරාධයක් සම්බන්ධයෙන් නඩුවකට පැටලී, උසාවියට කැඳවනු ලැබ, නඩු පවරනු ලැබ හෝ දඬුවම් ලබා ඇද්ද ? එසේ නම් විස්තර සපයන්න :————.

(12) ඔබ මෙයට කලින් කාන්තා පොලිස් බලකායට බැඳීම සඳහා අයදුම්පතක් ඉදිරිපත් කරන ලද්දෙහිද ? එසේ නම් දිනය සපයන්න :————.

(13) විශේෂ සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර :————.

ඉහත සඳහන් කරුණු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය ඒවා බව මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

5–1041—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

---

## සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

### උද්‍යාන ඕවර්සියර් තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා පහත දැක්වෙන සුදුසුකම් ලද ලාංකිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2. **සුදුසුකම් :**

**වයස.**—1969.5.1 දිනට අවු. 21 ට නොඅඩු හා 30 ට නොවැඩි විය යුතුය.

**අධ්‍යාපන.**—අඩුම තරමින් 8 වැනි ප්‍රමාණය සමත් වී සිටිය යුතුය.

**වෙනත්.**—කම්කරු පාලනය හා උයන් වැඩ ගැන හොඳ දැනුමක් හා පළපුරුද්දක් තිබිය යුතුය. පේරාදෙණිය හා හක්ගල උද්‍යාන වල උයන් වැඩ පුරුදුවූ අය ගැන වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ. හොඳ ශරීර සෞඛ්‍යයෙන් සිටිය යුතුය.

3. **සේවා කොන්දේසි.**—මේ තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. පත්වීම තුන් අවුරුදු ආධුනික කාලයකට යටත් ය.

4. **වැටුප් සහ දීමනා.**—මෙම තනතුරට අවුරුද්දකට රු. 834—42—රු. 1,296 වැටුප් ක්‍රමය හිමිය.

5. **ඉල්ලුම් පත්‍ර.**—පහත දැක්වෙන ආකෘතිය අනුව සකස්කොට ඇත් ඉල්ලුම් පත්‍ර 1969 ජූනි 16 දින හෝ ඊට පෙර " අධ්‍යක්ෂ, සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව, දෙහිවල " යන ලිපිනයට ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය. දැනට රජයේ සේවයේ යෙදී සිටින අය සිය දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කළ යුතුය.

ඩබ්ලිව්. ඇල්. ඊ. ද අල්විස්,
අධ්‍යක්ෂ.

1969 මැයි මස 17 වැනි දින,
දෙහිවල,
සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ දීය.

### සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ ඕවර්සියර් තනතුර සඳහා ඉල්ලුම් පත්‍රයයි

1. සම්පූර්ණ නම :————.

2. ලිපිනය :————.

3. 1969.5.1 දිනට වයස :————.

උපන් දිනය :————.

4. ලාංකිකත්වය පරම්පරාවෙන් ද ? ලියාපදිංචියෙන් ද ? :————.

5. අධ්‍යාපන සුදුසුකම් :————.

6. පළපුරුද්ද :————.

7. අපරාධ උසාවියක් මඟින් දඬුවම් විඳ තිබේද ? :————.

මා විසින් මේ ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කොට ඇති විස්තර නිවැරදි හා සත්‍ය බවත්, අධිකරණ උසාවියකින් වරදකරු කොට නැති බවත්, මීට පෙර රජයේ සේවයෙන් පහකොට නැති බවත් මෙයින් ප්‍රකාශ කරමි. මේ විස්තර වලින් කවරක් හෝ අසත්‍ය හෝ වැරදි හෝ බැව් සොයාගනු ලැබුවහොත්, පත්වීම ලැබීමට මා නුසුදුස්සෙකු වන බවත්, පත්වීම ලැබුනායින් පසු එසේ සොයාගනු ලැබුවහොත් කිසිදු වන්දියක් නැතිව සේවයෙන් පහ කොට දැමීමට මා යටත්වන බවත් මම හොඳාකාර දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

5-1148—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### ගුවන් විදුලි සේවාකරු තනතුර

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගුවන් විදුලි සේවාකරු තනතුරක් සඳහා අයදුම්පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙහි පහත දක්වා ඇති ආකෘති පත්‍රයේ ආකාරයට පිළියෙල කරන ලද අයදුම්පත්, 1969 ජූනි මස 20 දින හෝ ඊට පෙර ලැබෙන ලෙස " වාරිමාර්ග අධ්‍යක්ෂ, තැ. පෙ. 1138, කොළඹ 7. " යන ලිපිනයට එවිය යුතුය. අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

2. **වැටුප් ක්‍රමය.**—වර්ෂයකට රු. 1,320—72—රු. 2,184.

3. **වයස් සීමාව.**— අයදුම්කරුවන් 1969. 5. 30 දින දී වයස අවුරුදු 17 ට නොඅඩු විය යුතු වන අතර, 30 ට නොවැඩි විය යුතුය. (රාජ්‍ය සේවයේ දැනටමත් නිරතවී සිටින අපේක්ෂකයන් කෙරෙහි මෙම වයස් සීමා බල නොපැවැත්වේ).

4. **අවශ්‍ය සුදුසුකම්.**— සෑම අයදුම්කරුවෙක්ම තමා,

(අ) ලාංකිකයෙකු බවත්, (පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් ලංකාවේ පුරවැසියා ලාංකිකයෙකි.)

(ආ) විශිෂ්ඨ චරිතයකින් සහ මනා ශාරීරික සෞඛ්‍යයෙන් යුක්ත බවත්,

(ඇ) (i) සිංහල/දෙමළ භාෂාව, ගණිතය සහ භෞතික විද්‍යාව යන විෂයයන් ඇතුළුව විෂයයන් 6 ක් සඳහා, දෙවතාවකට නොවැඩි වාර ගණනකදී ලබාගත් සාමාන්‍ය පෙළ අධ්‍යයන පොදු සහතික පත්‍රය.

සහ

(ii) ගුවන් විදුලි උපකරණ නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කිරීම සම්බන්ධව අවුරුදු 5 කට නොඅඩු ප්‍රායෝගික පළපුරුද්දක් ඇති බවත්, සනාථ කළ යුතුය.

5. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**— මෙම තනතුර ස්ථිරය ; විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු සහ අනත් දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුය.

6. අයදුම්කරුවන් පහත දැක්වෙන ලියකියවිලි වල පිටපත් (මුල් පිටපත් නොවේ) තමන්ගේ ඉල්ලුම් පත්වලට අමුණා එවිය යුතුවේ. මේවා ආපසු එවනු නොලැබේ.

(i) ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතික.

(ii) ගුවන් විදුලි උපකරණ නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කිරීම සම්බන්ධව අවුරුදු 5 කට නොඅඩු ප්‍රායෝගික පළපුරුද්දක් ඇති බවට ලිඛිත සාක්ෂි.

(iii) මෑතදී ලබාගත් චරිත සහතික පත්‍ර 3 ක්. (මින් එකක් අයදුම්කරු අන්තිමට උගත් පාඨශාලාවේ ප්‍රධානාචාර්යතුමාගෙන් විය යුතුය.)

(iv) උප්පැන්න සහතික පත්‍රය.

**සැලකිය යුතුයි :** බෞතීස්ම සහතික හෝ උපකෘත පාඨශාලාවල රෙගුලාසි පද්ධතියේ අවශ්‍යතාවයන් සඳහා නිකුත් කරන ලද සහතික හෝ භාරගනු නොලැබේ. උප්පැන්නය ලියා පදිංචි නොවුණු යම් අයදුම්කරුවකු සම්බන්ධයෙන් ඔහුගේ වයස පිළිබඳ තීරණය කිරීම සඳහා රෙජිස්ට්‍රාර් ජෙනරාල් විසින් වයස පිළිබඳ නිකුත් කර ඇති විශේෂ සහතිකය භාරගනු ලැබේ.

7. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ පළකර ඇති රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අයදුම්කරුවන්ගේ අවධානය යොමු කරනු ලැබේ.

වී. පත්මනාදන්,
වාරිමාර්ග අධ්‍යක්ෂ වෙනුවටය.

1969 මැයි මස 21 දින,
තැ. පෙ. 1138, කොළඹ 7.

## ආදර්ශ ආකෘති පත්‍රය

**වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගුවන් විදුලි සේවාකරු තනතුර**

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
2. ලිපිනය :————.
3. (අ) අයදුම්කරු උපන් ස්ථානය හා දිනය :————.
   (ආ) පහත දැක්වෙන අයවලුන් උපන් ස්ථාන—
      (i) අයදුම්කරුගේ පියා :————.
      (ii) අයදුම්කරුගේ පියාගේ පියා :————.
      (iii) අයදුම්කරුගේ පියාගේ පියාගේ පියා :————.

   අයදුම්කරු ලංකාවේ උපන් අයෙක් නම්, (ආ) (i) හෝ (ii) සහ (iii) හෝ පිරවිය යුතුය. අයදුම්කරු උපන්නේ ලංකාවේ නොවේ නම්, එක්කෝ (ආ) (i) සහ (ii) නැත්නම් (iii) පිරවිය යුතුය.
4. ජාතිය :————.
5. විවාහකද, අවිවාහකද, වැන්දඹුද යන බව :————.
6. අධ්‍යයන සුදුසුකම්, සමත්වූ විෂයයන්ද සමග :————.
7. ගුවන් විදුලි උපකරණ නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කිරීම සම්බන්ධව පළපුරුද්දේ විස්තර :————.
8. දැනට තනතුරක් දරන්නේ නම් එම තනතුර (ස්ථිරද තාවකාලිකද යන බවත් සඳහන් කරන්න) :————.
9. අමුණා ඇති චරිත සහතික ලබාගත් අය—
   (i) ————.
   (ii) ————.
   (iii) ————.

මෙම අයදුම් පතෙහි මවිසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත්, මම මෙයින් සහතික කරමි. මෙම අයදුම් පතෙහි කිසියම් අසත්‍ය හෝ වැරදි ප්‍රකාශයක් තිබුණු බව තෝරා ගැනීමට ප්‍රථම අනාවරණය වුවහොත්, මා එයින්ම නුසුදුසු වන බවත්, තෝරා ගැනීමෙන් පසුව ඒ බව එළිදරව් වුවහොත්, කිසිම වන්දියක් නොමැතිව මාව රාජකාරියෙන් පහකර දැමීමට හැකි බවත්, මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

ස්ථානය :————.
දිනය :————.

5–1078—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

---

අංකය පීආර්/එච්එස් ඩබ්ව්/20.

## මහා භාණ්ඩාගාරයේ පරිපාලන අභ්‍යාස ආයතනය, විදේශ පුහුණුව

**ඔක්ස්පර්ඩ්හි ක්වීන් එලිසබෙත් නිවාසයේ විදේශ සංවර්ධන අමාත්‍යාංශ අධි ශිෂ්‍යත්වය**

ඔක්ස්පර්ඩ්හි ක්වීන් එලිසබෙත් නිවාසයේ විදේශ සංවර්ධන අමාත්‍යාංශ අධි ශිෂ්‍යත්වයක් පිරිනැමීම සඳහා රාජ්‍ය සේවයේ ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික ශ්‍රේණිවල නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මේ අධි ශිෂ්‍යත්වයන් සම්පාදනය කර ඇත්තේ සංවිධානය කරන ලද පාඨ මාලාවකට සහභාගි වන්නන් වශයෙන් ඔක්ස්පර්ඩ් හි කාල පරිච්ඡේදයක් ගත කිරීමට අවස්ථාවක් සලසනුවටට වඩා පුද්ගල පදනමක් මත ස්වකීය රාජකාරි වලට අදාළ විෂයයක් හැදෑරීමට පුද්ගලයන්ට ඉඩ සලසනු පිණිසය. මේ අධි ශිෂ්‍යත්වයන් වූකලී, ස්වකීය නිලය හා සම්බන්ධ වගකීම්වලින් කලකට මුදා හරිනු ලැබිය හැක්කාවූද, ඒ කාලය තුළදී ස්වකීය දර්ශන පථය පුළුල් කර ගැනීමට හා තමන්ටත් තම රටවලටත් ප්‍රයෝජනවත් වන වෘත්තීය අධ්‍යයන මාර්ගයක් දියුණු කර ගැනීමට හැකි වන්නාවූද, තමන්ට විශේෂ වූ ක්ෂේත්‍රයෙහි ගැඹුරු ඇනුමක් ලබා ගනු ඇතැයි අපේක්ෂා කෙරෙන, ස්වරූපයෙන් සැලකියයුතු කුසලතාවෙකින් හා විශිෂ්ඨත්වයෙකින් යුතු අයට ලබාගත හැකිව ඇති ජ්‍යෙෂ්ඨ ප්‍රදානයන් ලෙස සලකනු ලැබේ. අධි ශිෂ්‍යත්ව ලාභියාගේ රාජකාරිවලට අදාල වේ නම් අධ්‍යයන ක්ෂේත්‍රය පිළිබඳ සීමා කිරීමක් නැත්තේය. සමහර අංශයන් හිදී වර්ෂයක් තුළදී පහත සඳහන් විෂයයන් පිළිබඳව ඩිප්ලෝමා සහ සහතික සඳහා හැදෑරීමට අධි ශිෂ්‍යත්ව ලාභීන්ට හැකිවේ.

කෘෂිකාර්මික ආර්ථික විද්‍යා ඩිප්ලෝමාව
භාවිත සංඛ්‍යා ලේඛන විද්‍යා ඩිප්ලෝමාව
ආර්ථික සංවර්ධන ඩිප්ලෝමාව
සමාජ අධ්‍යයන විශේෂ ඩිප්ලෝමාව
කළමනාකාරිත්ව අධ්‍යයනය පිළිබඳ සහතිකය.

**යෝග්‍යත්වය :**

(i) අයදුම්කරුවෝ වගකිවයුතු මාණ්ඩලික තනතුරක අඩුම වශයෙන් හත් අවුරුද්දක සේවයක් ඇති සංසන්දනාත්මක ජ්‍යෙෂ්ඨතාවන් ඇති රාජ්‍ය සේවයේ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන් විය යුත්තාහ.

(ii) අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ටත් 45 ටත් අතර විය යුතුය.

(iii) පිළිගත් විශ්ව විද්‍යාලයක හොඳ උපාධියක් තිබිය යුතුය.

(iv) විදේශයෙහි පුහුණුව සඳහා තෝරා ගන්නා ලද සෑම නිලධාරියෙකුම අංක 627 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාර ගිවිසුමකට අත්සන් කළ යුතුය.

**ප්‍රදානයේ කොන්දේසි :**

(i) එක්සත් රාජධානියට හා එහි සිට ආපසු ගමන් ගාස්තු.

(ii) මාසික ජීවනාධාර දීමනාවක්.

(iii) අධ්‍යයන වියදම්.

**අයදුම්පත් :**

ආදර්ශ ආකෘතියකට අනුව සාරානුකූලව පිළියෙල කළයුතු අයදුම් පත් (එක් එක් පාඨ මාලාවක් සඳහා එක් පිටපතක් බැගින්) 1969 ජූනි මස 15 වැනිදාට හෝ ඊට පළමු කොළඹ 3, ග්ලෙන් ආබර් පෙදෙසේ අංක 32 දරණ ස්ථානයේ පරිපාලන අභ්‍යාස අධ්‍යක්ෂට ලැබිය යුතුය. අයදුම්පත් ඉදිරිපත් කළයුත්තේ අදාළ ස්ථිර ලේකම් මඟිනි. වැඩි දුර විස්තර අවශ්‍ය නම් සාමාන්‍ය කාර්යාල වේලාව තුළදී පරිපාලන අභ්‍යාස ආයතනයට (දුර කථනය 86236) කථා කරන්න

ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.

එච්. එස්. වනසිංහ,
පරිපාලක අභ්‍යාස අධ්‍යක්ෂ.
භාණ්ඩාගාරයේ ලේකම් වෙනුවට

## පරිපාලන අභ්‍යාස ආයතනය, මහා භාණ්ඩාගාරය—විදේශ පුහුණුව

### I වැනි කොටස

1. අයදුම්කර සිටින පාඨ මාලාව :————.
2. නිලධාරියාගේ නම :————.
3. උපන් දිනය සහ 1969.5.1 දිනට වයස :————.
4. සේවය හා ශ්‍රේණිය :————.
5. රාජ්‍ය සේවයට බැඳුනු දිනය (මාණ්ඩලික ශ්‍රේණිය :————.
6. රාජ්‍ය සේවයේ දැරූ තනතුරු දින සහ වකවානු :————.

7. ශාස්ත්‍රීය සුදුසුකම් :————.
8. භාෂා ප්‍රවීණත්වය :————.
9. නිලධාරියා සහභාගිවී ඇති විදේශ අභ්‍යාස පාඨ මාලා, සම්මන්ත්‍රණය, සාකච්ඡා සම්මේලන ආදියේ විස්තර :————.
10. නිලධාරියා ලංකාවේදී හදාරා ඇති අභ්‍යාස පාඨ මාලා හෝ වෙනත් ශාස්ත්‍රීය කටයුතු පිළිබඳ විස්තර :————.
11. ඉහත 9 සහ 10 වැනි අංකයන් යටතේ දක්වා ඇති කටයුතු වල ප්‍රතිඵලයක් වශයෙන් යම් විශේෂ කාර්ය ක්ෂෙත්‍රයක නිලධාරියා ඇති කර ඇති වෙනස්කම් හා වැඩිදියුණු කිරීම් පිළිබඳ විස්තර :————.
12. මෙම පාඨ මාලාව හැදෑරීමෙන් ඔබට කිනම් වගකීම් භාරගත හැකිවේ ද ?

මා විසින් සපයා ඇති ප්‍රකාශයන් මගේ හොඳ විශ්වාසයේ හැටියට සත්‍ය බවත්, නිවැරදි බවත්, ..................වන මම සහතික කරමි.

පුහුණුව සඳහා පිළිගනු ලැබුවහොත්, ලංකා රජය සඳහා හා ඒ වෙනුවට පරිපාලන අභ්‍යාස අධ්‍යක්ෂ විසින් නියම කරනු ලබන උපදෙස් පිළිපැදීමටත් කොන්දේසිවලට අනුව ක්‍රියා කිරීමටත් මම පොරොන්දු වෙමි.

————,
අත්සන.

දිනය :————.

## II වැනි කොටස

.................................... දෙපාර්තමේන්තුවේ ......................
(පදවි නාමය)

.............................මහතාගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත්
(නම)

කරමි. තෝරා ගනු ලැබුවහොත් අභ්‍යාස පාඨ මාලාව හැදෑරීම සඳහා ඔහු මුදා හරිනු ලැබේ.

......................මහතා මෙම පාඨ මාලාව හැදෑරීම පිණිස තෝරා ගනු ලැබුවහොත් පෙරලා පැමිණිවිට පහත සඳහන් අතිරේක වගකීම් ඔහු වෙත පවරනු ලැබේ.

මෙම අතිරේක වගකීම් සඳහා මෙම පාඨ මාලාවේ පහත නම් සඳහන් කරුණු/අංක/ලක්ෂණ සුදුසු යයි කල්පනා කරමි.

————,
අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්

දිනය :————.

5–1109—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

---

අංකය : ටීආර්/එච්එස්ඩබ්ලිව්/20.

## මහා භාණ්ඩාගාරයේ පරිපාලන අභ්‍යාස ආයතනය විදේශ පුහුණුව

### කර්මාන්ත සංවර්ධන පරිපාලනය—ආසියානු ආයතනය

1970 ජනවාරි මාසයේ සිට මාර්තු මාසය දක්වා බැංකොක් නුවර පිහිටි එක්සත් ජාතීන්ගේ ආසියානු ආයතනයේ පවත්වනු ලබන කර්මාන්ත සංවර්ධනය පරිපාලනය පිළිබඳ සති 12 ක පාඨ මාලාව හැදෑරීමේ ශිෂ්‍යත්වයක් පිරිනැමීම සඳහා රාජ්‍ය සේවයේ සහ රාජ්‍ය සංස්ථාවල මාණ්ඩලික ශ්‍රේණිවල නිලධාරීන්ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ.

යෝග්‍යත්වය :—

(i) අයදුම්කරුවෝ වගකිව යුතු මාණ්ඩලික තනතුරක අවුරුදු 7 ක අඩුම සේවයක් ඇති රාජ්‍ය සේවයේ සහ රාජ්‍ය සංස්ථාවල මාණ්ඩලික ශ්‍රේණිවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විය යුත්තාහ.

(ii) 1969. 6. 1 වැනි දිනට වයස අවුරුදු 35 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය.

(iii) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් තිබිය යුතුය.

(iv) විදේශයන්හි පුහුණුව සඳහා තෝරා ගන්නා ලද සෑම නිලධාරියකුටම අංක 627 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාර ගිවිසුමකට අත්සන් කරන ලෙස නියම කරනු ලැබේ.

මේ පාඨ මාලාවෙන්, ආර්ථික සංවර්ධනයෙහි ලා කාර්මික කරණය. කාර්මික කරණය සඳහා සමාජ හා ආර්ථික සැලකිල්ල, භෞතික පදනම් නිර්මානය, කර්මාන්ත අතර සම්බන්ධතා සහ ව්‍යාපාරයන්ගේ ආර්ථික හා මුදල් පිළිබඳ විශ්ලේෂණය සඳහා අවශ්‍ය මූලික උපකරණ ගැනද උපදෙස් දෙනු ලැබේ. පාඨ මාලවෙන් වැඩි කොටසක් ව්‍යාපාර හඳුණාගැනීම, අගය තීරණය හා ක්‍රියාත්මක කිරීම සඳහා වැය කෙරේ. මේ සඳහා විෂය අධ්‍යයනයන් ප්‍රයෝජනයට ගනු ලැබේ. කාර්මික වාතාවරණය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිය හා වෙනත් විවිධාන ගැන ද වැදගත් ස්ථානයක් දෙනු ලැබේ. අධ්‍යයනය සඳහා තෝරා ගත් යන්ත්‍රාගාර භූමි බැලීමට යාම හා වෙනත් පහසුකම්, ව්‍යාපාර වාර්තාවන් පිළියෙල කිරීම යන කරුණු සඳහා කටයුතු පිළියෙල කරනු ලැබේ. පුහුණුවේ කොටසක් වශයෙන්, තෝරාගත් කාර්මික ව්‍යාපාරයක් පිළිබඳ ප්‍රායෝගික වැඩ හා කුඩා කණ්ඩායම් වශයෙන් හෝ තනි තනිව අගැයීමේ වාර්තාවක් පිළියෙල කිරීමද පාඨ මාලවෙන් අදහස් කෙරේ.

විශේෂයෙන්ම වැඩ සටහනින් අරමුණු කෙරෙනුයේ (අ) කාර්මික ක්ෂෙත්‍රයෙහි විශේෂිත වැඩ සටහන් පරිපාලකයන් පුහුණු කිරීම සහ (ආ) පෞද්ගලික කර්මාන්ත ව්‍යාපාරයන්හි පුද්ගලයන් සහ කර්මාන්ත පිළිබඳ කටයුතු කරන රජයේ හෝ අර්ධ රාජ්‍ය පරිපාලන යේ අංශයන්ට අයත් නිලධාරීන් කර්මාන්ත සංවර්ධන ක්ෂෙත්‍රයට නැවත පුහුණු කිරීම ද වේ.

**ප්‍රදානයේ කොන්දේසි :**

(i) බැංකොක් නුවරට සහ එහි සිට ආපසු ගමන් ගාස්තු.

(ii) මාසික ජීවනාධාර දීමනාවක්.

(iii) අධ්‍යයන වියදම.

**අයදුම්පත් :**

ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙල කළයුතු අයදුම්පත් 1969 ජූනි 16 වැනිදාට පළමු කොළඹ 3, ග්ලේන් ආබර් පෙදෙසේ අංක 32 හි පරිපාලන අභ්‍යාස අධ්‍යක්ෂ වෙත ලැබිය යුතුය. රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ අයදුම්පත් ස්ථිර ලේකම් මගින් ඉදිරිපත් කළ යුතුය. වැඩි විස්තර සඳහා සාමාන්‍ය කාර්යාල වේලාවන් තුළදී පරිපලන අභ්‍යාස ආයතනය (දුර කථනය 86236) අමතන්න.

ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ගැන ක්‍රියා කරනු නොලැබේ.

එච්. එස්. වනසිංහ,
පරිපාලන අභ්‍යාස අධ්‍යක්ෂ,
භාණ්ඩාගාරයේ ලේකම් වෙනුවට.

## පරිපාලන අභ්‍යාස ආයතනය, මහා භාණ්ඩාගාරය—විදේශ පුහුණුව

### I වැනි කොටස

1. අයදුම්කර සිටින පාඨ මාලාව :————.
2. නිලධාරියාගේ නම :————.
3. උපන් දිනය, සහ 1969.5.1 දිනට වයස :————.
4. සේවය හා ශ්‍රේණිය :————.
5. රාජ්‍ය සේවයට බැඳුණු දිනය : (මාණ්ඩලික ශ්‍රේණිය) :————.
6. රාජ්‍ය සේවයේ දැරූ තනතුරු සහ දින සහ වාකවානු :————.
7. ශාස්ත්‍රීය සුදුසුකම් :————.
8. භාෂා ප්‍රවීණත්වය :————.
9. නිලධාරියා සහභාගිව ඇති විදේශ අභ්‍යාස පාඨ මාලා, සම්මන්ත්‍රණය, සාකච්ඡා සම්මේලන ආදියේ විස්තර :————.
10. නිලධාරියා ලංකාවේදී හදර ඇති අභ්‍යාස පාඨමාලා හෝ වෙනත් ශාස්ත්‍රීය කටයුතු පිළිබඳ විස්තර :————.
11. ඉහත 9 සහ 10 වැනි අංකයන් යටතේ දක්වා ඇති කටයුතුවල ප්‍රතිඵලයක් වශයෙන් යම් විශේෂ කාර්යක්ෂේත්‍රයක නිලධාරියා ඇති කර ඇති වෙනස්කම් හා වැඩිදියුණු කිරීම් පිළිබඳ විස්තර : ————.
12. මෙම පාඨමාලාව හැදෑරීමෙන් ඔබට කිනම් වගකීම් භාරගත හැකිවේද ? :————.

මා විසින් සපයා ඇති ප්‍රකාශයන් මගේ හොඳ විශ්වාසයේ හැටියට සත්‍ය බවත්, නිවැරදි බවත්..........................................වන මම සහතික කරමි.

පුහුණුව සඳහා පිළිගනු ලැබුවහොත්, ලංකා රජය සඳහා හා ඒ වෙනුවට පරිපාලන අභ්‍යාස අධ්‍යක්ෂ විසින් නියම කරනු ලබන උපදෙස් පිළිපැදීමටත් කොන්දේසිවලට අනුව ක්‍රියා කිරීමටත් මම පොරොන්දු වෙමි.

————,
අත්සන.

දිනය :————.

### II වැනි කොටස

.................................... දෙපාර්තමේන්තුවේ ......................................
(පදවි නාමය)

.................................................................... මහතාගේ අයදුම්පත
(නම)

නිර්දේශ කර ඉදිරිපත් කරමි. තෝරා ගනු ලැබුවහොත් අභ්‍යාස පාඨ මාලාව හැදෑරීම සඳහා ඔහු මුදා හරිනු ලැබේ.

...............................................මහතා මෙම පාඨ මාලාව හැදෑරීම පිණිස තෝරා ගනු ලැබුවහොත් පෙරලා පැමිණිවිට පහත සඳහන් අතිරේක වගකීම් ඔහු වෙත පවරනු ලැබේ.

මෙම අතිරේක වගකීම් සඳහා මෙම පාඨ මාලාවේ පහත නම් සඳහන් කරුණු/අංක/ලක්ෂණ සුදුසු යයි කල්පනා කරමි.

————,
අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

දිනය :————.

5–1110—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

## ලංකා ගමනාගමන මණ්ඩලයේ පුරප්පාඩු

මණ්ඩලිය සංවිධානයේ සිවිල් ඉංජිනේරු කොට්ඨාශයේ 4 වැනි ශ්‍රේණියේ සහකාර සිවිල් ඉංජිනේරු තනතුරු සඳහා අයදුම් පත් එවන මෙන් ලංකා පුරවැසියන්ට මෙයින් ආරාධනය කරනු ලැබේ.

2. **පඩි ක්‍රමය :**

මසකට (සියලු දීමනා ඇතුළුව) රු. 700.00—රු. 40×5 සහ රු. 50×6—රු. 1,200 කාර්යක්ෂමතා කඩඉම් රු. 900 හා රු. 1,050 ට ප්‍රථමයෙනි.

3. **සුදුසුකම් :**

(i) 1969. 5. 1 වෙනි දාට වයස අවුරුදු 25 ටත් 40 ටත් අතර විය යුතුය.

(ii) බී. ඇස්. සී. ඉංජිනේරු (සිවිල්) උපාධිය.

හෝ

සිවිල්/කැටුම් ඉංජිනේරු ආයතනයේ විභාගයේ I වෙනි හා II වෙනි කොටස්වලින් සමර්ථවී තිබීම හා එම සුදුසුකම් ලැබීමෙන් පසු 3 අවුරුදු පළපුරුද්දක් ලබා තිබීම.

සැ. යු. :—තෝරාගනු ලබන අයදුම්කරුවන් ලබා ඇති සුදුසුකම් සහ පළපුරුද්ද අනුව ඉහත සඳහන් වැටුප් ක්‍රමයේ සුදුසු පියවරක තැබිය හැකිය.

4. (අ) රාජ්‍ය සේවාවේ හෝ පළාත් පාලන සේවාවෙහි සිටින නිලධාරීන් ඉල්ලුම් පත්‍ර එවිය යුත්තේ ඒ ඒ දෙපාර්ත මේන්තු මගිනි. එම ඉල්ලුම් පත්‍ර සලකා බලනු ලබන්නේ එම දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් 1957 තේ 48 අංකය දරණ මෝටර් ගමනාගමන පණතේ 9 වෙනි වගන්තිය අනුව මණ්ඩලය යටතේ සේවය කිරීමට එම නිලධාරීන් නිදහස් කිරීමට එකඟ වෙතොත් පමණකි.

(ආ) සංයුක්ත මණ්ඩලවල සිටින් නාවුද, දැන් වීම් අනුව සුදුසුකම් ඇත්තාවුද නිලධාරීන් එවන ඉල්ලුම් පත්‍ර සැලකිල්ලට භාජනය කරන්නේ ඒ නිලධාරීන් දැන් සේවය කරන සංයුක්ත මණ්ඩලයේ සභාපති මහතා හෝ සාමාන්‍යාධිකාරි මහතා ඔවුන් (පත්කිරීමට) තෝරුනොත් තම සේවාවෙන් නිදහස් කිරීමට එකඟ වෙතොත් පමණකි. ඉල්ලුම් පත්‍ර සංයුක්ත මණ්ඩලය මගින් එවිය යුතුයි.

5. **සේවා කොන්දේසි :**

තෝරාගනු ලබන අපේක්ෂකයින් 1 වෙනි වතාවට තුන් අවුරුදු ප්‍රවාසන කාලයක් පිට පත් කරනු ලැබේ. ඔවුන් පහත සඳහන් වන කොන්දේසි වලට යටත් විය යුතුයි :—

(1) පත්වීමට කලින් ශාරීරික යෝග්‍යතාව සම්බන්ධයෙන් වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය ;

(2) දැනටමත් පණවා ඇත්තාවුද, කලින් කල පණවනු ලබන්නාවුද මණ්ඩලීය ව්‍යවස්ථාවන් හා රෙගුලාසි පිළිපැදිය යුතුයි,

(3) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම් වස්, ප්‍රවාසන කාලය තුලදී මණ්ඩලය විසින් නියම කරන ප්‍රමාණයේ සිංහල ප්‍රවීණත්වයක් ලබාගත යුතුයි.

(4) මණ්ඩලීය අර්ථසාධක අරමුදල සඳහා පඩියෙන් සියයට 10 ක දායක මුදල් ගෙවිය යුතුයි. මණ්ඩලීය දායක මුදල සියයට 15 කි ;

(5) ලංකාවේ කොයි පෙදෙසෙහිත්, මණ්ඩලීය සංවිධානයේ ඕනෑම කොට්ඨාශයෙහිත් සේවය කිරීමට කැමති විය යුතුයි.

6. පහත දක්වා ඇති ආදර්ශ පෝරමය අනුව සකස් කළ ඉල්ලුම් පත්‍ර කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයේ සිටින ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවකමණ්ඩල කළමනාකාර තැන වෙත 1969 යේ ජූනි මස 16 වෙනි දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ එවිය යුතුයි.

ලංකා ගමනාගමන මණ්ඩලයේ
සේවක මණ්ඩල කළමනාකාර තැන.

කොළඹ 5, කිරුළ පාරේ,
අංක 200 වෙනි ස්ථානයේදිය.

### ලංකා ගමනා ගමන මණ්ඩලය
### ඉල්ලුම් පත්‍ර පෝරමය

1. ඉල්ලන තනතුර :————.
2. ඉල්ලුම්කරුවාගේ සම්පූර්ණ නම :————.
3. ලියුම් ලැබෙන පිළිවෙල :————.
4. උපන් දිනය :————.
(උප්පැන් සහතිකයේ මුල් පිටපත නොව අනු පිටපතක් අමුණන්න)
5. 1969.5.1 දිනට වයස :—අවුරුදු————. මාස————. දවස්————.
6. ලංකිකයෙකු වූයේ පෙලපතකින්ද, ලියා පදිංචි වීමෙන්ද යන වග :————.
7. විවාහකද, අවිවාහකද යන බව :————.
(විවාහක නම් විවාහවූ දිනයත් දරුවන් ගණනත් ඔවුන්ගේ වයසත් සඳහන් කරන්න)
8. ද්විතිය පාඨශාලා අධ්‍යාපනය :————.
(ඉගෙනීම ලැබූ පාඨශාලාවද, සමත්වූ විභාගයද දිනයන් සහිතව සඳහන් කරන්න)
9. උසස් අධ්‍යාපනය : (ඔබ ඉගෙනීම ලැබූ විද්‍යායතන, සාමාර්ථය ලත් විභාග, වෘත්තිය සුදුසුකම් යන මේවා පිළිබඳ සම්පූර්ණ විස්තර දිනයන් සහිතව සඳහන් කරන්න) :————.
(සහතික පත්‍රවල මුල් පිටපත් නොව, අනු පිටපත් අමුණන්න)
10. වෛවිධ සුදුසුකම් : (ඔබ ඉගෙනීම ලැබූ ආයතන, සමත්වූ විභාග, ලබා ඇති සුදුසුකම් යන මේවා පිළිබඳ සම්පූර්ණ විස්තර දිනයන් සහිතව සඳහන් කරන්න) :————.
සහතික පත්‍රවල මුල් පිටපත් නොව අනු පිටපත් අමුණන්න)
11. (යාපලෙන් අස්වූ දා සිට කළ රක්ෂාවන් පිළිබඳ සම්පූර්ණ විස්තර සඳහන් කරන්න. එනම් දැරූ පදවියේ හා සේවා යෝජකයාගේ නම, පත්වූ දිනය, රක්ෂාවෙන් අස්වූ හෝ අස්කල දිනය, රක්ෂාවෙන් අස්වීමට හේතු යන මේ කරුණු.) ————.
12. වෘත්තිය පරිචය හෝ රාජ්‍ය සේවාවේ හෝ පළාත්පාලන සේවාවේ හෝ වෙළඳ ආයතනයක හෝ අන් කිසි ආයතනයක විධායක තනතුරක වැඩ කිරීමේ පළපුරුද්ද පිළිබඳ විස්තර. (දරූ තනතුරු, කළ කටයුතු, සියළු දීමනාවන් ඇතුළු වූ පඩි යන මේවා දිනයන් සහිතව සඳහන් කරන්න.) :
13. මේ තනතුර ඉල්ලීමට තමාට ඇති විශේෂ සුදුසුකම් :————.
(මේ තනතුරට ඔබේ සුදුසුකම් වැඩි කරවන්නාවූද, යථෝක්ත තනතුරු දරද්දී ඔබ කළාවූද වැඩ පිළිබඳ සංක්ෂෙප විස්තරයක් ලියන්න.)
14. සිංහල භාෂාව ඉගෙනගත් ඉහලම ප්‍රමාණය :————.
15. මීට කලින් ඔබ ලංකා ගමනාගමන මණ්ඩලයේ කිසියම් තනතුරක් ඉල්ලා ඇත්තේද? එසේ නම් එහි ප්‍රතිඵලය කුමක්ද ? :————.
16. සෙසු විස්තර :————.
17. යම් ක්‍රිමිනල් වරදක් සම්බන්ධයෙන් ඔබ උසාවියකදී වරදකරු වෙකු වූයේ දැයි සඳහන් කරන්න. වරදකරුවෙකු වූයේ නම් විස්තර සඳහන් කරන්න :————.
18. ඔබ ගැන තොරතුරු දැනගැනීමට සුදුසු තැනැත්තන් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සඳහන් කරන්න. :————.
1. ..................................................
2. ..................................................

මා විසින් දක්වා ඇති යථෝක්ත තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් මෙහි අඩංගු යම්කිසි තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව මා තෝරීමට කලින් දැන ගතහොත් මා නුසුදුස්සෙකු විය හැකි නියාව හා තෝරා ගැනීමෙන් පසුව දැනගතහොත් වන්දි ගෙවීමක් නැතිව මා සේවාවෙන් පහකර දැමීමට සිදුවිය හැකි නියාව මා දන්නා බවත් මෙයින් ප්‍රකාශ කරමි.

————,
දිනය :————. ඉල්ලුම්කරුවාගේ අත්සන.

5-1056—69.5.30 දින අංක 14,656 දරණ ගැසට් පත්‍රය

---

## සමුපකාර තොග වෙළඳ සංස්ථාව

### ඇබැර්තු

පහත සඳහන් ඇබැර්තු සඳහා ලාංකිකයින්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ :—

(i) **උපාධිධාරී පුහුණුවන් නන්.**

**අවශ්‍ය සුදුසුකම් :**—පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත්

(අ) පළමුවැනි පන්තියේ හෝ දෙවැනි පන්තියේ උපාධියක්,

**හෝ**

(ආ) ඕනෑම විද්‍යා විෂයයකින් හෝ විෂයයක් කිහිපයකින් ලබාගත් උපාධියක්,

**හෝ**

(ඇ) අර්ථ ශාස්ත්‍රය හෝ භූගෝල විද්‍යාව පිළිබඳ විශේෂ උපාධියක්.

වයස.—1969. 6. 6 වැනි දිනට අවුරුදු 26 කට වැඩි නොවිය යුතුයි.

තෝරාගත් අයදුම්කරුවන්ට පුහුණුවන කාලය තුල මසකට රු. 500 ක දීමනාවක් ලැබෙනු ඇත. අවුරුදු 1-2 කාලයක සාර්ථක පුහුණුව අවසන් කිරීමෙන් පසුව, එකී පුහුණුවන්නන් මසකට රු. 600—40×10—රු. 50×5—රු. 1,250 (සියල්ල ඇතුලත්) වැටුප් ගිණක් උඩ ස. තො. ස. මාණ්ඩලික ශ්‍රේණියට පත් කෙරෙනු ඇත.

(ii) **සහකාර ගොඩනැගිලි ඉංජිනේරුවන්.**

**අවශ්‍ය සුදුසුකම්.**— පිළිගත් විශ්ව විද්‍යාලයක ඉංජිනේරු ශිල්පය පිළිබඳ බී. එස්. සී. උපාධියක්.

වැටුප් ගිණ.—මසකට රු. 600—රු. 40×10—රු. 50×5—රු. 1,250.

**වයස.**— 1969. 6. 6. වැනි දිනට වයස අවුරුදු 30 ට වැඩි නොවිය යුතුයි.

තෝරාගත් අයදුම්කරුවන්, ස්වකීය වැටුප් හිණේ රු. 1,000 හේ පියවර ඉක්මවා වැටුප් වැඩිවීම් ලැබීමට සුදුසුවීම සඳහා සිවිල් ඉංජිනේරු ශිල්පය පිළිබඳ ආයතනයේ ආශ්‍රිත සාමාජික (ඒ. එම්. අයි. සී. ඊ.) විභාගය හෝ නිර්මාණ ඉංජිනේරු ශිල්පය පිළිබඳ ආයතනයේ ආශ්‍රිත සාමාජික (ඒ. එම්. අයි. එස්. ඊ) විභාගය සමත් විය යුතු ය. දැනටමත් මෙකී සුදුසුකම් ඇති අය මෙම වැටුප් හිණ උඩ කිසියම් සුදුසු පියවරක තැබීමට සුදුස්සන් වනු ඇත.

උප්පැන්න සහතිකයේ හා අධ්‍යාපන සහතිකවල පිටපත් සහ අයදුම්කරුගේ චරිතය හා හැකියාව පිළිබඳ සහතික කළ හැකි දෙදෙනෙකුගේ ලිපිනය සහිත අයදුම්පත් 1969. 6. 6 වැනි දින හෝ ඊට පෙර කොළඹ 2, වොක්සෝල් වීදියේ අංක 21 දරණ තැන සේවක මණ්ඩල කළමනාකරු වෙත ලැබෙන සේ එවිය යුතු ය.

සේවක මණ්ඩල කළමනාකරු.

1969. 5. 18,
සමුපකාර තොග වෙළඳ සංස්ථාව,
21, වැක්සෝල් වීදිය,
කොළඹ 2.

5-1083—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

(904 වෙනි පිට හා සම්බන්ධයි)

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

මගේ අංකය : 1/23/4/13 (ජී).

## සාමාන්‍ය ලිපිකාර සේවයේ විධායක ලිපිකරු පංතියේ II වැනි ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වූ කාර්යක්ෂමතා කඩඉම් විභාගය—1969 අගෝස්තු

1955.10.1 දින අංක 10,844 දරණ ආණ්ඩුවේ ඇති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද, 1957.11.15 දින අංකය 1/36/2/1 (ජී) සහ 1967.11.26 දින අංකය ජී (162) දරණ භාණ්ඩාගාර චක්‍රලේඛ ලිපිවලින් සංශෝධිත, සාමාන්‍ය ලිපිකාර සේවය පිළිබඳ වාර්තාවේ "සී" උපග්‍රන්ථයෙහි දැක්වෙන සාමාන්‍ය ලිපිකාර සේවයේ විධායක ලිපිකරු පංතියේ දෙවැනි ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වූ කාර්යක්ෂමතා කඩඉම් විභාගයක් 1969 අගෝස්තු මස 4 දින කොළඹ දී පවත්වන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2. මෙම විභාගය, විභාග කොමසාරිස් විසින් පවත්වනු ලබන අතර විභාග පැවැත්වීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ.

3. මෙම විභාගය සඳහා ඉල්ලුම් කිරීමේ ආදර්ශ අයදුම් පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ පළකර ඇත. එම ආදර්ශ අයදුම් පත්‍රය හා 1967.11.26 දින අංකය ජී (162) දරණ භාණ්ඩාගාර චක්‍රලේඛ ලිපියේ 2 වැනි ඡේදයෙහි සඳහන් උපදෙස් අනුව, නිවැරදිව හා පැහැදිලිව පිළියෙල කරගනු ලබන අයදුම් පත තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් 1969 ජූනි මස 30 වැනි දින හෝ එදිනට පෙර හෝ කොළඹ 2, මැලේ වීදියේ, විභාග කොමසාරිස් වෙත ලැබෙන ලෙස **ලියාපදිංචි තැපෑලෙන්** එවිය යුතුය. අයදුම් පත් විභාග කොමසාරිස් වෙත ඉදිරිපත් කරන ලියුම් කවරයේ වම් පැත්තේ ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් විය යුතුය. අයදුම් පත් භාරගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම් පත් ප්‍රතික්ෂේප කෙරෙනවා ඇත.

4. අයදුම් පත් පිළිගෙන ඇති අපේක්ෂකයන් වෙත විභාග කොමසාරිස් විසින් විභාග කාල සටහනේ පිටපතක්ද සමග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනවා ඇත. යම්කිසි විභාග අපේක්ෂකයෙකුට විභාගය පැවැත්වීමට අඩු වශයෙන් දින හතකටවත් පෙර ප්‍රවේශ පත්‍රය නොලැබුනහොත්, ප්‍රවේශ පත්‍රය නොලැබුන බව පහත සඳහන් විස්තර සමග කොළඹ, තැ. පෙ. අංක 1503, කොම්පඤ්ඤ වීදියේ, මැලේ වීදියේ විභාග කොමසාරිස් (විදුලි පණිවුඩ ලිපිනය "විභාග" කොළඹ) වෙත අප්‍රමාදව ලියා දැන්විය යුතුය.

(1) විභාගයේ නම,

(2) අයදුම්කරුගේ සම්පූර්ණ නම,

(3) සම්පූර්ණ ලිපිනය,

(4) තැපැල් කාර්යාලය, ලියාපදිංචි කළ අංකය සහ යැවූ දිනය.

ප. ඩ. උඩුවෙල,
භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම්.

1969 මැයි 21 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දිය.

### ආදර්ශ අයදුම් පත්‍ර ආකෘතිය

## සාමාන්‍ය ලිපිකාර සේවයේ විධායක ලිපිකරු පංතියේ II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වූ ජාතික භාෂා සහ ගිණුම් පිළිබඳ විභාගය—1969 අගෝස්තු

### ඉල්ලුම් පත්‍රය

**සැලකිය යුතුයි.**—මෙම ආකෘතිය අපේක්ෂකයාගේ අත් අකුරින්ම පිරවිය යුතුයි.

(1) ඔබගේ අගට යෙදෙන නම මූලකුරු සමග :———.
මූලකුරුවලින් හැඳින්වෙන නම් :———.
(පැහැදිළිව ලියන්න)

විභාග අංකය :———.
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණයි).

(2) උපන් දිනය :———.

(3) මව්පියන් අනුව ජාතිය :———.
(සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ ආදි වශයෙන්.)

(4) තනතුර :———.

(5) සා. ලි. සේ. වි. ලි. ප. II වැනි ශ්‍රේණියට ඇතුළත් වූ දිනය : ———.

(6) ඔබ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා ආදි ප්‍රවේශකයෙක් ද නැතහොත් නව ප්‍රවේශකයෙක් ද :——— ද ? :———.

(7) දෙපාර්තමේන්තුව :———.

(8) කාර්යාලයීය ලිපිනය :———.

(9) ඔබ මින් ඉහත විභාගයකදී පහත සඳහන් විෂයයන් එකකින් හෝ සමත් වී තිබේද :—
ගිණුම් : සිංහල (ඒ), (බී) ; පහළ සිංහල (ඒ), (බී)
දෙමළ (ඒ), (බී) ; පහළ දෙමළ (ඒ), (බී)
එසේ නම් විෂය සහ විභාග දිනය සඳහන් කරන්න :———.

(10) 1965 දෙසැම්බර් 7 වැනි දින අංක ජී (98) දරණ භාණ්ඩාගාර චක්‍රලේඛ ලිපියේ විධිවිධානවලට අනුව ඔබ සිංහල/දෙමළ විෂයයෙන් නිදහස් කර ඇත්නම්, එසේ නිදහස් කරන ලද භාණ්ඩාගාර ලිපියොමුව සඳහන් කරන්න :———.

(11) දැන් ඉදිරිපත් වන විෂයයන් :———.

(i) ගිණුම් (සිංහලෙන්)
ගිණුම් (දෙමළෙන්)
ගිණුම් (ඉංග්‍රීසියෙන්)

(ii) සිංහල (ඒ), (බී)

(iii) පහළ සිංහල (ඒ), (බී)

(iv) දෙමළ (ඒ), (බී)

(v) පහළ දෙමළ (ඒ), (බී)

ඒ = කථනය හා භාෂණ පරිවර්තනය

බී = කියවීම හා ලිවීම

**සැලකිය යුතුයි.**—සා. ලි. සේ. වි. ලි. ප. II වැනි ශ්‍රේණියේ නියුක්ත සිංහල, දෙමළ හෝ මුස්ලිම් නොවන නිලධාරීන්ට (එනම් බර්ගර් සහ මැලේ ජාතිකයන්ට) පමණක් පහළ සිංහල හෝ පහළ දෙමළ ගත හැකිය.

මා දන්නා හැටියට හා මගේ විශ්වාසය අනුව මවිසින් ඉහත කරන ලද ප්‍රකාශ සත්‍ය බැව් මෙයින් සහතික කරමි. විභාග ව්‍යවස්ථා අනුගමනය කිරීමට ද එකඟ වෙමි.

———.
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

ඉහත දක්වා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බව ද ඒවා නිවැරදි බව ද අයදුම්කරු විභාගයට පෙනී සිටීමට සුදුස්සකු බව ද මින් සහතික කරමි.

————————,
දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ අත්සන.
පදවි නාමය :————————.

දිනය :————————.

## ලංකා විභාග දෙපාර්තමේන්තුව

### විභාගාපේක්ෂකයන් සඳහා නීති

සියලුම විභාගාපේක්ෂකයන් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ :—

(i) මුළු විභාගයට ම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම තහනම් කිරීම.

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයට ම හෝ නුසුදුස්සකු කිරීම.

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.

(iv) මුලු ජීවිත කාලයේම විභාගයට පෙනී සිටීම තහනම් කිරීම.

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකියයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලිසියට බාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලිසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතර තුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාග අපේක්ෂකයකු සම්බන්ධයෙන් ක්‍රියාකිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත්, රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

## නීති

1. සියලුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසල දීත් විභාගශාලාධිපතීන්ට ද ඔහුගේ සහකාරයන්ට ද අනික් විභාගාපේක්ෂකයන්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්ත දාන්ත ව හැසිරිය යුතුයි. විභාග ශාලාවට ඇතුළුවන විටත් ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරුවිය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන්වූ විගසත් විභාගශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේත් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුයි.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන් ගෙන පැය බාගයක් ගත වූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයකු විභාග ශාලාවට ඇතුළු කරගනු නො ලැබේ. විභාගය පටන් ගෙන පැය බාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයකට පෙනී සිටින අපේක්ෂකයකුට විභාග ශාලාවෙන් පිටවී යාම ද තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචක පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයකු ම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුයි. විභාග ශාලාධිපතීන්ගේ විශෙෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නො කළ යුතුයි. තමන්ට නියම නො කරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්යමණ්ඩලයේ කෙනකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ ඉන් පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පනිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන් ම තහනම් ය. යම්කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවකු සමග කතාබස් කිරීම් ආදියක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතීන්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයකුගේ උත්තර පත්‍රය අඳුනා ගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නො ලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනා ගත නො හැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදු වෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසියෙහි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නො ලිය යුතුයි. මේ නීතිය නො සැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියාකිරීමකැයි සැළකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරා දැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකා මකා දැමීම හෝ නොකළ යුතුය. කටු වැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද කඩදාසි ඇතුළු පාවිච්චි කරන ලද සෑම කඩදාසියක් ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුයි. ඒවා උත්තර පත්‍රයෙහි ම කොටසක් විය යුතුයි. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි.) විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයට පිළිතුරු දෙ තැනක ලියැවී තිබේනම් අනවශ්‍ය පිළිතුර පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැලකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණන් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත්, චිත්‍ර කර්මයෙහිදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයකුගේ චිත්‍රයකට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමාන ව එසේ නැතිනම් බොහෝ සෙයින් කිට්ටුව තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතුවිය හැකිය.

10. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටත ගෙන යාම තහනම් ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩ කිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතුවෙනවා ඇත.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත් සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කෑබැලිද, තමන්ගේ පාටපෙට්ටි හෝ ජ්‍යාමිති උපකරණ පෙට්ටි අවශ්‍ය අවස්ථාවලදී, ඒවා හැර අන්‍ය අත් බෑග්, පසුම්බි, පෙට්ටි හා පාර්සල් ආදියද, පයිල් කවර, කාර්ඩ් බෝර්ඩ්, පෑඩ්, නැමූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදියද විභාග ශාලාව තුළ සිටින කිසිවිටක තමා වෙත හෝ තමා සමීපයෙහි හෝ තබා නො ගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයකු අත කිසිම පොත පතක් හෝ සටහන් ලියනලද කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන් තහනම්ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීමද හොර උත්තර ලිවීමට යත්න දැරීම ද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීමද නොකළ යුතුය. වෙන අයදුම්කරුවකුට උදවු දීමෙන් ද වෙන අයදුම් කරුවකුගෙන් හෝ පුද්ගලයකුගෙන් හෝ උදවු ලබාගැනීමෙන්ද සම්පූර්ණයෙන් ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණවූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබාගත යුතුයි. ලියන ලද කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත්, ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසි විභාගාපේක්ෂකයකුට ඉඩ දෙනු නො ලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයකුට ඉන් පිටත යන්නට වුවමනා වූවොත් විභාගශාලාධිපතීන්ගේ සහකාර නිලධාරියකුගේ සුපරීක්ෂකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔදුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත්, නැවත විභාග ශාලාවට ඇතුළුවන විටත් ඔහු සෝදිසියකට භාජන විය යුතුයි.

15. විභාග ශාලාවේදී පිළිතුරු ලියනවිට හෝ විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුයි.

16. විභාගාපේක්ෂකයකු නොවන අයෙක් ඕසියම් අපේක්ෂකයකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදවු දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

**විභාගාපේක්ෂකයන් සඳහා උපදෙස්**

විභාගාපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුයි :—

(i) විභාගය පටන්ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10 කට හෝ 15 කටත් කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරි හැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත් වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසු කම ගැන හෝ සැකයක් ඇතිවූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතීන්ට ඒ බැව් සැලකර එම සැකය දුරු කර ගත යුතුයි. එලෙස ක්‍රියා නො කිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතුවිය හැකි ය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අනන්‍යතා පත්‍ර (හැඳින්වීමේ පත්‍ර) ඉදිරිපත් කළ යුතු අපේක්ෂකයන් සෑම විෂයයකට ම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාව ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නො කළහොත් ඔබේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්ට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සලසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම් :—ලියනකඩදාසි, තීන්ත පොවන කඩදාසි, ප්‍රස්තාර කඩදාසි, ලෙජර කඩදාසි, සාරාංශ ලියන කඩදාසි ආදිය) සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණොත් ඒ බව නො පමාවම විභාගශාලාධිපතීන්ට දැන්විය යුතුය. විභාග ශාලාවේ දී ඔබට ම දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක් වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නො කළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නො කර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝු ගණක චක්‍ර සපයන ලද නම් ඒවා පරෙස්සමෙන් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්ට හැරිය යුතුයි.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන රබර් කෑලි, අඩි කෝදු, ජ්‍යාමිති උපකරණ පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියක ම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නො පමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේ ම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තැබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලීවාට පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන හැම දෙයක් ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නො හැකි ලෙස නො ලිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නො ලිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයකට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමෙන් නිවැරදි ලෙස යෙදිය යුතුයි.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමෙන් කියවා බැලිය යුතුයි. මෙය නො සලකා හැරීමෙන් බොහෝවිට පාඩු සිදු විය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගණ බැලීම් සහ කටුවැඩ ඒ ඒ ගණන සෑදීමේ කොටසක් වශයෙන්, අනුක්‍රමයෙන් විස්තර ලෙස දක්විය යුතුයි. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් සහ චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහනක් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමු කර විය යුතු අවස්ථාවලදී ඒ රූප සටහන නැවත නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්න වලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතු කොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කෑබැල්ලෙන් නො ගැලවී යන පරිදි එකට තබා අමුණා ගැට ගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නො ගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතකුට හෝ සියතින් ම බාර දිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේ ම වාඩි වී සිටිය යුතුය. මෙසේ නො කිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිව යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නො වූවකුසේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙන යම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාගශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතකුට හෝ කථා කිරීම අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නො නැගිට අත පමණක් එසවිය යුතුය.

කේ. ඊ. ඩබ්ලිව්. සුමනසූරිය,
වැඩබලන විභාග කොමසාරිස්.

කොළඹ 2, මැලේ වීදියේ
විභාග දෙපාර්තමේන්තුවේ දීය.

5-1081—69.5.30 දින අ ක 14,856 දරන ගැසට් පත්‍රය

---

අංකය : 1/23/8/15 (ජී)

**භාෂණ පරිවර්තකයන් සඳහා විභාගය—1969 සැප්තැම්බර්**

**විභාග දිනය.**—භාෂණ පරිවර්තකයින් වශයෙන් පත්වීම සඳහා සුදුසුකම් ලැබීමට කැමති සාමාන්‍ය ලිපිකාර සේවයේ නිලධාරීන් සඳහා විභාගයක් විභාග කොමසාරිස්වරයා විසින් 1969 සැප්තැම්බර් 24 වැනි දින සිට කොළඹ දී පවත්වනු ලැබේ.

2. **සුදුසුකම්.**—උසාවිවල භාෂණ පරිවර්තකයින් වශයෙන් පත්වීම් දරණ සාමාන්‍ය ලිපිකාර සේවයේ නිලධාරීන්, විධායක ලිපිකරු පන්තියේ ii වැනි ශ්‍රේණියේ නිලධාරීන් සහ ස්වකීය තනතුරුවල ස්ථිර කරනු ලැබ ඇති භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්ගේ පාලනය යටතේ පවත්නා සාමාන්‍ය ලිපිකරු සේවයේ සාමාන්‍ය ලිපිකරු පන්තියේ නිලධාරීන් මෙම විභාගයට පෙනී සිටීමට සුදුස්සන් වේ.

3. **ඉල්ලුම් පත්.**—(i) මේ විභාගයට ඇතුළත්වීමේ ආදර්ශ ෆෝරමයක් මේ නිවේදනයට යා කොට ඇත. අයදුම්කරුවන් විසින් බාග ප්‍රමාණයේ පුල්ස්කැප් කඩදාසියක තම අයදුම්පත් පිළියෙල කළ යුතුය. (මේ සඳහා වෙන් අන් ප්‍රමාණයක කඩදාසි පාවිච්චි නො කළ යුතු යි).

(ii) අයදුම්පත් නිවැරදිවද, පැහැදිලිවද, අපේක්ෂකයාගේ අත් අකුරින් ම සම්පූර්ණ කොට 1969 ජූනි මස 21 වැනිදා හෝ ඊට කලින් හෝ විභාග කොමසාරිස් වෙත ලැබෙන ලෙස, තමන් සේවය කරන දෙපාර්තමේන්තුවල ප්‍රධානයන්ගේ මාර්ගයෙන්, ලියාපදිංචි කළ තැපෑලෙන් යැවිය යුතුය. අයදුම් පත් ෆෝරමයේ අගට යොදා ඇති අන්දමේ සහතිකයක් දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් දිය යුතු ය. නියමිත දිනයට පසුව ලැබෙන කවර අයදුම් පතක් හෝ ප්‍රතික්ෂෙප කරනු ලැබේ. ෆෝරමය බහා එවන ලියුම් කවරය මුදුනේ වම් කෙළවරෙහි විභාගයේ නම පැහැදිලිව ලිවිය යුතු ය. මේ ක්‍රියා පිළිවෙල අනුගමනය නො කරන සියලුම අපේක්ෂකයන් ගේ අයදුම්පත් ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

(iii) 1969 ජූනි මස 21 වැනි දිනයට හෝ ඊට පෙර හෝ විභාග කොමසාරිස් වෙත ලැබෙන පරිදි යවන්නට කියන ඉල්ලීමකුත් සමග ස්වකීය අයදුම් පත් තමන්ගේ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් වෙත කල් ඇතිව ඉදිරිපත් කරන මෙන් අයදුම්කරුවන්ට දන්වා සිටිනු ලැබේ.

4. **නිවාඩු, බත්තා සහ ගමන් වියදම්.**—විභාග කොමසාරිස් විසින් පිළිගත් ඉල්ලුම් පත්‍ර යවන ලද නිලධාරීන්ට එම පරීක්ෂණයට පෙනී සිටීම පිණිස, එම දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින් රාජකාරි නිවාඩු දිය යුතුය.

පරීක්ෂණයේ දී පහත සඳහන් අඩු ම ලකුණු ප්‍රමාණයන් ලබා ගන්නා පිට පළාත්වල අයදුම්කරුවන්ට බත්තා සහ ගමන් වියදම් ගෙවනු ලැබේ :—

ඉංග්‍රීසි භාෂාවෙන් සියයට 30 ක්,
සිංහල භාෂාවේ මුළු ලකුණු ගණනින් සියයට 30 ක්,
දෙමළ භාෂාවේ මුළු ලකුණු ගණනින් සියයට 30 ක්,

5. **විභාග පරිපාටිය.**—පරීක්ෂණයේ විෂයයන් සහ එම විෂයයයන්ගේ නිර්දේශ පත්‍රිකා පහත දැක්වේ :—

**(අ—විෂයය)—ඉංග්‍රීසි භාෂාව.**—(පැය දෙකක කාලයකට සීමා වූ ප්‍රශ්න පත්‍රයකි.) අයදුම්කරුවන්ගේ පහත සඳහන් සමත්කම් පරීක්‍ෂා කර බලනු පිණිස ප්‍රශ්න දෙනු ලැබේ :—

(අ) ප්‍රකාශ කිරීමේ ශක්තිය ;

(ආ) සාමාන්‍ය දුෂ්කරතාවයන් ඇති වාක්‍ය ඛණ්ඩයන්ගේ අවබෝධය (මෙම ඡෙදයෙන් ප්‍රවෘත්ති පත්‍ර කාර්යාලයීය ප්‍රකාශන හෝ වර්තමාන කර්තෘවරුන්ගේ ග්‍රන්ථයන්ගෙන් උපුටාගනු ඇත.) ; සහ

(ඇ) භාෂා සම්ප්‍රදාය සහ වචන මාලාව පිළිබඳ දැනුම.

**(ආ—විෂයය)—සිංහල භාෂාව.**—මෙම විෂයයට ලිඛිත ප්‍රශ්න පත්‍ර දෙකක් සහ වාචක පරීක්ෂණයක් ද අයත් වේ :—

(අ) සිංහල භාෂාව $1\frac{1}{2}$ (සිංහලෙන් ඉංග්‍රීසියට පරිවර්තනය කිරීම—කාල සීමාව පැය $1\frac{1}{2}$) අයදුම්කරුවන් විසින් පහත දැක්වෙන දේ ඉංග්‍රීසියට පරිවර්තනය කළ යුතු ය :—

(i) ප්‍රවෘත්ති පත්‍රයකින් හෝ වර්තමාන ගද්‍ය ග්‍රන්ථයකින් උපුටාගත් කොටසක් ;

(ii) සාමාන්‍ය දුෂ්කරතාවයෙන් යුතු ලියමනක්, පෙත්සමක්, ඔප්පුවක් හෝ වාර්තාවක්.

වාග් සම්ප්‍රදායානුකූල යෙදීම නිවැරදි ව සම්ප්‍රදායානුකූල ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කිරීම සම්බන්ධයෙන් අයදුම්කරුවාට ඇති දක්‍ෂකම පරීක්‍ෂා කිරීමට ප්‍රශ්න දෙනු ලැබේ. පරිවර්තනය කිරීම සඳහා වූ ඡෙද අත් පිටපත් මගින් දෙනු ලැබේ.

(ආ) සිංහල භාෂාව II (ඉංග්‍රීසියෙන් සිංහලට පරිවර්තනය කිරීම, කාල සීමාව පැය $1\frac{1}{2}$ යි) පහත සඳහන් එකක් හෝ ඊට වැඩි ගණනක් අයදුම්කරුවන් විසින් පරිවර්තනය කළ යුතුය :—

මහේස්ත්‍රාත් උසාවියක හෝ දිස්ත්‍රික් උසාවියක විභාග වූ නඩුවක තීන්දුව, ආඥාපනතකින්, අතුරු නීතියකින්, ගැසට් නිවේදනයකින්, හැන්සාඩ් වාර්තාවකින් හෝ වෙනත් ආණ්ඩුවේ ප්‍රකාශයකින් උපුටා ගත් කොටසක් අයදුම්කරුවන් විසින් ඉංග්‍රීසි වාග් සම්ප්‍රදායානුකූල ඡෙදයන් පරිවර්තනය කිරීම ද අවශ්‍ය වන්නේ ය.

(ඇ) **වාචක පරීක්ෂණ.**—මෙහි දී පහත දැක්වෙන දේවලට අවධානය යොමු කරවනු ලැබේ. ව්‍යවහාරයෙහි ඇති සාමාන්‍ය පාරිභාෂික පද පරිවර්තනය කිරීම, සිංහලෙන් අදහස් ප්‍රකාශ කිරීමේ ඇති පහසුකම්, සිංහලෙන් සහ ඉංග්‍රීසියෙන් වාග් සම්ප්‍රදායානුකූල ඡෙදයන් උච්චාරණය කිරීම සහ ඒ පිළිබඳ දැනීම.

කලින් සූදානමක් නැතිව, ප්‍රථම වතාවට දෙන ලද, ඉංග්‍රීසි ලිපියක, වාර්තාවක හෝ වෙනත් කාර්යාලීය ලිපි කඩදාසියක පරිවර්තනයක්, කට වචනයෙන් දීමට අයදුම්කරුවන්ගෙන් බලාපොරොත්තු වනු ලැබේ.

**(ඇ—විෂයය)—දෙමළ භාෂාව.**—මෙම විෂයයට ලිඛිත ප්‍රශ්න පත්‍ර දෙකක් සහ වාචික පරීක්‍ෂණයක් ද අයත් වේ.

(අ) දෙමළ භාෂාව I (දෙමළ භාෂාවෙන් ඉංග්‍රීසියට පරිවර්තනය කිරීම—කාල සීමාව පැය $1\frac{1}{2}$) ;

(ආ) දෙමළ භාෂාව II (ඉංග්‍රීසි භාෂාවෙන් දෙමළ භාෂාවට පරිවර්තනය කිරීම—කාල සීමාව පැය $1\frac{1}{2}$) ;

(ඇ) **වාචක පරීක්ෂණය.**—දෙමළ භාෂාව I, දෙමළ භාෂාව II සහ දෙමළ වාචක පරීක්ෂණය සඳහා වූ නිර්දේශ පත්‍රිකා, සිංහල භාෂාව I සිංහල භාෂාව II සහ සිංහල වාචක පරීක්ෂණය සඳහා වූ නිර්දේශ පත්‍රිකා මෙනි.

6. පරීක්ෂණයෙන් සාමාර්ථ්‍යයක් ලබා ගැනීමට අයදුම්කරුවන් විසින් පහත දැක්වෙන අන්දමින් ලකුණු ලබාගත යුතුය :—

| | |
|---|---|
| ඉංග්‍රීසි භාෂාවෙන් සියයට ... ... | 40ක් |
| සිංහල භාෂාවේ ලකුණුවල මුළු ගණනින් සියයට | 40ක් |
| දෙමළ භාෂාවේ ලකුණුවල මුළු ගණනින් සියයට | 40ක් |

7. අ, ආ සහ ඇ යන විෂයයන්ගෙන් විෂයයන් දෙකකින් සාමාර්ථ්‍යය ලබන අයදුම්කරුවන්ට, ඔවුන් විසින් සාමාර්ථ්‍යය ලබන ලද එක් එක් විෂයයේ ලකුණුවල මුළු ගණනින් සියයට 50ක් ලබා තිබුණ හොත් තුන්වෙනි විෂයය එම විභාගය පවත්වන **ඊළඟ අවස්ථාවේ දී පමණක් ගැනීමට අවසර දෙනු ලැබේ.**

8. පරීක්ෂණය පැවැත්වීම සඳහා විභාග කොමසාරිස් විසින් නියම කර ඇති නීති සහ රෙගුලාසිවලින් අයදුම්කරුවන් බැඳී සිටිනු ඇත.

9. **දීමනා.**—සාමාන්‍ය ලිපිකරු සේවයේ නිලධාරීන්ට (විශේෂ ශ්‍රේණියේ සාමාජිකයින් හැරෙන්නට) පහත දැක්වෙන කොන්දේසි යටතේ රුපියල් 20ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ :—

(i) නිලධාරියා භාෂා පරිවර්තකයෙකු වශයෙන් සේවයේ යෙදී සිටිය යුතුය. උසාවිවල අතිරේක භාෂණ පරිවර්තකයින් මෙන් සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ට දීමනාව හිමි නොවන්නේ ය.

(ii) නිලධාරියා භාෂණ පරිවර්තකයින් සඳහා වූ පරීක්ෂණයෙන් සමත් විය යුතු වෙයි. දැනට භාෂණ පරිවර්තකයින් වශයෙන් සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ට, එම පරීක්ෂණයෙන් සමත් වන තුරු දීමනාවකට හිමිකමක් නො ලැබෙන්නේ ය ;

(iii) තෙමසක කාල සීමාවක් තුළ, මහේස්ත්‍රාත්වරයා, විනිශ්චයකාර තුමා හෝ කොමිසමේ සභාපතිවරයා තෘප්තිවන අයුරින් ඔහු උසාවියක, විනිශ්චය සභාවක, පරීක්ෂණ කොමිසමක ආදියෙහි කටයුතුවල දී භාෂණ පරිවර්තකයකු වශයෙන් ක්‍රියා කොට තිබිය යුතුය. මේ කාල සීමාව තුළ දී, ඔහුට දීමනාව ගෙවනු නොලැබේ. ඔහු භාෂණ පරිවර්තකයින් සඳහා වූ පරීක්ෂණයෙන් සමත් වී තිබුණත්, එම කාල සීමාව තුළ දී මහේස්ත්‍රාත්වරයා, විනිශ්චයකාරතුමා, නායකයා හෝ සභාපතිවරයා තෘප්තියට පැමිණවීමට ඔහු අසමත් වුවහොත් ඒ හේතුවෙන් දීමනා සම්බන්ධයෙන් ඔහුට ඇති හිමිකම් වැළකී යනු ඇත. එමෙන් ම ඔහුගේ එම අසමත්වීම නිසා, ඔහු අවස්ථාවට සුදුසු පරිදි, සාමාන්‍ය ලිපිකරු සේවයේ වෙනත් තනතුරකට මාරු කරනු ලැබිය හැක. එම නිලධාරියා මහේස්ත්‍රාත්වරයා, විනිශ්චයකාරතුමා, නායකයා හෝ සභාපතිවරයා තෘප්තියට පත් කරන ලද්දේ නම්, අතීතයටද වලංගු වන සේ ඔහුට දීමනාවන් ගෙවනු ලැබිය හැක. එම දීමනාවන් ඔහුට ගෙවනු ලබන්නේ භාෂණ පරිවර්තකයන්ගේ පරීක්ෂණය හෝ එම තනතුරට පත් කරනු ලැබීම යන දෙකින් වඩා මෑතක වූ දෙය සිදු වූ දින සිට ය.

(iv) භාෂණ පරිවර්තකයින්ගේ පරීක්ෂණයෙන් සමත්ව දීමනා ලබාගත් නිලධාරියෙක් වෙනත් වැඩකට මාරු කරනු ලැබ නැවත වරක් භාෂණ පරිවර්තක තනතුරකට මාරු කරන ලද නම්, තවදුරටත් විභාගයක් නො පවත්වා, දීමනාව ගෙවනු ලැබේ. එසේ කරනු ලබන්නේ ඔහු භාෂණ පරිවර්තක තනතුරින් ඉවත්ව ගත වූ කාලය අවුරුද්දකට අඩුවේ නම් පමණකි. එසේ ගතවූ කාලය අවුරුද්දකට වැඩි වේ නම් දීමනාව ලැබීමට සුදුස්සකු වීමට ප්‍රථම එම නිලධාරියා විසින් (iii) වෙනි වගන්තියේ ප්‍රකාර, ඔහුගේ සමාර්ථතාවය සම්බන්ධයෙන් මහේස්ත්‍රාත්වරයා, විනිශ්චයකාරතුමා, නායකයා හෝ සභාපතිවරයා තෘප්තියට පත්කළ යුතු වන්නේ ය.

ප. ධ. උඩුවෙල,
භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම්.

1969 මැයි මස 21 වැනි දින,
කොළඹ මහා භාණ්ඩාගාරයේ දීය.

| |
|---|
| විභාග අංකය |
| .................... |
| කාර්යාලීය ප්‍රයෝජනය පිණිසයි. |

**ආදර්ශ ඉල්ලුම් පත්‍ර පෝරමය**

**භාෂණ පරිවර්තකයින් සඳහා වූ විභාගය—1969 සැප්තැම්බර්**

| | |
|---|---|
| 1. ඔබේ පුරුදු අත්සන ...<br>මුල් අකුරු සහිත ඔබේ නම ...<br>පැහැදිලි ලොකු අකුරෙන් )<br>ඔබේ නම සියල්ල සම්පූර්ණයෙන් ...<br>(පැහැදිලි ලොකු අකුරෙන්) | |
| 2. සම්පූර්ණ ලිපිනය ... ...<br>(කාර්යාලයීය පමණකි) | |
| 3. පහත සඳහන් කරුණු පිළිබඳ තොරතුරු සපයන්න :—<br>(i) ඔබ දැනට උසාවියක භාෂණ පරිවර්තක පදවියක් දරන්නෙහිද යන වග ...<br>(ii) ඔබ සාමාන්‍ය ලිපිකාර සේවයෙහි සාමාජිකයෙක් වන්නෙහි ද යන වග සහ එසේ නම් ඔබේ පන්තිය සහ ශ්‍රේණිය ... ... | |
| 4. ඔබ සේවය කරන දෙපාර්තමේන්තුවේ නම ... ... | |
| 5. විභාගය සම්පූර්ණ කිරීම පිණිස ඔබ ගනු ලබන්නේ එක් විෂයයක් පමණක් නම් පහත සඳහන් කරුණු පිළිබඳ තොරතුරු සපයන්න:—<br>(i) ඔබ සුදුසුකම් ලැබූ පසුගිය විභාගය සඳහා ලද සූචි අංකය ...<br>(ii) ඔබ දැන් ගන්නා විෂයය ... | |

මා විසින් කරන ලද මේ ප්‍රකාශයන් මගේ දැනීම හා විශ්වාසයේ පරිදි සත්‍ය බව මගේ ආත්ම ගෞරවයේ නාමයෙන් මම සහතික කරමි. භාෂණ පරිවර්තකයකු ලෙස මා පත් කෙරෙන ලංකාවේ ඕනෑම පෙදෙසක සේවය කිරීමටත්, මෙම විභාගය පිළිබඳ රෙගුලාසිවලට එකඟව ක්‍රියා කිරීමටත් බැඳෙමි.

————————,
අපේක්ෂකයාගේ අත්සන,
(දෙපාර්තමේන්තු ප්‍රධානියා ඉදිරිපිට දී).

දිනය :————————.

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

ඉහත විස්තර දැක්වෙන අපේක්ෂකයා විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලබා ඇති බව මෙයින් සහතික කරමි.

————————,
(අත්සන සහ අත්සන් කරන නිලධාරියාගේ පදවි නාමය.)
(දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ පදවි නාමය)

දිනය :————————.

## ලංකා විභාග දෙපාර්තමේන්තුව

### විභාගාපේක්ෂකයන් සඳහා නීති

සියලුම විභාගාපේක්ෂකයන් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි හෝ පමුණුවනු ලැබේ :—

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම තහනම් කිරීම ;

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයට හෝ නුසුදුස්සකු කිරීම ;

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම ;

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම් කාල සීමාවක් තුළ තහනම් කිරීම ;

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලිසියට බාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලිසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාග අපේක්ෂකයකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත්, රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේය.

### නීති

සියලුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුලදීත් ඒ අසලදීත් විභාගශාලාධිපතීන්ට ද ඔහුගේ සහකාරයන්ට ද අනික් විභාගාපේක්ෂකයන්ටද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්ත දාන්ත ව හැසිරිය යුතුයි. විභාග ශාලාවට ඇතුළුවන විටත් ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරුවිය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත් විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේත් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුයි.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීමට පටන් ගෙන පැය බාගයක් ගත වූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය බාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයකට පෙනී සිටින අපේක්ෂකයකුට විභාග ශාලාවෙන් පිටවී යාම ද තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයකු ම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුයි. විභාග ශාලාධිපතීන්ගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නො කරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ ඉන් පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පනිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන් ම තහනම්ය. යම්කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවකු සමග කතා බස් කිරීම ආදියක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාශාලාධිපතීන්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයකුගේ උත්තර පත්‍රය අඳුනා ගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනා ගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදු වෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසියෙහි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුයි. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරා දැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකා මකා දැමීම හෝ නොකළ යුතුය. කටු වැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද කඩදාසි ඇතුළු පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුයි. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුයි. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙන යාම තහනම්ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුර පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැලකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණන් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත්, චිත්‍රකර්මයෙහි දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයකුගේ චිත්‍රයකට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරීත්වයෙන් හෝ යනාදියකින් සමාන ව එසේ නැතිනම් බොහෝ සෙයින් කිට්ටුව තිබීමත් වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටත ගෙනයෑම තහනම් ය. මේ සියලු ම ද විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩ කිරීමට වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතුවෙනවා ඇත.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හෝ ජ්‍යාමිති උපකරණ පෙට්ටි අවශ්‍ය අවස්ථාවලදී, ඒවා හැර අන්‍ය අත්බෑග්, පසුම්බි, පෙට්ටි හා පාර්සල් ආදියද, පයිල් කවර, කාර්ඩ් බෝර්ඩ්, පෑඩ්, නැමූ ප්‍රවෘත්ති පත්‍ර, බ්ලොටින් පේපර් යනාදිය ද විභාග ශාලාව තුළ සිටින කිසිවිටක තමා වෙත හෝ තමා සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩකිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයකු අත කිසිම පොත පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන ලද කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන් තහනම්ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීමට වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම ද හොර උත්තර ලිවීමට යත්න දැරීම ද තහනම් ය. තවත් අපේක්ෂකයකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීමද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදවු දීමෙන්ද වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදවු ලබාගැනීමෙන් ද සම්පූර්ණයෙන් ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක් ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුයි. ලියන ලද කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත්, ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවීයාමට කිසි විභාගාපේක්ෂකයකුට ඉඩ දෙනු නොලැබේ. එහෙත් යම් කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයකුට ඉන් පිටත යන්නට වුවමනා වූවොත් විභාගශාලාධිපතීන්ගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂකත්වය යටතේ විභාගශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත්, නැවත විභාග ශාලාවට ඇතුළුවන විටත් ඔහු සෝදිසියකට භාජන විය යුතුයි.

15. විභාග ශාලාවේදී පිළිතුරු ලියන විට හෝ විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල්ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාගාපෙක්ෂකයකු නොවන අයෙක් කිසියම් අපේක්ෂකයකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදවු දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

**විභාගාපේක්ෂකයන් සඳහා උපදෙස්.**—විභාගාපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුයි :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10 කට හෝ 15 කට වත් කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරි හැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත් වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින් ඒ බැව් සැලකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගුවී යාමට හේතුවිය හැකිය ;

(iii) විභාගයට පෙනී සිටීමේදී අනන්‍යතා පත්‍ර (හැඳින්වීමේ පත්‍ර) ඉදිරිපත් කළ යුතු අපේක්ෂකයන් සෑම විෂයයකට ම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතු ය. අනන්‍යතාව ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔබේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඊමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්ට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සලසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වගීයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම් :—ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ප්‍රස්තාර කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශය ලියන කඩදාසි ආදිය) සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුනොත් ඒ බව නො පමාවම විභාගශාලාධිපතීන්ට දන්විය යුතු ය. විභාගශාලාවේදී ඔබට ම දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝු ගණක චක්‍ර සපයන ලද නම් ඒවා පරෙස්සමෙන් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුයි.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පෑන් සල්, තීන්ත, කූඩු, මකන රබර් කෑලි, අඩි කෝදු, ජ්‍යාමිති උපකරණ, පාට පෑන් සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නො පමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේ ම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තැබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලීවාට පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන හැම දෙයක් ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නො ලිය යුතු යි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන් කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතු වන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමෙන් නිවැරදි ලෙස යෙදිය යුතුයි.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමෙන් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදු විය හැකි ය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැණ බැලීම් සහ කටු වැඩ ඒ ඒ ගණන සෑදීමේ කොටසක් වශයෙන්, අනුක්‍රමයෙන් විස්තර ලෙස දක්විය යුතුයි. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් සහ චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිගු පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහනක් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර වියයුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවත නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙළ අනුව එකතු කොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කෑබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැට ගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගහන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ සියතින් ම බාර දිය යුතුය. නැත හොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේ ම වාඩි වී සිටිය යුතු ය. මෙසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිව යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූ වකු සේ සළකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියන් කෙනෙකුට හෝ වෙන යම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාගශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතකුට හෝ කථා කිරීම අවශ්‍ය වූ විට ද කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නො නැගිට අත පමණක් එසවිය යුතුය.

කේ. පී. ඩබ්. සුමනසූරිය,
වැඩ බලන විභාග කොමසාරිස්.

කොළඹ 2, මැලේ වීදියේ,
විභාග දෙපාතීමේන්තුවේ දී ය.

5–1099—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

---

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාතීමේන්තුව

### ලෑලි, ඔතන කඩදාසි හා පීප්ප පටි මිළයට ගෙන ඉවත් කිරීම පිළිබඳ ටෙන්ඩරය

කොළඹ, ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය : තැ. පෙ. 418, සර් චිත්තම්පලම් ගාඩිනර් මාවත, කොළඹ) ලෑලි, ඔතන කඩදාසි හා පීප්ප පටි (ආනයනය කළ මුද්‍රණ කඩදාසි ඇසිරීම සඳහා පාවිච්චි කළ) තොගයක් මිළයට ගෙන ඉවත් කිරීම සඳහා 1969 ජූනි 17 අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් නියමිත ආකෘති පත්‍රයෙහි පිටපත් දෙකකින් යුතුව ලියන ලද ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. සඳහන් කර ඇති දේවල් කොළඹ, බෝධිරාජ මාවතේ, පැරඩයිස් පෙදෙසේ, අංක 4 දරණ ගබඩාවෙහි ඇති අතර, 1969 ජූනි 2 වැනි සඳු දින හා 1969 ජූනි 12 වැනි බ්‍රහස්පතින්දා දිනවල පමණක් පෙ. ව. 10 සිට දවල් 12 තෙක් ටෙන්ඩර්කරුවන්ට ඒවා පරීක්ෂා කළ හැක.

3. ආපසු ගෙවනු ලබන රු. 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් බැඳ 1969 ජූනි 16 වැනි සඳුදා දවල් 12 වන තෙක් මෙම කාර්යාලයෙන් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගත හැක.

4. 1969 ජූනි 17 වැනි අඟහරුවාදා පෙ. ව. 9.30 ට මෙම කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවකුට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපැලෙන් එවීමට හෝ අතින් ගෙනවිත් භාරදී ලැබුණු බවට ලිපියක් ලබාගැනීමට හෝ පුළුවන.

එස්. ඒ. පී. රූපසිංහ,
ගබඩා අධිකාරී.

1969 මැයි මස 30 දින,
කොළඹදීය.

5–1151—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය: තැ. පෙ. 418, කොළඹ 1.) පහත සඳහන් සේවයන් සඳහා ඒ ඒ දිනයන්හි පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

| සේවයන් | ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය |
|---|---|
| 1. 1969.7.1 සිට 69.12.31 තෙක්, මෙරට සෑදූ විදුලි සිලිං, මේස හා පෙඩස්ටල් පංකා සැපයීම ... ... | 1969.6.24 |
| 2. 1969.10.1 සිට 1970.9.30 තෙක් මෙරට සෑදූ කැන්වස් සපත්තු සැපයීම ... ... | 1969.6.24 |
| 3. 1969.10.1 සිට 1970.9.30 තෙක්, ඕඩු පිටපත් පොත් යනාදිය සැපයීම ... | 1969.6.24 |
| 4. 1969.10.1 සිට 1970.9.30 තෙක්, මෙරට සෑදූ කපු බැනියන් සැපයීම ... | 1969.6.24 |
| 5. 1969.10.1 සිට 1970.9.30 තෙක්, මෙරට සෑදූ ඇළුමිණියම් භාණ්ඩ සැපයීම ... ... | 1969.7.1 |
| 6. 1969.10.1 සිට 1970.9.30 තෙක් මෙරට සෑදූ සබන් සැපයීම ... | 1969.7.8 |

සබන් සැපයීම සම්බන්ධයෙන් ඒ ඒ ටෙන්ඩර්කරුවන් විසින් කොළඹ 7, බෞද්ධාලෝක මාවතේ අංක 363 දරණ "විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ලංකා ආයතනයෙන්" තමන්ගේ සැම්පල් පරීක්‍ෂා කරවාගෙන ඒ සඳහා ලැබෙන සහතික පත්‍ර සමග ඉදිරිපත් කළ යුතුය.

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ ශ්‍රීමත් සිත්තම්පලම් ගාඩිනර් මාවතේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරී තැනගෙන් ෆෝර්ම කොළ ලබා ගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුය.

එක් එක් සේවය සම්බන්ධයෙන් රුපියල් 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් මෙහි ඉදිරිපත් කළ විට ඉහත සඳහන් දිනවලට කලින් දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

එස්. ඒ. පී. රූපසිංහ,
ගබඩා අධිකාරී.

1969.5.30 දින,
කොළඹ දී ය.

5–1152—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

## රත්මලානේ පළාත් පාලන අමාත්‍යාංශයේ ජල සම්පාදන, ජලාපවහන හා පළාත් පාලන වැඩ අංශය

### ගාල්ල ජලසම්පාදන යෝජනා ක්‍රමය (වෘද්ධිය) I පියවර

ශක්තිමත් කරන ලද කොන්ක්‍රීට්වලින් තනනු ලබන ගැලුම් දස ලක්ෂ 1 1/2 ක් අල්ලනු ලබන සේවා ජලාශයක්, එයට අදාළ නල වැඩ හා ජලස්ථානයට ප්‍රවේශවීමේ මාර්ගයක්ද නිර්මාණය කරනු ලබන ගාල්ලේ ජලසම්පාදන ක්‍රමයේ වෘද්ධිය සඳහා ටෙන්ඩර් කැඳවා ඇත. මෙම ටෙන්ඩර් කොළඹ 1, යෝර්ක් වීදියේ හේමාස් ගොඩනැගිල්ලේ 1 වන මහලේ 75 1/1, පළාත් පාලන අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1969 අගෝස්තු මස 8 වන සිකුරාදා, පස්වරු 2.30 දක්වා බාරගනු ලැබේ. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් විවෘත කරනු ලබන එදිනම පස්වරු 2.35 ට පැමිණ සිටිය හැක.

2. මෙම අංශයේ නිර්මාණ පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල ටෙන්ඩර් දෙපිටපකින් යුක්තව ඉදිපත් කළ යුතු අතර, සියළු විස්තර හා තොරතුරුද ඉහත කී ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකිවේ. මෙයට අදාළ සැලසුම්ද ඔහුගේ කාර්යාලයේදී ලබාගත හැකි වන්නේ ය.

3. ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රුපියල් 250 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක්, 1969 ජූනි මස 27 වන සිකුරාදා දවල් 12 ට පෙරාතුව ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් ලිය කියවිලි නිකුත් කරණු ලැබේ. ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල් ජලසම්පාදන, ජලාපවහන හා පළාත් පාලන වැඩ අංශයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කළ හැකිවේ.

4. පහත සඳහන් වර්ගයට අයත් ටෙන්ඩර්කරුවන් පමණක් ටෙන්ඩර් පත්‍ර එවීමට සුදුස්සන් වන්නේ ය :—

(අ) රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ "ඒ" කාණ්ඩයේ ලියා පදිංචිවී ඇති කොන්ත්‍රාත්කරුවන්. (ලියා පදිංචිය පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කළ යුතුය)

(ආ) "ඒ" කාණ්ඩයේ කොන්ත්‍රාත්කරුවන්ට සමාන තත්ත්වයේ සිටින විදේශීය හා දේශීය කොන්ත්‍රාත්කරුවන්.

5. ටෙන්ඩර් ආකෘතිපත්‍ර ඉල්ලුම් කරන විට මේ හා සමාන වෙනත් වැඩකර ඇති බවට හා යෝජිත වැඩය භාරගැනීම සඳහා සම්පූර්ණ සුදුසුකම් ඇති නිලධාරීන් තමන්ගේ කාර්ය මණ්ඩලයේ සිටින බවටත් සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

6. ටෙන්ඩර් ආකෘතිපත්‍ර නිකුත් කිරීමේ අවසාන දිනය වනතෙක් නොසිට හැකි පමණ ඉක්මණින් ඒවා ලබාගන්නා ලෙස ටෙන්ඩර් කරුවන් වෙත දැනුම් දෙනු ලැබේ.

ආර්. වී. පෙරුමසිනාර්,
වැඩ බලන අධ්‍යක්‍ෂ.

ජලසම්පාදන, ජලාපවහන හා
පළාත් පාලන වැඩ අංශය,
රත්මලාන.

5–1142—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

## රාජකීය ලංකා ගුවන් හමුදව

1969 ඔක්තෝබර් මස 1 දින සිට 1970 සැප්තැම්බර් මස 30 දින දක්වා වූ කාලසීමාව තුළ පහත සඳහන් සැපයීම්/සේවාවන් සඳහා, කොළඹ 2, තැ.පෙ. 594, ශ්‍රීමත් සිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි, රාජකීය ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් එක් එක් සැපයීම්/සේවාවන් ඉදිරියේ දක්වා ඇති දිනයන් හි පෙරවරු 10 තෙක්, මුද්‍රා තබන ලද ටෙන්ඩර් භාර ගනු ලැබේ.

| I<br>සැපයීම/සේවය | II<br>ටෙන්ඩර් විවෘත කරන දිනය | III<br>ටෙන්ඩර් ආකෘති නිකුත් කරන අවසාන දිනය |
|---|---|---|
| (1) කටුනායක, චීනවරාය සහ දියතලාව පිහිටි ගුවන් හමුදා කඳවුරුවලට ගොඩනැගිලි උපකරණ සැපයීම ... | ... 1969. 6.20 | ... 1969. 6.19 |
| (2) චීනවරාය සහ දියතලාව පිහිටි ගුවන් හමුදා කඳවුරුවලට නිළ ඇඳුම් සහ බැරැක්ක රෙදිපිළි ඇපිල්ලීම ... | ... 1969. 6.20 | ... 1969. 6.19 |

2. ටෙන්ඩර් ආකෘති ලබා ගැනීම පිණිස, කොළඹ 2, ශ්‍රීමත් සිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි, රාජකීය ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ, සිවිල් පාලක හා ගණකාධිකාරි වෙත ඉහත සඳහන් එක් එක් ටෙන්ඩරයක් සඳහා නැවත ලබාගත හැකි රු. 75ක මුදලක් තැන්පත් කර රිසිට් පතක් ලබාගත යුතුයි. ඉහත සඳහන් එක් එක් සැපයීම්/සේවාවන් ඉදිරියෙහි III වැනි තීරයේ දක්වා ඇති දිනයන්හි මධ්‍යාහ්නයේ 12 තෙක් ටෙන්ඩර් ආකෘති නිකුත් කෙරේ.

3. වැඩි විස්තර, කොළඹ 2, ශ්‍රීමත් සිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි ගුවන් හමුදා මූලස්ථානයෙන් දැනගත හැකි ය.

ඊ. ආර්. අමරසේකර,
එයාර් වයිස් මාර්ෂල්,
ගුවන් හමුදාධිපති.

5–1018—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### විදුලියෙන් ක්‍රියා කරවන වතුර පොම්පයක් සැපයීම

විනාඩියකට ගැලුම් 10 ක ධාරිතාවයකින් යුත් විදුලියෙන් ක්‍රියා කරවන වතුර පොම්පයක් සැපයීම සඳහා ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් 69.6.27 වන දින පෙරවරු 11 දක්වා ටෙන්ඩර් භාර ගනු ලැබේ.

2. ටෙන්ඩර්කරුවන් විසින් සැපයීම කළ යුත්තේ (ඒ) තිබෙන තොගයෙන්/ආනයනය කරන තොගයෙන් හෝ (බී) ආනයනයකර කිරුළපනේ මධ්‍යම ගබඩාවට භාරදීමටත් ය. ටෙන්ඩර්කරුවන් විසින් භාරදිය හැකි ඉතාම නුදුරු කාල සීමාව සඳහන් කළ යුතුය.

3. 69.6.26 වෙනි දින දවල් 12 තෙක් ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත හැකි ටෙන්ඩර් පෝර්මයක අනු පිටපතකුත් සමග ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කාර්යාලයේ හෝ කොළඹ යෝර්ක් වීදියේ ලංකා බැංකු කාර්යාලයේ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගේ අංක 1 දරන ගිණුමට හෝ කොළඹින් බැහැර කච්චේරියක හෝ රු. 25 ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට මත්තෙන් ඉදිරිපත් කළ යුතුයි.

4. ටෙන්ඩර් පෝර්ම ආදිය ලබාගත් පසු ටෙන්ඩර් කිරීමට නොහැකි වූවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල් ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනයට හා නියමිත වේලාවට පෙර ඉදිරිපත් කළහොත් පමණක් ආපසු ගෙවනු ලැබේ.

5. සියලු ටෙන්ඩර් කවරයන්හි වම් පස ඉහළ කෙළවරේ "විදුලියෙන් ක්‍රියා කරවන වතුර පොම්පයක් සැපයීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කොට ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ, එච්ලන් චතුරශ්‍රය, කොළඹ 1, යන ලිපිනයට එවිය යුතුයි. කවරයේ වම් පස පහළ කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය සඳහන් කළ යුතුයි. ටෙන්ඩර් ලියාපදිංචි කළ තැපෑලෙන්, පුද්ගලික නියෝජිතයෙකුගේ මාර්ගයෙන් හෝ තමා විසින් හෝ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරි තැනට භාරදිය යුතුයි.

6. ටෙන්ඩර් ස්ථිර වූවාක් මෙන්ම කිසියම් වෙනස් කිරීමකට අදාළ නොවිය යුත්තේ ය. ටෙන්ඩර් සලකා බැලීමට ඇති හෙයින් විවෘත කළ දින සිට දින 60 ක් යන තෙක් ඒවා ආපසු ගෙන්වා ගත නොහැකිය.

7. ටෙන්ඩර්කරුවන් සැපයීම පිළිබඳව සම්පූර්ණ විස්තරයක් ඉදිරිපත් කළ යුතුයි. පිළිගත් විස්තරයකට යම්කිසි වෙනස්වීමක් වෙතොත් ඒ බැව් සඳහන් කළ යුතුයි.

8. සාර්ථක වූ ටෙන්ඩර්කරු සැපයීම පැහැර හැරියොත් තැන්පත් මුදල රාජසන්තක වනවා පමණක් නොව, රජයේ කොන්දේසි කඩ කරන කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයට ඔහුගේ නමද ඇතුළත් වන්නේ ය.

9. කොළඹ, එච්ලන් චතුරශ්‍රයේ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේදී 69.6.27 වැනි දින පෙරවරු 11 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර්කරුවන්ට ඒ අවස්ථාවේදී පෙනී සිටිය හැක.

10. කිසියම් ප්‍රශ්න කිරීමක් නොමැතිව ටෙන්ඩරයක කොටසක් හෝ සම්පූර්ණයෙන්ම හෝ ප්‍රතික්ෂේප කිරීමට හෝ ටෙන්ඩරයේ කොටසක් පිළිගැනීමට අයිතිය රජය සතුය.

11. වැඩි විස්තර සඳහා ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධිකාරි ඉංජිනේරු තැනගෙන් විමසන්න.

පී. රත්නසිංහම්,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙනුවට.

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කාර්යාලය,
කොළඹ, 69.5.21.
සීපී/2/371.

5–1158—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

මණ්ඩලය මගින් නිකුත් කරන මාසික ගමනාගමන පුවත්පත ඉදිරි වර්ෂයට මුද්‍රණය කර සැපයීම සඳහා සීල් තැබූ ටෙන්ඩර්පත්‍ර කොළඹ 5, කිරුළ පාරේ නො. 200 වෙනි ස්ථානයෙහි පිහිටි ලංකා ගමනාගමන මණ්ඩලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1969 ජූලි මස 1 වෙනිදා පෙ. ව. 10 වනතෙක් භාරගනු ලැබේ.

ටෙන්ඩර්පත්‍ර නියමිත පෝර්මවල ලියා අනුපිටපතකින්ද යුක්ත කොට එවිය යුතුයි. මෙම පෝර්ම කොළඹ 5, කිරුළ පාරේ නො. 200 වෙනි ස්ථානයෙහි පිහිටි ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන සම්පාදක නිලධාරී තැනගේ කාර්යාලයෙන් 1969 ජූනි මස 30 වෙනිද දවල් 12 වනතෙක් ලබා ගත හැකිය. පෝර්ම පත් ලබා ගැනීමට කොළඹ 5, කිරුළ පාරේ නො. 200 වෙනි ස්ථානයෙහි වූ ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන ගිණුම් නිලධාරි තැන වෙත මුදලින් රු. 100 ක් තැන්පත් කර ඒ වෙනුවෙන් ලබා ගන්නා ලද රිසිට් පත ඉදිරිපත් කළ යුතුයි.

වැඩි විස්තර ප්‍රධාන සම්පාදක නිලධාරිතැනගේ කාර්යාලයෙන් ලබාගත හැක.

ප්‍රධාන සම්පාදක නිලධාරිතැන.

නො. 200, කිරුළ පාර,
කොළඹ 5.

5-966—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### කුරුණෑගල කෘෂිකර්ම කායශාලයට ගරාජයක් සහ ගබඩා කාමරයක් තැනීම

කුරුණෑගල කෘෂිකර්ම කායශාලයට ගරාජයක් සහ ගබඩා කාමරයක් තැනීම සඳහා පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1969.6.18 වැනි දින පස්වරු 2.30 වනතුරු ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. කොළඹ 3, ගාලු පාරේ අංක 457 දරණ ස්ථානයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ඉංජිනේරු) තැනගෙන් ලබා ගත හැකි පෝර්ම පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් පත්‍ර පිළියෙලකොට ඉදිරිපත් කළ යුතුය. ඔහුගෙන් රූප සටහන්, විශේෂ විස්තර හා වෙනත් තොරතුරුද ලබාගත හැක.

3. ටෙන්ඩර්කරුවන් රුපියල් 10,000 කට නොඅඩු ගොඩනැගිලි කොන්ත්‍රාත් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ රජයේ දෙපාර්තමේන්තුවක හෝ ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් විය යුතුය.

4. පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කළ විට, 1969.6.9 වෙනි දින දවල් 12 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ :—

(අ) 3 වැනි ඡේදයේ සඳහන් ලියාපදිංචි කිරීමේ ලියවිල්ලක්,

(ආ) රු. 25 ක ටෙන්ඩර් තැන්පත් මුදලේ කුවිතාන්සියක්.

5. ටෙන්ඩර් තැන්පත් මුදල පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ කච්චේරියක හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂවරයාගේ අංක 37 දරණ ගිණුමට බැර කරමින් කොළඹ යෝක් වීදියේ ලංකා බැංකු ශාඛාවෙහි තැන්පත් කළ යුතුය.

ඒ. සී. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

1969.5.18 වෙනි දින,
සිවිල් ඉංජිනේරු අංශයේ දී,
අංක 457, ගාලු පාර,
කොළඹ 3.

5–1108—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### පොම්ප සැපයීම සඳහා මිල ගණන් කැඳවීම

පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් පහත සඳහන් උපකරණ සැපයීම සඳහා මිල ගණන් පත්‍ර 1969 ජූනි මස 21 වැනි දින පෙ. ව. 10.30 වන තෙක් භාර ගනු ලැබේ :—

| මිල ගණන් අංකය | | සේවාව |
|---|---|---|
| එල්. කිප්‍ර. 686920 | ... | චූෂණ උස අඩි 25 ක් ද ඇතුළුව සම්පූර්ණයෙන් අඩි 225ක් උඩට, පැයකට ඉම්පිරියල් ගැලුම් 2,000 බැගින් පිට කිරීමේ හැකියාව ඇති කේන්ද්‍රාපසාරක නල 3 ක්. පිට කිරීමේ සිදුරේ විෂ්කම්භය අඟල් 2 ට නොවැඩි විය යුතුය. |
| එල් කිප්‍ර. 686921 | ... | චූෂණ උස අඩි 25 ක් ද ඇතුළුව සම්පූර්ණයෙන් අඩි 175 ක් උඩට, පැයකට ඉම්පිරියල් ගැලුම් 2,000 බැගින් පිට කිරීමේ හැකියාව ඇති කේන්ද්‍රාපසාරක නල 3 ක්. පිට කිරීමේ සිදුරේ විෂ්කම්භය අඟල් 2 ට නොවැඩි විය යුතුය. |
| එල්. කිප්‍ර. 686922 | ... | චූෂණ උස අඩි 25 ක් ද ඇතුළුව සම්පූර්ණයෙන් අඩි 125 ක් උඩට පැයකට ඉම්පිරියල් ගැලුම් 2,000 බැගින් පිට කිරීමේ හැකියාව ඇති කේන්ද්‍රාපසාරක නල 3ක්. පිට කිරීමේ සිදුරේ විෂ්කම්භය අඟල් 2ට නොවැඩි විය යුතුය. |
| එල්. කිප්‍ර. 686923 | ... | චූෂණ උස අඩි 25 ක් ද ඇතුළුව සම්පූර්ණයෙන් අඩි 125 ක් උඩට පැයකට ඉම්පිරියල් ගැලුම් 15,000ක් බැගින් පිට කිරීමේ හැකියාව ඇති කේන්ද්‍රාපසාරක නල 3 ක්, අඟල් 6 යේ විෂ්කම්භය සහිත පිට කිරීමේ සිදුරු සහ ආවරණ සහිත අඩි 60 වේ චූෂණ නලයක් ද සහිතව. |

විදුලි බලයෙන් හෝ ඩීසල් එන්ජින්වලින් ක්‍රියා කරවන පොම්ප සඳහා විකල්ප මිල ගණන් ඉදිරිපත් කළ හැකිය. (වැඩි විස්තර සඳහා කරුණාකර ඉංග්‍රීසි අනුවාදය බලන්න).

2. අනුපිටපතක් සහිත මිල ගණන් පත්‍ර එක් එක් උපකරණ සම්බන්ධයෙන් වෙන් වෙන්ව ඉදිරිපත් කළ යුතුය. මිල ගණන් මුද්‍රා තබන ලද කවරවල බහා කවරයේ ඉහළ වම් කෙළවරේ "........................................ සැපයීම සඳහා මිල ගණන් පත් අංකය ........................" යනුවෙන් සඳහන් කොට පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ටැන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත, මිල ගණන් නිම කිරීමට නියම වේලාවට පෙර ලැබෙන සේ එවිය යුතුයි.

3. මිල ගණන් දක්විය යුත්තේ මෙකී ද්‍රව්‍ය ගබඩාවෙන් (Ex Stock) නාරාහේන්පිට, නාවල පාරේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ යන්ත්‍රාගාරයට භාර දීම කළ හැකි වන අයුරුය. ගබඩාවෙන් සපයන (Ex Stock) අයුරු මෙම ද්‍රව්‍ය භාර දීම කළ නොහැකි නම්, ටෙන්ඩර්කරු විසින් මෙම ද්‍රව්‍ය භාර දීමට හැකි පහසු දිනය දක්වමින් මිල ගණන් දක්විය හැකිය.

4. සියලුම මිල ගණන්, ටෙන්ඩර් අවසන් කරන ලද දිනයේ සිට සති තුනක කාලයක් භාර ගැනීම සඳහා විවෘතව තිබිය යුතුය.

5. පිළිගත් ටෙන්ඩර්කරුට, කොන්ත්‍රාත්තුව භාර දෙනු ලැබූ දිනයේ සිට දින 10 ක් ඇතුළත ටැන්ඩර් කරන ලද උපකරණයේ වටිනාකමෙන් 5%කට නොඅඩු ඇප තැන්පත් මුදලක් බැඳීමට සිදු වනු ඇත.

6. ඇප තැන්පත් මුදල ආපසු දෙනු ලබන්නේ කොන්ත්‍රාත්තුව සාර්ථක අයුරින් නිම කිරීමෙන් පසු පමණි.

7. පිළිගත් ටැන්ඩර්කරුට ඔහුගේ මිළ ගණන් පිළිගත් බැව් දන්වමින් කෘෂිකර්ම අධ්‍යක්‍ෂ හෝ ඔහුගේ බලය ලත් නිලධාරියා හෝ විසින් ලිඛිත දැන්වීමක් එවනු ලබන අතර පිළිගත් ටෙන්ඩර්කරු කෘෂිකර්ම අධ්‍යක්‍ෂ සමග ගිවිසුමකට එළඹිය යුතුවේ.

8. මුද්දර ගාස්තු ගෙවා, ගිවිසුම් පත්‍රයට ඇලවීමට අවශ්‍ය මුද්දර, පිළිගත් ටැන්ඩර්කරු විසින් ඔහුගේ වියදමින් ඉදිරිපත් කළ යුතුයි.

9. කිසියම් ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටැන්ඩර් පත්‍ර හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතියත්, කිසියම් ටැන්ඩරයක් හෝ ටැන්ඩරයක කොටසක් පමණක් හෝ පිළිගැනීමේ අයිතියත් රජය සතුවේ.

ඇල්. ආර්. ඇල්. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්‍ෂ වෙනුවට.

69. 5. 20 වෙනි දින,
පේරාදෙණියේ,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දීය.

5–1104/1—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### ජලනල මල් සැපයීම සඳහා මිල ගණන්

ටෙන්ඩර් අංකය : ඇල්. කිව්. 686924

පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් පහත සඳහන් උපකරණ සැපයීම සඳහා මිල ගණන් පත්‍ර 1969 ජූනි මස 21 වැනි දින පෙ. ව. 10.30 වන තෙක් භාරගනු ලැබේ :—

#### විස්තර

ජල නල මල් (Sprinkler Irrigation Nozzles)

සැපයීම—සංඛ්‍යාව 50 යි.

(වැඩි විස්තර සඳහා කරුණාකර ඉංග්‍රීසි අනුවාදය බලන්න.)

2. මිල ගණන් පත්‍ර පිටපත් දෙකකින් යුතුව තිබිය යුතුයි. මිළ ගණන් මුද්‍රා තබන ලද කවරයක බහා, කවරයේ ඉහළ වම් කෙළවරේ "ජලනල මල් සැපයීම සඳහා මිළ ගණන්, මිළ ගණන් අංක ඇල්. කිව්. 686924" යනුවෙන් සඳහන් කොට පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ටැන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත මිල ගණන් නිම කිරීමට නියමිත වේලාවට පෙර ලැබෙන ලෙස එවිය යුතුයි.

3. මිල ගණන් දැක්විය යුත්තේ මෙකී ද්‍රව්‍ය ගබඩාවෙන් (Ex Stock) නාරාහේන්පිට, නාවල පාරේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ යන්ත්‍රාගාරයට භාර දීම කළ හැකි වන අයුරුය. ගබඩාවෙන් සපයන (Ex Stock) අයුරු මෙම ද්‍රව්‍ය භාර දීම කළ නොහැකි නම්, ටෙන්ඩර්කරු විසින් මෙම ද්‍රව්‍ය භාර දීමට හැකි පහසු දිනය දක්වමින් මිල ගණන් දැක්විය හැකිය.

4. සියලුම මිල ගණන්, ටෙන්ඩර් අවසන් කරන ලද දිනයේ සිට සති තුනක කාලයක් භාර ගැනීම සඳහා විවෘතව තිබිය යුතුය.

5. පිළිගත් ටෙන්ඩර්කරුට, කොන්ත්‍රාත්තුව භාර දෙනු ලැබූ දිනයේ සිට දින 10 ක් ඇතුළත, ටැන්ඩර් කරන ලද උපකරණයේ වටිනාකමෙන් 5%කට නොඅඩු ඇප තැන්පත් මුදලක් බැඳීමට සිදු වනු ඇත.

6. ඇප තැන්පත් මුදල ආපසු දෙනු ලබන්නේ කොන්ත්‍රාත්තුව සාර්ථක අයුරින් නිම කිරීමෙන් පසු පමණි.

7. පිළිගත් ටැන්ඩර්කරුට ඔහුගේ මිළ ගණන් පිළිගත් බැව් දන්වමින් කෘෂිකර්ම අධ්‍යක්‍ෂ හෝ ඔහුගේ බලය ලත් නිලධාරියා හෝ විසින් ලිඛිත දැන්වීමක් එවනු ලබන අතර පිළිගත් ටෙන්ඩර්කරු කෘෂිකර්ම අධ්‍යක්‍ෂ සමග ගිවිසුමකට එළඹිය යුතුවේ.

8. මුද්දර ගාස්තු ගෙවා, ගිවිසුම් පත්‍රයට ඇලවීමට අවශ්‍ය මුද්දර, පිළිගත් ටැන්ඩර්කරු විසින් ඔහුගේ වියදමින් ඉදිරිපත් කළ යුතුයි.

9. කිසියම් ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටැන්ඩර් පත්‍ර හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතියත්, කිසියම් ටෙන්ඩරයක් හෝ ටෙන්ඩරයක කොටසක් පමණක් හෝ පිළිගැනීමේ අයිතියත් රජය සතුවේ.

ඇල්. ආර්. ඇල්. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්‍ෂ වෙනුවට.

69.5.20 වෙනි දින,
පේරාදෙණියේ,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දීය.

5–1104/2—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**1969 ජූනි මස සිට 1969 සැප්තැම්බර් මාසය දක්වා නුවර එළිය දිස්ත්‍රික්කයේ අඹේවෙල සත්ව ගොවිපල් ව්‍යාපාරයට ගොඩනැගිලි ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා ටෙන්ඩර් පත්‍ර කැඳවීම**

පහත සඳහන් ගොඩනැගිලි ද්‍රව්‍ය නුවර එළියේ දිස්ත්‍රික්කයේ අඹේවෙල සත්ව ගොවිපල් ව්‍යාපාරයට සැපයීම සඳහා 1969.6.18 දින පස්වරු 2.30 වනතෙක් පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ :—

(1) කළුගල් 6″ සිට 9″ (කියුබයකට)
(2) කැටගල් 2″ (කියුබයකට)
(3) කැටගල් 1½″ (කියුබයකට)
(4) කැටගල් 1″ (කියුබයකට)
(5) කැටගල් ¾″ (කියුබයකට)
(6) ගංගා වැලි (කියුබයකට)
(7) පිළිස්සූ ගඩොල් (1,000 කට)
(8) වියාපු පොල්අතු (1,000 කට)
(9) දිය ගසපු හුණු (බුසලයකට)
(10) තම්බාපු හුණු (බුසලයකට)

2. කොළඹ 3, ගාලු පාරේ අංක 457 දරණ ස්ථානයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ඉංජිනේරු) තැනගෙන් ලබා ගත හැකි පෝර්ම පත්‍රවල පිටපත් දෙකකින් (2) යුක්තව ටෙන්ඩර් පත්‍ර පිළියෙලකොට ඉදිරිපත් කළ යුතුය. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර ඔහුගෙන්ම ලබා ගත හැකිය.

3. රු. 25 කට ටෙන්ඩර් තැන්පත් මුදලේ කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1969.6.9 දින දවල් 12 දක්වා ටෙන්ඩර් පත් ලබා ගත හැක.

4. ටෙන්ඩර් තැන්පත් මුදල පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ කච්චේරියේ හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂගේ අංක 37 දරණ ගිණුමට බැර කරමින් කොළඹ යෝක් වීදියේ ලංකා බැංකු ශාඛාවෙහි තැන්පත් කළ යුතුය.

ඒ. සී. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
සිවිල් ඉංජිනේරු අංශය,
අංක 457, ගාලු පාර,
කොළඹ 3.
1969 මැයි මස 20 දින දීය.

5–1105—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

ගාලු උප කොටසේ පහත සඳහන් වැඩ සඳහා ඉදිරිපත් කරන ටෙන්ඩර් අයදුම් පත්‍ර තංගල්ලේ ප්‍රාදේශීය ඉංජිනේරු තැන විසින් 1969 ජූනි 20 වැනි ද පු. භා. 10 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවේලේම සිදු කෙරේ.

| වැඩ විස්තර | ලියා පදිංචි මුදල | ටැන්ඩර් තැන්පත් මුදල |
|---|---|---|
| 1. හික්කඩුව ව්‍යාපාරයේ මහපැලැන ඇල හරහා නිර්මිතයක් හා වේල්ලක් තැනීම | රු. 35,000 0 | රු. 50 0 |

ටෙන්ඩර් ඇප මුදල ඉහත සඳහන් වාරිමාර්ග කාර්යාලයක හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් 1969 ජූනි 19 වෙනි දින දවල් 12ට හෝ ඊට පෙර ටෙන්ඩර් පෝර්ම ගාල්ල/මාතර/හම්බන්තොට/තිස්ස වාරිමාර්ග කාර්යාලවලින් ලබා ගත හැක. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ ලියා පදිංචි පොත් ඉදිරිපත් කළ යුතුයි.

මේ ගැන වැඩි විස්තර ගාල්ලේ වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැක.

වාරිමාර්ග කාර්යාලය,
ගාල්ල 69.5.17

ජේ. එම්. ඩී. එල්. සෙනෙවිරත්න,
වාරිමාර්ග ඉංජිනේරු, ගාල්ල උප කොටස.

5–923—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව–අනුරාධපුර උප කොටස

උතුරු මැද පළාතේ, අනුරාධපුර උප කොට්ඨාශයේ පහත සඳහන් වැඩය සඳහා අනුරාධපුර උතුරු මැද කොට්ඨාශයේ, ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1969 ජූනි මස 24 වෙනි අඟහරුවාදා පෙරවරු 10 දක්වා ටෙන්ඩර් අයදුම් පත් භාර ගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවලේම එහිදී සිදුකෙරේ.

| වැඩයේ විස්තරය | ලියාපදිංචි මුදල රු. | ටෙන්ඩර් ඇප රු. |
|---|---|---|
| කටුපත්වැව වැඩි දියුණු කිරීම ... | ... 50,000 | ... 100 |

**2.** වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉහත සඳහන් ගණන්වලට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවනට, සමූපකාර සමිතිවලට හා ග්‍රාම සංවර්ධන සමිතිවලට පමණක් මෙම වැඩය සඳහා ටෙන්ඩර් අයදුම් පත් ඉදිරිපත් කළ හැක.

3. ජූනි මස 21 වෙනි දින දහවල් 12 දක්වා කාර්යාලීය වේලාවන් තුලදී අනුරාධපුර/මහකනදරාව/රාජාංගනය/පදවිය යන වාරිමාර්ග කාර්යාලවලින් ලබාගත හැකි ටෙන්ඩර් පෝර්ම වල පමණක් ටෙන්ඩර් අයදුම් පත් සකස් කළ යුතුය. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ ඔවුන් දැනට කරන වැඩ සහ ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශයක් ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට පෙර මෙම වැඩය සඳහා ඉහත සඳහන් ටෙන්ඩර් ඇප මුදල ඉහත සඳහන් කාර්යාලවල හෝ ලංකාවේ ඕනෑම කච්චේරියක තැන්පත් කර ඒ වෙනුවට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

**4.** මෙම වැඩය සඳහා සියළුම විස්තර සැලසුම් ආදිය කාර්යාල වේලාවන් තුලදී අනුරාධපුර වාරිමාර්ග කාර්යාලයෙන් ලබා ගත හැක.

ඩබ්ලිව්. එස්. සහාරත්නම්,
වාරිමාර්ග ඉංජිනේරු තැන, අනුරාධපුර උප කොටස.

5–1000—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—වෙන්කලඩි උප කොටස

නැගෙනහිර කොට්ඨාශයේ වෙන්කලඩි උප කොටසේ පහත සඳහන් කාර්ය සඳහා ටෙන්ඩර්පත් 1969 ජූනි 24 වෙනි අඟහරුවාද පෙ. ව. 10 දක්වා නැගෙනහිර කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුතුමා විසින් භාර ගෙන එදිනම පෙරවරු 10.05 ට විවෘත කරණු ලැබේ.

| වැඩයේ නම | කොන්ත්‍රාත්කරු ලියා පදිංචිවී සිටියයුතු මුදල | ටෙන්ඩර් තැන්පත් මුදල |
|---|---|---|
| 1. ජ්‍යෙෂ්ඨ සේවකයින් උදෙසා රජයේ නිවාසයක් වෙන්කළඩිහි ගොඩ නැංවීම | රු. 40,000. 0 ... | රු. 50. 0 |

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉහත සඳහන් වටිනාකම්වලට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් මෙම වැඩය සඳහා ටෙන්ඩර් කිරීමට සුදුස්සෝ වෙති.

3. 1969 ජූනි මස 20 සිකුරාද දවල් 12 වනතෙක් කාර්යාල වේලාවන් තුළදී වෙන්කලඩි වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයෙන් හා කල්මුණේ හා අම්පාර යන වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල වලින් ලබාගත් ටෙන්ඩර් පෝරමවල අයදුම්පත්‍ර සකස් කළ යුතුය. ටෙන්ඩර් පෝරම සඳහා ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත්වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියා පදිංචි පොත් හා දැනට ඔවුන් කරණ වාරිමාර්ග වැඩ සහ ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශයක්, ඔවුනට ටෙන්ඩර් කිරීමට දිය යුතුද නැද්ද යන්න සළකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු වෙත ඉදිරිපත් කළ යුතුය. පෝර්ම නිකුත් කිරීමට ප්‍රථම ඉහත සඳහන් ආකාරයට තැන්පත් මුදල් වාරිමාර්ග කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කොට ඒ වෙනුවෙන් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

4. මේ සඳහා වැඩි විස්තර කාර්යාල වේලාව තුළ වෙන්කලඩි වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැක.

එස්. මරියසිංහම්,
වාරිමාර්ග ඉංජිනේරු—වෙන්කලඩි උප කොටස.

1969.5.17
වෙන්කලඩි.

5–1046—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—කොළඹ උප කොටස

කොළඹ උප කොට්ඨාශයේ පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් අයදුම් පත් 1969 ජූනි 24 වන අඟහරුවාදා පෙරවරු 11 දක්වා ජාවත්ත පාරේ, කොළඹ 5, බස්නාහිර කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් බාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවලේම සිදුකෙරේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ එම වැඩය ඉදිරියේ දක්වා ඇති අයුරු හෝ ඊට වැඩි ගණන්වලට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට, සමුපකාර සමිතිවලට හා ග්‍රාම සංවර්ධන සමිතිවලට පමණක් මෙම වැඩය සඳහා ටෙන්ඩර් අයදුම් පත් ඉදිරිපත් කළ හැක.

| වැඩයේ නම | කොන්ත්‍රාත්කරු ලියාපදිංචි වූ ගණන රු. | ටෙන්ඩර් තැන්පත් මුදල රු. |
|---|---|---|
| 1. මැට්වල බොක්කේ කපොලු 6 පතුරු ගේට්ටු නිර්මානය අළුත්වැඩියා කිරීම ... ... | 46,000 ... | 50 |
| 2. දඩුගම්ඔය අමුණ දකුණ ඉවුර ඇල තැනීම ... ... | 32,000 ... | 50 |
| 3. වත්තල අයිසොලේෂන් බැම්ම සක්ක ගල් අල්ලා ගල් අතුරා කාර දැමීම ... | 30,000 ... | 50 |
| 4. හෙට්ටිගෙ ඔය අමුණ ඉතිරි වැඩ ... | 17,000 ... | 25 |

3. 1969 ජූනි මස 21 වෙනිදා දක්වා කාර්යාල වේලාවන් තුළදී කොළඹ/කළුතර/ගම්පහ/රත්නපුර වාරිමාර්ග ඉංජිනේරුවන් ගේ කාර්යාලයන් ගෙන් ලබාගත හැකි ටෙන්ඩර් පෝර්මවල ටෙන්ඩර් අයදුම් පත් සකස් කළ යුතුයි. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ ඔවුන් දැනට කරන වැඩ හා ඒවායේ වටිනා කම දක්වෙන ප්‍රකාශනයක් ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද ? නැද්ද ? යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුයි. පෝර්ම නිකුත් කිරීමට පෙර එම වැඩය ඉදිරියෙන් සඳහන් කර ඇති පරිදි ටෙන්ඩර් තැන්පත් මුදල් වාරිමාර්ග ඉංජිනේරු වරුන්ගේ කාර්යාල වලදී හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් 1969 ජූනි මස 21 වෙනි දින හෝ ඊට පෙර කාර්යාල වේලාවන් තුළදී ඉදිරිපත් කළ යුතුයි.

4. මෙම වැඩය ගැන සියළුම විස්තර, සැලසුම් ආදිය හා කාර්යාල වේලාවන් තුළදී කොළඹ වාරිමාර්ග කාර්යාලයෙන් ලබාගත හැක.

අයි. එච්. පෙරේරා,
වාරිමාර්ග ඉංජිනේරු, කොළඹ උප කොටස.

වාරිමාර්ග කාර්යාලය,
ජාවත්ත පාර, කොළඹ 5.

5–1050—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—තිස්සමහාරාමය උප කොටස

දකුණු කොට්ඨාශයේ, තංගල්ලේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින්, තිස්සමහරාමය උප කොට්ඨාශයේ පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් අයදුම්පත් 1969 ජූනි මස 20 වෙනි දින පෙ. ව. 10 දක්වා භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘතකිරීම එවෙලේම එහිදී සිදුකෙරේ.

| වැඩෙහි නම | කොන්ත්‍රාත් කරුගේ ලියාපදිංචිය රු. ශ. | ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශ. |
|---|---|---|
| තිස්ස වැව රොන්මඩ ඉවත්කිරීම ... | 75,000 0 ... | 100 0 |

2. මෙම දෙපාර්තමේන්තුවේ ඉහත සඳහන් ගණනට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචිවී ඇති කොන්ත්‍රාත් කරුවනට, සමුපකාර සමිතිවලට සහ ග්‍රාමසංවර්ධන සමිතිවලට පමණක් මේ වැඩ සඳහා ටෙන්ඩර් අයදුම්පත් ඉදිරිපත්කළ හැකිය.

3. 1969 ජූනි මස 1 වැනි දින සිට 1969 ජූනි මස 20 වෙනි දින දක්වා, සාමාන්‍ය කායර්‍යාලීය වේලාවන් තුළදී, තිස්ස/හම්බන්තොට/මාතර සහ ගාල්ල උප කොට්ඨාශ කායර්‍යාලවලින් ලබාගතහැකි පෝරමවල ටෙන්ඩර් අයදුම්පත් සකස්කළ යුතුය. ටෙන්ඩර් පෝරම සඳහා ඉල්ලුම්කිරිමේදී ඒ සඳහා ඉදිරිපත්වන ටෙන්ඩර් කරුවන්, ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දනට ඔවුන්කරන වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශ නයක්, ඔවුන්ට ටෙන්ඩර් අයදුම්පත් ඉදිරිපත්කිරීමට ඉඩ දියයුතුද? නැද්ද? යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළයුතුය. පෝරම නිකුත්කිරීමට පෙර ඉහත සඳහන් ගණන්වලට ටෙන්ඩර් තැන්පත් මුදල්, වාරිමාර්ග ඉංජිනේරුතැනගේ කාර්යාලයයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත්කොට, ඒ වෙනුවෙන් ලබාගත් කුවි තාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

4. මේ ටෙන්ඩර් ගැන සියළු විස්තර කායර්‍යාලීයය වේලාවන් තුළදී තිස්ස වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායර්‍යාලයයෙන් ලබාගතහැකිය. මෙකී වැඩ ඉටුකිරීම සඳහා සැතපුම් එකක් පමණ දුර ප්‍රමාණයක් ඇදීමට හැකියාවක් ඇති යන්ත්‍ර පාවිච්චිකළ යුතුය. දෙපාර්තමේන්තුවෙන් කිසිවක් සපයනු නොලැබේ.

ඕ. ඩී. අබේසේකර,
වාරිමාර්ග ඉංජිනේරු—තිස්සමහාරාම උප කොට්ඨාශය.

1969 මැයි මස 18 දින,
තිස්ස වාරිමාර්ග කාර්යාලයයේදීය.

5–1033—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

පදවිය ව්‍යාප්ත කිරීමේ ව්‍යාපාරයේ ඊයායේ දෙබිඩි කම්කරු නිවාස දෙකක් ඉදි කිරීම සඳහා 1969 ජූනි මස 24 වෙනි අඟහරුවාදා පෙ. ව. 10 තෙක් අනුරාධපුර උතුරු මැද කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් භාරගෙන එවේලේම විවෘත කරනු ඇත.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 35,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් මේ වැඩය සඳහා ටෙන්ඩර් අයදුම්පත් ඉදිරිපත් කළ හැකිය.

3. 1969 ජූනි මස 15 වෙනි දින සිට 20 වෙනි දින දහවල් 12 තෙක් පදවිය අනුරාධපුර සහ මහකනදරාව වාරිමාර්ග ඉංජිනේරු කායර්‍යාල වලින් ටෙන්ඩර් අයදුම් පත් නිකුත් කරනු ඇත. ටෙන්ඩර් ඉල්ලුම් පත් ලබා ගැනීමේදී ඒ සඳහා ඉදිරිපත් වන කොන්ත්‍රාත් කරුවන් ඔවුන්ගේ ලියා පදිංචි පොත් සහ දැනට ඔවුන් රජය යටතේ කරන වැඩ හා ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශනයක් ද ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩදිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත් නිකුත් කිරීමට ප්‍රථම රු. 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායර්‍යාලයේ හෝ ඕනෑම කච්චේරියක තැන් පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

4. මේ ටෙන්ඩර් ගැන වැඩි විස්තර කායර්‍යාලයීය වේලාවන් හි දී පදවිය වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායර්‍යාලයෙන් ලබාගත හැකිය.

වාරිමාර්ග ඉංජිනේරු තැන,
පදවිය ව්‍යාප්ත කිරීමේ ව්‍යාපාරය.

1969 මැයි මස 19 වෙනි දින,
වාරිමාර්ග කාර්යාලය, පදවිය.

5-1026—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**1969 ජූනි මස සිට 1969 සැප්තැම්බර් මාසය දක්වා පොළොන්නරුවේ, තමන්කඩුව සත්ව ගොවිපල් ව්‍යාපාරයට ගොඩනැගිලි ද්‍රව්‍ය ලබා ගැනීම**

පහත සඳහන් ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම සඳහා පොළොන්නරුවේ තමන්කඩුව සත්ව ගොවිපල් ව්‍යාපාරයට 1969.6.18 දින පස්වරු 2.30 වනතෙක් පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ.

(1) කළුගල් 6″ සිට 9″ (කියුබයකට)
(2) කැටගල් 2″ (කියුබයකට)
(3) කැටගල් 1½″ (කියුබයකට)
(4) කැටගල් 1″ (කියුබයකට)
(5) කැටගල් ¾″ (කියුබයකට)
(6) ගංගා වැලි (කියුබයකට)
(7) පිළිස්සූ ගඩොල් (1000 කට)
(8) වියාපු පොල් අතු (1000 කට)
(9) දිය ගසපු හුණු (බුසලකට)
(10) තම්බාපු හුණු (බුසලකට)

2. කොළඹ 3, ගාලු පාරේ අංක 457 දරණ ස්ථානයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ඉංජිනේරු) තැනගෙන් ලබා ගත හැකි පෝර්ම පත්‍රවල පිටපත් දෙකකින් (2) යුක්තව ටෙන්ඩර් පත්‍ර පිළියෙල කොට ඉදිරිපත් කළ යුතුය. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර ඔහුගෙන් ලබා ගත හැකිය.

3. රු. 25ක ටෙන්ඩර් තැන්පත් මුදලේ කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1969.6.9 දවල් 12 දක්වා ටෙන්ඩර් පත් ලබා ගත හැකිය.

4. ටෙන්ඩර් තැන්පත් මුදල පේරාදෙනියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ කච්චේරියේ හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂකගේ අංක 37 දරණ ගිණුමට බැර කරමින් කොළඹ යෝක් වීදියේ ලංකා බැංකු ශාඛාවෙහි තැන්පත් කළ යුතුය.

ඒ. සී. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
සිවිල් ඉංජිනේරු අංශය,
අංක 457, ගාලු පාර,
කොළඹ 3,
1969. 5. 19 වැනි දින දීය.

5–1106—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

### මාතර දිස්ත්‍රික්කයේ සුළු වාරිමාර්ග කර්මාන්ත

මෙම කාර්යාලයේ, පලාතේ කච්චේරියේ, ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ගෙන්, විවිධ සේවා සමුපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති හා කම්කරු සමිතිවලින් මාතර දිස්ත්‍රික්කයේ පහත සඳහන් සුළු වාරිමාර්ග කර්මාන්ත සඳහා මෙයින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

#### ගම් වගා නිලධාරි කොට්ඨාශය—ඌරුබොක්ක

(1) බක්මීගහලියද්ද වේලි හා අමුණ ප්‍රතිසංස්කරණය—කිරිලපනේ ගොවි කාරක සභා ප්‍රදේශය.

(2) ඇල්ලගාව දෙනිය හරස් බැම්ම—ගොම්ල මාවරල ගොවි කාරක සභා ප්‍රදේශය.

(3) සෙල්ලවත්තේ ඇලේ ගල් අස්කිරීම—ඌරුබොක්ක ගොවි කාරක සභා ප්‍රදේශය.

(4) වීවලදොල පැතිබැම්ම තැනීම—පට්ටිගල උඩුහුපිටිය ගොවි කාරක සභා ප්‍රදේශය.

#### ගම් වගා නිලධාරි කොට්ඨාශය—දෙයියන්දර

(5) පල්ලෙහික්ගොඩ කුඹුරේ අමුණ ප්‍රතිසංස්කරණය—මාකඳුර රංචාගොඩ ගොවි කාරක සභා ප්‍රදේශය.

(6) දෙයියන්දර යායේ අමුණ සෑදීම—බෙල්පාමුල්ල දෙයියන්දර ගොවි කාරක සභා ප්‍රදේශය.

(7) හුණුගොඩ කුඹුරට පීල්ලක් දැමීම—බෙල්පාමුල්ල දෙයියන්දර ගොවි කාරක සභා ප්‍රදේශය.

(8) කන්සැවගේ ගෙදර කුඹුරේ අමුණ ප්‍රතිසංස්කරණය—මාකඳුර රංචාගොඩ ගොවි කාරක සභා ප්‍රදේශය.

(9) වැකඩ කුඹුරට අමුණක් තැනීම—මාකඳුර රංචාගොඩ ගොවි කාරක සභා ප්‍රදේශය.

(10) උඩුමුල්ලයාය අමුණ සෑදීම—මාකඳුර රංචාගොඩ ගොවි කාරක සභා ප්‍රදේශය.

(11) රණගලයායේ පිට ඇලේ ගල් කැඩීම—බැරගම ගොවි කාරක සභා ප්‍රදේශය.

#### ගම් වගා නිලධාරි කොට්ඨාශය—වැලිගම

(12) දෙනියවත්ත අසල අමුණ ප්‍රතිසංස්කරණය—මීදිගම නැගෙනහිර ගොවි කාරක සභා ප්‍රදේශය.

#### ගම් වගා නිලධාරි කොට්ඨාශය—මාතර II

(13) කුට්ටිගේන වෙලේ සිට කැකුලන්වෙල දක්වා ඇල ප්‍රතිසංස්කරණය—කනත්තේගොඩ ගොවි කාරක සභා ප්‍රදේශය.

2. සෑම ටෙන්ඩර පත්‍රයක් ම පිටපත් දෙකකින් විය යුතු ය. ඒවා ඉදිරිපත් කළ හැක්කේ මාතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන ගෙන් ලබාගත හැකි ආකෘති පත්‍ර වල ය. එක එක කර්මාන්තය සඳහා පිටපත් දෙකකින් යුතු ටෙන්ඩර් පත්‍රය බැගින් ඉදිරිපත් කළ යුතු ය. නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් නො කරනු ලබන හෝ මේ කොන්දේසිවලට සම්පූර්ණයෙන් ම එකඟ නොවන කිසි ම ටෙන්ඩරයක් සළකා බලනු නො ලැබේ. ටෙන්ඩර් ආකෘතිපත්‍ර 1969.6,13 වැනි දින දවල් 12.30 දක්වා මාතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකිය. කච්චේරියේ රුපියල් දහයක් (රු. 10 ක්) තැන්පත් කොට ඒ බවට ලබාගත් කුවිතාන්සිය ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගැනීම සඳහා ඉදිපත් කළ යුතු ය.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක් ම ටෙන්ඩර්කරු විසින් ම අත්සන් කර තිබිය යුතු ය. මිළ ගණන් හා ප්‍රමාණයන් ඉලක්කම්වලින් මෙන් ම වචනවලින් ද දැක්විය යුතු ය. මිළ ගණන් හා ප්‍රමාණයන් ගණිතානුකූලව නිවැරදි විය යුතු අතර, දක්වන ලද ගණන්වල සංශෝධනයක් කර තිබේ නම්, ඒ හැම එකක් ම ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන යොදා සහතික කළ යුතු ය.

4. ටෙන්ඩර් පත්‍ර අත්සන් කොට දින යොදා සීල් තබන ලද ලියුම් කවරවල බහා, මාතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන ගේ ලිපිනයට එවිය යුතු ය. ටෙන්ඩරය බහා එවන ලියුම් කවරයේ, උඩ වම් කෙළවරේ "............සුළු වාරිමාර්ග කර්මාන්ත කිරීම සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතු ය. ටෙන්ඩර්පත්‍ර 1969.6.21 දින දවල් 12 ට හෝ ඊට පෙර මාතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නො එසේ නම්, ඒ සඳහා මෙම කාර්යාලයේ තබා ඇති "ටෙන්ඩර් පෙට්ටියට" දැමිය යුතු ය.

5. තෝරා ගත් ටෙන්ඩර්කරුට ඒ බව මාතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ ටෙන්ඩර් භාර ගන්නා වූ නිලධාරි තැන විසින් හෝ ලියවිල්ලකින් දැනුම් දෙනු ඇත. මේ දැනුම් දීම නිකුත් කළ දින සිට දින දහයක් ඇතුලත දී ටෙන්ඩර්කරු විසින් මාතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන සමග ඒ සම්බන්ධයෙන් ගිවිසුමකට ඇතුළත් විය යුතු ය. නියමිත පරිදි හා සතුටුදායක ලෙස වැඩ නිම කරන වගට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් සියයට දහයක් ටෙන්ඩර්කරු විසින් තැන්පත් කළ යුතු ය. ගිවිසුම අත්සන් කළ පසු සියලුම ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ඇත.

6. පිළිගත් ටෙන්ඩරය අනුව ගිවිසුමකට ඇතුලත් වන ලෙස තෝරා ගත් ටෙන්ඩර්කරුට දැන්වීමෙන් පසුව ද, එසේ කිරීමට ඔහු අසමත් වුවහොත් ඔහුගේ ටෙන්ඩර් ඇපමුදල රාජසන්තක කොට ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ නාම ලේඛනයට ඇතුලත් කිරීමට ක්‍රියා කරනු ඇත.

7. කිසිම හේතුවක් නො දන්වා ඕනෑම ටෙන්ඩරයක් හෝ සියලුම ටෙන්ඩර් හෝ ප්‍රතික්ෂේප කිරීමේ හෝ ඕනෑ ම ටෙන්ඩර පත්‍රයක ඕනෑ ම කොටසක් පිළිගැනීමේ හෝ බලය රජයට ඇත.

8. මාතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ හෝ ඔහු විසින් බලය පවරන නියෝජිතයාගේ හෝ අවසරයක් නොමැතිව කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට හෝ නො පැවරිය යුතුය.

9. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් ගේ නාම ලේඛනයට තනිව හෝ වෙනත් පුද්ගලයෙකු ගේ නමත් සමඟ නම ඇතුලත් වී ඇති කිසිවකු සමග හෝ තමාට ප්‍රමාණවත් යයි හැඟෙන හේතුන් උඩ මාතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විරුද්ධවන කවරකු සමඟ හෝ ගිවිසුමකට නො බැඳෙනු ඇත.

10. ටෙන්ඩර් භාරගැනීමේ අවසාන දිනය දක්වා ඕනෑ ම දිනයක කාර්යාලීය වේලාවන් තුළ දී සැලැසුම් පරීක්ෂා කර බැලීමට මාතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් ටෙන්ඩර්කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් වැඩ විස්තර පත්‍රිකාවෙහි ඇතුලත් කළයුතු විස්තර ප්‍රමාණවත් ලෙස සඳහන් නොකිරීම නිසා, ටෙන්ඩර් පත්‍රිකාවල ඇති වන වැරදි ගැන දෙපාර්තමේන්තුව වග නොකියනු ඇත. යෝජිත ස්ථානයත් සැලැසුම් ආදියත් පරීක්ෂා කර බැලීමෙන් ද, වෙනත් අවශ්‍ය වැඩ විස්තර ගැන කාර්යාලීය වේලාවන් තුල දී මාතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් විමසීමෙන් ද ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය අවශ්‍ය සේවය කුමක් දැයි හොඳින් වටහාගත යුතුය.

11. තෝරා ගත් ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදවිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණය. "ලාංකික" යනුවෙන් අදහස් වනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියන් වූ අයයි.

12. තෝරා ගනු ලැබූ කොන්ත්‍රාත්කරු ආණ්ඩුව සඳහා හෝ ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින මාතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන සමග ගිවිසුමකට ඇතුලත් විය යුතුය. "ගොවිජන සේවා සහකාර කොමසාරිස්" යනුවෙන් හැඳින්වෙනුයේ දැනට ලංකාණ්ඩුව යටතේ එම තනතුර දරණ නිලධාරි තැනය. ගිවිසුම්පත්‍රයේ අඩංගුවිය යුතු මුද්දර කොන්ත්‍රාත්කරු විසින් සැපයිය යුතුය.

13. මාතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන වෙනත් නිලධාරියෙකු විසින් 1969.6.24 වැනි දින පස්වරු 2.30 ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේ දී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර්කරුවන්ගේ දැනගැනීම සඳහා ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා ඒවායේ සම්පූර්ණ මිල ගණන් කියවනු ලැබේ. වැඩි විස්තර කියවීමක් හෝ දැන්වීමක් හෝ නොකරනු ඇත. ඕනෑ ම ටෙන්ඩර් කරුවෙකුට මුලු ගණන් පරීක්ෂා කිරීමට වුවමනා නම් මුල් ටෙන්ඩර් පත්‍රයේ අවසාන පිටුව බැලීමෙන් එසේ කළ හැක.

14. ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ සියලුම මිල ගණන් ටෙන්ඩර් විවෘත කළ දින පටන් මසක් ගත වනතුරු වලංගුව තිබිය යුතුය.

කේ. ඒ. පෙරේරා,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්,
මාතර දිස්ත්‍රික්කය.

මාතර දිස්ත්‍රික්කයේ
ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ
කාර්යාලය.
1969 මැයි මස 18 වැනි දින දී ය.

5-931—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

### සුළු වාරි කර්මාන්ත

මෙම කාර්යාලයේ, පළාතේ කච්චේරියේ, ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන්ගෙන් විවිධ සේවා සමුපකාර සමිති වලින් හා ග්‍රාම සංවර්ධන සමිති වලින් පහත සඳහන් සුළු වාරි කර්මාන්ත සඳහා මෙයින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

**හංවැල්ල ගම්වගා නිලධාරි කොට්ඨාශයේ බරුව සංවර්ධන ව්‍යාපාරය**

1. අංක 306 බටවල ගොවිකාරක සභා ප්‍රදේශයේ මාවතකඩ ඇල හරහා යෝජිත සුළු ගංවතුර නැවැත්වීමේ නිර්මාණකය තැනීම.

2. අංක 306 බටවල ගොවිකාරක සභා ප්‍රදේශයේ අලවත්ත ඇල හරහා යෝජිත සුළු ගංවතුර නැවැත්වීමේ නිර්මාණකය තැනීම.

3. අංක 306 බටවල ගොවි කාරක සභා ප්‍රදේශයේ අරමස්කඩ ඇල හරහා යෝජිත සුළු ගංවතුර නැවැත්වීමේ නිර්මාණකය තැනීම.

4. අංක 306 බටවල ගොවි කාරක සභා ප්‍රදේශයේ පුස්සැලිඔය වම් ඉවුරේ ගංවතුර නැවැත්වීමේ බැම් තැනීම.

2. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ඒවා ඉදිරිපත් කළ යුත්තේ කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවලය. නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් නොකරනු ලබන හෝ මේ කොන්දේසිවලට සම්පූර්ණයෙන් එකඟ නොවන කිසිම ටෙන්ඩරයක් හෝ සලකා බලනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර 1969 ජූනි මස 10 දින දවල් 12 දක්වා කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක. කච්චේරියේ රු. 10 ක් (රුපියල් දහයක්) තැන්පත් කොට ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ටෙන්ඩර්කරු විසින්ම අත්සන් කර තිබිය යුතුය. මිල ගණන් හා ප්‍රමාණයන් ඉලක්කම්වලින් මෙන්ම වචන වලින්ද දැක්විය යුතුය. මිල ගණන් හා ප්‍රමාණයන් ගණිතානුකූලවද, නිවැරදි විය යුතු අතර දක්වන ලද ගණන්වල සංශෝධනයන් කර තිබේ නම්, ඒ සෑමෙකක්ම, ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන යොදා සහතික කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර අත්සන් කොට, දින යොදා, සීල් තබන ලද ලියුම් කවරවල බහා, කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ ලිපිනයට යැවිය යුතුය. ටෙන්ඩරය බහා එවන ලියුම් කවරයේ උඩ, වම් කෙළවරේ "......සුළු වාරි කර්මාන්තය කිරීම සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර, 1969 ජූනි මස 11 දින දවල් 12 ට පෙර කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනට ලැබෙන පරිදි, ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. නො එසේ නම්, ඒ සඳහා මේ කාර්යාලයේ තබා ඇති "ටෙන්ඩර් පෙට්ටියට" දැමිය යුතුය.

5. තෝරාගත් ටෙන්ඩර්කරුට ඒ බව කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද ටෙන්ඩර් භාරගන්නා වූ නිලධාරි තැන විසින් හෝ ලියාපදිංචි ලිපියකින් දැනුම් දෙනු ඇත. මේ දැනුම් දීම නිකුත් කළ දින සිට, දස දිනක් ඇතුළත දී එම ටෙන්ඩර්කරු විසින් කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන සමග ඒ සම්බන්ධයෙන් ගිවිසුමකට ඇතුළත් විය යුතුය. නියමිත පරිදි හා සතුටුදායක ලෙස වැඩය නිම කරන වගට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් 10% ක් ටෙන්ඩර්කරු විසින් තැන්පත් කළ යුතුය. ගිවිසුම අත්සන් කළ පසු සියළුම ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ඇත.

6. පිළිගත් ටෙන්ඩරය අනුව ගිවිසුමකට ඇතුළත් වන ලෙස තෝරාගත් ටෙන්ඩර්කරුට දැන්වීමෙන් පසුව ද, එසේ කිරීමට ඔහු අසමත් වුවොත් ඔහුගේ ටෙන්ඩර් ඇප මුදල රාජසන්තක කොට ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ නාම ලේඛනයට ඇතුළත් කිරීමට ක්‍රියා කරනු ඇත.

7. කිසිම හේතුවක් නොදක්වා, ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් හෝ ප්‍රතික්ෂේප කිරීමේ හෝ ඕනෑම ටෙන්ඩර් පත්‍රයක ඕනෑම කොටසක් පිළිගැනීමේ හෝ බලය රජයට ඇත.

8. කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ හෝ ඔහු විසින් බලය පවරන ලද නියෝජිතයාගේ හෝ අවසරයක් නොමැතිව කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට නොපැවරිය යුතුය.

9. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ නාම ලේඛනයට තනිව හෝ වෙනත් පුද්ගලයෙකුගේ නමත් සමග නම ඇතුළත් වී ඇති කිසිවකු සමග හෝ තමාට ප්‍රමාණවත් යයි හැඟෙන හේතුන් උඩ කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විරුද්ධ වන කවරෙකු සමග හෝ ගිවිසුමකට නොබැඳෙනු ඇත.

10. ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය දක්වා ඕනෑම දිනයක කාර්යාලීය වේලාවන් තුළදී සැලසුම් පරීක්ෂා කර බැලීමට කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් ටෙන්ඩර් කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් වැඩ විස්තර පත්‍රිකාවෙහි ඇතුළත් කළ යුතු විස්තර ප්‍රමාණවත් ලෙස සඳහන් නොකිරීම නිසා ටෙන්ඩර් පත්‍රිකාවල ඇති වන වැරදි ගැන දෙපාර්තමේන්තුව වග නොකියනු ඇත. යෝජිත ස්ථානයන්, සැලසුම් ආදිය පරීක්ෂා කර බැලීමෙන්ද, වෙනත් අවශ්‍ය වැඩි විස්තර ගැන කාර්යාලීය වේලාවන් තුළදී කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් විමසීමෙන්ද, ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය, අවශ්‍ය සේවය කුමක්දැයි හොඳින් වටහා ගත යුතුය.

11. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණය. "ලාංකික" යනුවෙන් අදහස් වන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියන් වූ අය යි.

12. තෝරා ගනු ලැබූ කොන්ත්‍රාත්කරු ලංකාණ්ඩුව සඳහා හෝ ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් සමග ගිවිසුමකට ඇතුළත් විය යුතුය. "ගොවිජන සේවා සහකාර කොමසාරිස්" යනුවෙන් හැඳින් වෙන්නේ දැනට ලංකාණ්ඩුව යටතේ එම තනතුරු දරණ නිලධාරි තැනය. ගිවිසුම් පත්‍රයේ අඩංගු විය යුතු මුද්දර කොන්ත්‍රාත් කරු විසින් සැපයිය යුතුය.

13. කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන වෙනත් නිලධාරියකු විසින් 1969 ජූනි මස 12 දින පෙ. ව. 9.30 ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර් කරුවන්ගේ දැනගැනීම සඳහා, ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් හා ඒවායේ සම්පූර්ණ මිල ගණන් කියවනු ලැබේ. වැඩි විස්තර කියවීමක් හෝ දැන්වීමක් නොකරනු ඇත. ඕනෑම ටෙන්ඩර් කරුවකුට මුළු ගණන් පරීක්ෂා කිරීමට වුවමනා නම් මුල් ටෙන්ඩර් පත්‍රවල අවසාන පිටුව බැලීමෙන් එසේ කළ හැක.

14. ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ සියළුම මිල ගණන් ටෙන්ඩර් විවෘත කළ දින පටන් මසක් ගතවන තුරු වලංගුව තැබිය යුතුය.

අ. සේ. ගුණතිලක,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්,
කොළඹ දිස්ත්‍රික්කය.

කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා
සහකාර කොමසාරිස් තැන ගේ කාර්යාලය,
1969 මැයි මස 19 දින දීය.

5-1015—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### අළුත්නුවර පශු වෛද්‍ය කොට්ඨාශයේ සංශෝධිත පට්ටි මධ්‍යස්ථාන ගොඩනැගිලි ඉදි කිරීම

බදුල්ල දිස්ත්‍රික්කයේ, අළුත්නුවර ,පශු වෛද්‍ය කොට්ඨාශයේ සංශෝධිත පට්ටි මධ්‍යස්ථානයක ගොඩනැගිලි ඉදිකිරීම සඳහා සීල් තබා එවන ටෙන්ඩර් 1969.6.20 වැනි දින පස්වරු 2.30 දක්වා කොළඹ 1, ඩියුක් වීදියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, සත්ව පාලන හා සෞඛ්‍ය අංශයේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් භාරගනු ලැබේ.

| ස්ථානය | ගොඩනැගිලි පිළිබඳ විස්තර |
|---|---|
| අළුත්නුවර සංශෝධිත පට්ටි මධ්‍යස්ථානය... | ගව මඩුවක් හා නිවාසයක් |

2. පිළිගත් ටෙන්ඩර්කරු කොන්ත්‍රාත්තුව භාර දුන් දින සිට මාස තුනක් ඇතුළතදී සම්පූර්ණ වැඩ නිමවා දෙපාර්තමේන්තුවට භාර දිය යුතු අතර, දෙපාර්තමේන්තුවට ගොඩනැගිලි භාර දුන් දින සිට හය මසක් ගතවන තුරු එකී ගොඩනැගිලි ගැන කොන්ත්‍රාත්කරු වගකිය යුතුය.

3. කොළඹ 1, ඩියුක් වීදියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, සත්ව පාලන හා සෞඛ්‍ය අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂගෙන් ටෙන්ඩර් ෆෝර්ම ලබාගෙන ඒවායේ ටෙන්ඩර් පිළියෙල කොට එවිය යුතුය. ටෙන්ඩර් භාර ගැනීමට නියමිත අවසාන දින දවල් 12 තෙක් ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ.

4. ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලබන්නේ එක් ටෙන්ඩර් ෆෝර්මයක් වෙනුවෙන් රු. 10 බැගින් තැන්පත් කළ බවට මුදල් කුවිතාන්සියක් ඉදිරිපත් කළහොත් පමණි. මෙම මුදල් තැන්පත් කිරීම පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ ඕනෑම කච්චේරියක නැතහොත්, කොළඹ යෝර්ක් වීදියේ, ලංකා බැංකු ශාඛාවේ අංක 37 දරණ කෘෂිකර්ම අධ්‍යක්ෂගේ ගිණුමට කළ හැකිය. බැංකුවේ මුදල් තැන්පත් කරන්නේ නම් අංක 118 දරණ පොදු ආකෘති පත්‍රය සම්පූර්ණ කර බැංකුවට ඉදිරිපත් කළ යුතුය.

5. ටෙන්ඩර්කරුවන් අඩුම වශයෙන් රු. 5,000 කට වත් රජයේ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුව/වාරිමාර්ග දෙපාර්තමේන්තුව/ අධ්‍යාපන දෙපාර්තමේන්තුව හෝ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි කරනු ලැබූවන් විය යුතුය. ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීමේදී මෙම ලියාපදිංචි කිරීමට අදාල සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. ලියාපදිංචි වූ ග්‍රාම සංවර්ධන සමිති හා සමුපකාර සමිති මෙම අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

6. ලබාගත් ටෙන්ඩර් ෆෝර්ම නිසි අයුරු සම්පූර්ණ කර පිටපත් දෙකකින් යුක්තව කවරයක බහා සීල් තබා "සභාපති, ටෙන්ඩර් මණ්ඩලය, සත්ව පාලන හා සෞඛ්‍ය අංශය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ඩියුක් වීදිය, කොළඹ 1" යන ලිපිනයට එවිය යුතුය. ටෙන්ඩර් බහාලන කවරයේ ඉහල වම් කෙළවරේ "අළුත්නුවර ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ටෙන්ඩර්" යන්න ලිවිය යුතුය. අතින්ම ගෙනැවිත් භාර දිය හැකි ටෙන්ඩර්ද පහත සඳහන් පරිදි සකස් කර කොළඹ 1, ඩියුක් වීදියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, සත්ව පාලන හා සෞඛ්‍ය අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය.

7. ටෙන්ඩරයේ කරනු ලබන වෙනස් කිරීම්, කපා හැරීම් ආදිය ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන තබා සහතික කළ යුතුය.

8. ටෙන්ඩර් මිළ ස්ථිර වූවාක් මෙන්ම කිසිම වෙනස් කිරීම් වලට භාජන නොවිය යුත්තේය. ටෙන්ඩර් සලකා බැලීමට හැකි වන පරිදි ඒවා භාර ගැනීම අවසාන වූ දින සිට දින 30 ක් ගතවන තෙක් ආපසු ගත නොහැක්කේය.

9. සාර්ථක ටෙන්ඩර්කරු පිළිගනු ලැබූ ටෙන්ඩරයේ මුළු මුදලින් සියයට පහක් ඇප වශයෙන් තැන්පත් කළ යුතුය. මෙම තැන්පත් මුදල, කොන්ත්‍රාත්තුව සතුටුදායක ලෙස නිමකිරීමෙන් මාස 6 ක් ඉක්ම යාමෙන් පසු ආපසු ගෙවනු ලැබේ.

10. සාර්ථක ටෙන්ඩර්කරු විසින් තම ටෙන්ඩරය පිළිගත් බව දන්වූ ද සිට මාස 3 ක් ඇතුළතදී වැඩ සියල්ලම නිම කළ යුතුය.

11. සාර්ථක ටෙන්ඩර්කරු ඉදිකිරීමේ කටයුතු පැහැර හරින්නේ නම් ඔහුගේ ඇප මුදල රාජසන්තක කරනු ලැබේ. තවද ටෙන්ඩර්කරුගේ නම රජයේ කොන්ත්‍රාත්තු පැහැර හරින්නන්ගේ ලැයිස්තුවටද ඇතුළත් කරනු ලැබේ.

12. කොන්ත්‍රාත්කරු විසින් අළුත්නුවර රජයේ පශු වෛද්‍ය නිලධාරීගේ උපදෙස් පරිදි, ඔහුගේ සතුටට හේතු වන පරිදි ගොඩනැගිලි ඉදිකිරීමේ කටයුතු නිම කළ යුතුය.

13. ටෙන්ඩර් භාර ගැනීමට නියමිත අවසාන දින නියමිත වේලාවට කොළඹ, ඩියුක් වීදියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, සත්ව පාලන හා සෞඛ්‍ය අංශයේදී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. අවශ්‍ය නම් ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ.

14. පිළිගත් ටෙන්ඩර්කරුට ඒ බව දන්වූ දින සිට දින 10 ක් ඇතුළතදී මෙහි 8 වැනි ඡේදයේ සඳහන් ඇප මුදල් තැන්පත් කර ගිවිසුම් පත්‍රයකටද බැඳිය යුතුය. එසේ නොකළහොත් ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක කරනු ලැබේ.

15. කොන්ත්‍රාත්කරු මෙම වැඩ ඉටු කිරීම සඳහා යෙදවිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණි. ලාංකික යන්නෙහි අදහස පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකා පුරවැසිකම ලබා ඇති බවය.

16. 1934 අංක 19 දරණ කම්කරු වන්දි ආඥාපනතේ (117 වැනි අධිකාරිය) යටතේ සේවයෙහි යොදවන කම්කරුවන් වෙනුවෙන් වන්දි ඉල්ලා එවනු ලබන ඉල්ලුම්පත් ගැන වගකීමෙන් කොන්ත්‍රාත්කරු විසින් රජය නිදහස් කළ යුතුය.

17. මෙම ගොඩනැගිලි කළයුතු ස්ථාන, සැලසුම් (PLANS) හා අනිකුත් තොරතුරු අළුත්නුවර රජයේ පශු වෛද්‍ය නිලධාරීගෙන් දැනගත හැකිය.

අබයරත්න බණ්ඩාරනායක,
නියෝජ්‍ය අධ්‍යක්ෂ (සත්ව පාලන හා සෞඛ්‍ය).

1969.5.22,
කොළඹ 1, ඩියුක් වීදියේ,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේදී ය.

5–1160—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### මහඉළුප්පල්ලම පාසැල් ගොවිපලේ ඇති බඩ ඉරිඟු විකිණීම සඳහා ටෙන්ඩර් කැඳවීම

පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (කෘෂිකර්ම, අධ්‍යාපන හා ගොවිපල්) කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් ඉහත සඳහන් ගොවිපලේ තිබෙන බීජ සඳහා නුසුදුසු බඩ ඉරිඟු රාත්තල් 62,832 ක් විකිණීම සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර 1969 ජූනි මස 20 වෙනි දින පෙරවරු 10.30 දක්වා භාර ගනු ලැබේ.

ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට පෙර ඒ ගොවිපලේදී මෙම බඩ ඉරිඟු සතියේ කාර්යාල වේලාවකදී පරීක්ෂා කර බැලිය හැක.

2. අනුරාධපුර ගොවිපල පාලන හා නිෂ්පාදන කාර්යාලයේ පරිපාලන නිලධාරී තැනගෙන් ආකෘති පත්‍ර ලබා ගෙන ටෙන්ඩර් පත්‍ර ඒවායේ එවිය යුතුයි. සියළුම ටෙන්ඩර් පත්‍ර ලියුම් කවරයක බහා මුද්‍රා තබා පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, නියෝජ්‍ය අධ්‍යක්ෂ (කෘෂිකර්ම, අධ්‍යාපන හා ගොවිපලවල්) කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති නමට එවිය යුතු අතර ටෙන්ඩර් බහා එවන කවරයේ වම්පස උඩ කළවරේ "මහඉළුප්පල්ලම පාසැල් ගොවිපලේ බඩ ඉරිඟු මිළදී ගැනීම" යන්න සඳහන් කළ යුතුය.

3. ටෙන්ඩර් පත්‍ර අනුපිටපතකින් යුක්ත විය යුතු අතර, ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් නොඑවතොත් ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් ඒවා පේරාදෙනියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, කෘෂිකර්ම, අධ්‍යාපන හා ගොවිපල් කාර්යාලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂකට අතින්ම භාර දිය යුතුය.

4. ලියාපදිංචි තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කළ දිනයේම ඒ ඒ ටෙන්ඩර් කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වීමට නියමිත දින සිට දින හතරක් ඇතුළත යම් ටෙන්ඩර් කරුවකුට එවැනි දැන්වීමක් නොලැබුනහොත් ඔහු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගෙන් ඒ ගැන කරුණු විමසිය යුතුයි.

5. 1969. 6. 19 වෙනි දින දවල් 12 තෙක් ටෙන්ඩර් ආකෘති පත්‍ර දෙනු ලැබේ. ඒ දීම කරනු ලබන්නේ, ටෙන්ඩර් පත්‍රයක් ඉදිරිපත් කිරීමට රුපියල් විසිපහක (25) මුදලක් තැන්පත් කර ඇති බවට කුවිතාන්සියක් අනුරාධපුර, නව නගරයේ, ගොවිපල පාලන හා නිෂ්පාදන කාර්යාලයේ, පරිපාලන නිලධාරීට ඉදිරිපත් කළ පසුවය. මෙම තැන්පත් කිරීම ඕනෑම කච්චේරියක් හෝ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පේරාදෙනියේ ප්‍රධාන කාර්යාලයේ හෝ කළ හැකිය. පත් කර ගනු ලැබූ ටෙන්ඩර්කරු විසින් නියම කරනු ලබන කාලයක් තුළදී සම්පූර්ණ බඩ ඉරිඟු තොගයේ වටිනාකම එකවර ගෙවා ඒ ගොවිපලින් ඉවත් කර ගත යුතුය. එසේ නොහැකිවුව හොත්, ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වනවාත් හැර, ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවටද ඇතුළත් වීමට ඉඩ ඇත.

6. පිළිනොගන්නා ලද ටෙන්ඩර්කරුවන්ගේ තැන්පත් මුදල් නිදහස් කිරීමට අනුරාධපුර, ගොවිපල පාලන හා නිෂ්පාදන කාර්යාලයේ, පරිපාලන නිලධාරී තැන කටයුතු කරනවා ඇත.

7. නියමිත ආකෘති පත්‍රයේ ලියා නැති නැතහොත් එකී නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටු වී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක්, ටෙන්ඩර් පත්‍රයක් වශයෙන් සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් හා ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාක් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළ හොත් ඒ තැන්වල ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන තැබිය යුතුය.

9. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරනු ලබන මිළ ගණන් යටත් පිරිසෙයින් සති පහකටවත් වෙනස් නොවන ඒවා විය යුතුය.

9. ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලි අකුරින් ටෙන්ඩර් පත්‍රයේ ලියා තිබිය යුතුය.

10. ටෙන්ඩර්කරුවන්ට වුවමනා නම්, ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේදී ඉදිරියේ සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වීමට නියමිත ඉහත කී දින, එකී වේලාවේදී පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (කෘෂිකර්ම, අධ්‍යාපන හා ගොවිපොල) ගේ කාර්යාලයේදී ඒවා විවෘත කරනු ලැබේ.

11. යම්කිසි ටෙන්ඩර්පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර්පත්‍ර ප්‍රතික්ෂේප කිරීමේත්, ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේත් බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙත තබා ගනු ලැබේ.

12. ටෙන්ඩර්කරුට භාර දිය යුතු සියලුම දැන්වීම් ඔහුගේ අතට දුන්නොත් හෝ ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට යැව්වොත් හෝ ඔහුගේ අතටම භාර දුන්නා ලෙස සලකනු ලැබේ.

13. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ එම ලැයිස්තුවේ නම සඳහන් වන කෙනෙකුගේ නම සමග ඇතුළත්වූ හෝ ටෙන්ඩර් මණ්ඩලයට සැහේයයි පෙනී යන විට ටෙන්ඩර් මණ්ඩලය විසින් එකඟ නොවන හෝ කිසිවකු සමග කොන්ත්‍රාත්තුවට බැඳෙනු නොලැබේ.

14. මේ කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩ කරවා ගැනීමට පුහුණු හා නුපුහුණු හෝ දෙවර්ගයේම "ලාංකික" කම්කරුවන් පමණක් යෙදීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟ වන අතර, ඔවුනු පමණක් එසේ නියුක්ත කරනු ලබන්නාහ. ඒ කම්කරුවන් හැකි තරම් දුරටත් එසේ බඳවා ගනු ලබන්නේ වැඩ කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරිනි.

15. කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසිය සපුරාලීමට කොන්ත්‍රාත්කරුවා කිසියම් විධියකින් අසමත් වුවහොත් කොන්ත්‍රාත්තුව අවලංගු වීමට එය තුඩු දෙනවා ඇත. එහෙත් කොන්ත්‍රාත්තුවට එළඹෙන ලද නිලධාරියා විසින් විශේෂ අවස්ථාවලදී ආහාර හා කෘෂිකර්ම අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වරයාගේ එකඟත්වය ඇතිව නිශ්චිත ලියවිල්ලකින් එකී නිලධාරියා විසින් අනුමත කරන ලද "ලාංකික" නොවන කම්කරුවන් නියුක්ත කර වීමට කොන්ත්‍රාත්කරුට බලය දිය හැකිය.

16. එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නැතිව ලාංකික නොවන කම්කරුවන් යෙදවීම තහනම් වන අතර, එය කොන්ත්‍රාත්තුව කඩකිරීමක් ලෙස සලකනු ලැබේ.

17. මේ කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා "ලාංකික" යන්නෙන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලංකාවේ රටවැසියකු අදහස් කරන අතර, එවැන්නෙක් එකී පාඨයට ඇතුළත් වෙයි.

18. මේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයකටම සාධාරණ වූද කම්කරුවනට වේතන ගෙවීම සම්බන්ධයෙන් දැනට බලපවත්වන සහ මින් ඉදිරියට ක්‍රියාත්මක විය හැකි සියලුම රෙගුලාසි වලට අනුකූලවද වේතනයක් ගෙවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟ වෙයි.

19. කොන්ත්‍රාත්කරු විසින් එකී වැඩ කෙරෙහි යොදවනු ලබන කම්කරුවන් සහ සම්බන්ධ ඔහුගේ පොතපත, චැක්රෝල් පොත්, පෙරෙව්වූ පොත් සහ අනිකුත් ලිපි ලේඛන පරීක්ෂා කර බැලීමට කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් විධිමත්ව බලය දෙනු ලැබූ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියකුට ඒවා පරීක්ෂා කිරීමට ඉඩ දීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

20. 1934 අංක 19 දරණ කම්කරු වන්දි ආඥාපනත (117 පරිච්ඡේදය) යටතේ තමාගේ යම්කිසි සේවකයකු වෙනුවෙන් වන්දි ඉල්ලා එවන ඉල්ලුම්පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත්කරු විසින් ආණ්ඩුව නිදහස් කළ යුතුය.

21. මේ පිළිබඳව වැඩි විස්තර ඒ ගොවිපල කළමනාකරුගෙන් විමසන්න.

පී. ටී. ජිනේන්ද්‍රදාස,
නියෝජ්‍ය අධ්‍යක්ෂ (කෘෂිකර්ම, අධ්‍යාපන හා ගොවිපල්).

1969 මැයි මස 18 වැනි දින,
පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ
කෘෂිකර්ම, අධ්‍යාපන හා ගොවිපල් කාර්යාලයේදීය.

5–1014—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

බණ්ඩාරවෙල ගොවිපල් පාලන හා නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1969 ජූනි මස 27 වන දින ප. ව. 2.00 දක්වා උඩරුදල්ල බීජ අර්තාපල් ගොවිපල කළමනාකාර තැනැවෙත ඩීසල් වතුර පොම්පයක් ගෙන ගොස් සැපයීම සඳහා ටෙන්ඩර් භාර ගනු ලැබේ.

**වතුර පොම්පයේ විස්තර.**—අශ්වබල 5 කින් යුක්ත වූ පෙට්‍රල් හෝ ලිස්ටන් ඇන්ජිමකින් ක්‍රියා කළ හැකි පිස්ටන් මාදිලියේ හෝ සෙන්ට්‍රිෆ්‍යුගල් වර්ගයේ වතුර පොම්පයක් විය යුතු අතර, උපරිම ශීර්ෂය අඩි 250 ක්ද දිය උරා ගන්නා පයිප්පය අඟල් 2 කින් ද, දිය බෙදන පයිප්පය අඟල් 1¼ කින්ද යුක්ත විය යුතුය.

2. ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය වන 1969 ජූනි මස 27 වෙනි දින පෙ. ව. 10.00 දක්වා ටෙන්ඩර් ෆෝරම නිකුත් කරනු ලැබේ. මේ ටෙන්ඩර් ෆෝරම ලබා ගැනීම සඳහා එක් එක් ටෙන්ඩර් පත්‍රය වෙනුවෙන් රු. 25 ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය. මේ තැන්පත් කිරීම් ඕනෑම කච්චේරියක හෝ පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ දී හෝ කොළඹ යෝක් වීදියේ පිහිටි ලංකා බැංකුවේ කෘෂිකර්ම අධ්‍යක්ෂකගේ අංක 37 දරන ගිණුමට හෝ කළ හැකිය. ලංකා බැංකුවේ මුදල් තැන්පත් කරන විට රජයේ කාර්යාලවල භාවිත කරන මුදල් භාර දෙන වවුචරය (පොදු 118 ආකෘතිය) සම්පූර්ණ කර බැංකුවට භාර දිය යුතුය.

3. ටෙන්ඩර් ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය. එසේ නැතිනම් බණ්ඩාරවෙල කෘෂිකර්ම කාර්යාලයේ තැන්පත් කර ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහා ලිය හැක.

සියළුම ටෙන්ඩර් "උඩරුදල්ල බීජ අර්තාපල් ගොවිපලට වතුර පොම්පයක් සැපයීම" යනුවෙන් ලිපි කවරයේ වම් කෙළවරේ ඉහල සඳහන් කර "කෘෂිකර්ම කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති, බණ්ඩාරවෙල" යනුවෙන් අමතා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය ලිපි කවරයේ පහළ වම් කෙළවරේ සඳහන් කර එවිය යුතුය.

4. 1969 ජූනි මස 27 වන දින ප. ව. 2 ට සියලුම් ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. අවශ්‍ය නම් ටෙන්ඩර් විවෘත කරන වේලාවට ටෙන්ඩර් කරුවන්ට පැමිණ සිටිය හැක.

5. නියමිත ෆෝරමයේ හෝ එහි අඩංගු විස්තර වලට හෝ අනුකූල නොවන කිසිදු ටෙන්ඩරයක් භාර ගනු නොලැබේ. ටෙන්ඩර් කරන ලද මිළ ගණන් සහ ප්‍රමාණයන් තීන්තෙන් ලිවිය යුතුය. යම් වෙනස් කිරීමක් වෙතොත් එහි කෙටි අත්සන යොදා සත්‍ය බවට ඒත්තු ගැන්විය යුතුය. ටෙන්ඩර් මිළ ගණන් වචනයෙන්ද ඉලක්කමෙන්ද ලිවිය යුතුය.

6. ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ටෙන්ඩර් සමග තමන් සැපයීමට බලාපොරොත්තු වන වතුර පොම්පයේ සියලු විස්තර දැක්වෙන සටහනක් ඉදිරිපත් කළ යුතුය.

7. ටෙන්ඩර් භාර ගන්නා අවසාන දින සිට සති හතරක් (4) ක් ගත වන තුරු ටෙන්ඩර් කරුවන්ගේ පිළිගැනීම් විවෘතව තබා ගත යුතුය.

8. ටෙන්ඩර් භාර ගත් බව දන්වා සති දෙකක් (2) ක් තුළ පිළිගත් ටෙන්ඩර් කරුවන් සැපයීම් නොකළ හොත් ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වනවාත් හැර, ඔහුගේ නම වැඩ පැහැර හරින ලද කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් කිරීමට ඉඩ ඇත.

9. යම්කිසි ටෙන්ඩරයක් හෝ ටෙන්ඩර් සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ බලය ආණ්ඩුව වෙත තබා ගනී.

10. කොන්ත්‍රාත්කරුවාට භාර දිය යුතු සියලුම දැන්වීම් ඔහුගේ අතට දුන හොත් හෝ ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපෑලෙන් යැව්වහොත් ඔහුගේ අතට භාර දුන්නා සේ සැලකිය යුතුය.

11. මේ පිළිබඳ තවත් තොරතුරු අවශ්‍ය නම් බණ්ඩාරවෙල කෘෂිකර්ම කාර්යාලයේ පරිපාලන නිලධාරී තැනගෙන් ලබාගත හැකිය.

පී. ටී. ජිනේන්ද්‍රදාස,
නියෝජ්‍ය අධ්‍යක්ෂක (කෘ. අ. හා. ගො.)
පේරාදෙනිය.

පේරාදෙණියේ දී ය.
69. 5. 18.

5–1012—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

බණ්ඩාරවෙල ගොවිපල් පාලන හා නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1969 ජූනි මස 20 වන දින ප. ව. 2.00 දක්වා හෝටන් තැන්න රජයේ බීජ අර්තාපල් ගොවිපළ කළමනාකාර තැන වෙත ඩීසල් වතුර පොම්පයක් එහි ගෙන ගොස් සැපයීම සඳහා ටෙන්ඩර් භාර ගනු ලැබේ.

**විස්තර.**—පැයකට වතුර ගැළුම් 500 ක් පමණ ඇද දිය හැකි වූ, උරා ඇද ගැන්ම ඇතුළු අඩි 100 ක් පමණ උසට වතුර ගෙන දිය හැකි ඩීසල් ඇන්ජිමකින් ක්‍රියාත්මක වතුර පොම්පයක් සැපයීම. පොම්පය අතින් ක්‍රියාත්මක කරන එකක් විය යුතු අතර පොදු සමතල රාමුවක් සවිකල ඇන්ජිමක් විය යුතුයි. එයට නියමිත උපකරණ පූට් වැල්වය, දිය පෙනේර සහිත පරිපූර්ණ එකක් විය යුතුයි.

2. ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය වන 69. 6. 20 වන දින පෙ. ව. 10.00 වන තුරු ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ. මේ ටෙන්ඩර් පෝරම ලබා ගැනීම සඳහා එක් එක් ටෙන්ඩර් පත වෙනුවෙන් රු. 25 ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය. මේ තැන්පත් කිරීම ඕනෑම කච්චේරියක හෝ පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ දී හෝ කොළඹ යෝක් වීදියේ පිහිටි ලංකා බැංකුවේ ශාඛාවේ අංක 37 දරන අධ්‍යක්ෂකගේ ගිණුමට හෝ කළ යුතුය. ලංකා බැංකුවේ මුදල් තැන්පත් කරන විට රජයේ කාර්යාලවල භාවිතා කරන මුදල් භාර දෙන වවුචරය (පොදු 118 ආකෘතිය) සම්පූර්ණ කර බැංකුවට භාර දිය යුතුය.

3. ටෙන්ඩර් ලේඛනගත තැපැලෙන් එවිය යුතුය. එසේ නැතිනම් බණ්ඩාරවෙල කෘෂිකර්ම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහා ලිය හැක.

සියලුම ටෙන්ඩර් "ඩීසල් ඇන්ජින් ක්‍රියාත්මක වතුර පොම්පය සැපයීම" යනුවෙන් ලිපි කවරයේ වමේ ඉහල සඳහන් කොට "කෘෂිකර්ම කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති—බණ්ඩාරවෙල" යනුවෙන් අමතා ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනය ලිපි කවරයේ පහල වම් කෙළවරේ සඳහන් කර එවිය යුතුය.

4. 1969 ජූනි මස 20 වෙනි දින ප. ව. 2.00 ට සියලුම ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. අවශ්‍ය නම් ටෙන්ඩර් විවෘත කරන වේලාවෙහි ටෙන්ඩර්කරුට පැමිණ සිටිය හැක.

5. නියමිත පෝරමයේ හෝ එහි අඩංගු විස්තර වලට අනුකූල හෝ නොවන කිසිදු ටෙන්ඩරයක් භාර ගනු නොලැබේ. ටෙන්ඩර් කරන ලද මිළ ගණන් සහ ප්‍රමාණයන් පැහැදිළිව තීන්තෙන් ලිවිය යුතු අතර වෙනස් කිරීම් වෙතොත් එහි කෙටි අත්සන යොදා සත්‍ය බවට ඒත්තු ගැන්විය යුතුය. ටෙන්ඩර් මිළ ගණන් වචනයෙන් ද ඉලක්කම්වලින් ද සඳහන් කළ යුතුය.

6. ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ටෙන්ඩර් සමග තමන් සැපයීමට බලාපොරොත්තු වන පොම්පය ගැන සියළු විස්තර දක්වෙන විස්තර සටහනක් ඉදිරිපත් කළ යුතුය.

7. ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනයේ සිට සති හතරක කාලයක් වන තුරු ටෙන්ඩර් කරුවන්ගේ පිළිගැනීම් විවෘතව තබා ගත යුතුය.

8. ටෙන්ඩර් භාර ගත් බව දන්වා සති දෙකක් තුළ පිළිගත් ටෙන්ඩර් කරුවා සැපයීම නොකළ හොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වනවාත් හැර, ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හරින ලද කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් කිරීමට ඉඩ ඇත.

9. යම්කිසි ටෙන්ඩරයක් හෝ ටෙන්ඩර් සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ආණ්ඩුව වෙත තබා ගනී.

10. කොන්ත්‍රාත් කරුවාට භාර දිය යුතු සියලුම දන්වීම් ඔහුගේ අතට දුන හොත් හෝ ඔහු විසින් සඳහන් ලිපිනයට තැපැලෙන් යැව්වහොත් ඔහුගේ අතට භාර දුන්නා සේ සැලකිය යුතුය.

11. මේ පිළිබඳ තවත් තොරතුරු අවශ්‍ය නම් බණ්ඩාරවෙල කෘෂිකර්ම කාර්යාලයේ පරිපාලන නිලධාරීගෙන් ලබාගත හැකිය.

ජී. වී. ජිනේන්ද්‍රදාස,
නියෝජ්‍ය අධ්‍යක්ෂක (කෘ. ආ. හා. ගො.)
**පේරාදෙනිය.**

පේරාදෙණියේ දී ය.
69. 5. 18.

5–1013—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

---

## ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය

### සුළු වාරි කර්මාන්ත සඳහා ටෙන්ඩර් කැඳවීමේ දැන්වීමයි

මෙම කාර්යාලයේ, පලාතේ කච්චේරියේ, ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන් ගෙන් පහත සඳහන් සුළු වාරි කර්මාන්ත සඳහා මෙයින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

| වැඩේ නම | | වැඩෙහි ස්වභාවය | ගොවි කාරක සභා ප්‍රදේශය |
|---|---|---|---|
| **කුච්චවෙලි ආදායම් පාලක කොට්ඨාශය** | | | |
| 1. ඔද්දුපුල්ලුකුලම් | ... | නැවත ගොඩනැගීම ... | වාමලන්කුලම් |
| 2. කුන්දිකුලම් | ... | වැඩිදියුණු කිරීම ... | පුද්දුවෙලිකුලම් |
| 3. ඔඩ්ඩන්කුලම් | ... | ඇල අළුත්වැඩියා කිරීම ... | වන්නියාර්වෙලි |
| 4. පොයිහාසිකුලම් | ... | ස්ලුයිස්එක ගොඩනැගීම | කුසවනාර්තුවෙලි |
| 5. කුසවනාර්තු | ... | ඇනිකට් එක අළුත්වැඩියා කිරීම | කුසවනාර්තුවෙලි |
| 6. ඇනිවිලුන්තකුලම් | ... | වැඩිදියුණු කිරීම ... | තෙන්නමරවාඩි |
| 7. කලිකද්දුකුලම් | ... | ස්ලුයිස් එක අළුත්වැඩියා කිරීම | ආන්දන්කුලම් |
| 8. වාමලන්කුලම් | ... | හරස් පාර ගොඩනැගීම ... | වාමලන්කුලම් |
| **මුතූර් ආදායම් පාලක කොට්ඨාශය** | | | |
| 9. කරාඩිපලිකුලම් | ... | වැඩිදියුණු කිරීම ... | සාම්පූර් |
| 10. වෙප්පන්කුලම් | ... | ස්ලුයිස් එක ගොඩනැගීම | කට්ටපරිච්චාන් |
| **කින්නියා ආදායම් පාලක කොට්ඨාශය** | | | |
| 11. මහමාර්කුලම් | ... | වැඩිදියුණු කිරීම ... | මහමාර් |

2. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ඒවා ඉදිරිපත් කළ යුත්තේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවලය. නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් නොකරනු ලබන හෝ මේ කොන්දේසි වලට සම්පූර්ණයෙන් එකඟ නොවන කිසිම ටෙන්ඩරයක් හෝ සලකා බලනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර 1969 ජූනි මස 17 දින දවල් 12 දක්වා ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක. කච්චේරියේ, රු 10 ක් (රුපියල් දහයක්) තැන්පත් කොට ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුයි.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක් ම ටෙන්ඩර් කරු විසින් ම අත්සන් කර තිබිය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ඉලක්කම්වලින් මෙන් ම වචන වලින් ද දක්විය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ගණිතානුකූලවද නිවැරදි විය යුතු අතර දක්වන ලද ගණන්වල සංශෝධනයක් කර තිබේ නම්, ඒ සැමෙකක්ම; ටෙන්ඩර කරුගේ කෙටි අත්සන යොද සහතික කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර අත්සන් කොට, දින යොදා, සීල් තබන ලද ලියුම් කවර වල බහා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ ලිපිනයට යැවිය යුතුය. ටෙන්ඩරය බහා එවන ලියුම් කවරයේ, උඩ, වම් කෙළවරේ "සුළු වාරි කර්මාන්ත කිරීම සඳහා ටෙන්ඩර පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතුය. ටෙන්ඩර පත්‍ර, 1969 ජූනි මස 19 දින දවල් 12 ට පෙර ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනට ලැබෙන පරිදි, ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය. නො එසේ නම්, ඒ සඳහා මේ කාර්යාලයේ තබා ඇති "ටෙන්ඩර් පෙට්ටියට" දැමිය යුතුය.

5. තෝරාගත් ටෙන්ඩර් කරුට ඒ බව ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද ටෙන්ඩර් භාරගන්නා නිලධාරි තැන විසින් හෝ ලියවිල්ලකින් දැනුම් දෙනු ඇත. මේ දැනුම්දීම නිකුත් කළ දින සිට, දශ දිනක් ඇතුලත දී එම ටෙන්ඩර්කරු විසින් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන සමග ඒ සම්බන්ධයෙන් ගිවිසුමකට ඇතුලත් විය යුතුය. නියමිත පරිදි හා සතුටුදයක ලෙස වැඩය නිම කරන වගට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් 10%ක් ටෙන්ඩර්කරු විසින් තැන්පත් කළ යුතුය. ගිවිසුම අත්සන් කළ පසු සියළුම ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ඇත.

6. පිළිගත් ටෙන්ඩරය අනුව ගිවිසුමකට ඇතුලත් වන ලෙස තෝරාගත් ටෙන්ඩර්කරුට දැන්වීමෙන් පසුව ද, එසේ කිරීමට ඔහු අසමත් වුවොත් ඔහුගේ ටෙන්ඩර ඇප මුදල රාජසන්තක කොට ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ නාමලේඛනයට ඇතුළත් කිරීමට ක්‍රියා කරනු ඇත.

7. කිසිම හේතුවක් නොදක්වා, ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් හෝ ප්‍රතික්ෂේප කිරීමේ හෝ ඕනෑම ටෙන්ඩර් පත්‍රයක ඕනෑම කොටසක් පිළිගැනීමේ හෝ බලය රජයට ඇත.

8. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ හෝ ඔහු විසින් බලය පවරන ලද නියෝජිතයාගේ හෝ අවසරයක් නොමැතිව කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට නොපැවරිය යුතුය.

9. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ නාම ලේඛනයට තනිව හෝ වෙනත් පුද්ගලයෙකුගේ නමත් සමහ නම ඇතුළත් වී ඇති කිසිවකු සමග හෝ තමාට ප්‍රමාණවත් යයි හැඟෙන හේතුන් උඩ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විරුද්ධ වන කවරෙකු සමහ හෝ ගිවිසුමකට නොබැඳෙනු ඇත.

10. ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය දක්වා ඕනෑම දිනයක, කාර්යාලීය වේලාවන් තුලදී සැලසුම් පරික්ෂා කර බැලීමට ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් ටෙන්ඩර් කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් වැඩ විස්තර පත්‍රිකාවෙහි ඇතුළත් කළයුතු විස්තර ප්‍රමාණවත් ලෙස සඳහන් නොකිරීම නිසා ටෙන්ඩර් පත්‍රිකා වල ඇතිවන වැරදි ගැන දෙපාර්තමේන්තුව වග නොකියනු ඇත. යෝජිත ස්ථානයත්, සැලසුම් ආදියත් පරික්ෂා කර බැලීමෙන්ද, වෙනත් අවශ්‍ය වැඩි විස්තර ගැන කාර්යාලීය වේලාවන් තුලදී ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් විමසීමෙන්ද, ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය, අවශ්‍ය සේවය කුමක්දැයි හොඳින් වටහා ගතයුතුය.

11. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණය. '' ලාංකික '' යනුවෙන් අදහස් වන්නේ පරම්පරා වෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියන් වූ අය යි.

12. තෝරා ගනු ලැබූ කොන්ත්‍රාත්කරු ලංකාණ්ඩුව සඳහා හෝ ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් සමහ ගිවිසුමකට ඇතුළත් විය යුතුය. '' ගොවිජන සේවා සහකාර කොමසාරිස් '' යනුවෙන් හැඳින් වෙන්නේ දැනට ලංකාණ්ඩුව යටතේ එම තනතුරු දරණ නිලධාරි තැනය. ගිවිසුම් පත්‍රයේ අඩංගු විය යුතු මුද්දර කොන්ත්‍රාත්කරු විසින් සැපයිය යුතුය.

13. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන වෙනත් නිලධාරියකු විසින් 1969 ජුනි මස 20 දින පෙ.ව. 9.30 ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර් කරුවන්ගේ දැන ගැනීම සඳහා, ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් හා ඒවායේ සම්පූර්ණ මිළ ගණන් කියවනු ලැබේ. වැඩි විස්තර කියවීමක් හෝ දැන්වීමක් නොකරනු ඇත. ඕනෑම ටෙන්ඩර් කරුවකුට මුළු ගණන් පරීක්ෂා කිරීමට වුවමනා නම් මුල් ටෙන්ඩර් පත්‍රවල අවසාන පිටුව බැලීමෙන් එසේ කළ හැක.

14. ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ සියළුම මිළ ගණන් ටෙන්ඩර් විවෘත කළ දින පටන් මසක් ගතවන තුරු වලංගුව තැබිය යුතුය.

ඒ. ෂන්මුගරාජා,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්,
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය.

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ
ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන ගේ කාර්යාලය,
1969 මැයි මස 19 දින දීය.

5–1124/1—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

---

## ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

### සුළු වාරි කර්මාන්ත සඳහා ටෙන්ඩර් දැන්වීමයි

මෙම කාර්යාලයේ, පලාතේ කච්චේරියේ, ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන් ගෙන් පහත සඳහන් සුළු වාරි කර්මාන්ත සඳහා මෙයින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

1. ගෝමරන්කඩවල ඇතා බැඳිවැව මහවැව ... වැඩි දියුණු කිරීම
2. කින්නියා මන්නෙඩෙත්තුකුලම් ... නැවත ගොඩනැගීම
3. කින්නියා පට්ටියනූර්තුකුලම් ... වැඩිදියුණු කිරීම

2. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ඒවා ඉදිරිපත් කළ යුත්තේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවලය. නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් නොකරනු ලබන හෝ මේ කොන්දේසි වලට සම්පූර්ණයෙන් එකඟ නොවන කිසිම ටෙන්ඩරයක් හෝ සලකා බලනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර 1969 ජුනි මස 17 දින දවල් 12 දක්වා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක. කච්චේරියේ, රු.50ක් (රුපියල් පනහක්) තැන්පත් කොට ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක් ම ටෙන්ඩර් කරු විසින්ම අත්සන් කර තිබිය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ඉලක්කම්වලින් මෙන්ම වචන වලින් ද දැක්විය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ගණිතානුකූලවද නිවැරදි වියයුතු අතර දක්වන ලද ගණන්වල සංශෝධනයන් කර තිබේ නම්, ඒ සැමෙකක්ම, ටෙන්ඩර් කරුගේ කෙටි අත්සන යොදා සහතික කළයුතුය.

4. ටෙන්ඩර් පත්‍ර අත්සන් කොට, දින යොදා, සීල් තබන ලද ලියුම් කවරවල බහා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ ලිපිනයට යැවිය යුතුය. ටෙන්ඩරය බහා එවන ලියුම් කවරයේ, උඩ, වම් කෙළවරේ '' සුළු වාරි කර්මාන්තය කිරීම සඳහා ටෙන්ඩර් පත්‍රය'' යනුවෙන් සඳහන් කළයුතුය. ටෙන්ඩර් පත්‍ර, 1969 ජුනි මස 19 දින දවල් 12ට පෙර ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනට ලැබෙන පරිදි, ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. නො එසේ නම්, ඒ සඳහා මේ කාර්යාලයේ තබා ඇති ''ටෙන්ඩර් පෙට්ටියට'' දැමිය යුතුය.

5. තෝරාගත් ටෙන්ඩර් කරුට ඒ බව ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද ටෙන්ඩර් භාරගන්නා වූ නිලධාරිතැන විසින් හෝ ලියවිල්ලකින් දැනුම් දෙනු ඇත. මේ දැනුම්දීම නිකුත් කළ දින සිට, දස දිනක් ඇතු ලත දී එම ටෙන්ඩර්කරු විසින් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන සමහ ඒ සම්බන්ධයෙන් ගිවිසුමකට ඇතුලත් විය යුතුය. නියමිත පරිදි හා සතුදයක ලෙස වැඩය නිම කරන වගට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් 10%ක් ටෙන්ඩර්කරු විසින් තැන්පත් කළ යුතුය. ගිවිසුම අත්සන් කළ පසු සියළුම ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ඇත.

6. පිළිගත් ටෙන්ඩරය අනුව ගිවිසුමකට ඇතුලත් වන ලෙස තෝරාගත් ටෙන්ඩර්කරුට දැන්වීමෙන් පසුව ද, එසේ කිරීමට ඔහු අසමත් වුවොත් ඔහුගේ ටෙන්ඩර් ඇප මුදල රාජසන්තක කොට ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ නාමලේඛනයට ඇතුළත් කිරීමට ක්‍රියා කරනු ඇත.

7. කිසිම හේතුවක් නොදක්වා, ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් හෝ ප්‍රතික්ෂෙප කිරීමේ හෝ ඕනෑම ටෙන්ඩර් පත්‍රයක ඕනෑම කොටසක් පිළිගැනීමේ හෝ බලය රජයට ඇත.

8. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ හෝ ඔහු විසින් බලය සවරන ලද නියෝජිතයාගේ හෝ අවසරයක් නොමැතිව කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට නොපැවරිය යුතුය.

9. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ නාම ලේඛනයට තනිව හෝ වෙනත් පුද්ගලයෙකුගේ නමත් සමහ නම ඇතුළත් වී ඇති කිසිවකු සමහ හෝ තමාට ප්‍රමාණවත් යයි හැඟෙන හේතුන් උඩ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විරුද්ධ වන කවරෙකු සමහ හෝ ගිවිසුමකට නොබැඳෙනු ඇත.

10. ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය දක්වා ඕනෑම දිනයක කාර්යාලීය වේලාවන් තුලදී සැලසුම් පරික්ෂා කර බැලීමට ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් ටෙන්ඩර් කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් වැඩ විස්තර පත්‍රිකාවෙහි ඇතුළත් කළයුතු විස්තර ප්‍රමාණවත් ලෙස සඳහන් නොකිරීම නිසා ටෙන්ඩර් පත්‍රිකාවල ඇතිවන වැරදි ගැන දෙපාර්තමේන්තුව වග නොකියනු ඇත. යෝජිත ස්ථානයත්, සැලසුම් ආදියත් පරික්ෂා කර බැලීමෙන් ද, වෙනත් අවශ්‍ය වැඩි විස්තර ගැන කාර්යාලීය වේලාවන් තුලදී ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් විමසීමෙන්ද, ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය, අවශ්‍ය සේවය කුමක්දැයි හොඳින් වටහා ගතයුතුය.

11. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණය. ''ලාංකික'' යනුවෙන් අදහස් වන්නේ පරම්පරා වෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියන් වූ අය යි.

12. තෝරා ගනු ලැබූ කොන්ත්‍රාත්කරු ලංකාණ්ඩුව සඳහා හෝ ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් සමහ ගිවිසුමකට ඇතුළත් විය යුතුය. ''ගොවිජන සේවා සහකාර කොමසාරිස්'' සනුවෙන් හැඳින් වෙන්නේ දැනට ලංකාණ්ඩුව යටතේ එම තනතුරු දරණ නිලධාරි තැනය. ගිවිසුම් පත්‍රයේ අඩංගු වියයුතු මුද්දර කොන්ත්‍රාත් කරු විසින් සැපයිය යුතුය.

13. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන වෙනත් නිලධාරියකු විසින් 1969 ජුනි මස 20 දින පෙ. ව. 9.30ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර් කරුවන් ගේ දැන ගැනීම සඳහා, ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් හා ඒවායේ සම්පූර්ණ මිළ ගණන් කියවනු ලැබේ. වැඩි විස්තර කියවීමක් හෝ දැන්වීමක් නොකරනු ඇත. ඕනෑම ටෙන්ඩර් කරුවකුට මුළු ගණන් පරීක්ෂා කිරීමට වුවමනා නම් මුල් ටෙන්ඩර් පත්‍ර වල අවසාන පිටුව බැලීමෙන් එසේ කළහැක.

14. ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ සියළුම මිළ ගණන් ටෙන්ඩර් විවෘත කළ දින පටන් මසක් ගතවනතුරු වලංගුව තැබිය යුතුය.

ඒ. ෂන්මුගරාජ,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය.

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ
ගොවිජන සේවා සහකාර කොමසාරිස්තැන ගේ කාර්යාලය,
1969 මැයි මස 19 දින දීය.

5—1124/2—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

## රජයේ විදුලිය දෙපාර්තමේන්තුව

**1969.9.1 දින සිට 1970.8.31 දක්වා වූ කාලය තුළ ලංකාවේ විවිධ කොට්ඨාශයන්හි ආණ්ඩුවේ ගොඩනැගිලිවලට පොයින්ට් ගාස්තු ප්‍රහරණය අනුව විදුලි කම්බි ඇදීම**

පහත සඳහන් කොට්ඨාශ එකක් හෝ ඊට වැඩි ගණනක් වෙනුවෙන් ඉහත සඳහන් කාර්‍ය සම්බන්ධව ටෙන්ඩර් පත්‍ර වර්ෂ 1969 ක්වූ ජූලි මස 7 වෙනි සඳුදා පූ. භා. 10 දක්වා රජයේ විදුලිය දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන (තැ. පෙ. 540, කොළඹ) විසින් භාරගනු ලැබේ :—

1 වෙනි කොට්ඨාශය : කොළඹ ආණ්ඩුවේ ඒජන්ත තුමාගේ පාලන දිස්ත්‍රික්කය.

2 වෙනි කොට්ඨාශය : රත්නපුරේ, කළුතර, ගාල්ල, මාතර සහ හම්බන්තොට ආණ්ඩුවේ ඒජන්තවරුන්ගේ පාලන දිස්ත්‍රික්ක.

3 වෙනි කොට්ඨාශය : බදුල්ල, මොනරාගල සහ නුවරඑළිය ආණ්ඩුවේ ඒජන්තවරුන්ගේ පාලන දිස්ත්‍රික්ක.

4 වෙනි කොට්ඨාශය : නුවර, කෑගල්ල සහ මාතලේ ආණ්ඩුවේ ඒජන්තවරුන්ගේ පාලන දිස්ත්‍රික්ක.

5 වෙනි කොට්ඨාශය : අනුරාධපුරය, පුත්තලම සහ කුරුණෑගල ආණ්ඩුවේ ඒජන්තවරුන්ගේ පාලන දිස්ත්‍රික්ක.

6 වෙනි කොට්ඨාශය : මඩකලපුව, අම්පාරේ, ත්‍රිකුණාමලය සහ පොළොන්නරුව ආණ්ඩුවේ ඒජන්තවරුන්ගේ පාලන දිස්ත්‍රික්ක.

7 වෙනි කොට්ඨාශය : යාපනේ, වව්නියාව සහ මන්නාරම ආණ්ඩුවේ ඒජන්තවරුන්ගේ පාලන දිස්ත්‍රික්ක.

2. ටෙන්ඩර් පත්‍ර සම්බන්ධ ලියකියවිලි කොළඹ පාර්සන්ස් පාරේ පිහිටි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැනගේ කාර්යාලයෙහි දී කියවා බලා ගත හැක. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට අදහස් කරන අයවලුන් විසින් රු. 100 ක මුදලක් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් ද, රු. 5 ක මුදලක් ටෙන්ඩර් ෆෝර්ම සැපයීමේ ගාස්තුව වශයෙන් ද, රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත ගෙවා ලබාගත් කුවිතාන්සි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් ෆෝර්ම සැපයීමේ ගාස්තුව වන රු. 5 හේ මුදල ආපසු ගෙවනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100 ය ටෙන්ඩර් කොන්දේසි උඩ ආපසු ගෙවනු ලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ ඉහත කී අයුරු ලබාගත් ටෙන්ඩර් ෆෝර්ම වලයි. වර්ෂ 1969 ජූලි මස 3 දින අ. භා. 2 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ.

4. වර්ෂ 1969 ජූලි මස 7 වන සඳුදා පූ. භා. 10 ට රජයේ විදුලිය දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගේ කාර්යාලයේ දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවසථාවේදී ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

ඇම්. අයි. අසීස්,
වැඩ බලන විදුලි කර්මාන්ත ප්‍රධාන කළමනාකරු.

1969 මැයි 30 වෙනි දින,
තැ. පෙ. 540,
රජයේ විදුලි දෙපාර්තමේන්තුවේදීය.

5–1002—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

---

## දිසාපති කාර්යාලය—හම්බන්තොට

හම්බන්තොට දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත තැන විසින් අනුමත කරනු ලබන හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගම්වලට බීමට ජලය සැපයීම සඳහා ලොරි අයිතිකරුවන්ගෙන් 1969 ජූනි 25 වැනිදා ප. ව. 3 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. ඉහත සඳහන් වේලාවෙන් පසු ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලබන හෙයින් ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටිය හැක.

2. ටෙන්ඩර් ෆෝර්ම ලබාගැනීම සඳහා හම්බන්තොට කච්චේරියේ හෝ වෙනත් කච්චේරියක රු. 10 ක් තැන්පත් කොට කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය. 1969 ජූනි 12 වැනිදා ප. ව. 3 දක්වා ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර කවරයක බහා මුද්‍රා තබා කවරයේ වම් පැත්තේ ඉහළ කෙළවරේ " හම්බන්තොට දිස්ත්‍රික්කයේ බීමට ජලය සැපයීම " යනුවෙන් සඳහන් කොට, කච්චේරියේ ටෙන්ඩර් පෙට්ටියේ බහාලීම හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් එවීම හෝ කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. සෑම දුවන තනි සැතැප්ම කට අය කරන ගාස්තුව පමණක් ටෙන්ඩර් පත්‍රවල අකුරෙන් හා ඉලක්කමෙන් ලිවිය යුතුය.

4. ජලය සැපයීමට තෝරාගනු ලබන ටෙන්ඩර්කරු විසින් එක ගමනකට යටත් පිරිසෙයින් වතුර ගැළුම් 800 ක් වත් ප්‍රවාහණය කළ යුතුයි. දිසාපතිතැනගේ නියමයන් අනුව සතුටුදායක ලෙස ජලය සැපයීම සඳහා රු. 500 ක ඇප මුදලක් හම්බන්තොට කච්චේරියේ තැන්පත් කළ යුතුය. තෝරාගත් ටෙන්ඩර්කරුට සතුටුදායක ලෙස ජලය සැපයිය නොහැකි වුවහොත් ඉහත කී ඇප මුදල රාජසන්තක කරනු ලැබේ.

5. ජලය සැපයීමට තෝරා ගනු ලබන ටෙන්ඩර්කරු විසින් දිසාපති තැනගේ නියමයන් අනුව ජලය සැපයිය යුතුය. දිනපතාම ජලය සැපයිය යුතුයයි ස්ථිර වශයෙන්ම කිව නොහැකිය. ජලය සැපයීම පෙ. ව. 6 සිට ප. ව. 5 දක්වා කාලය තුළ කළ යුතුය.

6. තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරු තමන් විසින්ම සපයාගනු ලැබූ පිරිසිදු ගැල්වනයිස් ටැංකිවල හෝ බවුසර්වල වතුර පුරවා ගෙන යායුතුය. සාමාන්‍යයෙන් අම්බලන්තොට, නලගම සහ කතරගම ජලය සැපයීමේ මධ්‍යස්ථානවල සිට ජලය ප්‍රවාහණය කළ යුතුවේ. අවශ්‍ය වුවහොත් අන් කිසි ස්ථානයක සිට වුවද ජලය ප්‍රවාහණය කරන ලෙස ආණ්ඩුවේ ඒජන්ත තැන විසින් නියම කරනු ඇත.

7. බෙදීමේ ප්‍රමාණය එක් පුද්ගලයෙකුට දිනකට වතුර ගැළුම් භාගයක් (1/2) ක් වන අතර පවුලකට ගැළුම් පහකට නොවැඩි වන ලෙසය. සෑම ගමකටම දින දෙකකට වරක් වතුර බෙදිය යුතු අතර කලින් කල හම්බන්තොට දිසාපති විසින් නියම කරන ලද ගම්වලට වතුර බෙදිය යුතුය.

8. තෝරා ගනු ලබන ටෙන්ඩර්කරු විසින් සතුටුදායක ලෙස ජලය සැපයීම සඳහා පොරොන්දු පත්‍රයකට අත්සන් තැබිය යුතුය. නිසියාකාර මෙම කාර්‍ය ඉටු කිරීමට තෝරාගත් ටෙන්ඩර්කරුට නොහැකි වූවිට හෝ නිසියාකාර එය කළ නොහැකි බව ඔහු විසින් ලියවිල්ලකින් දැන්වීමෙන් පසු ඔහුගේ තැන්පත් මුදල රාජසන්තකකර යම්කිසි ටෙන්ඩර්කරුවෙකුට තමාගේ අභිමතය පරිදි ජලය ප්‍රවාහණය කිරීමට බලය දීමට ආණ්ඩුවේ ඒජන්ත තැනට බලය තිබේ.

9. කිසිදු කරුණක් නොපෙන්වා ටෙන්ඩර් පත්‍ර එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ සියල්ලම ප්‍රතික්ෂෙප කිරීමට ආණ්ඩුවේ ඒජන්ත තැනට බලය තිබේ.

ර. බ. අලවත්තෙගම,
හම්බන්තොට දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත වෙනුවට.

1969 මැයි මස 17 වැනිදා,
හම්බන්තොට කච්චේරියේදීය.

5–1009—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

---

## ආහාර දෙපාර්තමේන්තුව

පහත සඳහන් ප්‍රයෝජනයට ගත නොහැකි මෝටර් රථවල අමතර කොටස් තොග 11 ක්, මිළදී ගෙනයාම සඳහා ටෙන්ඩර් පත්‍ර 1969 ජූනි 12 දින පස්වරු 2.30 දක්වා කොළඹ, යූනියන් පෙදෙසේ අංක 330 දරණ ස්ථාන යෙහි ආහාර කොමසාරිස් විසින් භාරගනු ලැබේ.

ආහාර කොමසාරිස් වෙත මුදලින් රු. 50 ක් තැන්පත් කිරීමෙන් 1969 ජූනි 11 දින දහවල් 12.00 දක්වා ලබාගත හැකි ෆෝරම්වල ටෙන්ඩර් (පිටපත් දෙකකින් යුක්තව) ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩරය පිළිබඳ සියළුම කොන්දේසි සහ අවශ්‍ය විස්තර ආහාර කොමසාරිස්ගෙන් ලබා ගැනීමට පුළුවන.

ඇම්. බී. සේනානායක,
ආහාර කොමසාරිස් වෙනුවට.

1969.5.15 දින,
කොළඹ,
ආහාර කොමසාරිස් කාර්යාලයේ දී ය.

### ප්‍රයෝජනයට ගත නොහැකි මෝටර් රථ අමතර කොටස්

| කොටස් අංකය | අමතර කොටස් විස්තර | කැලි ගණන |
|---|---|---|
| | **තොග අංක 1** | |
| 1 ... | සිලින්ඩර 6යේ චවලට් පැට්‍රල් ඇන්ජින් ... | 2 |
| | **තොග අංක 2** | |
| 2 ... | ගියර් බොක්ස්, ෆෙඩරල් ... ... | 1 |
| 3 ... | සිලින්ඩර් බ්ලොක්ස්—ඔස්ටින් ... ... | 2 |
| 17 ... | ඩිෆරන්ෂල් හවුසිං—ෆෝර්ඩ්, වී 8 ... ... | 1 |
| | **තොග අංක 3** | |
| 4 ... | රෝඩ් වීල්ස්—ඔස්ටින් වෑන් ... ... | 1 |
| 5 ... | එම —ෆෝර්ඩ් වී 8 ... ... | 52 |
| 6 ... | එම —චවලට් ... ... | 6 |
| 7 ... | එම —මොරිස් කොමර්ෂල් ... ... | 5 |
| 8 ... | එම —ෆෝඩ්සන් තේම්ස් ... ... | 1 |
| 9 ... | වීල් ඩිස්ක්ඩ්- ඉනර්- ඩොජ්- බීජ් ... ... | 62 |
| 10 ... | වීල් ඩිස්ක්ඩ්-අවුටර්-ඩොජ්-බීජ් ... ... | 60 |
| 11 ... | ෆ්ලේන්ජස් ෆොරෝඩ්වීල්ස්—ඔස්ටින් ... | 25 |
| 12 ... | වීල්රිම්සයිඩ්රිංග්ස්—ෆෝර්ඩ් වී 8 ... ... | 115 |
| | **තොග අංක 4** | |
| 13 ... | ෆ්‍රන්ට් බ්‍රෙක්ඩ්‍රම්ස්—ෆෝඩ් වී 8 ... ... | 8 |
| 14 ... | රෙයර් බ්‍රෙක්ඩ්‍රම්ස්—ෆෝඩ් වී 8 ... ... | 2 |
| 15 ... | රෙයර් බ්‍රෙක්ඩ්‍රම්ස්—ෆෝඩ් ඔස්ටින් ... ... | 1 |
| 16 ... | ෆ්‍යුවල් ටෑන්ක්ස්—ෆෝර්ඩ් වී 8 ... ... | 2 |
| | **තොග අංක 5** | |
| 18 ... | රේඩියේටර්ස්—ඇසෝර්ටඩ් (විවිධ) ... ... | 60 |
| | **තොග අංක 6** | |
| 19 ... | ස්ටාටර් මෝටර් ආමේචර්ස් ... ... | 99 |
| 20 ... | ජෙනරේටර් ආමේචර්ස් ... ... | 92 |
| | **තොග අංක 7** | |
| 21 ... | ටයර්—ප්‍රමාණය 9.00—16 ... ... | 17 |
| 22 ... | ටයර්— ප්‍රමාණය 10.50—16 ... ... | 20 |
| 23 ... | ටයර්—ප්‍රමාණය 11.00—16 ... ... | 1 |
| 24 ... | ටයර්—ප්‍රමාණය 6.50—20 ... ... | 6 |
| 25 ... | ටයර්—ප්‍රමාණය 7.00—20 ... ... | 207 |
| 26 ... | ටයර්—ප්‍රමාණය 7.50—20 ... ... | 331 |
| 27 ... | ටයර්—ප්‍රමාණය 8.25—20 ... ... | 261 |

| කොටස් අංකය | අමතර කොටස් විස්තර | කැලි ගණන |
|---|---|---|
| 28 ... | ටයර්—ප්‍රමාණය 9.00—20 ... ... | 4 |
| 43 ... | ටයර් මෆ්ලර්ස් (ෆ්ලැප්ස්) ... ... | 988 |
| | **තොග අංක 8** | |
| 44 ... | ටියුබ්—ප්‍රමාණය 9.00—16 ... ... | 15 |
| 45 ... | ටියුබ්—ප්‍රමාණය 10.50—16 ... ... | 37 |
| 46 ... | ටියුබ්—ප්‍රමාණය 7.00—20 ... ... | 288 |
| 47 ... | ටියුබ්—ප්‍රමාණය 7.50—20 ... ... | 182 |
| 48 ... | ටියුබ්—ප්‍රමාණය 8.25—20 ... ... | 12 |
| 49 ... | ටියුබ්—ප්‍රමාණය 9.00—20 ... ... | 3 |
| | **තොග අංක 9** | |
| 29 ... | ටයර් ප්‍රමාණය 5.20—13 ... ... | 9 |
| 30 ... | ටයර් ප්‍රමාණය 5.60—13 ... ... | 8 |
| 31 ... | ටයර් ප්‍රමාණය 5.90—13 ... ... | 17 |
| 32 ... | ටයර් ප්‍රමාණය 6.40—13 ... ... | 10 |
| 33 ... | ටයර් ප්‍රමාණය 5.50—15 ... ... | 6 |
| 34 ... | ටයර් ප්‍රමාණය 5.50/5.90—15 ... ... | 16 |
| 35 ... | ටයර් ප්‍රමාණය 5.90—15 ... ... | 9 |
| 36 ... | ටයර් ප්‍රමාණය 6.00/6.40—15 ... ... | 22 |
| 37 ... | ටයර් ප්‍රමාණය 6.40/15 ... ... | 41 |
| 38 ... | ටයර් ප්‍රමාණය 5.75/600—16 ... ... | 2 |
| 39 ... | ටයර් ප්‍රමාණය 6.00—16 ... ... | 7 |
| 40 ... | ටයර් ප්‍රමාණය 4.75/5.00—17 ... ... | 14 |
| 41 ... | ටයර් ප්‍රමාණය 1.85—400 ... ... | 7 |
| 42 ... | ටයර් ප්‍රමාණය 7.00—14 ... ... | 1 |
| 50 ... | ටියුබ් ප්‍රමාණය 5.50/5.60/5.75/5.90/15 ... | 18 |
| 51 ... | ටියුබ් ප්‍රමාණය 5.50/5.60/5.75/5.90—16 ... | 13 |
| 52 ... | ටියුබ් ප්‍රමාණය 4.75/5.00—17 ... ... | 5 |
| 53 ... | ටියුබ් ප්‍රමාණය 1.85—4.00 ... ... | 1 |
| | **තොග අංක 10** | |
| 54 ... | බැටරි—වෝල්ට්ස් 12 ... ... | 53 |
| 55 ... | බැටරි—වෝල්ට්ස් 06 ... ... | 629 |
| | **තොග අංක 11** | |
| 56 ... | ඉටිරෙදි (ටාපෝලින්ස්) ... ... | 204 |
| 57 ... | පැති ආවරණ රෙදි (සයිඩ් කර්ටින්ස්) ... | 216 |
| 58 ... | ආසන මෙට්ට (සීට් කුෂන්ස්) ... ... | 462 |

5–1075—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

## දිසාපති කාර්යාලය—මොණරාගල

### ජීප් රථයක් විකිණීම සඳහා මිල ගණන් කැඳවීම

ලියාපදිංචි අංක 1 ශ්‍රී 9350 දරණ ' වීලීස් ' වර්ගයේ ජීප් රථය මිළයට ගෙන ඉවත ගෙන යාම සඳහා, මිළ ගණන් අඩංගු ටෙන්ඩර් පත්‍ර මොණරාගල දිසාපති විසින් 1969. 6. 26 වැනි දින දහවල් 11.30 වන තෙක් භාරගනු ලැබේ.

2. මොණරාගල දිසාපති කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘතිවල මිල ගණන් ඉදිරිපත් කළ යුතුය. අනුමත ආකෘතිවල නොවන මිළ ගණන් සළකා බලනු නොලැබේ. මෙම ආකෘති පත්‍ර සඳහා මෙම කාර්යාලයේ ඉහ් ඕනෑම කච්චේරියක රු. 50 ක් තැන්පත් කොට ලබා ගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ හොත් පමණක් 1969.6.24 වැනි දින පෙරවරු 12.00 දක්වා ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ.

3. මිළ ගණන් පිළිගත් බව දැනුම් දීමෙන් පසු දින පහක් (5) ඇතුලත රථය සඳහා ඉදිරිපත් කරන ලද සම්පූර්ණ වටිනාකම තැන්පත් කිරීමට නොහැකිවූ හෝ පැහැර හරින ලද හෝ අයගේ ටෙන්ඩර් තැන්පත් මුදල් රාජසන්තක කරනු ලැබේ.

4. සාර්ථක වූ ටෙන්ඩර්කරු, වටිනාකම තැන්පත් කරනු ලබන දින යේම රථය ගෙන යා යුතුය.

5. කිසිම විමසීමක් නොමැතිව මිළ ගණන් එකක් හෝ සියල්ල ප්‍රතික්ෂේප කිරීමට, මොණරාගල දිසාපති ට සම්පූර්ණයෙන්ම අයිතිය ඇත.

6. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම බහා එවන කවරය වම්පස උඩ කෙළවරේ " ජීප් රියක් මිළයට ගැනීම සඳහා මිළ ගණන් " යනුවෙන් සඳහන් කර ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ මොණරාගල දිසාපති කාර්යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහා ලීම හෝ කළ හැකිය.

7. මොණරාගල දිසාපති කාර්යාලයේ දී කාර්යාලීය වේලාවන් ඇතුලත මෙම ජීප් රථය පරීක්ෂාකර බැලිය හැක.

8. 1969.6.27 වැනි දින පෙරවරු 10.00 ට ටෙන්ඩර් විවෘත කරන අතර, එම අවසථාවේ දී ටෙන්ඩර්කරුවනට පැමිණ සිටිමට අවසර දෙනු ලැබේ.

9. තවද, වැඩි විස්තර කාර්යාලීය වේලාවන් ඇතුලත මොණරාගල දිසාපති කාර්යාලයෙන් ලබා ගත හැක.

පී. ජී. පුංචිහේවා,
මොණරාගල දිස්ත්‍රික්කයේ දිසාපති.

1969. 5. 18 වැනි දින,
මොණරාගල දිසාපති කාර්යාලයේ දීය.

5–941—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

## ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

මස්කෙළිය විදුලි බල පෝෂ කර්මාන්ත ගොඩනැගිලි ඉදි කිරීම සඳහා කොළඹ 7, ටොරින්ටන් චතුරශ්‍රයේ ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1969 ජූනි 21 වැනි දින පෙරවරු 10 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. පහත සඳහන් දෙපාර්තමේන්තුවක රු. 1,00,000 කට හෝ එසට වැඩි මුදලකට හෝ ගොඩනැගිලි කොන්ත්‍රාත් වැඩ සඳහා ලියාපදිංචි වී ඇති ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවන්ට මෙයට සහභාගි විය හැක.

1. රජයේ වැඩ දෙපාර්තමේන්තුව.
2. වාරිමාර්ග දෙපාර්තමේන්තුව.
3. දුම්රිය දෙපාර්තමේන්තුව.
4. අධ්‍යාපන දෙපාර්තමේන්තුව.
5. ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු දෙපාර්තමේන්තුව.

3. මෙම කොන්ත්‍රාත්තුවට සහභාගි වීමට කැමති කොන්ත්‍රාත්කරුවන් විසින් රු. 100 ටෙන්ඩර් තැන්පත් මුදලක් මෙම දෙපාර්තමේන්තුවේ හෝ කොළඹින් පිට කච්චේරියක හෝ තැන්පත් කොට 1969 ජූනි මස 20 දින පෙරවරු 12 ට පෙර කුවිතාන්සි හා ලියාපදිංචිය ඉදිරිපත් කර ටෙන්ඩර් පත් ලබා ගත යුතු වේ.

පී. එච්. පී. ද සිල්වා,
අධ්‍යක්ෂක,
ග්‍රාම සංවර්ධන හා කුඩා කර්මාන්ත
දෙපාර්තමේන්තුව.

යොමුව : සීඒ/සී/190,
1969 මැයි 17,
කොළඹ 7.

5–944—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

---

## ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

කිරිඳිවැල රජයේ පෝෂකර්ම පාසැල් ගොඩනැගිලි ඉදි කිරීම සඳහා කොළඹ 7, ටොරින්ටන් චතුරශ්‍රයේ ග්‍රාම සංවර්ධන හා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1969 ජූනි 21 වැනි දින පෙරවරු 10 දක්වා ටෙන්ඩර් භාර ගනු ලැබේ.

3. ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල වන රුපියල් 50 සහ ටෙන්ඩර් ගාස්තු වශයෙන් රුපියල් 10 ක් ද කොළඹ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරීගේ කාර්යාලයේ තැන්පත් කර ලබා ගත් රිසිට් පත්‍ර පහත සඳහන් ඉංජිනේරු තැන වෙත 1969 ජූනි මස 12 වැනි දින පස්වරු 4 ට පෙර ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම ලබා ගත හැකිය.

4. මේ සඳහා තවත් විස්තර හා ටෙන්ඩර් පෝර්ම ද කොළඹ ඩී. ආර්. විජේවර්ධන මාවතේ පිහිටි දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉන්ජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැකිය.

ජේ. පෝල් සේනාරත්න,
ප්‍රධාන ඉන්ජිනේරු තැන,
ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව.

තැ. පෙ. 370,
කොළඹ,
1969 මැයි 19 වැනි දින.

5–1156/2—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉන්ජිනේරු කාර්යාලයීය "ටෙන්ඩර්" මණ්ඩලයේ සභාපතිතැන විසින් අඟල් 1½ කළුගල් කියුබ් 500 ක් රත්මලානට සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1969 ජූනි මස 27 වැනි සිකුරාදා පස්වරු 2.30 දක්වා භාර ගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමට පෙර ඉහත සඳහන් සේවාවන් භාරගෙන සාර්ථක අන්දමින් කරගෙන යාමට මුදල් අතින් හැකියාවක් තිබෙන බව පෙන්වීමට ටෙන්ඩර්කරුවන් විසින් අවශ්‍ය ලියවිලි ඉදිරිපත් කළ යුතුයි.

3. ටෙන්ඩරය සඳහා තැන්පත් කළයුතු මුදල වන රුපියල් 50 සහ ටෙන්ඩර් ගාස්තු වශයෙන් රුපියල් 10 ක් ද කොළඹ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරීගේ කාර්යාලයේ තැන්පත් කර ලබා ගත් රිසිට් පත්‍ර පහත සඳහන් ඉන්ජිනේරු තැන වෙත 1969 ජූනි මස 12 වැනි දින පස්වරු 4 ට පෙර ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝරම ලබාගත හැකිය.

4. මේ සඳහා තවත් විස්තර හා ටෙන්ඩර් පෝරම ද කොළඹ ඩී. ආර්. විජේවර්ධන මාවතේ පිහිටි දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉන්ජිනේරුතැනගේ කාර්යාලයෙන් ලබාගත හැකිය.

ජේ. පෝල් සේනාරත්න,
ප්‍රධාන ඉන්ජිනේරු තැන,
ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව.

තැ. පෙ. 370,
කොළඹ.
1969 මැයි 19 වැනි දින.

5–1159—69.5.30 දින අංක 14,856 දරණ ගැසට් පත්‍රය

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1969 ජූනි මස 20 වැනි සිකුරාදා පෙ. ව. 10.30 වනතෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර ගම්පහ අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාර ගනු ලැබේ :—

| පාඨශාලාවේ නම | | වැඩයේ ස්වභාවය |
|---|---|---|
| 1. කොළ/මීනුවන්ගොඩ මහා විද්‍යාලය | මධ්‍ය | පන්ති කාමර ගොඩනැගිල්ල |
| 2. කොළ/මීනුවන්ගොඩ මහා විද්‍යාලය | මධ්‍ය | විද්‍යාගාරයේ වැඩි දියුණුව |
| 3. තුඩැල්ල ක්‍රිස්තුරාජ විද්‍යාලය | | පන්ති කාමර ගොඩනැගිල්ල |
| 4. කැලණිය ගුරුකුල විද්‍යාලය | මහා | වැට |
| 5. කොළ/හීනටියන විද්‍යාලය | මහා | ගොඩනැගිලි අළුත්වැඩියාව |
| 6. කොළ/කැලණිය මහා විද්‍යාලය | ගුරුකුල | විද්‍යාගාරය |
| 7. කොළ/දළුගම කනිෂ්ඨ විද්‍යාලය | කොහල්විල | ගොඩනැගිලි අළුත්වැඩියාව |

සංලක්ෂය :—කොළ/කොළඹ උතුර දිස්ත්‍රික්කය.

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේ හෝ ගම්පහ අධ්‍යාපන කාර්යාලයේ හෝ එක් වැඩක් සඳහා රු. 100 බැගින් මුදල් තැන්පත් කර එම කුවිතාන්සිය ගම්පහ, ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන් පහත සඳහන් මුදල්වලට හෝ ඊට වැඩි මුදලකට හෝ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1969 ජූනි මස 19 වැනි බ්‍රහස්පතින්දා දවල් 12 දක්වා ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ. චෙක්පත්, මුදල් ඇනවුම්, තැපැල් ඇනවුම් ආදිය භාරගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාරදීමේ කුවිතාන්සි කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ ගම්පහ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ ගෙන් හෝ ලබාගත හැක. මුදල් භාරදීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියා පදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක්ය.

**අවශ්‍ය ලියාපදිංචිය :**

අංක 1-5 සහ 7 සඳහා රු. 15,000 හෝ ඊට වැඩි ගණනකට
අංක 6 සඳහා රු. 25,000 හෝ ඊට වැඩි ගණනකට

3. දෙවැනි ඡෙදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයන්ට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වී ඇති අනුමත සමිතිවලටද ටෙන්ඩර් පත්‍ර මේ වැඩ සඳහා එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍ය වේ. ඔවුන් දෙවැනි ඡෙදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යු.

4. ටෙන්ඩර් පත්‍ර 2 වැනි හා 3 වැනි ඡෙදවල සඳහන් පරිදි ගම්පහ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ ගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුයි. මොහුගෙන් වැඩය සම්බන්ධ සියළු විස්තර දැනගත හැකි අතර සැලස්ම ආදියද ලබා ගත හැක. තැපැලෙන් එවන ටෙන්ඩර් පත් ලියාපදිංචි තැපැලෙන් ගම්පහ අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය. තැපැලෙන් නොඑවන ටෙන්ඩර් පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් පුද්ගලිකව ගම්පහ අධ්‍යාපන කාර්යාලයේ කාර්යාල සහකාර වෙත භාර දිය යුතුයි. එසේ භාර දුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුයි.

5. 1969 ජූනි මස 20 වැනි සිකුරාදා පෙ. ව. 10.30 ට ගම්පහ අධ්‍යාපන කාර්යාලයේදී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් හා මිල ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර්පත් භාර ගැනීම අවසන් කල දින සිට සති හයක් ගතවන තුරු තමන් සඳහන් කරන ලද මිල ගණන් වලට එම වැඩය කිරීමට ටෙන්ඩර්කරුවන් කැමති විය යුතුයි.

7. තවත් අවශ්‍ය විස්තර වෙතොත් ගම්පහ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගේ කාර්යාලයෙන් ලබා ගත හැක. ටෙන්ඩර් ලියවිලි පරීක්ෂා කර බැලීම සඳහා මෙම කාර්යාලයේ තබා ඇත.

8. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේදී 66. 9. 30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව, කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචි කිරීම් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය මගින් කරන ලද ලියා පදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සලකනු ලැබේ.

ඩබ්ලිව්. ඒ. ජේ. ඩබ්ලිව්. ජයතිලක,
ගම්පහ ප්‍රදේශයේ
ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ.

1969 මැයි මස 20 වැනි දින,
ගම්පහ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදීය.

5–1048—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

වැල්ලවත්ත ආහාර ගබඩාවට මායිම් තාප්පයක් ඉදිකිරීම සඳහා වූ ටෙන්ඩර් පත්, අධිකාරි ඉංජිනේරු ගොඩනැගිලි ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපතිවරයා විසින් වෂී 1969 ජූනි මස 18 වැනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාරගනු ලැබේ.

2. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු ගොඩනැගිලි වරයාගෙන් ලබාගත් ආකෘති පත්වල ටෙන්ඩර් පත් පිළියෙල කොට අනු පිටපතක්ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගතහැකි වන අතර, සැලැස්මද ඔහුගේ කායශීලයේදී බලා ගැනීමට පිළිවන.

3. ර. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 45,000ක්ට *නොඅඩු ගණනකට ලියා පදිංචිවූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් පත් තැන්පත් මුදල වන රු. 50ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය වෂී 1969 ජූනි මස 12 වැනි සිකුරාදා පස්වරු 4.30ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් එවීමට සුදුසු වනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාද වී අයදුම් කරන්නන් විසින් එක් දින කට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමා වීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරි තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර් පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතුවේ.

5. " ටෙන්ඩර් ලබාගැනීමට බලාපොරොත්තුවන අය, ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවස්ථාවේදී, දැනට කර ගෙන යන වැඩ පිළිබඳ සියලු විස්තර අඩංගු කළ යුතු ආකෘති පත්‍ර නිකුත් කරන නිලධාරියාගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය."

6. ටෙන්ඩර් තැන්පත් මුදල් කොළඹ කොටුවේ ර. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්‍යාලයේදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

පී. නඩරාජා,
රජයේ වැඩ අධ්‍යක්‍ෂ වෙනුවට (අධිකාරී),
ප්‍රධාන නිර්මාණ/ප්‍රධාන ඉංජිනේරු ගොඩනැගිලි.

ප්‍රධාන කාර්යාලය, කොළඹ 1,
අධිකාරී (ප්‍රධාන නිර්මාණ) ප්‍රධාන ඉංජිනේරු ගොඩනැගිලි කාර්‍යාලය,
ටොරින්ටන් චතුරශ්‍රය, කොළඹ 7,
1969.5.18.

5–1055—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

මරදන්කඩවෙල-හබරණ-වාලච්චේනෙහි පාරේ 43 සහ 45 දරණ සැතපුම්වලට ' සිල් කෝට් ' වැඩ සඳහා අඟල් ½ ගේ කලු ගල් කියුබ් 89.00 ක් සැපයීම සහ ගෙනගොස් භාරදීම සඳහා වූ ටෙන්ඩර් පත්, මඩකලපුවේ, නැගෙනහිර කොට්ඨාශයේ අධිකාරී ඉංජිනේරු කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපතිවරයා විසින් වර්‍ෂ 1969 ජූනි මස 18 වැනි බදාදා පෙරවරු 11 වන තෙක් භාර ගනු ලැබේ.

2. පොළොන්නරුවේ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරුවරයාගෙන් ලබාගත් ආකෘති පත්වල ටෙන්ඩර් පත් පිළියෙල කොට අනු පිටපතක් ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිවන අතර, සැලැස්මද ඔහුගේ කාර්යාලයෙහිදී බලා ගැනීමට පිළිවන.

3. ර. වැ. දෙපාර්තමේන්තුවේ මාර්ග වැඩ සඳහා රුපියල් 12,000 කට නොඅඩු ගණනකට ලියා පදිංචිවූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් පත් තැන්පත් මුදල වන රු. 25ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය වර්‍ෂ 1969 ජූනි මස 6 වැනි සිකුරාදා පස්වරු 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ ටෙන්ඩර් පත් එවීමට සුදුසු වනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාද වී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන ප්‍රමාවීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරී තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර් පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතු වේ.

5. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ර. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කල හැක.

6. ටෙන්ඩර් ලබාගැනීමට බලාපොරොත්තු වන අය ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවස්ථාවේදී දැනට කරගෙන යන වැඩ පිළිබඳ සියලු විස්තර අඩංගු කළ යුතු ආකෘති පත්‍ර නිකුත් කරණ නිලධාරියාගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුයි.

ටී. බී. පී. සමරවික්‍රම,
අධිකාරී/ඉංජිනේරු, නැ. කො.

අධිකාරී,
ඉංජිනේරු කාර්යාලය, නැ. කො.,
මඩකලපුව,
1969.5.13

5–1023—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

තලෙයිමන්නාරමේ රේගු නිවාස 3 ක එකතු කිරීම් හා වැඩි දියුණු කිරීම් ඇතුලු ආරක්‍ෂක බැම්ම සහ මායිම් තාප්පය තැනීම සඳහා වූ ටෙන්ඩර් පත්, කොළඹ 1, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්‍යාලයේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපති වරයා විසින් වර්‍ෂ 1969 ජූලි මස 2 වැනි බදාදා පෙරවරු 11 වන තෙක් භාර ගනු ලැබේ.

2. මන්නාරමේ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරුවරයාගෙන් ලබාගත් ආකෘති පත්වල ටෙන්ඩර් පත් පිළියෙල කොට අනුපිටපතක් ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකි වන අතර, සැලැස්මද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පිළිවන.

3. ර. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 1,32,000 කට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් පත් තැන්පත් මුදල වන රු. 200 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය වර්‍ෂ 1969 ජූනි මස 13 වැනි සිකුරාදා පස්වරු 1 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් එවීමට සුදුසු වනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාද වී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමා වීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරී තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර් පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතු වේ.

5. ටෙන්ඩර් ලබා ගැනීමට බලාපොරොත්තුවන අය, ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවසථාවේදී, දැනට කරගෙන යන වැඩ පිළිබඳ සියලු විස්තර අඩංගු කළ යුතු ආකෘති පත්‍ර, නිකුත් කරන නිලධාරියාගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

6. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ර . වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

පී. ගුණරත්නම්,
රජයේ වැඩ අධ්‍යක්‍ෂ වෙනුවට.

ර. වැ. දෙ. ප්‍රධාන කාර්යාලය,
කොළඹ 1.
1969.5.22.

5–1149—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

---

## දිසාපති කාර්යාලය—පොළොන්නරුව

පොළොන්නරුවේ දිසාපති විසින් මෙහි පහතින් සඳහන් කර ඇති උපලේඛනයේ සඳහන් වැඩ සඳහා 1969 ජූනි මස 16 දින ප. ව. 4.30 දක්වා ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

2. සෑම ටෙන්ඩර් ඉල්ලීමක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතු අතර එය බහාලන කවරය මුද්‍රා තබා පොළොන්නරුවේ දිසාපති වෙත ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය. තැපැලන් නො එවන ටෙන්ඩර් පත් පොළොන්නරුව කච්චේරියේ කාර්යාල සහකාර තැනගේ කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ හැකිය. ටෙන්ඩර් බහා ඇති සෑම ටෙන්ඩර් කවරයකම පිට පැත්තේ තමා විසින් ටෙන්ඩරය ඉදිරිපත් කරන්නේ කුමන වැඩක් සඳහා ද යන්න පැහැදිලිවම සඳහන් විය යුතුය. එක් එක් වැඩය සඳහා වෙන් වෙන් වශයෙන් ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

3. ටෙන්ඩර් ඉදිරිපත් කළ යුත්තේ පොළොන්නරුවේ දිසාපති කාර්යාලයේ එක් එක් වැඩය සඳහා රු. 10 බැගින් වූ ටෙන්ඩර් තැන්පත් මුදලක් තැන්පත් කර ලබා ගන්නා ටෙන්ඩර් පෝරම වල වේ.

4. ටෙන්ඩර් පෝරම 1969 මැයි මස 30 දින සිට ජූනි මස 10 දින දක්වා පොළොන්නරුව දිසාපති කාර්යලයේ ගිණුම් අංශයෙන් නිකුත් කරනු ලැබේ.

5. පොළොන්නරුව දිසාපති කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලය විසින් මෙම ටෙන්ඩර් පත් 1969 ජූනි මස 17 දින පෙ. ව. 10 ට පොළොන්නරුව දිසාපති කාර්යාලයේදී විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත් විවෘත කරනු ලබන අවස්ථාවේ ටෙන්ඩර් ඉල්ලුම්කරුවන් හෝ ලියවිල්ලකින් ඔවුන්ගේ බලය ලබාගත් නියෝජිතයන් හෝ ටෙන්ඩර් මණ්ඩලය ඉදිරියේ පෙනී සිටිය යුතුය. ටෙන්ඩර් ඉදිරිපත්

කර ඇති අයවලුන්ගේ නම් හා ඔවුන් විසින් ටෙන්ඩර් කර ඇති මුදල් ප්‍රමාණයන් ද ටෙන්ඩර් විවෘත කිරීමෙන් පසුව ප්‍රකාශ කරනු ලැබේ.

6. නියමිත පෝරමයේ ඉදිරිපත් කර නොමැති ටෙන්ඩර් පත් භාර ගනු නො ලැබේ. ටෙන්ඩර් කර ඇති මුදල ටෙන්ඩර් පෝරමයේ අකුරින් හා ඉලක්කම් වලින් ද සඳහන් කළ යුතුය. අකුරින් සඳහන් කර ඇති මුදල ඉලක්කම් වලින් සඳහන් කර ඇති මුදලට වෙනස් වුවහොත් ටෙන්ඩර් පත් ප්‍රතික්ෂේප කිරීමට ඉඩ තිබේ.

7. යම් ටෙන්ඩර් ඉල්ලුම්කරුවකුගේ ටෙන්ඩරය භාරගත් බැව් දන්වා දින 7 ක් ඇතුළත එම ටෙන්ඩර්කරුට පොලොන්නරුවේ දිසාපති සමග ගිවිසුමකට අත්සන් කිරීමට නොහැකි වුවහොත් හෝ එසේ අත්සන් කිරීම ප්‍රතික්ෂේප කළ හොත් එබඳු ටෙන්ඩර්කරුවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජ සන්තක කරනු ලැබේ. යම් ටෙන්ඩර්කරුවකු විසින් ටෙන්ඩරය මා විසින් භාර ගත් බැව් ලියාපදිංචි තපෑලෙන් යැවෙන ලිපියකින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් ලිපිනයට දන්වා යැව්වහොත් ඉල්ලුම්කරුට එය ලැබුන බව පිළිගනු ලැබේ.

8. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ප්‍රතික්ෂේප කිරීමේ බලයත්, යම් ටෙන්ඩරයක කොටසක් පමණක් භාර ගැනීමේ බලයත් පොලොන්නරුවේ දිසාපති වෙත පවරාගෙන ඇත.

9. පිළිනොගත් ටෙන්ඩර් පත් වෙනුවෙන් තැන්පත් කර ඇති මුදල් පිළිගත් ටෙන්ඩර් ඉදිරිපත් කළ ටෙන්ඩර්කරු සමග ගිවිසුමකට අත්සන් කිරීමෙන් පසු ආපසු ගෙවනු ලැබේ.

10. ටෙන්ඩර් පත්‍රයේ ඇති සෑම මැකීමක්ම හෝ වෙනස් කිරීමක්ම ටෙන්ඩර්කරු විසින්ම කෙටි අත්සන යොදා සහතික කළ යුතුය.

11. පොලොන්නරුවේ දිසාපතිගෙන් ලිපියකින් ලබා ගත් අවසරයක් නොමැතිව ලබාගත් කොන්ත්‍රාත්තුවක් අන් අයෙකුට පැවරිය නො හැකිය.

12. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩර් කර ඇති මුදලින් සියයට දහයක මුදලක් ඇප මුදල් වශයෙන් කච්චේරියේ තැන්පත් යුතුය. ගිවිසුම අත්සන් කරනු ලබන්නේ මෙම මුදල කච්චේරියේ තැන්පත් කර කුවිතාන්සියක් ලබා ගත්තායින් පසුවය.

13. ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝරමය සුපරීක්ෂාකාරීව කියවා බැලිය යුතු අතර ඒ සම්බන්ධයෙන් කිසියම් කරුණක් පැහැදිලි කර ගනීමට අවශ්‍ය වුවහොත් ඒ පිළිබඳව පොලොන්නරුවේ දිසාපති කාර්යාලයේ ගිණුම් අංශයෙන් විමසා බැලිය යුතුය.

14. කොන්ත්‍රාත්තුව විධි වූ පරිදි ඉටු කිරීම සඳහා ඇප වන්නා වූ වග කිව යුතු පුද්ගලයන් දෙදෙනකු විසින් අත්සන් කරන ලද ලිපියක් ද ඔවුන්ගේ ලිපිනයන් ද එක් එක් ටෙන්ඩරය හා සමග ඉදිරිපත් කළ යුතුය.

15. මෙම කොන්ත්‍රාත්තුවල වැඩ සඳහා ලාංකික කම්කරුවන් පමණක් යෙදා ගැනීමට කොන්ත්‍රාත් කරු වගබලා ගත යුතුය.

16. (අ) සමුපකාර සමිති මගින් ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමේදී මෙම කොන්ත්‍රාත්තු වැඩ භාර ගැනීමට ඒ ඒ සමිතිවලට හැකියාවක් ඇති බවත් ඒ ඒ සමිතිවල මුදල් තත්ත්වය සම්බන්ධයෙන් ඉතිරි කිරීමේ බැංකුවක හෝ වෙනත් බැංකුවක හෝ තැන්පත් කර ඇති මුදල සම්බන්ධයෙන් වූ විස්තර දැක්වෙන සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් තුමා විසින් නිකුත් කරන ලද ලිපියක් ද මා වෙත ඉදිරිපත් කළ යුතුය.

(ආ) අනෙකුත් අයවලුන්ගේ ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමේදී මෙම කොන්ත්‍රාත්තුව භාර ගැනීමට ඔවුන්ට ඇති හැකියාව සම්බන්ධයෙන් හා එම අයගේ මුදල් තත්ත්වය සම්බන්ධයෙන් වූ විස්තරත් (ඉතිරි කිරීමේ බැංකුවක හෝ වෙනත් බැංකුවක තැන්පත් මුදල්) අඩංගු ප්‍රාදේශීය ආදායම් නිළධාරි තුමා විසින් නිකුත් කරන ලද ලිපියක් ද මා වෙත ඉදිරිපත් කළ යුතුය.

17. මුදල් තත්ත්වය සතුටුදායක නොවන සමිති වලින් හා පුද්ගලයන් විසින් ද ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමේ බලය ද දිසාපති තුමා විසින් පවරා ගෙන ඇත.

ඒ. පී. ජී. ජයසේකර,
පොලොන්නරුවේ දිසාපති වෙනුවට.

1969 මැයි 20 දින,
පොලොන්නරුවේ දිසාපති
කාර්යාලයේ දී ය.

### උපලේඛනය

1. දිසාපති කාර්යාලයීය භූමියට පිවිසෙන දොරටු වලට යකඩ ගේට්ටු සවි කිරීම.

5–1031—69.5.36 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

---

යොමුව : පීඑස්සී 2/17/69.

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### විකිරණ පටල සහ රසායන ද්‍රව්‍ය සැපයීම

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් විකිරණ පටල සහ රසායන ද්‍රව්‍ය සැපයීම සඳහා පහත සඳහන් උපලේඛනයේ ප්‍රකාශිත අයවලුන්ගෙන් ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ :—

(i) මා විසින් ලේඛනගත කළ වෙළඳ සමාගම්,

(ii) ලන්ඩනයේ රාජ්‍ය නියෝජිතයින්,

(iii) ඉන්දියාවේ කල්කටා නියෝජිතයින්.

(iv) ඔස්ට්‍රියාව, පෝලන්තය, චෙකෝස්ලෝවැකියාව, මහජන චීන සමූහාණ්ඩුව, ස. සෝ. රු. ස., යුගෝස්ලේවියාව, එක්සත් අරාබි ජනරජය, බල්ගේරියාව, ජර්මානු ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය, හංගේරියාව හා රුමේනියාව.

2. සැපයීම් සඳහා ටෙන්ඩර් පත්‍ර, කොළඹ, තැ.පෙ. 584, අමාත්‍යාංශ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1969 ජූලි 11 වන දින පෙර වරු 10 තෙක් භාරගනු ලැබේ.

3. මෙම ටෙන්ඩර්යට අදාල, ටෙන්ඩර් ආකෘති කොන්දේසි ආදිය නිකුත් කරනු ලබන්නේ—

(i) මා විසින්ම හෝ විදේශවල ඇති ලංකා නියෝජිතයින් මගින් ලේඛනගත කොට ඇති වෙලඳ සමාගම්වලටත්,

(ii) 1 වැනි ඡෙදයේ iv වැනි උප ඡෙදයේ සඳහන් රාජ්‍යයනට, ඔවුන්ගේ ලංකා නියෝජිතයින් මගිනුත්

පමණකි.

4. ඉහත 2 වැනි ඡෙදයේ සඳහන් දින නියමිත වේලාවට නියමිත ස්ථාන යේදී, ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී, ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ අනුමත නියෝජිතයින්ට පැමිණීමට ඉඩ දෙනු ලැබේ.

5. මේ සම්බන්ධ වැඩි විස්තර, කොළඹ 10, ඩීන්ස් පාරේ, අංක 355හි, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (සැපයීම්) ගෙන් ලබාගත හැක.

ඇන්. කේ. පී. විජයසිංගම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට ය.

කොළඹ, 1969 මැයි මස 21 වන දා.

### SCHEDULE REFERRED TO

| *Item No.* | *Description* | *Estimated Requirements* | *Packing required* |
|---|---|---|---|
| 1. | Duplitized X-Ray Films, size 17″ × 14″ | 1,800 packets | Packets of 25 films in airtight tins tropical packing |
| 2. | Duplitized X-Ray Films, size 15″ × 12″ | 18,000 packets | Packets of 25 films in airtight tins tropical packing |
| 3. | Duplitized X-Ray Films, size 12″ × 10″ | 12,000 packets | Packets of 25 films in airtight tins tropical packing |
| 4. | Duplitized X-Ray Films, size 10″ × 8″ | 3,600 packets | Packets of 25 films in airtight tins tropical packing |
| 5. | Duplitized X-Ray Films, size 14″ × 14″ | 1,800 packets | Packets of 25 films in airtight tins tropical packing |
| 6. | Duplitized X-Ray Films, size 5″ × 7″ | 84 packets | Packets of 25 films in airtight tins tropical packing |
| 7. | Dental X-Ray Radiatized Films, size $1\frac{1}{4}$″ × $1\frac{5}{8}$″ | 1,320 packets | Packets of 25 films in airtight tins tropical packing |
| 8. | Duplitized Occlusal Dental X-Ray Films, size 3″ × $2\frac{1}{4}$ | 1,800 packets | Packets of 25 films in airtight tins |
| 9. | X-Ray Developer | 1,500 tins | 4-gallon tins tropical packing |
| 10. | X-Ray Fixing Salts with hardner | 1,300 tins | 4-gallon tins tropical packing |
| 11. | X-Ray Replenisher | 2,400 tins | 1-gallon tins tropical packing |
| 12. | X-Ray Quick-acting Developer | 100 tins | 4-gallon tins tropical packing |
| 13. | Quick-acting Fixer | 100 tins | 4-gallon tins tropical packing |
| 14. | X-Ray Fixing Salt with hardner | 3,000 tins | 1-gallon tins tropical packing |
| 15. | X-Ray Developer | 2,400 tins | 1-gallon tins tropical packing |

5–1052—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

### මොණරාගල කච්චේරිය

**1969 කතරගම ඇසළ උත්සවය**

1969 කතරගම ඇසළ උත්සවය නිමිත්තෙන් කතරගම ඉදි කෙරෙන තාවකාලික ගොඩනැගිලි හා වැසිකිලි සඳහා 1969 ජූනි මස 10 වැනි දින පස්වරු 2 දක්වා මොණරාගල දිස්ත්‍රික්කයේ දිසාපති විසින් පහත සඳහන් ප්‍රකාර ටෙන්ඩර් පත් භාරගනු ලැබේ :—

(1) අක්කර 38 ක ප්‍රදේශයේ ළඳු කැලය ශුඩ කිරීම.

(2) බටහිර දිසාවේ තාවකාලික ගොඩනැගිලි තැනීම.

(3) නැගෙනහිර දිසාවේ තාවකාලික ගොඩනැගිලි තැනීම.

(4) තාවකාලික වැසිකිලි 920 ක් තැනීම.

2. රජයේ ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට 1969 ජූනි මස 4 වැනි දින පස්වරු 2 දක්වා ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ. ඊට ප්‍රථම ඉහත සඳහන් එක් එක් වැඩ කොටස සඳහා ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25 ක් බැගින් වෙන් වෙන් වශයෙන් දිවයිනේ ඕනෑම කච්චේරියක තැන්පත් කොට කුවිතාංසි ඉදිරිපත් කළ යුතුය.

3. මොණරාගල දිස්ත්‍රික්කයේ රජයේ දිසාපතිගෙන් ලබා ගන්නා ලද ටෙන්ඩර් ආකෘතිවල පිටපත් දෙකකින් යුතුව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් විවෘත කිරීම 1969 ජූනි මස 10 වැනි දින පස්වරු 2.05 ට මොණරාගල කච්චේරියේ දී කරනු ලැබේ. මේ අවස්ථාවේ දී ටෙන්ඩර්කරුවනට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ.

5. එක් එක් වැඩ කොටස සඳහා වෙන් වෙන් වශයෙන් ටෙන්ඩර් එවිය යුතුය. ඉල්ලුම්කරන වැඩ කොටසේ නම ලියුම් කවරයේ වම් පස උඩ කෙළවරේ සඳහන් කොට සීල් තබා ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ මෙම කච්චේරියේ ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහා ලීමට හෝ පුළුවන.

6. තෝරා ගන්නා ලද කොන්ත්‍රාත්කරු වහාම වැඩ පටන් ගැනීමට සූදානම්ව සිටිය යුතුය.

7. වැඩි විස්තර කාර්යාලීය වේලාවන් හිදී මොණරාගල දිසාපතිගෙන් ලබාගත හැක.

පී. ජී. පුංචිහේවා,
මොණරාගල දිස්ත්‍රික්කයේ දිසාපති.

1969.5.20,
මොණරාගල දිසාපති කාර්යාලයේ දීය.

5–1051—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

---

## තීරණය කළ ටැන්ඩර් පත් පිළිබඳ දැන්වීම්

### මු. රෙ. 700 (6) යටතේ පළ කෙරෙන දැන්වීමයි

අංක 14,841 සහ 1969.2.14 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ පළවූ මගේ 1969.1.31 දින දරන දැන්වීමට පිළිතුරු වශයෙන් ලැබුණු ටෙන්ඩරයේ විස්තර :—

| ටෙන්ඩර්කරුගේ නම | 7.5% ක් මද්‍යසාර අඩංගු රා සැපයීමට සඳහන් කළ මිළ ගැලුමට රු. ශ. |
|---|---|
| සීමාසහිත පහළ වලහපිටියේ විවිධ සේවා සමුපකාර සමිතිය ... ... | 1 50 |

සඳහන් කළ මිල අධිකයයි අමාත්‍යාංශ ටැන්ඩර් මණ්ඩලයේ අදහස වූයෙන් මෙම ටෙන්ඩරය පිළිගනු නොලැබිණ. කෙසේ වුවද පසුව භාණ්ඩාගාරය විසින් නියම කරන ලද මිලට සීදුවේ ස්කාගාරයට රා සැපයීම සඳහා පූර්වෝක්ත සමිතිය සහ සීමාසහිත හලාවත දිස්ත්‍රික්කයේ රා සපයන්නන්ගේ සමුපකාර සමිතිය දෙපාර්තමේන්තුව සමග කොන්ත්‍රාත්තු අත්සන් කරන ලදි. එනම් කොළඹ හා හලාවත දිස්ත්‍රික්කවලින් සපයන රා ගැලුමකට රු. 1.45 බැගින් සහ අනෙක් දිස්ත්‍රික්කවලින් කොන්ත්‍රාත්කරුගේම වාහන වලින් ප්‍රවාහණය කර සපයනු ලබන රා ගැලුමකට රු. 1.51 බැගින් ද වේ.

මු. බ. දිසානායක,
සුරාබදු කොමසාරිස්.

ප්‍රධාන සුරාබදු කාර්යාලය,
කොළඹ 7,
1969.5.17.

5–912—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

---

### ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

**අවසාන තීරණය**

| සේවයේ ස්වභාවය | ටෙන්ඩර් අවසාන වූ දිනය | ටෙන්ඩර් කරුවන් | පිළිගත් ගාස්තුව | ටෙන්ඩරය ලබාගත් සමාගම |
|---|---|---|---|---|
| ඩීසල් එන්ජින් 87ක් ප්‍රවාහණය කිරීම සඳහා ටෙන්ඩරය | 1968 ජුනි 12 වැනි දිනය | 4ක් ... | ඇමෙරිකන් ඩොලර් 608,962 | ද යූ. කේ. කොන්ටිනෙන්ටල් සිලෝන් ඊස්ට් බොන්ඩ් කොන්ෆරන්සස්, 117, ෆේන්චර්ච් ස්ට්‍රීට්, ලන්ඩන් ඊ.සී. 3 වෙනුවෙන් සීමාසහිත සිලෝන් සිපිංලයින්ස්, 333/1, ප්‍රින්ස් ස්ට්‍රීට්, කොළඹ 1 |

ඇම්. සරීන්,
දුම්රිය සාමාන්‍යාධිකාරි වෙනුවට, ල.දු.දෙ.

කොළඹ, 1969 මැයි මස 30 වෙනි දින.

5–936—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

---

## බඩු බාහිරාදිය විකිණීම්

### රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශය

**වෙන්දේසියේ විකිණීමයි**

පහත සඳහන් වන ප්‍රයෝජනයට ගත නොහැකි ද්‍රව්‍ය 1969 ජූනි මස 17 වන අඟහරුවාදා අපරභාග 2 ට සෙනෙට් ගොඩනැගිල්ලේ පිහිටි ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේදී විකුණනු ලැබේ :—

1. පරණ ප්‍රවෘත්තිපත්‍ර (රාත්තල් 200 ක් පමණ)
2. පරණ ගැසට්පත්‍ර
3. පරණ හැන්සාඩ් පොත්
4. පරණ පොත් සහ ප්‍රකාශන
5. පරණ කාර් ටයර් (දොලහක්) සහ ටියුබ් (හතරක්) (7.50×14)
6. හිස් බෝතල්.

2. වෙන්දේසිය අවසානවූ වහාම, මිලයට ගත් අය විසින් ඒවාට මුදල් ගෙවා එම ද්‍රව්‍ය රැගෙන යා යුතුය.

යූ. සී. ද සිල්වා,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු
අමාත්‍යාංශයේ සථිර ලේකම් වෙනුවට.

කොළඹ,
69.5.22.

5–1143—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

## රේගුවේ වෙන්දේසියක්

පහත සඳහන් අල්ලා ගන්නා ලද හා අහිමි කරන ලද බඩු තොග 176 (එකසිය හැත්තෑ හයක්) රජයේ රේගුවේ ප්‍රධාන නිවාරණ නිළධාරි තුමාගේ කායර්‍යාලයේ දී 1969 ජූනි මස 12 වැනි දින පෙරවරු 10 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

සාර්ථක ලෙස ලන්සු තැබූ අය විකිණීම අනුමත කළ දින පටන් ඉවත් කරගෙන නොයන ලද බඩු නැවත වෙන්දේසියේ විකුණනු ලබන අතර, ඔවුන් විසින් ගෙවන ලද අත්තිකාරම් ද රාජසන්තක කරනු ලැබේ.

වැඩිදුර විස්තර සඳහා කොළඹ 1, රේගු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන නිවාරණ නිලධාරි අමතන්න.

ජේ. ජේ. ඒ. ද නීස්,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

1969 මැයි මස 21 වැනි දින,
කොළඹ, රජයේ රේගු දෙපාර්තමේන්තුවේ
නිවාරණ කායර්‍යාලයේ දී යැ.

| අංකය | ඇස්. ආර්. | විස්තරයන් |
|---|---|---|
| 1. | 332/66 ... | ට්‍රාන්සිස්ටර් රේඩියෝ 1, කමිස 2, පැන්ඩන්ට් 8යි, ගල් බඳින ලද බන්දි වළලු සහිත පෙට්ටියක්, කැස්බෑ ලෙලි කර්ණාභරණ කුට්ටමක්, අත් බොත්තම් කුට්ටම් 3ක්, බෲච් 2ක්, රිදී දම්වැල් පොටවල් 1යි, නොකපන ලද බාල මැණික් ගල් |
| 2. | 171/66 ... | '' වික්ස් '' ආනත 70. |
| 3. | 268/66 ... | සනීපාරක්ෂක උපකරණ පෙට්ටියක්. |
| 4. | 299/66 ... | මෝටර් රථ අමතර උපකරණ සහ ජැක් එකක් සහිත කාටනයක්. |
| 5. | 44/66 ... | මෝටර් රථ කොටස් පාර්සලයක්. |
| 6. | 295/66 ... | මෝටර් රථ අමතර කොටස් |
| 7. | 408/67 ... | ට්‍රාන්සිස්ටර් 8වේ රේඩියෝ 24, ට්‍රාන්සිස්ටර් දහයේ රේඩියෝ 4, ඉයර්පෝන්ස් සහ පටි 55. |
| 8. | 151/67 ... | ට්‍රාන්සිස්ටර් රේඩියෝ (පැනාසෝනික්) 1. |
| 9. | 319/67 ... | බාල මැණික් ගල් පෙට්ටියක්. |
| 10. | 350/60 ... | ට්‍රෝමා ප්ලත්ට් 372. |
| 11. | 94/67 ... | පිස්ටන් රින්ග්ස් 27. |
| 12. | 200/67 ... | රිදී කෝප්පයක්. |
| 13. | 344/67 ... | පිස්ටන් රින්ග්ස් 12 සහ පාවිච්චි කළ පටියක්. |
| 14. | 31/67 ... | '' රිවිස් '' වර්ගයේ දියසායම් පෙට්ටි 36. |
| 15. | 39/67 ... | පොඩි ළමුන්ගේ සූප්පු 17 හා බෝල් රේසරයක්. |
| 16. | 396/67 ... | යාන්ත්‍රික කොටස් කෑලි 4. |
| 17. | 476/67 ... | මහපුකෝට් එකක්. |
| 18. | 95/67 ... | රෙදි යාර 2½ |
| 19. | 416/68 ... | ට්‍රාන්සිස්ටර් ටේප් රෙකෝඩරයක්, කෘතිම සේද රෙදි යාර 3. |
| 20. | 254/68 ... | ට්‍රාන්සිස්ටර් රේඩියෝ 1, ටේප් රැකෝඩරයක්, තැටිගත කරන ලද ටේප් 2, තැටිගත කරන ටේප් 1 |
| 21. | 514/68 ... | ට්‍රාන්සිස්ටර් රේඩියෝ එකක්. |
| 22. | 388/68 ... | ට්‍රාන්සිස්ටර් රේඩියෝ එකක්, සූට් දෙකකට රෙදි. |
| 23. | 234/68 ... | සම්මාන කුඩයක්. |
| 24. | 190/68 ... | ට්‍රාන්සිස්ටර් ටේප් රැකෝඩර් එකක්. |
| 25. | 540/68 ... | ට්‍රාන්සිස්ටර් රේඩියෝ 4, (සාක්කුවේ පාවිච්චි කරන) කණට යොදන උපකරණ 3. |
| 26. | 544/68 ... | යාර තුනක වැල්වට් රෙදි කැල්ලක්. |
| 27. | 143/68 ... | සිගරට් දල්වන 160. |
| 28. | අංකයක්නැත | ආවුද පාර්සලයක්. |
| 29. | 141/68 ... | විටව් ඇන පැකට්ටු 5ක් සහ බෙත් ටියුබ් 3. |
| 30. | 288/68 ... | පැන්ටෝර්ච් බැටරි 8ක්. |
| 31. | 187/68 ... | මෝටර් රථ අමතර කොටස් පාර්සලයක්. |
| 32. | 85/68 ... | පුල්සින් පෙති පැකට් 2. |
| 33. | 496/68 ... | ස්ටාටර් මෝටර් ආමේචර් 8, බෙයරින් බෝල් 10ක්, අතස්හෝස් වැල්ව් 8, ඉග්නිෂන් ස්විච්ස් යතුරු සමඟ 3, හෙඩ්ලයිට් ස්විච්ස් 2, හැන්ඩ් ස්පයිඩර් ජෙයින්ට්ලස් ඉදිකටු 1, ඩොර්කෝම් ස්විච්ස් දෙකක්, රෝද සිලින්ඩර් 2, ප්‍රධාන බෙයරින් සැට් තුනක්; කොලවර බෙයරින් සැට් 2. |
| 34. | 456/68 ... | ආවුද කෑලි 3ක්. |
| 35. | 513/68 ... | කපු ජර්කින් එකක්. |
| 36. | අංකයක් නැත | බෝනික්කන් 20. |
| 37. | 48/68 ... | නෝනාවරුන්ගේ සෙරෙප්පු කුට්ටම් 18. |
| 38. | 447/68 ... | කපු පිලි රෝල් දෙකක් සහ යාර 30ක පමණ කැල්ලක්, ප්ලැෂ් ටෝච් 1ක් සහ බෝල් පොයින්ට් පෑන් යනාදිය. |
| 39. | 562/68 ... | සළු 5ක්. |
| 40. | 561/68 ... | රා මන්ඩි (වියලි යීස්ට්) ටින් 24, සළු 14, කලිසම් තුනක රෙදි. |
| 41. | 564/68 ... | වියලි යීස්ට් ටින් 18. |
| 42. | 483/68 ... | නූල් බෝල සහ වානේ ඉදිකටු තොගයක්, අඟුරු දමන දිස්ත්‍රික්කයක්. |
| 43. | 566/68 ... | කුඩ නාන ගෝනියක්. |
| 44. | 18/68 ... | ඉලාස්ටික් පටි පැකට් 9 |
| 45. | 153/68 ... | තොරොම්බල් බඩු පෙට්ටියක්. |
| 46. | 283/68 ... | ෂෙක් ඇබ්සෝර්බර්ස් එකක් හා හිස් සිමෙන්ති මළු |
| 47. | 207/68 ... | අලවන ද්‍රව්‍ය ටින් 5ක් සහිත පාර්සලයක්. |
| 48. | නොදනී ... | ලාච්චු යතුරු පෙට්ටි 4ක්. |
| 49. | 26/68 ... | එඬරු තෙල් පීප්පයක්. |
| 50. | 233/68 ... | ඇඳ ඇතිරිලි 4, බැනියම් 1, මළ නොබැඳෙන වානෙ පිහානක්, කෑම ගෙනයන භාජනයක්, දින් දර්ශණ මිටියක්, සබන් කැලි 9, අත් ඔර්ලෝසු පටි 8, ඉලාස්ටික් ස්විච් එකක්, පිස්න පටියාර 6, ඉමිටේෂන් මාල, පෙස්ලබයන් සෙරෙප්පු කුට්ටම් 3, කමිස දෙකක් රෙදියාර එකක්, සූට් රෙදි යාර 6, බ්ලැඩර් රබර් 396, අත් බෑග් 1, විලවුන් බෝතල යක්, සෙරෙප්පු කුට්ටම් 1, ටීෂර්ට් 13, ප්‍රතිමා 3, හඳුන්කූරු පැකට් 3ක්, පෙති බෝතලයක්, හවරි දෙකක් මල් කුඩු පැකට් එකක්, ප්ලාස්ටික් වලලු 36, බෙඩ්ෂීට් 1, තුවා 5ක්, රෙදි කැල්ලක්, කමිස රෙදි යාර 4, පාවිච්චි කරන ලද කමිසයක්, බුමුතුරුණු එකක්, සූට් රෙදි කෑලි 4ක්, කෘතිම සේද රෙදි කෑලි 23, සළු 10ක්, නැස්කැපේ ටින් 2ක්. |
| 51. | 478/68 ... | පරිවර්ෂ පටි (ඉන්සියුලේටින් ටේප්) බෑග් 1. |
| 52. | 511/68 ... | සනීපාරක්ෂක උපකරණ පාර්සල් 1ක්. |
| 53. | 53/68 ... | කරාබුනැටි රාත්තල් 20ක්. |
| 54. | අංකයක් නැත | ෂොක් ඇබ්සෝබර්ස් 8. |
| 55. | 206/68 ... | සෙලෝෆේන් බෑග් 1. |
| 56. | 581/68–ඒ ... | විදුලි බුබුලු සහිත ඉස්කුරුප්පු නියන් 3. |
| 57. | 260/68 ... | මැන්ටල් පාර්සල් 1. |
| 58. | 584/68 ... | ලාච්චුවල යතුරු තහඩු 10. |
| 59. | 319/68 ... | බෙහෙත් කුඩු ටින් 10. |
| 60. | 98/68 ... | රේඩියෝ වැල්ව් 30ක්. |
| 61. | 482/68 ... | 7ඕ ක්ලොක් බ්ලේඩ් පැකට් 20. |
| 62. | 266/68 ... | රෙදි යාර 13. |
| 63. | 286/68 ... | රෙදි කෑලි 5ක්. |
| 64. | 342/68 ... | ඉබියතුරු දුසිම් 7ක් (යතුරු සමඟ). |
| 65. | 341/68 ... | බැටරි කෑලි සමඟ විදුලි පන්දම් 4ක්. |
| 66. | 175/68 ... | පොකට් ට්‍රාන්සිස්ටර් රේඩියෝ 2. |
| 67. | 99/68 ... | සිගරට් එතුම් කොල සහ කපුරු පාර්සල් 1. |
| 68. | 497/68 ... | නයිලෝන් මදුරු දැල් 1. |
| 69. | 262/68 ... | නයිලෝන් රෙදි කෑලි 3ක්. |
| 70. | 541/68 ... | දොර අගුල් 84ක්. |
| 71. | 472/68 ... | ට්‍රාන්සිස්ටර් රේඩියෝ 1. |
| 72. | 299/68 ... | සූට් රෙදි කෑලි 2. |
| 73. | 108/68 ... | ලෝහ දම්වැල් පාර්සල් 1. |
| 74. | 593/68 ... | කලිසම් රෙදි කෑලි 5. |
| 75. | 171/68 ... | ගැස්කට් පැකට් 61. |
| 76. | 296/68 ... | දුම්කොළ ටින් 6, රේඩියෝ පොනෝග්‍රෑම් 1. |
| 77. | 509/68 ... | ට්‍රාන්සිස්ටර් රේඩියෝ 2. |
| 78. | 185/68 ... | මෝටර් රථ අමතර කොටස් පාර්සල් 3ක්. |
| 79. | 253/68 ... | මෝටර් රථ අමතර කොටස් 4ක් සහ පටි 1. |
| 80. | 127/68 ... | මැනියන් 9ක්. |
| 81. | 40/68 ... | රෙදි රෝල් 3ක්. |
| 82. | 536/68 ... | පාවිච්චි කළ කෝට් 2ක් සහ ජර්කින් 1ක්. |
| 83. | 384/68 ... | පිජාමා සූට් 1ක්. |
| 84. | 415/68 ... | ලෝම කමිස (පුල්ඕවර්) 2. |
| 85. | 359/68 ... | බෝල් රේෂර් 1ක්. |
| 86. | 579/68 ... | 7ඕ ක්ලොක් බ්ලේඩ් තල 600ක්, විල්කින්සන් බ්ලේඩ් තල 60ක්. |
| 87. | 246/68 ... | කපු රෙදි යාර 6ක්. |
| 88. | 523/68 ... | සැරසිලි විදුලි බුබුලු සෙට් 1ක්. |
| 89. | 521/68 ... | ට්‍රාන්සිස්ටර් රේඩියෝ 1ක්. |
| 90. | 249/68 ... | රෙදි රෝල් 1ක්. |
| 91. | 453/68 ... | නිල් ස්වෙටර් 1ක්. |
| 92. | 165/68 ... | ඇස්ප්‍රින් කාටන් 4ක්. |
| 93. | 423/68 ... | පුල්ඕවර් 9ක්. |
| 94. | 42/68 ... | ටෙරලින් කමිස 1ක්. |
| 95. | 538/68 ... | ලෝමරෙදි කෑලි 1ක් සහ ජර්සි 1ක්. |
| 96. | 588/68 ... | බැනියන් 29ක්. |
| 97. | 86/68 ... | ටෙරලින් කමිස 1 ක් සහ ස්වෙටර් 1. |
| 98. | 518/68 ... | තුවා 2ක්. |
| 99. | 115/68 ... | මෝටර් රථ අමතර කොටස් පාර්සල් 1ක්. |
| 100. | 578/68 ... | රෙදි රෝල් 1ක්. |
| 101. | 250/68 ... | '' ටී '' ෂර්ට් 2ක්. |
| 102. | 100/68 ... | කැන්වස් සපත්තු දුසිම් 1ක්. |
| 103. | 93/68 ... | නූල් පාර්සල් 2ක්. |

| අංකය | ඇස්. ආර්. | | විස්තරයන් |
|---|---|---|---|
| 104. | 539/68 | ... | පොකට් ට්‍රාන්සිස්ටර් රේඩියෝ 1ක්. |
| 105. | 258/68 | ... | බෝල් රේෂර් 1ක් සහ කමිස 1ක්. |
| 106. | 261/68 | ... | මෝටර් රථ අමතර කොටස් පාර්සල් 1ක්. |
| 107. | 306/68 | ... | රෙදි යාර $2\frac{1}{2}$ ක්. |
| 108. | 320/68 | ... | '' එකෝ '' රේඩියෝවල අමතර කොටස් 119 ක්. |
| 109. | 259/68 | ... | නයිලෝන් රෙදි කෑලි 1ක්. |
| 110. | 554/68 | ... | '' නැෂනල් '' ට්‍රාන්සිස්ටර් රේඩියෝ එකක්. |
| 111. | 300/68 | ... | කරුංකා මලු 59 ක්. |
| 112. | අංකයක් නැත | | කරුංකා මලු 68ක්. |

127

| අංකය | ඇස්. ආර්. | | විස්තරයන් |
|---|---|---|---|
| 113. | 169/68 | ... | ඕඩි කොලොං බෝතල් 1ක්. |
| 114. | 181/68 | ... | 7ඕ ක්ලොක් බෙල්ඩ් තල පැකට් 7ක්. |
| 115. | 63/68 | ... | ස්වයංක්‍රියාකාරී රේඩියෝ 1ක්. |
| 116. | 270/68 | ... | පැදුරු 2ක්. |
| 117. | 589/68 | ... | සුදු පොප්ලින් රෝල් 4ක්. |
| 118. | 243/68 | ... | ටයි 74යි, බෝ පටි 56ක්, ටයි පින් සහ කමිස අත්වලට යොදන බොත්තම් අඩංගු පෙට්ටි 3ක්. කලු කණ්නාඩි 3ක්, ටයි හැංගර් 104ක්. |
| 119. | 256/68 | ... | '' ටී '' ෂර්ට් පෙට්ටි 1ක්. |
| 120. | 525/68 | ... | මයා ඇති කෝට් 1ක්. |
| 121. | 52/69 | ... | ට්‍රාන්සිස්ටර් රේඩියෝ 7ක්, බැටරි වලින් ක්‍රියා කරන රැවුල බාන යන්ත්‍රයක්. |
| 122. | 34/69 | ... | '' ස්ටෑන්ඩර්ඩ් '' වර්ගයේ ට්‍රාන්සිස්ටර් 8වේ ට්‍රාන් සිස්ටර් රේඩියෝ 1ක්. |
| 123. | 191/69 | ... | '' ෂොක් ඇබ්සෝර්බර්ස් '' 4ක්. |
| 124. | 171/69 | ... | විදුලි කේතල 2ක්. |
| 125. | 130/69 | ... | ට්‍රැක්ටර් රථ අමතර කොටස් පාර්සල් 1ක්. |
| 126. | 180/69 | ... | යාර 3ක හෝස් පයිප් 1ක්. |
| 127. | 51/69 | ... | පොත් පාර්සල් 1ක්. |
| 128. | 118/69 | ... | නැවියහැකි කුඩ 2ක්. |
| 129. | 44/69 | ... | පොකට්ට්‍රාන්සිස්ටර් රේඩියෝ 1ක්. |
| 130. | 19/69 | ... | චුවින් ගම්-පැකට් 17ක්, කලිසම් රෙදි කෑලි 1ක්. |
| 131. | 85/69 | ... | කලු වර්ණයේ අත් බෑග් 1ක්, ට්‍රාන්සිස්ටර් රේඩියෝ 2ක්. |
| 132. | 101/69 | ... | ඉබියතුරු පැකට් 3ක්. |
| 133. | 46/69 | ... | හාල් මැස්සන් රාත්තල් $1\frac{1}{2}$ක් සහ සුදු ලූනු රාත්තල් 1ක්. |
| 134. | 33/69 | ... | වෙරලින් රෙදි රෝල් 2ක්. |
| 135. | 14/69 | ... | මැන්ටල් පාර්සල් 2ක්. |
| 136. | 117/69 | ... | 7ඕ ක්ලොක් බේල්ඩ් පැකට් 10ක්, කමිස 1ක්. |
| 137. | 16/69 | ... | ස්තිරික්ක 1ක්. |
| 138. | 78/69 | ... | සුදු හම් කෑලි 10. |
| 139. | 3/69 | ... | යතුරුකටු පෙට්ටි 1ක්. |

| අංකය | ඇස්. ආර්. | | විස්තරයන් |
|---|---|---|---|
| 140. | 1/69 | ... | කලිසම් 2ක රෙදි, නූල් කෑලි 4ක් සහ කලු පටි 1ක්. |
| 141. | 114/69 | ... | පුල්ඕවර්ස් 3ක්. |
| 142. | 127/69 | ... | රෙදි රෝල් 2ක්. |
| 143. | 32/69 | ... | පාලක ස්විච් 1ක්, ඇණ සහ මුරිච්චි, ප්ලග් හෝල් ඩර්ස් 1ක්, පරණ සේවර්ටර්ස් 2ක්. |
| 144. | 188/69 | ... | ජර්සිස් 2ක්. |
| 145. | 79/69 | ... | පෑන පිහියා පැකට් 13ක්. |
| 146. | 95/69 | ... | ලෝම ස්වෙටර් 1ක්. |
| 147. | අංකයක් නැත | | ලියන පට්ටල් යන්ත්‍රවල අමතර කොටස් 2ක්. |
| 148. | අංකයක් නැත | | '' මාර්කෝනි '' රේඩියෝ උපකරණ 1ක්. |
| 149. | අංකයක් නැත | | සූප්පු පෙට්ටි 1ක් සහ බෑග් 1ක්. |
| 150. | අංකයක් නැත | | ටයර් 4ක්. |
| 151. | 555/68 | ... | ටයර් 2ක්. |
| 152. | 601/68 | ... | ග්ලිසර්රින් (ට්‍රම්) පීප්ප 1ක්. |
| 153. | 68/69 | ... | බාබර් දැලිපිහි පෙට්ටි 16ක්. |
| 154. | 88/69 | ... | සම්පූර්ණ බ්රේක් ඩ්රම්ස් 2ක්. |
| 155. | 95/68 | ... | නලහමුවක් සහ ගෑස්කට් 1ක්. |
| 156. | 101/68 | ... | නොයෙක් වර්ගයේ මෝටර් රථ අමතර කොටස් 25ක්. |
| 157. | 293/68 | ... | ඔර්ලෝසු දුනු පැකට් 37ක්. |
| 158. | 323/68 | ... | වීදුරු තහඩු ක්රේට් 1ක්. |
| 159. | 380/60 | ... | සනීපාරක්ෂක ද්‍රව්‍ය ක්රේට් 1ක්. |
| 160. | 421/68 | ... | ලොරි ටියුබ් 2ක්. |
| 161. | 37/68 | ... | පොලිතින් බෑග් 351ක්. |
| 162. | 195/68 | ... | රේඩියේටර් 3ක්, මෝටර් රථ අමතර කොටස් බෑග් 1ක්. |
| 163. | 2/68 | ... | මැලියම් මලු 2ක්. |
| 164. | 502/68 | ... | මල නොබැඳෙන වානේ ගැරුප්පු පෙට්ටි 5ක්. |
| 165. | 245/68 | ... | පාවිච්චි කරණ ලද උණුවතුර බෝතල් 1ක්. |
| 166. | 386/68 | ... | බෝල්පොයින්ට් පෑන් 37ක්, නෝනාවරුන්ගේ අත් ඔර්ලෝසු පටි 92ක්. |
| 167. | 26/68 | ... | එරඬු තෙල් පීප්ප 1ක්. |
| 168. | අංකයක් නැත නාවුක අල්ලා ගැනීම් | | වේවැල් පුටු 2ක්, පාපුටු 1ක්, විසිතුරු බඩු කෑලි කීපයක්. |
| 169. | අංකයක් නැත | | මෝටර් රථ අමතර කොටස් ගෝනි 1ක්. |
| 170. | 417/68 | ... | ලගේජ් කැරියර් එක සමඟ පාපැදියක්. |
| 171. | 222/69 | ... | පයිප්ප සහ සොකට් කෑලි 125ක් අඩංගු ගෝනි 1ක්. |
| 172. | 239/69 | ... | වෑ තල 36ක් අඩංගු ගෝනි 1ක්. |
| 173. | 238/69 | ... | බෙයාරින් තහඩු 115ක් අඩංගු බෑග් 1ක්. |
| 174. | 511/65 | ... | ෂොක් ඇබ්සෝබර්, ශල්‍ය ඉදිකටු, බ්ලේඩ්, කතුරු යනාදිය අඩංගු බාස්කට් 2ක්. |
| 175. | අංකයක් නැත | | තහනමට ගන්නා ලද පා පැදි 4ක්. |
| 176. | 249/69 | ... | ඇඹරුම් මෝල් යන්ත්‍රවල ඇක්සල් 3ක්. |

5–1165—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

## පොලිස් දෙපාර්තමේන්තුව

### පරණ නිල ඇඳුම්, ශුදිරි සහ වෙනත් බඩු වෙන්දේසියක්

වර්ෂ 1969 ජූනි මස 12 වෙනි දින පෙ. ව. 9 ට පමණ පරණ නිල ඇඳුම්, ශුදිරි සහ වෙනත් බඩු මිරිහාන පොලිසිය අසට පිහිටි නුගේගොඩ දිස්ත්‍රික්කයේ ප්‍රධාන බඩු ගබඩාව අසලදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. වෙන්දේසියට පෙර දින එකී බඩු ගබඩාවේදී පරීක්ෂා කිරීමට ඉඩ දෙනු ලැබේ. වෙන්දේසිය අවසානයේ ලබාගත් බඩුවලට මුදල් ගෙවා එම බඩු ගෙනයාමට හැකි වේ.

පොලිස් අධිකාරී,
බස්නාහිර පළාත (මැද).

1969.5.20
පොලිස් කාර්යාලය,
නුගේගොඩ.

5-942—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

## කැලෑ දෙපාර්තමේන්තුව

### දැව වෙන්දේසියේ විකිණීම

මාතලේ දැව ගබඩාවේ ඇති ඝන අඩි 203.4 කින් සමන්විත I, II සහ III වැනි පංතියේ ඉරූ දැව කෑලි 440 ක් ද, 2″×1″ ප්‍රමාණයේ තද සහ මෘදු ලී රිප්ප අඩි 3,328 ක් ද III පංතියේ වටලී 2,685 ක් ද මාතලේ දැව ගබඩාවේදී 1969 ජූනි 24 දින පෙ. ව. 10 ට වයඹ දිසාභාර වන නිළධාරි විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඉල්ලුම්කරුවන්ට වෙන්දේසියට පෙර දැව පරීක්ෂාකර බැලිය හැක.

වැඩි විස්තර සඳහා මාතලේ දැව ගබඩා පාලක හෝ වයඹ දිසාභාර වන නිළධාරි විමසන්න.

ඊ. සී. ද ඉසෙඩ්. වීරවර්ධන,
වයඹ දිසා භාර වන නිළධාරි,
කුරුණෑගල.

1969 මැයි 13 දින,
කුරුණෑගල දිසා කැලෑ කාර්යාලය.

5-1038—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

## කැලෑ දෙපාර්තමේන්තුව

### දැව වෙන්දේසිය

කුරුණෑගල අඩවියේ යක්දෙස්සකන්ද හා කඩවත් කැලේ විදුලි මාගීසන්න ගබඩාවල ඇති, කෝන්, තිඹිරි, හබර, කුණුමැල්ල, කැන්ද, ලබු, රිටි, අත්කෙන්ද,. බල, ඉඹුල්, කොස්, තේක්ක යනාදි කඳන් 164 කින් යුත් ඝන අඩි 1,422 ක් හා I වැනි II වැනි පංතිවලට අයත් වටලී 458 ක් 1969 ජූනි මස 17 දින පෙ. ව. 10 ට වයඹ දිසාවේ දිසාවන නිළධාරි විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඉල්ලුම්කරුවන්ට දැව වෙන්දේසියට පෙර පරීක්ෂාකර බැලිය හැක. වැඩි විස්තර සඳහා කුරුණෑගල අඩවි කැලෑ නිළධාරි හෝ වයඹ දිසාවේ දිසාකැලෑ නිළධාරිගෙන් විමසන්න.

ඊ. සී. ද ඉසෙඩ් වීරවර්ධන,
වයඹ දිසාභාර වන නිළධාරී,
කුරුණෑගල.

1969. 5. 11 දින,
කුරුණෑගල දිසාකැලෑ කාර්යාලය.

5–1039—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

---

## කැලෑ දෙපාර්තමේන්තුව

### දැව වෙන්දේසිය

නාඋල අඩවියේ නා නා ස්ථානයන්හි ඇති මිල්ල, ඇටනිඹිරි, බුරුත, පලු, වැවරණ ලුනුමිදෙල්ල හා හුලංහිත් යනාදි කඳන් 198 කින් යුත් ඝන අඩි 1,638.9 ක් හා අබ බුසල් $3\frac{1}{2}$ක් 1969 ජූනි මස 18 දින පෙ. ව. 10 ට නාඋල අඩවි කැලෑ කාර්යාලයේදී වයඹ දිසා කැලෑ නිළධාරි විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. ඉල්ලුම්කරුවන්ට වෙන්දේසියට පෙර දැව පරීක්ෂා කර බැලිය හැක. වැඩි විස්තර සඳහා නාඋල අඩවි කැලෑ නිළධාරි හෝ වයඹ දිසාභාර වන නිළධාරි විමසන්න.

ඊ. සී. ද ඉසෙඩ් වීරවර්ධන,
වයඹ දිසාභාර වන නිළධාරි,
කුරුණෑගල.

1969.5.11 දින,
කුරුණෑගල දිසාකැලෑ කාර්යාලය.

5–1040—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

---

## ධීවර දෙපාර්තමේන්තුව

### පාවිච්චි කරන ලද නාවික ඩීසල් එන්ජින් වෙන්දේසියේ විකිණීම

පාවිච්චි කරන ලද නාවික ඩීසල් එන්ජින්, වෙන්දේසියේ විකිණීම පහත සඳහන් උප ලේඛනයේ දක්වෙන ස්ථාන වලදී සහ දිනවලදී පෙ. ව. 9.30ට සිදුකරනු ලැබේ.

2. උප ලේඛනයේ සඳහන් ස්ථානයන්හිදී මෙම එන්ජින් පරීක්ෂා කර බැලිය හැකිය.

3. ගෙවීම පහත දක්වෙන පරිදි මුදලින්ම ගෙවිය යුතුය :—

(අ) ඇන්ජිමේ විකුණුම් මිළෙන් $\frac{1}{4}$ක් විකිණීම අවසන්වූ වහාම,
(ආ) විකුණුම් මිළෙන් ඉතිරි $\frac{3}{4}$ කොටස දින 3 ක් ඇතුළත දී.

4. වෙන්දේසියේ විකුණන ලද එන්ජින් මුදල් ගෙවීමෙන් පසු ඉවත් කරගෙන යනතෙක් ජයග්‍රාහී ඉල්ලුම්කරුවන්ගේ සම්පූර්ණ වගකීම මත එම භූමිභාගයෙහිම තිබෙන්නට හරිනු ලැබේ.

### උපලේඛනය

| යාත්‍රා අංකය | ඇන්ජිමේ වර්ගය | තිබෙන ස්ථානය | වෙන්දේසි කරන දිනය |
|---|---|---|---|
| ටී. 62 | ... අබ. 8 යන්මාර් ... | ධීවර කාර්යාලය, කොඩ්ඩවෙලි | |
| එස්. 379 | ... අ. බ. 24 ටෝර්පිඩෝ | එම | |
| ටීඑස්. 24 | ... අ. බ. $12\frac{3}{4}$ ලිස්ටර්... | එම | |
| ටීඑස්. 61 | ... කවෙන්ට්‍රි වික්ටර් | එම | 69. 7. 7 |
| ජේබී. 84 | ... රසියන් ... | එම | |
| ටීඑස්. 57 | ... කවෙන්ට්‍රි වික්ටර් | එම | |
| කේඑස්එල්. 9 | පාර්සන්ස් ... | එම | |
| ජේබී. 13 | ... අ. බ. 8 යන්මාර් ... | ධීවර කාර්යාලය, ජේසාලේ | 69. 7. 8 |
| ටීඑස්. 21 | ... අ. බ. $12\frac{3}{4}$ ලිස්ටර්... | එම | |
| ටී. 80 | ... බුක් ... | ධීවර කාර්යාලය, කවුනෝරිය | 69. 7.22 |
| එජ්. 21 | ... බුක් ... | එම | |
| එජ්. 22 | ... බුක් ... | ප්‍රාදේශීය ධීවර — කායාීාලය, මීගමුව | 69. 7.23 |
| — | ... ලිස්ටර් එස්. එල්. 3 | ජේපීඑජ් යාත්‍රාංගනය මීගමුව | 69. 7.15 |
| ජේබී. 26 | ... කුබෝටා ... | ධීවර කායාීාලය,... පානදුර | 69. 7.16 |
| ටී. 450 | ... බුක් ... | ධීවර කායාීාලය, බේරුවල | 69. 7.17 |
| එල්. 7 | ... ලිස්ටර් එච්ජ් 2 ... | එම | |
| එස්. 381 | ... ටෝර්පිඩෝ ... | ධීවර කාර්යාලය, කයිට්ස් | |
| ඩීඩ්. 6 | ... අ. බ. 22 ලිස්ටර් ... | එම | 69. 7. 4 |
| එස්. 376 | ... ටෝර්පිඩෝ ... | ලේඩන් ගරාජය, කයිට්ස් | |
| එස්. 382 | ... බුක් සිලි. 2 ... | ධීවර කායාීාලය,... තලයාඩි | 69. 7.11 |
| එස්අයිසී. 102 ... | ටෝර්පිඩෝ ... | ධීවර කායාීාලය,... මුලතිවු | 69. 7.12 |
| විකේඑස්. 30 ... | ඇලියා ග්‍රෙග් ... | ධීවර කායාීාලය, කන්කසන්තුරේ | 69. 7.16 |
| විකේඑස්. 31 ... | ඇලිසා ග්‍රෙග් ... | එම | |
| ඩබ්ලිව්. 22 | ... අ. බ. 16 යන්මාර්... | ධීවර කායාීාලය,... වාලච්චනේ | 69. 7. 4 |
| ජේපීඑජ්. 53 ... | ඇලිසා ග්‍රෙග් ... | ධීවර කායාීාලය,... වෙන්කලාඩි | 69. 7. 5 |
| ටී. 48 | ... අ. බ. 8 යන්මාර් ... | ධීවර කායාීලය,... මඩකලපුව | 69. 7. 7 |
| එම්සී. 42 | ... අ.බ.$12\frac{3}{4}$ ලිස්ටර් ... | ධීවර කායාීාලය,... ත්‍රිකුණාමලය | |
| එස්අයිසී.43 | ... ටෝර්පිඩෝ ... | එම | |
| එස්අයිසී. 96 | ... ටෝර්පිඩෝ ... | එම | |
| ජේබී. 27 | ... අ. බ. 8 යන්මාර් ... | එම | 69. 7.27 |
| ටී. 286 | ... යන්මාර් ... | එම | |
| එස්. 81 | ... ලිස්ටර් එච්. ජ්. 2 | එම | |
| ටීඑස්. 36 | ... පර්කින්ස් ... | එම | |

අයි. ඕ. කේ. ජී. ප්‍රනාන්දු,
ධීවර අධ්‍යක්ෂ.

1969 මැයි මස 19 දින,
කොළඹ, ධීවර දෙපාර්තමේන්තුවේ දීය.

5—911—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

---

## ධීවර දෙපාර්තමේන්තුව

### ඇන්ජින් සහිත වූ/ රහිත වූ/පාවිච්චි කරන ලද ධීවර යාත්‍රා වෙන්දේසියේ විකිණීම

ඇන්ජින් සහිත වූ/රහිත වූ ටොන් $3\frac{1}{2}$ ඉරේ පාවිච්චි කරන ලද ධීවර යාත්‍රා පහත සඳහන් උපලේඛනයෙහි දක්වෙන දිනයන්හිදී සහ ස්ථානයන්හිදී පෙ. ව. 9.30ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

උපලේඛනයෙහි සඳහන් ස්ථානයේදී මෙම යාත්‍රා පරීක්ෂාකර බැලිය හැකිය. ගෙවීම් පහත සඳහන් පරිදි මුදලින් ම කළ යුතුය:—

(අ) යාත්‍රාවේ විකුණුම් මිළෙන් $\frac{1}{4}$ ක් විකිණීම අවසන් වූ වහාම
(ආ) විකුණුම් මිළෙන් ඉතිරි $\frac{3}{4}$ කොටස දින 3ක් ඇතුළත දී.

වෙන්දේසියේ විකුණන ලද යාත්‍රා මුදල් ගෙවීමෙන් පසු ඉවත් කරගෙන යනතෙක් ජයග්‍රාහී ඉල්ලුම්කරුවන්ගේ සම්පූර්ණ වගකීම මත එම භූමි භාගයෙහි තිබෙන්නට හරිනු ලැබේ.

### උපලේඛනය

| යාත්‍රා අංකය | | ඇන්ජිමේ වර්ගය | තිබෙන ස්ථානය | වෙන්දේසි කරන දිනය |
|---|---|---|---|---|
| ඩීසී. | 27... | — ... | සිලාවතුරේ | ... 69. 7. 1 |
| ටීඑස් | 24... | අ. බ. $12\frac{3}{4}$ ලිස්ටර්... (බ්ලෝක් එක පමණි) | මන්නාරම | ... 69. 7. 2 |
| ටීඑස්. | 61... | — ... | සවුත්බාර්, මන්නාරම | ... 69. 7. 2 |
| ඩීඩී. | 12... | අ. බ. 30 පර්කින්ස් | පල්ලිමුනෙයි | ... 69. 7. 3 |
| ජේ. පීඑජ්. | 14... | — ... | වන්කාලෙයි | ... 69. 7. 4 |
| ජේබී. | 84... | — ... | එම | ... එම |
| ටීඑස්. 21 | ... | — ... | නාඩුකුඩා වෙරළ | ... 69. 7. 5 |
| එස් | 100... | — ... | එස්අයිසී යාත්‍රාංගනය, කොග්ගල | 69: 7. 1 |

| යාත්‍රා අංකය | ඇන්ජිමේ වර්ගය | තිබෙන ස්ථාන | වෙන්දේසි කරන දිනය |
|---|---|---|---|
| ටී. 243... | ලිස්ටර් සිලි 3 ... | මිරිස්ස වෙරළ | |
| එස් 14... | අ. බ. 8 යන්මාර් ... | එම | |
| එස් 108... | යන්මාර් ... | එම | |
| එස්අයිසී 92... | — ... | එම | 69. 7. 2 |
| එස් 63... | — ... | එම | |
| එස් 93... | අ. බ. 10 කුබෝටා | එම | |
| එම්සී 52... | යන්මාර් ... | එම | |
| එම්සී 2... | — ... | මහතොට ගරාජය, මාතර | 69. 7. 3 |
| ටී 29... | පාර්සන්ස් ... | දෙවුන්දර, වෙරළ | 69. 7. 4 |
| ටී 36... | අ. බ. 11 පාර්සන්ස් | කවිස්සවැල්ල | |
| ටී. 300... | — ... | කෝට්ටෙගොඩ, ඔරුවැල්ල | 69. 7. 5 |
| එස්. 142... | — ... | තංගල්ල වෙරල | ... 69. 7. 7 |
| එස්. 68... | — ... | එම | ... 69. 7. 7 |
| එස්අයිසී. 113 ... | ටෝර්පිඩෝ ... | හබන්තොට වෙරල | ... 69. 7. 8 |
| ටී. 346 ... | — ... | ලූකස් යා ත්‍රාංගනය, පානදුර | 69. 7. 9 |
| ටී. 175 ... | අ. බ. 8 යන්මාර් ... | කටුකුරුන්ද යා ත්‍රා සාදන්නන්ගේ සමූ . පකාර සමිතිය, කළුතර උතුර | 69. 7.10 |
| කේ. බී. බී. 1 ... | — ... | එම | |
| එල්.2 ... | ලීස්ටර් ... | එම | |
| විජේ. 6 ... | — ... | එම | |
| ජේපීඑජ්. 38 ... | අ. බ. 20 කෙල්වින් | නවලංකා යාත්‍රාංගනය බේරුවල | |
| එස්. 89 | — ... | එම | |
| එම්සී. 58 ... | — ... | එම | 69. 7.11 |
| ජේබී. 43 ... | — ... | එම | |
| ඕඑස් 7 ... | — ... | එම | |
| එම්සී. 4 ... | — ... | බේරුවල වෙරළ | |
| එස්. 172 ... | — ... | එම | |
| ජීඒපී. 3 ... | — ... | බලපිටිය ධීවර කායර්‍යාලය අසල | |
| ජේබී 10 ... | — ... | එම | 69. 7.12 |
| එස්. 162 ... | — ... | බලපිටිය පාලම අසල | |
| එම්සී. 15 ... | — ... | බලපිටිය වෙරළ | |
| ටී. 403 ... | — ... | හික්කඩුව වෙරල | 69.7.14 |
| එස්. 107 ... | — ... | එම | |
| එස්. 3 ... | — ... | ජේපීඑජ් යාත්‍රාංගනය, මීගමුව | 69. 7.15 |
| එස්. 20 ... | — ... | එම | |
| වීජේ. 1 ... | — ... | වීජේ යාත්‍රාංගනය, මීගමුව | ... 69. 7.16 |
| ටී. 14 ... | — ... | මීගමුව වෙරල | 69. 7.17 |
| එස්. 38 ... | ඩොයිස් ... | එම | |
| එස්. 28... | — ... | ඩබ්ලිව්එජ් යාත්‍රාංගනය, මීගමුව | 69. 7.18 |
| ටී. 122 ... | පාර්සන්ස් ... | අලුත්කුරුව, මීගමුව | ... 69. 7.19 |
| ඩීසී. 28 ... | අ. බ. 20 ලිස්ටර් ... | ඩිවලොප්මන්ට් යාත්‍රාංගනය, කන්කසන්තුරය | ... 69. 7. 7 |
| එම්සී.30 ... | — ... | වේලානෙයි | ... 69. 7. 8 |
| එස්අයිසී. 59... | ටෝර්පිඩෝ ... | තාලයාඩි | ... 69. 7.11 |
| එස්අයිසී. 127... | — ... | මුලතිවු වෙරළ | |
| ජේබී 74... | බුක් ... | එම | 69. 7.12 |
| එස්. 117... | — ... | සෙල්වම් යාත්‍රාංගනය, මුලතිවු | |
| ආර්එස්. 3... | — ... | පවර් ක්‍රාෆ්ට් යාත්‍රාංගනය | |
| එස්අයිසී. 84 ... | අ. බ. 24 ටෝර්පිඩෝ | එම | 69. 7. 9 |
| එම්සී. 83 ... | — ... | එම | |
| ටීඑස්. 48... | අ. බ. 22 ලිස්ටර් ... | පෙතලායි, වාලච්චනේ | 69. 7.14 |
| එම්ජේඩී. 15... | — ... | මඩකලපුව බාර් | 69.7. 15 |
| විජේ. 2... | — ... | එම | |
| ඩබ්ලිව්. 5... | — ... | උප්පොඩෙයි | ... 69. 7.16 |
| ටී. 7... | — ... | පොතුවිල් වෙරල | ... 69. 7.18 |
| ටී. 410... | — ... | ගං. නි. ස. ම. යාත්‍රාංගනය, අම්පාරේ | |
| ටී. 233... | — ... | එම | 69. 7.19 |
| එස්. 150... | අ. බ. 18 ඩයියා ... | එම | |
| එස්. 92... | අ. බ. 8 යන්මාර් ... | එම | |
| ටීඑස්. 47... | — ... | සිලෝන් ෂිප් යාඩ්, චයිනා බේ, ත්‍රිකුණාමලය | 69. 7.22 |
| ජේබී. 30... | අ. බ. 11 යන්මාර් | අභ්‍යන්තර වරායපාර ත්‍රිකුණාමලය | |
| එස්අයිසී. 43... | — ... | එම | 69. 7.23 |
| ටී. 347 ... | — ... | උප්පුවෙලි | 69. 7.24 |
| ජේබී. 27... | — ... | එම | |
| එස්අයිසී. 96... | — ... | ඩිවිෂන් අංක 10 | ... 69. 7.25 |
| එස්අයිසී. 22... | ඇලිසා ග්‍රෙග් ... | රාජකීය ලංකා නාවික හමුද භූමිභාගය | 69. 7.26 |
| එම්සී. 82... | — ... | ධීවර කායර්‍යාලය, ත්‍රිකුණාමලය | 69. 7.27 |
| එස්. 106... | අ. බ. 10 කෙල්වින් | කලරාවූ | ... 69. 7.29 |

අයි. ඕ. කේ. ජී. ප්‍රනාන්දු,
ධීවර අධ්‍යක්ෂ,

1969.5.19 දින,
කොළඹ, ධීවර දෙපාර්තමේන්තුවේදී ය.

5—908—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

---

## බන්ධනාගාර දෙපාර්තමේන්තුවට අයත් පල්ලෙකැලේ, එළිමහන් සිරකඳවුරේ ගොවිපලට අයත් සතුන් වෙන්දේසියේ විකිණීම

1969 ජූනි මස 10 වන දින පෙරවරු 10·30 ට පහත සඳහන් සත්වයින් පල්ලෙකැලේ එළිමහන් සිරකඳවුරේ ගොවිපලේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ:—

1. අයර්ෂයර් ගොන්නු 1, උපන් දිනය; 66.12.12
2. අයර්ෂයර් එළදෙන්නු 1, උපන් දිනය; 64.6.4
3. ලාජ් වයිට් ඊරි පැටව් 2, උපන් දිනය; 68.10.4
4. ලාජ් වයිට් ඊරියන් 1, උපන් දිනය; 67.3.17
5. එලුදෙන්නු ජම්නාපාරි මිශ්‍ර 1, උපන් දිනය; 65.9.15
6. එලුදෙන්නු ජම්නාපාරි මිශ්‍ර 1, උපන් දිනය; 67.1.30
7. එලුදෙන්නු ජම්නාපාරි මිශ්‍ර 1, වයස අවුරුදු 8
8. එලුවන් පම්නාපාරි මිශ්‍ර 1, උපන් දිනය 67.2.9
9. එලුවන් ජම්නාපාරි 1, උපන් දිනය; 67.7.19
10. එලුවන් ජම්නාපාරි මිශ්‍ර 1, උපන් දිනය; 67.11.15

1. විකුණූ සතුන් වෙන්දේසිය අවසන් වී පැය 12 ඇතුළත මුදල් ගෙවා ඉවත් කරගත යුතුයි.

2. ගැනුම්කරුවන්ට බන්ධනාගාර අධිකාරිගේ අවසරය පිට සතුන් පරීක්ෂාකළ හැකිය.

3. ඉල්ලුම්කරුවකු හෝ කීපදෙනෙකු විසින් ඉදිරිපත් කරන ලද මිළ ගණන් ප්‍රශ්නයක් නැති ව ප්‍රතික්ෂේප කිරීමේ බලය පහත අත්සන් කරන අය සතුවේ.

ෂෙ. ව. අබේනායක,
අධිකාරි, පල්ලෙකැලේ එළිමහන්
සිරකඳවුර, කුණ්ඩසාලේ.

1969.5.15.

5–922—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

## රේගුවේ වෙන්දේසියක්

කොළඹ, රේගුවේ එලිසබෙත් රැජින තටාකයේ තැන්පත් පහත සඳහන් බඩු 1969 ජූනි මස 9 වෙනි දින පෙ. ව. 10 ට එම ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. 1969 ජූනි මස 8 වෙනි දින එම බඩු ගැණුම්කරුවන්ට පරීක්ෂා කර බැලීමට පිළිවන.

මෙම වෙන්දේසියෙන් මිලයට ගන්නා බඩු වෙන්දේසිය අනුමත කර දින හතකින් ගෙන නොගියහොත් එම බඩු නැවත විකුණන බවත්, ඒ සඳහා ගෙවා ඇති අත්තිකාරම් මුදල් රාජසන්තක වන බවත් සැළකිය යුතුය.

ඇස්. ඒ. සන්සෝනි,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

මගේ අංකය : ඒ ඩී/විකිණීම්/1
1969 මැයි මස 21 වෙනි දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දී ය.

ඇන්. පී. කෝ. පෝර ගෝනි 2,275 යි.

5-1153—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

---

## රේගුවේ වෙන්දේසියක්

කොළඹ, රේගුවේ ඩෙල්ෆ්ට් තටාකයේ තැන්පත් පහත සඳහන් බඩු 1969 ජූනි මස 10 වෙනි දින පෙ. ව. 10 ට එම ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. 1969 ජූනි මස 9 වෙනි දින එම බඩු ගැණුම්කරුවන්ට පරීක්ෂා කර බැලීමට පිළිවන.

මෙම වෙන්දේසියෙන් මිලයට ගන්නා බඩු වෙන්දේසිය අනුමත කර දින හතකින් ගෙන නොගියහොත් එම බඩු නැවත විකුණන බවත්, ඒ සඳහා ගෙවා ඇති අත්තිකාරම් මුදල් රාජසන්තක වන බවත් සැළකිය යුතුය.

ඇස්. ඒ. සන්සෝනි,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

මගේ අංකය : ඒ ඩී/විකිණීම්/2
1969 මැයි මස 21 වෙනි දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දී ය.

(1) රසායන ද්‍රව්‍ය තොගයක් (තෙත් සහිත පලුදු)
(2) රසායන ද්‍රව්‍ය තොගයක් (තෙත් සහිත පලුදු)
(3) ධාන්‍ය වර්ග තොගයක් (තෙත් වූ කලවම් සහිත)
(4) කොත්තමල්ලි තොගයක් (තෙත් සහිත)

1-1150—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

---

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

ඒ. ඇක්ස් 13/69.

## අරක්කු රේන්ද නැවත විකිණීම—කොළඹ දිස්ත්‍රික්කය—1968–69

1969 ජූනි මස 23 දින සිට 1969 සැප්තැම්බර් 30 දින දක්වා ඇති තනි අයිතිය පිට පහත පෙනෙන කොන්දේසිවලට යටත්ව මෙහි දක්වෙන අරක්කු තැබෑරුම්වල සිල්ලරට අරක්කු විකිණීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

(1) 1968 අප්‍රේල් 11 දින අංක 14,797 දරණ රජයේ ගැසට් පත්‍රයේ දක්වෙන අරක්කු රේන්ද විකිණීම පිළිබඳ කොන්දේසි.

(2) සුරාබදු බලපත්‍ර සම්බන්ධව දැනට වලංගුව පවතින පොදු කොන්දේසි.

2. පහත දක්වෙන කාර්යාලයන්ගෙන් ලබාගත හැකි නියමිත පෝර්ම මාර්ගයෙන් ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ, පහත (එච්) තීරයේ එක් එක් තැබෑරුමට කෙළින් දක්වා තිබෙන නියමිත මුදල් තැන්පත් කළ බවට කච්චේරියෙන් ලබාගත් කුවිතාන්සියක් හා ප්‍රාදේශීය ආදයම් නිලධාරිගෙන් ලබාගත් වත්කම් සහතිකයක් ද සමගය :—

(අ) ඕනෑම කච්චේරියකින් ;

(ආ) කොළඹ 7 සුරාබදු කොමසාරිස් කාර්යාලයෙන් ;

(ඇ) කොළඹ සුරාබදු මණ්ඩල කාර්යාලය ;

(ඈ) කළුතර සුරාබදු මණ්ඩල කාර්යාලය ;

(ඉ) හලාවත සුරාබදු මණ්ඩල කාර්යාලය.

ප්‍රාදේශීය ආදයම් නිලධාරින්ගෙන් ලබා ගන්නා ලද වත්කම් සහතික ඒවායේ උපලේඛනයෙහි ඇතුළත් එසේම එම සහතික නිකුත්කිරීම සඳහා පදනම් කරගත් කිසිදු දේපොලක් විකුණා නැත්නම්, එම වත්කම් සහතික නිකුත් කළ දින සිට අවුරුදු පහක කාලයක් සඳහා වලංගු වේ.

3. මුද්‍රාව තැබූ කවරයක බහන ලද එක් එක් ටෙන්ඩර් පත්‍රය ඇතුළත් කවරයෙහි උඩ වම් කෙළවරේ මෙසේ සඳහන් කළ යුතුය : "කොළඹ දිස්ත්‍රික්කයේ 1968–69 වර්ෂ අංක——දරණ අරක්කු තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍රය" ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනයන් සහ පහත දක්වෙන නියමිත වේලාවලදී හෝ ඊට පෙර කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත තුමාට ලැබෙන සේ එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් භාරගන්නා අවසාන වේලාවේදී කොළඹ කච්චේරියට පැමිණිය යුතුයි.

4. තෝරාගත් ටෙන්ඩර්කරු ඒ මොහොතේම ගැනුම්කරු වශයෙන් දැනුම්දෙනු ලබන අතර, විකිණීම සඳහා කොන්දේසි අත්සන් කිරීමට අරක්කු රේන්ද විකිණීමේ කොන්දේසි අනුව 9 (1) (ඒ) කොන්දේසි යටතේ නියමිත තැන්පත් ඇප මුදල ආණ්ඩුවේ ඒජන්ත තුමාට ගෙවිය යුතුය.

5. මිලයට ගන්නා හැටියට වරප්‍රසාද ලැබූ යම් ටෙන්ඩර්කරුවෙක් විකිණීම පිළිබඳ කොන්දේසිවලට අත්සන් කිරීම ප්‍රතික්ෂෙප කිරීමෙන් හෝ උවමනා කරන ඇප මුදල නියමිත අවස්ථාවේදී ඉදිරිපත් කිරීමට අපොහොසත්වීමෙන් ඔහු විසින් තබන ලද ටෙන්ඩර් තැන්පත් මුදලට අහිමියෙක් වන අතර, වරදකරුවෙක් වශයෙන් ඔහුගේ නම සුරාබදු බලපත්‍ර සම්බන්ධ වරදකරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වන්නට ද පුළුවන. මෙයට විශේෂයක් වශයෙන් සාර්ථක ටෙන්ඩර්කරු හෝ ලන්සුකරු විසින් විකිණීම සම්බන්ධ කොන්දේසි අත්සන් කළ පසු, ටෙන්ඩර්කරුවන් විසින් තැන්පත් කළ මුදල් ආපසු දීම සහ ඉහත කී සාර්ථක ටෙන්ඩර්කරු හෝ ලන්සුකරු විසින් තබන ලද ඇපය ද ආපසු ගෙවනු ලැබේ.

6. කිසි කරුණක් නොදක්වාම එකක් හෝ සියළුම ටෙන්ඩර් ප්‍රතික්ෂෙප කිරීමේ බලය ආණ්ඩුවේ ඒජන්ත තුමාට තිබේ.

7. වැඩි විස්තර කොළඹ කච්චේරියෙන් ඉල්ලා යැවීමෙන් ලබා ගත හැක.

සී. ආර්. උමගිලිය,
කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

කොළඹ කච්චේරිය,
1969 මැයි මස 25 දින.

කොළඹ දිස්ත්‍රික්කය

ඉහත දැක්වූ අනුමත කළ තැබෑරුම් ලැයිස්තුව

| (ඒ) අනුක්‍රමික අංකය | (බී) ප්‍රදේශය | (සී) ප්‍රාදේශික ප්‍රදේශය (තැබෑරුමට අයත් විය යුතු පෙදෙස) | (ඩී) විකිණීම කරන දිනය | (ඊ) ටෙන්ඩර් භාරගන්නා අවසාන වේලාව | (එෆ්) තැබෑරුම් විවෘත කරන වේලාව | (ජී) තැබෑරුම් වසන වේලාව | (එච්) ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල |
|---|---|---|---|---|---|---|---|
| 2 ... | නො. 27 කොට්ඨාශය, බම්බලපිටිය | පෙදෙස මෙසේ සීමාවී තිබේ :—ස්කූල් පටුමගේ සහ කොල්ලුපිටිය පටුමගේ සන්ධිය දක්වා ද, එම සන්ධියේ සිට ගාලුපාරේ නැගෙණහිර පෙදෙස දක්වා සහ යාන්ති කිල්ඩා පටුමගේ ද, 14 වෙනි පටුමගේද සන්ධිය දක්වා එම සන්ධියේ සිට ගාලුපාරේ බටහිර පෙදෙස ද වෙත්. | 69.6.19... | පෙ.ව 10.00... | පෙ.ව. 8.00... | ප.ව. 7.00... | රු. 5,000 |
| 4 ... | නො. 5 කොට්ඨාශය, කොටහේන බටහිර (ජම්පටා විදිය) | පෙදෙය මෙසේ සීමාවී තිබේ :—උතුරට ලැස්කරින් විදියේ සහ කෝටබෝන් විදියේ සන්ධිය දක්වාද එම සන්ධියේ සිට උතුරු ස්කිනර් පාරේ දකුණු පෙදෙස ; නැගෙණහිරට : ජම්පටා වීදියේ සහ උතුරු ස්කිනර් පාරේ සන්ධිය දක්වා සහ එම සන්ධියේ සිට ලැස්කරින් විදියේ බටහිර පෙදෙස ; දකුණට : කෝටබෝන් විදියේ සහ ලැස්කරින් වීදියේ සන්ධිය දක්වා, එම සන්ධියේ සිට ජම්පටා වීදියේ උතුරු පෙදෙස ; බටහිරට : උතුරු ස්කිනර් පාරේ සහ ජම්පටා වීදියේ සන්ධිය දක්වා | 69.6.19... | පෙ.ව.11.00... | පෙ.ව. 8.00... | ප.ව. 7.00... | රු. 5,000 |

5–1189/1—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

---

ඒ. එක්ස්. 13/69.

## රා රේන්ද නැවත විකිණීම—කොළඹ දිස්ත්‍රික්කය, 1868–69

1968 මාර්තු 1 දින අංක 14,791 දරණ රජයේ ගැසට් පත්‍රයේ පෙනෙන, රා රේන්ද විකිණීමේ කොන්දේසි හා දනට වලංගුව පවතින සුරාබදු බලපත්‍ර සම්බන්ධ පොදු කොන්දේසි අනුව පැසුණු රා සිල්ලරට පහත දැක්වෙන තැබෑරුමේ 1969 ජූනි මස 24 දින සිට 1969 සැප්තැම්බර් මස 30 දින දක්වා තනි අයිතිය පිට විකිණීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. පහත දැක්වෙන කායයීාලයන්ගෙන් ලබාගත හැකි නියමිත පෝර්ම මාර්ගයෙන් ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ, පහත පෙනෙන ''ජී'' තීරයේ එක් එක් තැබෑරුමට කෙළින් දක්වා තිබෙන නියමිත මුදල් තැන්පත් කළ බවට කච්චේරියෙන් ලබාගත් කුවිතාන්සියක් හා ප්‍රා.ආ. නි. ගෙන් ලබාගත් වත්කම් සහතිකයක් ද සමග ය. ප්‍රාදේශීය ආදායම් නිලධාරීන්ගෙන් ලබාගන්නා ලද වත්කම් සහතික, එම සහතිකයන්හි උපලේඛනයෙහි ඇතුළත් එසේම එම සහතික නිකුත් කිරීම සඳහා පදනම් කරගත් කිසිදු දේපොලක් විකුණා නැතිනම්, එම වත්කම් සහතික නිකුත් කළ දින සිට අවුරුදු පහක කාලයක් සඳහා වලංගුවේ

(ඒ) ඕනෑම කච්චේරියකින් ;

(බී) කොළඹ 7, සුරාබදු කොමසාරිස් කායයීාලයෙන් ;

(සී) කොළඹ, සුරාබදු මණ්ඩල කායයීාලයය ;

(ඩී) කළුතර, සුරාබදු මණ්ඩල කායයීාලයය ;

(ඊ) හලාවත, සුරාබදු මණ්ඩල කායයීාලයය.

3. මුද්‍රාව තැබූ කවරයක බහන ලද එක් එක් ටෙන්ඩර් පත්‍රය ඇතුළත් කවරයෙහි උඩ වම් කෙළවරේ මෙසේ සඳහන් කළ යුතුයි : '' අංක—— දරණ රා තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍රය, කොළඹ දිස්ත්‍රික්කය, 1968–69 '' පහත දක්වා තිබෙන තැබෑරුමට කෙළින් ඇති දිනේ දී සහ වේලාවේදී කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත තැන විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් භාරගන්නා අවසාන වේලාවේදී කච්චේරියට පැමිණිය යුතුයි

4. තෝරාගත් ටෙන්ඩර්කරු, ඒ මොහොතේම ගැනුම්කරු වශයෙන් දනුම් දෙනු ලබන අතර, ඉහත පෙනෙන රා රේන්ද විකිණීම කොන්දේසි ප්‍රකාර, 9 වෙනි කොන්දේසිය යටතේ වරප්‍රසාද විකිණීමේ කොන්දේසිය අත්සන් කිරීම සඳහා නියම කරනු ලබන මුදලක් තැන්පත් ඇප මුදල් වශයෙන් දිසාපතිතැනට ගෙවිය යුතුයි.

5. මිළයට ගන්නා හැටියට වරප්‍රසාදය ලැබූ යම් ටෙන්ඩර්කරුවෙක් විකිණීම පිළිබඳ කොන්දේසිවලට අත්සන් කිරීම ප්‍රතික්ෂෙප කිරීමෙන් හෝ උවමනා කරන ඇප මුදල නියමිත අවස්ථාවේ දී ඉදිරිපත් කිරීමට අපොහොසත් විමෙන් ඔහු විසින් තබන ලද ටෙන්ඩර් තැන්පත් මුදලට අහිමියෙක් වන අතර වරදකරුවෙක් වශයෙන් ඔහුගේ නම සුරාබදු බලපත්‍ර සම්බන්ධ වරදකරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වන්නට ද පුළුවන. මෙයට විශෙෂයක් වශයෙන් සාර්ථක ටෙන්ඩර්කරු හෝ ලන්සුකරු විසින්, විකිණීම සම්බන්ධ කොන්දේසි අත්සන් කළ පසු ටෙන්ඩර්කරුවන් විසින් තැන්පත් මුදල් ආපසු දීම සහ ඉහත කී සාර්ථක ටෙන්ඩර්කරු හෝ ලන්සුකරු විසින් තබන ලද ඇපය ආපසු ගෙවනු ලැබේ.

6. එකක් හෝ සියළුම ටෙන්ඩර්, එසේ කිරීමට කිසි කරුණක් නොදක්වාම ප්‍රතික්ෂෙප කිරීමේ බලය ආණ්ඩුවේ ඒජන්තතුමාට තිබේ.

7. වැඩි විස්තර කොළඹ කච්චේරියෙන් ලබාගත හැක.

ඩී. ආර්. උමගිලිය,
කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

කච්චේරිය,
කොළඹ, 1969 මැයි මස 25 දින.

## අනුමත කරණ ලද තැබෑරුම—කොළඹ දිස්ත්‍රික්කය

### කොළඹ නාගරික සභාව

| (ඒ) අනුක්‍රමික අංකය | (බී) ප්‍රදේශය | (සී) ප්‍රාදේශික ප්‍රදේශය (තැබෑරුමට අයත් විය යුතු පෙදෙස) | (ඩී) ටෙන්ඩර් භාරගන්නා අවසාන වේලාව | (ඊ) තැබෑරුම් විවෘත කරන වේලාව | (ඇෆ්) තැබෑරුම් වසන වේලාව | (ජී) ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල | (එච්) විකිණීම කරන දිනය |
|---|---|---|---|---|---|---|---|
| 5 ... | නො. 3 කොට්ඨාශය, මාදම්පිටිය | දේශය මෙසේ සීමාවී තිබේ :—උතුරට : පර්ගියුෂන් පාරේ දකුණු පෙදෙසේ සිට සන්ධිය දක්වා. ලූකස් පාරේ සහ නාගලගම් වීදියේ සන්ධිය දක්වා ; නැගෙනහිරට: නාගලගම් වීදියේ දකුණු පෙදෙසේ සිට සන්ධිය දක්වා පර්ගියුෂන් පාරේ සහ මාදම්පිටිය පාරේ සන්ධිය දක්වා; දකුණට මාදම්පිටිය පාරේ උතුරු පෙදෙසේ සිට සන්ධිය දක්වා, නාගලගම් වීදිය සහ ලූකස් පාරේ සන්ධිය දක්වා ; බටහිරට : ලූකස් පාරේ නැගෙනහිර පෙදෙසේ සිට සනධිය දක්වා, මාදම්පිටිය පාරේ සහ පර්ගියුෂන් පාරේ සන්ධිය දක්වාය. | දවල් 12.00... | පෙ.ව. 7.00... | ප.ව. 7.00... | රු. 5,000... | 69.6.19 |

5–1189/2—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

---

## මහනුවර දිස්ත්‍රික්කයේ 1969-70 වර්ෂයේ රා තැබෑරුම් රේන්ද විකිණීම

1969 මාර්තු මස 21 වෙනි දින සහ අංක. 14,846 දරණ ගැසැට් පත්‍රයේ ප්‍රසිද්ධකොට ඇති 1969-70 වර්ෂයට හා ඊට පසු කාල පරිච්ඡේදයන් සඳහා වලංගු රා තැබෑරුම් රේන්ද විකිණීමමේ කොන්දේසිවලටත්, එම කාලයට බලපවත්නා සෑම සුරාබදු බලපත්‍රයක් කෙරෙහිම බලපාන්නාවූ පොදු සුරාබදු කොන්දෙසිවලටත් යටත්ව 1969 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට 1970 සැප්තැම්බර් මස 30 වෙනි දින තෙක්වූ කාලසීමාව තුළ පහත සඳහන් උපලේඛණයේ සඳහා රා තැබෑරුම්වල පැසුණු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාදය මිළදී ගැනීම සඳහා මහනුවර ආණ්ඩුවේ ඒජන්තතැන විසින් 1969 ජුනි මස 27–වෙනි දින ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. සෑම ටෙන්ඩර් පත්‍රිකාවක්ම දිවයිනේ ඕනෑම කච්චේරියකින් ලබාගත හැකි නිසි ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර—

(අ) ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් ඕනෑම කච්චේරියක රු. 2,500ක් තැන්පත් කර ඒ සඳහා ලබාගත් කුවිතාන්සියක් සහ

(ආ) ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපල පිහිටා ඇති ප්‍රදේශයේ, ප්‍රාදේශීය ආදයම් නිලධාරිතැනගෙන් ලබාගත් ටෙන්ඩර්කරුගේ වත්කම් සහතිකයක් සමග ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම සම්බන්ධව යට කී රා රේන්ද විකිණීමේ කොන්දෙසි මාලාවේ අඩංගුව ඇති නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර් ඉදිරිපත් කරන්නන් වෙත තරයේ නිවේදනය කෙරේ. ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කිරීමේදී ටෙන්ඩර් කරුවන් පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂයෙන් සැළකිලිමත් විය යුතුය :—

(1) ටෙන්ඩර් පත්‍රය මුළුමනින්ම සම්පූර්ණ කළ යුතුය. මෙසේ කිරීමේදී එහි සඳහන් කර ඇති මුදල ඉලක්කමෙන් පමණක් නොව නොව අකුරෙන් ද ලිවිය යුතුය. තවද, නියමිත සාක්ෂිකරුවන්ගේ අත්සන් යොද තිබිය යුතුය.

(2) සෑම වෙනස් කිරීමක් හෝ කැපීමක් ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන සහ දිනය යොද සහතික කළ යුතුය.

මෙකී නියමයන්ට පටහැනිව ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ ටෙන්ඩර් පත්‍රය නිසි ටෙන්ඩර් තැන්පත් මුදල තැන්පත් කර ලබාගත් කච්චේරි කුවිතාන්සියක්, වත්කම් සහතිකයක් සමග ලියුම් කවරයක බහා මුද්‍රා තබා ලියුම් කවරයෙහි වම් කෙළවර මුදුනේ ''තැබෑරුමේ නම සහ අංකය'' සඳහන් කර කච්චේරියේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් භාරගැනීම අවසන් කිරීමට පෙර තැන්පත් කළ යුතුය. එසේ නැතහොත් ටෙන්ඩර් භාරගැනීමේ වේලාව ඉකුත් වීමට ප්‍රථමයෙන් මහනුවර ආණ්ඩුවේ ඒජන්තතැනට ලැබෙන සේ ලියා පදිංචි කළ, සීඝ්‍රගාමී තැපැලෙන් එවිය යුතුය

4. එක් එක් රේන්දයක් වෙනුවෙන් ටෙන්ඩර් භාරගැනීම අවසන් කරන වේලාව පහත සඳහන් උපලේඛනයෙහි සඳහන් කර ඇත. එකී වේලාවට සියළුම ටෙන්ඩර්කරුවන් මහනුවර කච්චේරියේ පෙනී සිටිය යුතුය.

5. සාර්ථක ලෙස ටෙන්ඩරයක් ඉදිරිපත් කළ අය වරප්‍රසාදය මිළ දී ගත් තැනැත්තා ප්‍රකාශ කරනු ලැබූ පසු එම දින පස්වරු 4ට පෙර මහනුවර ආණ්ඩුවේ ඒජන්තතැන විසින් නියම කරනු ලැබූ මුදලක් ඇප වශයෙන් මහනුවර කච්චේරියේ තැන්පත් කොට රා තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවට අත්සන් තැබිය යුතුය. මෙම ගෙවීම මුදලින් ම හෝ බැංකුවක් විසින් '' ගෙවීම සඳහා '' යයි ලකුණු කරන ලද චෙක්පතකින් හෝ ලංකා බැංකුවෙන් හෝ මහජන බැංකුවෙන් ''ආරක්ෂිත චෙක්පත'' යන ස්වරූපයෙන් නිකුත් කරන ලද චෙක්පතකින් හෝ බැංකුවකින් ඒ බැංකුවේ නමටම නිකුත් කරන ලද චෙක්පතකින් හෝ ගෙවිය යුතු වේ.

6. මෙ සම්බන්ධ වැඩි විස්තර මහනුවර කච්චේරියෙන් විමසා දැනගත හැකිය.

1969 මැයි මස 17 වන දින
මහනුවර කච්චේරියේ දීය.

ඩබ්ලිව්. ජේ. ප්‍රනාන්දු,
මහනුවර ආණ්ඩුවේ ඒජන්ත තැන.

### උප ලේඛනය

### 1969/70 වර්ෂය සඳහා මහනුවර දිස්ත්‍රික්කයේ අනුමත කරන ලද රා තැබෑරුම් ලැයිස්තුව

| අනුක්‍රමික අංකය | කොට්ඨාශය | තැබෑරුම් පිහිටවිය යුතු කොට්ඨාශය | තැබෑරුම් අරින වේලාව | තැබෑරුම් වසන වේලාව | ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් කරන වේලාව |
|---|---|---|---|---|---|
| 1 ... | මහනුවර නගරයේ අංක 19 මහයාය සහ අංක 7 මපනාවතුර ඡන්ද කොට් කොට්ඨාශය | (වටපුළුවේ රා තැබෑරුම) කටුගස්තොට පාරේ එම පාර සහ ත්‍රිකුණාමල වීදිය මංසංදියටත්, කටුගස්තොට පාර සහ වට්ටාරන්තැන්න පාර මංසංදිය අතර පාර, මහනුවර නාගරිකයේ අංක 19 මහයාය සහ අංක 7 මාපනාවතුර ඡන්ද කොට්ඨාශයන් තුළ පිහිටි ප්‍රදේශයේ | පෙ.ව.8.0... | ... ප.ව. 7.30 | ...පෙ.ව.10.30 |
| 2 ... | උඩ පළාත ... | (වහුගේපිටිය රා තබෑරුම) වහුගේ පිටියගම තුළ ... | පෙ.ව. 7.30 ... | ප.ව. 7.00 ... | පෙ.ව. 11.00 |
| 3 ... | පුස්සැල්ලාව සුළු නගර සභා කොට්ඨාශය | (පුස්සැල්ලාව රා තැබෑරුම) පුස්සැල්ලාව සුළු නගර සභාවේ සීමා තුළ | පෙ.ව 7.30 ... | ප.ව. 7.00 ... | පෙ.ව. 11.30 |

### ටෙන්ඩර් නොකළ යුතු වතු කැන්ටීන්

| අනුක්‍රමික අංකය | කොට්ඨාශය | තැබෑරුම පිහිටවිය යුතු කොට්ඨාශය | තැබෑරුම් අරින වේලාව | තැබෑරුම් වසන වේලාව |
|---|---|---|---|---|
| 4 | උඩ පළාත | අංක 2 දරණ කැන්ටීම : ගලහ පුපුරැස්ස වතුයායේ මායිම තුළ | විකිණීමේ වේලාව වතු අධිකාරී විසින් නියම කරන පරිදි | |
| 5 | උඩ දුම්බර | අංක 3 දරණ කැන්ටීම : වූඩ් සයිඩ් වතුයායේ මායිම් තුළ | එම | |

**සටහන.**—දැනට පවතින තැබෑරුම් ස්ථාන 1969—70 රේන්ද වර්ෂය තුළ ලැබේ යයි ප්‍රතිඥාවක් දිය නොහැක. සෑම ස්ථාන සඳහාම මහනුවර ආණ්ඩුවේ ඒජන්තගේ පෙර අනුමැතිය ලබාගත යුතුය.

5—925—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

---

## 1969–70 වර්ෂයේ රා රේන්ද විකිණීම—නුවරඑළිය දිස්ත්‍රික්කය

**කාලසීමාව.**—1969 ඔක්තෝබර් මස 1 වන දින සිට 1970 සැප්තැම්බර් මස 30 වන දින දක්වා.

1969 ඔක්තෝබර් මස 1 වන දින සිට 1970 සැප්තැම්බර් මස 30 වන දින තෙක් වූ කාලසීමාව තුළ පහත සඳහන් ස්ථානයන්හි පැසුණු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාදය මිළ දී ගැනීම සඳහා ටෙන්ඩර් පත්‍රිකා 1969.3.21 වන දින ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ සඳහන් රා රේන්ද විකිණීමේ කොන්දේසි වලට හා දැනට බලපවත්නා සියලු කොන්දේසි වලට යටත් ව ම විසින් භාරගනු ලැබේ.

2. සෑම ටෙන්ඩර් පත්‍රයක් ම ඕනෑ ම දිසාපති කාර්යාලයකින් ලබාගත් නියමිත ආකෘති පත්‍රිකාවක විය යුතු අතර සෑම ටෙන්ඩර් පත්‍රිකාවක් සමගම ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රු. 1,000ක් භාරගත් බවට නිකුත් කරන ලද කච්චේරි කුවිතාන්සියක් හා ඉහත සඳහන් ගැසට් පත්‍රයේ පළ වූ කොන්දේසි වල 4 (3) යටතේ දක්වා ඇති වත්කම් සහතිකය ද අමුණා තිබිය යුතු ය.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක් ම මුද්‍රා තබන ලද කවරයක බහා, එහි මුදුනේ වම් කෙළවරේ ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් පත්‍රයට සම්බන්ධ තැබෑරුමේ නම ද අනුමත තැබෑරුම් ලැයිස්තුවේ දක්වා ඇති එහි අංක ද පැහැදිලි ව ලියා කච්චේරියේ ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහා ලිය යුතුය. නැතහොත් ටෙන්ඩර් වැසීමට නියමිත වේලාවට පෙර ලැබෙන සේ නුවරඑළියේ දිසාපති නමට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

4. සියලුම ටෙන්ඩර් පත් භාරගැනීම 1969 ජූලි මස 7 වන දින පහත උපලේඛනයේ එක් එක් තැබෑරුමට ඉදිරියෙන් දක්වා ඇති වේලාවට වසනු ලැබේ. සියලු ම ටෙන්ඩර්කරුවන් එම වේලාවට නුවරඑළියේ කච්චේරියේ පෙනී සිටිය යුතුයි.

5. ටෙන්ඩර් පත්‍රිකාව ඉදිරිපත් කළ අය ඔහු ගැනුම්කරු වශයෙන් ප්‍රකාශිත දින සවස 4ට තැබෑරුම් පිළිබඳ කොන්දේසිවලට අත්සන් තබා දිසාපති විසින් නියම කරනු ලබන මාස දෙකකට නො අඩු කාලයක බදු මුදල් තැන්පත් ඇප වශයෙන් දිසාපතිට ගෙවියයුතුය.

6. කිසියම් කාරණයක් සඳහන් නොකර ටෙන්ඩර්පත්‍රිකාවක් හෝ සියල්ල ම හෝ ප්‍රතික්ෂෙප කිරීමේ අයිතිය දිසාපති සතු ය.

7. වැඩිපුර විස්තර නුවරඑළිය කච්චේරියෙන් ඉල්ලා සිටිය විට ලබාගත හැකි ය.

1969 මැයි මස
නුවරඑළිය දිසාපති කාර්යාලයේ දීය.

පී. එම්. විජේකෝන්,
නුවරඑළිය දිස්ත්‍රික්කයේ දිසාපති.

### උපලේඛනය

### අනුමත තැබෑරුම් ලැයිස්තුව—නුවරඑළිය දිස්ත්‍රික්කය

| තැබෑරුම් අංකය | කොට්ඨාශය | තැබෑරුම් පිහිටවිය යුතු ග්‍රාමය | තැබෑරුම් විවෘත කරන වේලාව | තැබෑරුම් වසන වේලාව | ටෙන්ඩර්පත් වසන වේලාව |
|---|---|---|---|---|---|
| 1 | කොත්මලේ | කඩදොරපිටිය ග්‍රාමය තුළ | පෙ.ව. 8.00 | ප.ව. 7.00 | පෙ.ව. 9.30 |
| 2 | එම | ඕතලාව ග්‍රාමය තුළ | පෙ.ව. 8.00 | ප.ව. 7.00 | පෙ.ව. 10.00 |
| 3 | එම | කටුකිතුල ග්‍රාමය තුළ | පෙ.ව. 8.30 | ප.ව. 7.30 | පෙ.ව. 10.30 |
| 4 | වලපනේ | හරස්බැද්ද ග්‍රාමය තුළ | පෙ.ව. 8.00 | ප.ව. 7.00 | පෙ.ව. 11.00 |
| 5 | උඩහේවාහැට | පදියපැලැල්ල ග්‍රාමය තුළ | පෙ.ව. 8.00 | ප.ව. 7.00 | පෙ.ව. 11.30 |

**සැලකිය යුතුයි.**—1969–70 වර්ෂය උදෙසා දැනට පවත්නා රා තැබෑරුම් ස්ථාන තිබේ යයි සහතික විය නොහැකි ය. සෑම ස්ථානයක් ම නුවරඑළිය දිසාපති ගේ පූර්ව අනුමැතිය ලබාගත් ස්ථාන වියයුතුය.

5–948—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

---

## 1969–70 වර්ෂයට කළුතර දිස්ත්‍රික්කයේ රා තැබෑරුම් රේන්ද විකිණීම

1969 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1970 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා කාලය තුළ පැසුණු රා සිල්ලරට විකිණීම සඳහා 1969 මාර්තු මස 21 වැනි දින අංක 14,846 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද රා තැබෑරුම් රේන්ද කොන්දේසිවලට හා සෑම සුරාබදු බලපත්‍රයකට අදල එවකට වලංගුව පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත විස්තර දැක්වෙන රා තැබෑරුම සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් ඇප මුදල් වෙනුවෙන් රු. 3,000 ක් ඕනෑම කච්චේරියක තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් සමග සෑම ටෙන්ඩරයක්ම ඕනෑම කච්චේරියකින් ලබාගත් නියමිත ටෙන්ඩර් පත්‍ර පෝර්මයක ඉදිරිපත් කළ යුතුය.

3. ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපල පිහිටා ඇති ප්‍රදේශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගෙන් ලබාගත් වත්කම් සහතිකයක් හෝ එයට විකල්පයක් වශයෙන් විශ්වාස සහතික ඔප්පුවක් ( Fidelity Gurantee Bond ) ඉදිරිපත් කරන ටෙන්ඩර් පත්‍රයට අමුණා තිබිය යුතුයි. එම වත්කම් සහතිකය හෝ විශ්වාස සහතික ඔප්පුවේ සඳහන් වටිනාකම තමා ටෙන්ඩරය ඉල්ලුම් කරන මුදලෙන් සියයට 25 කට වඩා අඩු නොවිය යුතුයි.

4. වත්කම් ඇඟවෙන සහතිකයට ගැනෙන දේපල සහතිකය ලබාගත් පසු විකිණීම හෝ වෙනත් අන්දමකින් අයිතිය වෙනස් කිරීම රේන්දයේ කොන්ත්‍රාත්තුව දෙන ගිවිසුමේ කොන්දේසිය කඩකිරීමක් හැටියට සලකනු ලැබේ.

5. සෑම ටෙන්ඩරයක්ම ටෙන්ඩර්කරුගේ නමින්ම ඉදිරිපත් කළ යුතු අතර, නියෝජිතයෙකු මගින් හෝ ලාංකික නොවූ හෝ 1969.3.21 අංක 14,846 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද රා තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවේ 6 වැනි කොන්දේසිය යටතේ නුසුදුසු වූවන්ගෙන් ටෙන්ඩර් පත්‍ර භාරගනු නොලැබේ.

6. තැබෑරුම වෙනුවෙන් එක් අයෙකුට එක් ටෙන්ඩර් පත්‍රයකට වඩා ඉදිරිපත් කළ නොහැකි වන අතර, පස් දෙනෙකුට වඩා හවුල්වද ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ නොහැක.

7. සෑම ටෙන්ඩරයක්ම කවරයක බහා සීල් තබා කවරය වම්පස මුදුනේ '' කළුතර දිස්ත්‍රික්කයේ අංක 1 දරන රා තැබෑරුමේ ටෙන්ඩරය—1969–70'' යනුවෙන් පැහැදිලි ලෙස සටහන් කළ යුතුය. ටෙන්ඩර් සහිත කවරය (අ) දිසාපති කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් හෝ (අ) ලියාපදිංචි කරන ලද තැපෑලෙන් එවීම හෝ 1969.7.8 වැනි දින පෙරවරු 10 ට පෙර ඉදිරිපත් කළ යුතුය. එම වේලාවට සියලුම ටෙන්ඩර්කරුවන් කළුතර කච්චේරියට පැමිණ සිටිය යුතුය. මෙහි 5 වැනි ඡේදයේ සඳහන් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවේ 6 වැනි කොන්දේසිය යටතේ නුසුදුසු අයකු නොවන බව ඔප්පු කිරීමට අවශ්‍ය වුවහොත් එය සනාථ කිරීමේ ලියවිලිද රැගෙන පැමිණ සිටිය යුතුය.

8. සාර්ථක වූ ටෙන්ඩර්කරුවන් විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර පිළිගත් බව දන්වූ වහාම රේන්ද විකිණීමේ කොන්දේසිවලට අත්සන් තබා කළුතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ දිසාපති විසින් ඇප තැන්පත් මුදල වශයෙන් නියම කරනු ලබන මුදලක්ද ගෙවිය යුතුයි.

9. ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර කිසිම හේතුවක් නොදක්වා ප්‍රතික්ෂෙප කිරීමේ සම්පූර්ණ අයිතිය කළුතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත වෙත පැවරී ඇත. විකිණීමේ කොන්දේසිවලට අනුකූල නොවූ හෝ වෙනයම් අන්දමකින් නියි පරිදි සකස් නොවූ හෝ ටෙන්ඩර් පත්‍ර භාරගනු නොලැබේ.

10. වැඩි විස්තර කළුතර දිසාපති කාර්යාලයෙන් ලබාගත හැක.

ලීල් ගුණසේකර,
කළුතර දිස්ත්‍රික්කණ්ඩුවේ ඒජන්ත.

1969 මැයි මස 20 දින,
කළුතර දිසාපති කාර්යාලයේ දී ය.

## 1969-70 වර්ෂයට කළුතර දිස්ත්‍රික්කයේ අනුමත කරන ලද රා තැබෑරුම්

| අනුක්‍රමික අංකය | කොට්ඨාශය | ග්‍රාමය | තැබෑරුම විවෘත කරන වේලාව | තැබෑරුම වසන වේලාව | ටෙන්ඩර් භාර ගන්නා අවසාන වේලාව |
|---|---|---|---|---|---|
| 1 ... | අළුත්ගම සුළු නගර සභා ප්‍රදේශය ... | අළුත්ගම සුළු නගර සභා සීමාව තුළ | පෙ.ව. 8.00 ... | ප.ව. 7.30 | පෙ.ව. 10.00 |

**සැලකිය යුතුයි**—1969–70 වර්ෂයට දැනට තැබෑරුම පිහිටා ඇති ස්ථානය ලබාදීමට සහතික වනු නොලැබේ. අළුත් ස්ථානයක තැබෑරුමක් විවෘත කරන්නේනම් ඒ සම්බන්ධයෙන් කළුතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ දිසාපතිගෙන් අනුමැතිය ලබාගත යුතුය.

3–165—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

---

## රා රේන්ද නැවත විකිණීම—මඩකලපු දිස්ත්‍රික්කය

## 1969-70

1969 ජූලි මස 1 වන දින සිට 1970 ජූනි මස 30 වන දින දක්වා ඇති කාල පරිච්ඡේදය තුළ සියළුම සුරාබදු බලපත්‍ර වෙනුවෙන්ද නට බලපවත්වන සාමාන්‍ය කොන්දේසි සහ 1969 මාර්තු මස 21 වන දින අංක 14,846 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකරන ලද 1969-70 වර්ෂය සඳහා රා රේන්ද විකිණීමේ කොන්දේසි අනුව පහත සඳහන් ප්‍රදේශයන්හි පැසුණු රා විකිණීමේ තනි අයිතිය මිලදී ගැනීම සඳහා මඩකලපු දිස්ත්‍රික්කයේ දිසාපති විසින් පහත සඳහන් දින හා වේලාව දක්වා මෙම දිසාපති කාර්යාලයේදී ටෙන්ඩර් පත් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවේදී ටෙන්ඩර්කරුවන් මෙම දිසාපති කාර්යාලයට පැමිණිය යුතුය.

2. අංක 3 දරණ ආරයිපත්තේ රා තැබෑරුම සඳහා රු. 1,000 කටද, අනික් සියළු රා තැබෑරුම් සඳහා රු. 500 කටද, එක් එක් ටෙන්ඩර් පත්‍රය වෙනුවෙන් මුදල් තැන්පත් කොට ලබාගත් කච්චේරි කුවිතාන්සි ඉදිරිපත් කර ඕනෑම දිසාපති කාර්යාලයකින්, කොළඹ සුරාබදු කොමසාරිස් කාර්යාලයෙන්, ත්‍රිකුනාමල සහකාර සුරාබදු කොමසාරිස්ගෙන් සහ මඩකලපු සුරාබදු අධිකාරිගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුය.

3. 1969 මාර්තු මස 21 වන දින අංක 14,846 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කොට ඇති 1969-70 වර්ෂය සඳහා රා රේන්ද විකිණීමේ කොන්දේසිවල අංක 4 (3) (1) දරණ කොන්දේසිය අනුව ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට අදහස් කරන ටෙන්ඩර් කරුවන් සෑම ටෙන්ඩර් පත්‍රයකටම වටිනාකමේ සහතිකයක් ඇමිණිය යුතුය.

4. මීලඟ රේන්ද කාලය තුළදී දැනට තැබෑරුම් පවතින ස්ථානම පාවිච්චිය සඳහා ප්‍රයෝජනයට ගතහැකි වේයයි සහතික කළ නොහැක.

5. වැඩි විස්තර මඩකලපුව දිසාපති කාර්යාලයෙන් ලබාගත හැකිය.

පී. කේ. පී. පල්ලවත්ත,
අතිරේක දිසාපති,
මඩකලපුව දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

1969 මැයි මස 20 වැනි දින,
මඩකලපුව දිසාපති කාර්යාලයේ දී ය.

### සඳහන් කරන ප්‍රදේශයන්

| රා තැබෑරුමේ අංකය | කොට්ඨාශය | ප්‍රාදේශිය කොටස (තැබෑරුම පිහිටිය යුතු) | ටෙන්ඩර් අවසාන වීම | |
|---|---|---|---|---|
| | | | දිනය | වේලාව |
| 3 ... | මන්මුනේ පත්තුව උතුර ... ... ... | ආරෙයිපත්තේ ගම තුළ ... | 69.6.13 ... | පෙ.ව. 10.00 |
| 4 ... | මන්මුනේ දකුණ සහ එරුවිල් පෝරතිව් පත්තුව ... | මාන්කාඩු ගම තුළ ... | 69.6.13 ... | පෙ.ව. 10.30 |
| 6 ... | මන්මුනේ දකුණ සහ එරුවිල් පෝරතිව් පත්තුව ... | එරුවිල් ගම ඇතුළත ... | 69.6.13 ... | පෙ.ව. 11.00 |

සැ.යු.—මඩකලපුව දිස්ත්‍රික්කයේ සෑම රා තැබෑරුමක්ම දිනපතා පූ.භා. 8 විවෘත කර අ.භා. 7 ට සෑම දිනම වැසිය යුතුය.

5–1022—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

## රත්නපුර දිස්ත්‍රික්කයේ රා රේන්ද විකිණීම 1969–70

1969 ඔක්තෝබර් මාසයේ 1 වැනි දින සිට 1970 සැප්තැම්බර් මාසයේ 30 වැනි ද දක්වා ඇති කාල සීමාව තුල මෙහි පහත උපලේඛණයේ දැක්වෙන ප්‍රදේශයන්හි පැසුණු රා සිල්ලර වශයෙන් විකිණීම පිණිස ටෙන්ඩර් කැඳවනු ලැබේ. මෙය පහත සඳහන් නීතිවලට අනුකූලව විය යුතුයි :—

(i) 1969 මාර්තු මස 21 වැනි දින අංක 14,846 දරණ රජයේ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද රා රේන්ද විකිණීමේ කොන්දේසි අනුව, හා

(ii) සුරා බදු නිවේදනයේ දැක්වෙන සෑම සුරා බදු බලපත්‍රයක් කෙරෙහිම බලපාන පොදු කොන්දේසි මාලාවට යටත්වය.

2. සෑම ටෙන්ඩරයක් වෙනුවෙන් කච්චේරියේ මුදල් තැන්පත් කර ලබාගත් රිසිට් පතක් ද ටෙන්ඩරයට අමුණා ඉදිරිපත් කළ යුතුයි. බලංගොඩ තැබෑරුම සඳහා නම්, රු. 3,000 ක්ද, පින්නවල තැබෑරුම සඳහා නම් රු. 2,000ක් ද තැන්පත් කළ යුතුයි.

3. ලංකාවේ සෑම කච්චේරියකින් ද, කොළඹ සුරාබදු කොමසාරිස්තැනගේ කාර්යාලයයෙන්ද, නුවර සී. ඩී. සහකාර සුරාබදු කොමසාරිස්තැනගේ කාර්යාලයයෙන් ද, බදුල්ලේ සුරාබදු අධිකාරිතැනගේ කාර්යාලයෙන් ද ලබාගත හැකි නියමිත ආකෘති පත්‍රයක ලියන ලද ටෙන්ඩර් පත කවරයක බහා සිල් තබා චම් කෙළවරේ මුදුනේ කුමණ තැබෑරුම් සඳහා ඉදිරිපත් කරන ටෙන්ඩරයදැයි පැහැදිළිව සඳහන් කළ යුතුයි.

ටෙන්ඩර් වැසීමට නියමිත කාලය ඉකුත්වීමට කළින්, රත්නපුර කච්චේරියෙ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමිය යුතුයි.එසේ නැතිව තැපෑලෙන් එවන්නේ නම්, නියමිත කාලය ඉකුත්වීමට කළින් '' රත්නපුර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්තතැන '' යන ලිපිනයට ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය.

4. සෑම ටෙන්ඩර්කරුවෙක් ම තමාගේ නමින් ම ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. නියෝජිතයන්ගේ මාර්ගයෙන් හෝ ලාංකික නොවන අයගේ නමින් හෝ රා රේන්ද විකිණීමේ කොන්දේසිවල 6 වැනි කොන්දේසිය අනුව නුසුදුස්සෙකු වූ අයෙකුගේ නමින් හෝ ටෙන්ඩර් පිළිගනු නොලැබේ.

5. එක් අයෙකුට එක් තැබෑරුමක් සඳහා එක් ටෙන්ඩර් පත්‍රයකට වඩා එවිය නොහැක. එක් තැබෑරුමක් සඳහා පස් දෙනෙකුට වැඩි අයවළුන් විසින් ද ටෙන්ඩර් ඉදිරිපත් කළ නොහැක.

6. ටෙන්ඩරයේ මුදල අකුරෙන් සහ ඉලක්කමෙන් දැක්විය යුතුය. ටෙන්ඩරයේ කරන සෑම වෙනස්වීමක්ම ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන සහ දිනය යොදා සහතික කළ යුතුය. මේ අවශ්‍යතාවයන්ට අනුකූල නොවන ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. ජයග්‍රාහී ටෙන්ඩර්කරු මිළ දී ගත් තැනැත්තා හැටියට ප්‍රකාශ කළ විගසින්ම රේන්ද විකිණීමේ කොන්දේසියට අත්සන් තබා, දිසාපතිතැන විසින් නියම කරන මුදල ඇප වශයෙන් තැන්පත් කළ යුතුයි.

8. පහත සඳහන් පරිදි, එක් එක් තැබෑරුමට නියම කර ඇති වේලාවන්හි 1969 ජූලි මස 4 වෙනි සිකුරාද දින ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ. සෑම ටෙන්ඩර්කරුවෙක්ම එකි නියමිත වේලාවට කච්චේරියේ පෙනී සිටිය යුතුය.

9. ටෙන්ඩර්කරුවන්ගේ දැන ගැනීම සඳහා මෙම දිස්ත්‍රික්කයේ වතුවල තිබෙන සුරාසැල් ලැයිස්තුවක් ද පහත සඳහන් කර ඇත.

10. වැඩි විස්තර රත්නපුර කච්චේරියෙන් විමසා දැන ගත හැකිය.

අ. පු. බ. මනම්පපේරි,
රත්නපුර දිස්ත්‍රික්කයේ දිසාපති.

1969 මැයි මස 20 වැනි දින,
රත්නපුර දිසාපති කාර්යාලයේදී ය.

### උපලේඛනය

| අනු අංකය | කොට්ඨාශය | තැබෑරුම පැවැත්විය යුතු ප්‍රදේශය | විවෘත කිරීමේ වේලාව පූ.භා. | වැසීමේ වේලාව අ.භා. | ටෙන්ඩර් වැසීමේ වේලාව පූ.භා. |
|---|---|---|---|---|---|
| 1 | බලන්ගොඩ නගරය | බලන්ගොඩ නගරයේ අංක 5 දරණ කොට්ඨාශය තුළ | 8.30 | 8.30 | 10.30 |
| 2 | කඩවත සහ මැද කෝරළය | පින්නවල ගම තුල | 8.30 | 7.00 | 11.00 |

වතු සුරාසැල් (ටෙන්ඩර් කැඳවීම සඳහා නොවේ)

| | | | |
|---|---|---|---|
| 1 | කඩවත සහ මැද කෝරළය | විකිලිය වත්තේ සීමාවන් තුල | (මෙය වතු අධිකාරීන්ගේ මනාපය අනුව පවතික්.) |
| 2 | නවදූන් කෝරළය | හපුගස්තැන්න වත්තේ සීමාවන් තුල | |
| 3 | නවදූන් කෝරළය | හපුගස්තැන්න වත්තේ සීමාවන් තුල | |
| 4 | නවදූන් කෝරළය | ලෙල්ලෝපිටිය වත්තේ සීමාවන් තුල | |
| 5 | නවදූන් කෝරළය | නිරිඇල්ලේ වත්තේ සීමාවන් තුල | |
| 6 | අටකලන් කෝරළය | මාදම්පෙ වත්තේ සීමාවන් තුල | |
| 7 | අටකලන් කෝරළය | ඔපාත වත්තේ සීමාවන් තුල | |

5–1054—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## වෙන්දේසියේ විකිණීමක්

### කොළඹ ජාවත්ත පාරේ පිහිටි මැනදී සාදන ලද නවටු ගෘහ සතරක ගොඩනැගිල්ලක්

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඇස්. ගුණසේකර මහතා විසින් සහතික කරන ලද අංක 342 සහ 1956. 6. 29 වැනි දින දරන උකස් සරය යටතේ සහ ඉහත කී නොතාරිස් සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඇf ජ්. ඒ. අයි. රත්නායක මහත්මිය ද විසින් සහතික කරන ලද අංක 1041/1350 සහ 1959. 5. 8 සහ 13 වන දිනයන් දරන අතිරේක ඔප්පුවද, සහ ඉහතකී නොතාරිස් ඇස්. ගුණසේකර මහතා සහතික කර ඇති අංක 1248 සහ 1960 මාර්තු 1 සහ 15 වෙනි දිනයන් දරන අතිරේක ඔප්පුවද යටතේ ගෙවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති බැවින් (1) දෙහිවල වෛද්‍ය පෙදෙසේ ඒ. ඩී. ජේ. පී. ජයසූරිය මයා. (2) කොළඹ 6, fපයිජ් පාරේ අංක 93 දරන ස්ථානයේ පදිංචි ඒ. ඇන්. ධර්මරත්න නොහොත් හොප්මන් මිය. (3) පී. ඒ. ධර්මරත්න මයා. සහ (4) පී. ඇන්. ධර්මරත්න මයා. යන අයගෙන් 1968. 7. 28 වෙනි දින දක්වා අයවිය යුතු රුපියල් 1,09,571/09 ක් සහ එසේම 1968. 7. 28 වන දින සිට විකිණීම පැවැත්වෙන දිනය හෝ සම්පූර්ණයෙන් මුදල් ගෙවන දින දක්වා තවදුරටත් රුපියල් 79,051 කට වසකට 4% ගණනේ එකතුවන පොලියද යථෝක්ත උකස් කර ප්‍රකාර 1968. 7. 28 වන දින සිට අයවිය යුතු සියලුම දඩ මුදල් ද මුදල් අයකර ගැනීමට දරන ලද සියලුම වියදම් සහ ගාස්තුද අයකර ගැනීම සඳහා ජාතික නිවාස සහකාර කොමසාරිස් ධනපාල සිරිසේන විරසිංහ මහත්මයා විසින් මාවෙත නිකුත් කර තිබෙන බලය ප්‍රකාර

වර්‍ෂ 1969 ජූනි මස 13 දින අ. භා. 4 ට මෙහි පහත සඳහන් ඉඩම එම ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

කොළඹ ජාවත්ත පාරේ වරිපනම් අංක 41/2, 41/3, 41/4 සහ 41/5 දරන තට්ටු ගොඩනැගිල්ල සමග බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. සී. ද සිල්වා විසින් සාදන ලද අංක 572 සහ 1954. 12. 15 දින දරන පැලැනය අනුව බිම් ප්‍රමාණය පර්චස් 16.75 ක් ඇති එම පැලැනයේ ලොට් 1 සී ලකුණු කර පෙන්වන ඉඩම එම පැලැනයේ ලොට් 1 ඒ 2 ලකුණු කර පෙන්වන පාරට වෙන්කර ඇති බිම් කොටස පාදයෙන් සහ වාහනවලින් යාම ඊමට බලයද සමගය.

ඔප්පු බැලීමට සහ වෙනත් විස්තර වලට කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ ජාතික නිවාස දෙපාර්තමේන්තුවේ කොමසාරිස් තුමාගෙන් විමසන්න.

කේ. ජී. එඩ්මන්,
වෙන්දේසිකරු බ්‍රෝකර් සහ තක්සේරුකාර තැන.

7, බෙල්මන් වීදිය,
කොළඹ 12.

5–1071—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

# විවිධ දැන්වීම්

## ග්‍රන්ථ කර්තෘන් ගේ හා පොත් පළකරන්නන් ගේ දැන ගැනීම පිණිසයි

පාසල් ශිෂ්‍යයන් සඳහා අතිරේක පාඩම් පොත් පළ කිරීමට අනුබල දීම් වස් රජය විසින් පොත් මිලයට ගැනීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාවේ යොදනවා ඇත. මෙම වැඩ පිළිවෙල අනුව පත් කරනු ලබන මණ්ඩල යක් විසින් සුදුසු යැයි සම්මත කරනු ලබන විද්‍යාවන් සම්බන්ධ සිංහල හා දෙමළ භාෂාවලින් ලියන ලද එක් එක් පොතින් පිටපත් 1,000 කට නොවැඩි සංඛ්‍යාවක් මිල දී ගැනීමට අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව බලාපොරොත්තු වෙයි.

මෙම වැඩ පිළිවෙල යටතේ සලකා බැලීම පිණිස පොත් ඉදිරිපත් කිරීමට කැමති ප්‍රකාශකයන් විසින් 68.6.1 දින සිට 69.5.31 දින දක්වා කාලය තුළ දී පළ කරන ලද විද්‍යා අධ්‍යාපනයට අදාල ආශ්‍රය පොත්වලින් පිටපත් 2 බැගින් 69.7.15 දිනට කලින් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් වෙත එවිය යුතුය.

යථෝක්ත වැඩ පිළිවෙළ යටතේ තෝරා ගනු ලබන්නේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලය විසින් සුදුසු යැයි සම්මත කළ පොත්වල පිටපත් පමණි. එසේ තෝරා ගත් පොත් වලට කර්තෘභාගය වශයෙන් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් නියම කරන මුදලක් ග්‍රන්ථ කර්තෘට ගෙවන බවට පළ කරන්නා පොරොන්දු විය යුතුය. ග්‍රන්ථ කර්තෘට ගෙවනු ලබන කර්තෘභාගය ගෙවිය යුත්තේ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව මගිනි.

එස්. වණිගතුංග,
වැ. බ. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස්.

කොළඹ 3, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවතේ,
"සිරිමතිපාය" හි,
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේදීය,
1969 මැයි මස 9 දින.

5–1947—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

# තනතුරු – ඇබෑර්තු

(862 වෙනි පිට හා සම්බන්ධිතයි)

## පළාත් පාලන සේවා කොමිෂන් සභා දෙපාර්තමේන්තුව

### භාෂා පරිවර්තක (දෙමළ) තනතුර

පළාත් පාලන සේවා කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ භාෂා පරිවර්තක (දෙමළ) තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

2. **වැටුප් ක්‍රමය.**—වර්‍ෂයකට රු. 1,620 න් පටන්ගෙන වර්‍ෂයකට රු. 120 බැගින් රුපියල් 3,780 දක්වා වැඩිවන වාර්ෂික වැටුප් ක්‍රමය මෙම තනතුරට අදාල වේ.

3. **සේවයට භාරගැනීමේ කොන්දේසි.**—

(i) පුරුෂ පක්ෂයේ අපේක්ෂකයින් පත්වීමේ දින සිට තුන් අවුරුදු කාලපරිච්ඡේදයක ආධුනිකත්වය පිට පත් කරනු ලැබෙන අතර, විශ්‍රාම වැටුප් සහිත පදනමක් මත පත්වීම් කරනු ලැබේ.

(ii) අපේක්ෂිකාවන් මුල් අවස්ථාවේදී පත් කරනු ලබන්නේ පත්වීමේ දින සිට තුන් අවුරුදු කාලපරිච්ඡේදයක පරීක්ෂාවකට යටත් කොටය. මේ කාල පරිච්ඡේදය තුළ මොවුන් විසින් අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. දස වර්‍ෂයක සේවය සම්පූර්ණ කිරීමට පෙර ඕනෑම විටකදී මොවුන්ට විශ්‍රාම වැටුප් හිමි කාර්ය මණ්ඩලයට ඇතුළුවීමට කැමැත්ත ප්‍රකාශ කිරීමට හිමිකම් ඇත්තේය. මෙසේ සිය කැමැත්ත ප්‍රකාශ කළොත්, එය පසුව අස් කරගත නො හැකිය. පරීක්ෂණ කාලය තුළදී මෙසේ කැමැත්ත ප්‍රකාශ කරන අපේක්ෂිකාවෝ ඉන් පසු ආධුනිකත්වයෙහි තබනු ලැබෙති. මේ ආධුනිකත්ව කාල පරිච්ඡේදය වන තුන් අවුරුද්දෙන් ඉතිරිවී තිබෙන කොටසය.

(iii) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා "නව ප්‍රවේශක" සංඛ්‍යාවෙහි ලා සලකනු ලබන තෝරාගනු ලබන අපේක්ෂකයා 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ ප්‍රතිපාදනයන්වද රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු සඳහා දැනට පවතින හෝ මතුවට පැනවෙන, නීති රීති සහ ව්‍යවස්ථාවලටද එකඟව කටයුතු කිරීමේ කොන්දේසිය පිළිගත යුතුය.

තෝරාගනු ලබන අපේක්ෂකයා විසින් ස්වකීය ආධුනික/පරීක්ෂනාත්මක කාලපරිච්ඡේදය තුළදී රාජ්‍ය භාෂාව වූ සිංහලෙන් වැඩ කිරීමේ දැනීමක් ලබාගත යුතුය. එම ආධුනික පරීක්ෂනාත්මක කාලපරිච්ඡේදය අවසාන වීමේදී මේ අපේක්ෂකයන්ගේ පත්වීම ස්ථිර කරනු ලබන්නේ, ඔවුන්ගේ වැඩ මෙන්ම, හැසිරීමත් සතුටුදායක වී නියමිත සිංහල ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත් වූ විටය.

4. **සුදුසුකම්.**—

(i) අපේක්ෂකයන් යහපත් චරිතයෙන් යුක්ත විය යුතුය.

(ii) ලාංකිකයන් විය යුතුය.

(iii) යටත් පිරිඳසෙයින්.

(1) දෙමළ භාෂා විෂයයෙහි ලන්ඩන් විශ්ව විද්‍යාලයේ අධ්‍යයන පොදු සහතිකය (උසස් තත්ත්වයක), හෝ

(2) දෙමළ ලංකා අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙල) විභාගය, හෝ

(3) දෙමළ විෂයයක් වශයෙන් ඇති (විශේෂ දෙමළ නොවේ.) උසස් පාඨශාලා සහතිකය, හෝ

(4) දෙමළ හෝ විෂයයක් වශයෙන් ඇතිව, ලන්ඩන් විශ්ව විද්‍යාලයේ කලා අංශයේ මධ්‍යම සහතිකය හෝ ලංකා විශ්ව විද්‍යාලයේ පොදු කලා විභාගයට සුදුසුකම් ලැබීමේ (ප්‍රථම) විභාග සහතිකය, හෝ

(5) භාණ්ඩාගාරයෙන් පවත්වන ලද දෙමළ පිළිබඳ ප්‍රවීණතා විභාගයේ (උසස් පෙල) දෙමළ විෂයෙන් සාමාර්ථයක්

යන ප්‍රධාන සුදුසුකම්වලින් **එකක්** හා යටත් පිරිසෙයින් පහත සඳහන් අතිරේක සුදුසුකම්වලින් එකක්ද ලබා තිබිය යුතුය :—

(අ) ඉංග්‍රීසි භාෂාවෙන් හෝ ඉංග්‍රීසි සාහිත්‍යයෙන් හෝ සම්මාන සාමාර්ථයක් සහිත 1957 ජූලි මස දි හෝ ඉන් පෙර හෝ ප්‍රදානය කරන ලද ඉංග්‍රීසි භාෂාමය පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතිකය, හෝ ඕනෑම අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයකදී ඉංග්‍රීසි භාෂාව "ඒ" නිර්දේශ යෙන් හෝ ඉංග්‍රීසි සාහිත්‍යයෙන් සම්මාන සාමාර්ථයක් ඇතිව පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතිකය හෝ ඉංග්‍රීසි භාෂාවෙන් මේවාට සමාන හෝ උසස් හෝ තත්ත්වයක් ඇතිව අන්‍ය විභාගයකින් සාමාර්ථය.

(ආ) ඉංග්‍රීසි භාෂාව "ඒ" නිර්දේශයෙන් හෝ ඉංග්‍රීසි සාහිත්‍යයෙන් හෝ සම්මාන සාමාර්ථය සහිත, විෂයයන් හයකින් වාර දෙකකට නොවැඩි වාර ගණනකදී ලබන ලද අධ්‍යයන පොදු සහතිකය (සාමාන්‍ය).

**සංලක්‍ෂ්‍යය.**—යම් යම් අපේක්ෂකයන් ඉහත සඳහන් විභාග වලින් යම්කිසිවකට පෙනී සිටි නමුත්, ඉල්ලුම් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනයට පෙර තමා පෙනී සිටි එම විභාගයේ ප්‍රතිඵල නිකුත්වී නැත්නම් එවැනි අපේක්ෂකයන් එවන ඉල්ලුම්පත්‍ර භාරගනු නොලැබේ.

(iv) 1969 ජූනි 13 වැනි දිනට වයස අවුරුදු 19 ට නොඅඩු හෝ 25 ට නොවැඩි හෝ අය විය යුතුය.

රාජ්‍ය සේවයට බඳවා ගැනීම පිළිබඳ සෑම කරුණක් සඳහාම "ලාංකික" යන පදයෙන් අදහස් කෙරෙන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් හෝ ලංකාවේ පුරවැසි බව ලබා ඇති තැනැත්තන් ය.

5. යුද්ධ හමුදාවේ සේවා මුක්ත භටයෝ පහත සඳහන් සහනය ලැබීමට සුදුස්සෝ වන්නාහ. යුද්ධ හමුදාවේ සේවා මුක්ත භටයන්ට එනම් ස්ථිර හමුදාවේ සේවය කිරීමෙන් පසුව උප සේවයට මාරු කරනු ලැබූ යුද්ධ හමුදාවේ අයට හෝ අවඥා සහගත ලෙස සේවයෙන් නෙරපන ලද්දා වූද, සේවයෙන් නිදහස් කරන ලද්දාවූද, එසේම යම් අන්දමක විෂමාචාරයක් නිසා සේවයෙන් අස්වන්ට සිදුවූද අය හැර යුද්ධ හමුදාවෙන් අස්ව සිටින අනෙක් නිලධාරීන්ට හා භටයන්ට (iv) වැනි ඡේදයේ නියම කරන ලද වයස් සීමාව සඳහා වයස ගණන් බැලීමේදී, තමන් ස්ථිර හමුදාවේ සිටි සේවා කාලය, තම වයසින් අඩු කිරීමට ඉඩ දෙනු ලැබේ.

6. අයදුම්කරුවන්, පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් සහතික නොවේ.) ස්වකීය අයදුම්පත් සමග එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (බෞතීස්ම සහතික පත්‍ර හෝ අධ්‍යාපන කටයුතු සඳහා නිකුත් කරනු ලබන සහතිකය හෝ පිළිගනු නොලැබේ).

(ආ) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඇ) මෑතදී ලබාගත් චරිත සහතික දෙකක්.

සහතික පිටපත් කිසිවක් ආපසු එවනු නොලැබේ.

7. රජයේ සේවයේ හෝ පළාත් පාලන සේවයේ නියුක්ත අයගේ අයදුම්පත්, අදාල දෙපාර්තමේන්තු ප්‍රධානීන් හෝ ප්‍රාදේශීය බලමණ්ඩලවල සභාපතිවරුන් හෝ කොමසාරිස්වරුන් මගින් ඉදිරිපත් කළ යුතුය. අයදුම්කරු භාෂා පරිවර්තන කටයුතු වල යෙදෙන බව හා එම කටයුතුවල ස්වභාවය පිළිබඳවත්, පත්වීම සඳහා තෝරාගනු ලැබුවහොත් අයදුම්කරු සේවයෙන් නිදහස් කළ හැකිද යන බවත්, අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් හෝ ප්‍රාදේශීය බලමණ්ඩලවල සභාපතිවරුන් හෝ කොමසාරිස්වරුන් සහතික කළ යුතුය.

8. අයදුම්පත් මේ සමග ඇති ආකෘතිපත්‍රය අනුව පිළියෙල කොට 1969 ජූනි 13 දින හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන ලෙස පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලය, තැ. පෙ. 530, කොළඹ, යන ලිපිනයට එවිය යුතුය.

9. අයදුම්පත් හෝ එයට අදාල වෙනත් ලිපි ලේඛන සියල්ලක්ම එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපතිතුමා වෙත මිස, පහත අත්සන් කරන අය වෙත පුද්ගලික වශයෙන් නොවේ.

10. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් භාරගනු ලබන්නේ, ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත අවසන් දිනට පෙර ලැබුණු බවට සහතික කර, ප්‍රමාදයට හේතුවූ පිළිගත හැකි කරුණු දක්වමින් ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළ හොත් පමණි.

11. කොළඹදී පැවැත්වෙන විභාගයක් සඳහා පෙනී සිටීමට අයදුම්කරුවනට නියම කරනු ලැබිය හැකිය. මේ සම්බන්ධයෙන් ගමන් වියදම් හෝ වෙනත් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.

12. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (II) ඡේදයේ පළ කරනු ලබන රාජ්‍ය සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි බලනු මැනවි.

එන්. විජේවර්ධන,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ
සභාපති.

1969 මැයි මස 9 දින,
තැ. පෙ. 530, කොළඹ,
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලයේදීය.

## පළාත් පාලන සේවා කොමිෂන් සභා දෙපාර්තමේන්තුව

### භාෂා පරිවර්තක (දෙමළ) තනතුර සඳහා අයදුම් පත්‍රයයි

1. දැන්වීමේ සම්බන්ධය :————.

2. සම්පූර්ණ නම පැහැදිළි අකුරින් :————

ජාතිය :————.

3. සම්පූර්ණ තැපැල් ලිපිනය :————.

4. අයදුම්කරු උපන් දිනය සහ ස්ථානය :————.

(අයදුම්කරුගේ උප්පැන්න සහතිකයේ සහතික කරන ලද පිටපතක් අමුණා එවිය යුතුයි.)

5. අයදුම්කරුගේ පියාගේ උපන් දිනය හා ස්ථානය :————.

6. විවාහකද, අවිවාහකද :————.

7. සම්මාන සාමාර්ථ්‍යය ලත් විෂයයන්ද සඳහන් කරමින් අධ්‍යාපනික සුදුසුකම් හා අවසාන වරට සමත් වූ විභාගය, දිනයත් සමග (සහතික පිටපත් අමුණා එවිය යුතුය.) : ————.

8. අධ්‍යාපනය ලැබූ ස්ථානය හා පාසලින් අස්වූ දිනය :————.

9. (අ) දින වකවානු හා සේවය පිළිබඳ සම්පූර්ණ විස්තර සහිතව පාසලින් අස්වූ දින සිට කළ රක්ෂාව : ————.

(ආ) මීට කලින් ආණ්ඩුව යටතේ සේවය කළේ නම් සේවය නතර කිරීමේ හේතුවත් සමග සේවය පිළිබඳ විස්තර සඳහන් කරන්න :————.

(ඇ) පළාත් පාලන සේවා සාමාජිකයකු නම් :—

(i) දැනට දරන තනතුරේ නම හා ශ්‍රේණිය :————.

(ii) දැනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය :————.

(iii) පළාත් පාලන මණ්ඩලවල සේවය පිළිබඳ වාර්තා සටහන :————.

(ඈ) සේවා මුක්ත භටයකු නම් :—

සේනාංකය, තරාතිරම, සේවයට බැඳුන දින හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

10. විශේෂ සුදුසුකම් පිළිබඳ විස්තර :————.

(උදා.—වෘත්තීය හා ශිල්පීය ආදී වශයෙන්.)

11. චරිත සහතික ලබාගෙන ඇති පුද්ගලයන්ගේ නම් සහ පදවි නාම :————.

12. විශේෂ හිමිකම් ආදිය පිළිබඳ විස්තර :————.

(උදා.—අයදුම්කරු ඉල්ලුම් කර සිටින ස්වභාවයේ තනතුරක ඇති පළපුරුද්ද.)

13. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේද ? එසේ නම් දිනය, නඩු නොම්මරය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

14. පළාත් පාලන සේවය යටතේ සේවය කළේද ? එසේ නම් කිසියම් අවස්ථාවක සේවය නතර කරනු ලැබුවේද ? : ————.

15. ණයතුරුස්වලින් හෝ මුදල් කරදරවලින් නිදහස්ද :————.

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවත්, සත්‍ය බවත් ප්‍රකාශ කරමි. මෙහි සඳහන් යම්කිසි තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව අනාවරණය වුවහොත්, එසේ අනාවරණය වූයේ තෝරාගනු ලැබීමට පළමු නම් එයින් මා නුසුදුස්සකු වන බවත්, පත් කිරීමෙන් පසුව නම් වන්දියක් නැතිව සේවයෙන් පහ කරනු ලැබිය හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

සභාපති,
පළාත් පාලන සේවා කොමිෂන් සභාව,
තැ. පෙ. 530, කොළඹ.

5-861—69.5.30 දින අංක 14,856 දරන ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳ වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතුවන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් **කොළඹ මහලේකම් කායඪාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කායඪාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

**උපලේඛනය**
**1969**

| මාසය | පළ කිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|
| ජනවාරි ... | 3. 1.69 | සිකුරාද ... | 24.12.68 | අඟහරුවාද | ප.ව. | 3.30 |
| | 9. 1.69 | බ්‍රහස්පතින්ද ... | 3. 1.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| | 16. 1.69 | බ්‍රහස්පතින්ද ... | 9. 1.69 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | 24. 1.69 | සිකුරාද ... | 16. 1.69 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | 31. 1.69 | සිකුරාද ... | 24. 1.69 | සිකුරාද | දවල් | 12.00 |
| පෙබරවාරි ... | 7. 2.69 | සිකුරාද ... | 31. 1.69 | සිකුරාද | දවල් | 12.00 |
| | 14. 2.69 | සිකුරාද ... | 7. 2.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| | 21. 2.69 | සිකුරාද ... | 14. 2.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| | 27. 2.69 | බ්‍රහස්පතින්ද ... | 20. 2.69 | බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| මාර්තු ... | 7. 3.69 | සිකුරාද ... | 27. 2.69 | බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 14. 3.69 | සිකුරාද ... | 7. 3.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| | 21. 3.69 | සිකුරාද ... | 14. 3.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| | 28. 3.69 | සිකුරාද ... | 21. 3.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| අප්‍රේල් ... | 3. 4.69 | බ්‍රහස්පතින්ද ... | 27. 3.69 | බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 11. 4.69 | සිකුරාද ... | 31. 3.69 | සඳුද | ප.ව. | 3.30 |
| | 18. 4.69 | සිකුරාද ... | 8. 4.69 | අඟහරුවාද | දවල් | 12.00 |
| | 25. 4.69 | සිකුරාද ... | 18. 4.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| | 30. 4.69 | බදාද ... | 23. 4.69 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| මැයි ... | 9. 5.69 | සිකුරාද ... | 30. 4.69 | බදාද | ප.ව. | 3.30 |
| | 15. 5.69 | බ්‍රහස්පතින්ද ... | 9. 5.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| | 22. 5.69 | බ්‍රහස්පතින්ද ... | 15. 5.69 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | 30. 5.69 | සිකුරාද ... | 22. 5.69 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| ජූනි ... | 6. 6.69 | සිකුරාද ... | 30. 5.69 | සිකුරාද | දවල් | 12.00 |
| | 13. 6.69 | සිකුරාද ... | 6. 6.69 | සිකුරාද | දවල් | 12.00 |
| | 20. 6.69 | සිකුරාද ... | 13. 6.69 | සිකුරාද | දවල් | 12.00 |
| | 27. 6.69 | සිකුරාද ... | 20. 6.69 | සිකුරාද | ප.ව. | 3.30 |

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
**වැඩබලන ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

**1968 දෙසැම්බර් මස 20 වැනි දින,**
**ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.**

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි